# ජයමංගල ගාථා

සම්පාදකඃ-

**පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි**

**ධර්ම දානය පිණිසයි**

---

ශ්‍රී බුඃ වඃ 2562 වූ මැදින් මස පුර ජලවක නම් තිථිය ලත් ගුරු දින. ව්‍යඃ වඃ 2020-02-27 දින

# හැඳින්වීම

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

**"සංසාරසොතං ඡින්දිත්වා - විද්ධංසෙත්වා තයො භවෙ,**
**ධම්මනාවං සමාරුය්හ - සන්තාරෙස්සං සදෙවකං"**

"(මේ සම්මා සම්බුදු රජාණන් වහන්සේ මෙන් මම ද) සංසාරය නැමැති සැඩ පහර සිඳ හැර කාම රූප අරූප යන තුන් භවය නසා දහම් නැවට නැගී දෙවියන් සහිත ලෝක සත්වයා එතර කරවන්නෙමි"

මෙය වනාහි අප මහ බෝසතාණන් වහන්සේ සුමේධ තාපසව උපන් කල්හි දීපංකර බුදුරජාණන් වහන්සේ හමුවෙහි ජීවිත පරිත්‍යාගයෙන් යුක්තව ප්‍රථම නියත විවරණය ලැබ කල ප්‍රාර්ථනාවය. එතැන් පටන් සම තිස් පෙරුම් දම් පුරා ලොව්තුරා බුදු බවට පැමිණ පන්සාළිස් වසක් මහා කරුණාවෙන් ධර්ම වර්ෂා වස්වා සූවිසි අසංඛ්‍ය නවකෝටි සැට ලක්‍ෂයක් සත්වයන් අමෘත මහා නිර්වාණයට පමුණුවා අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

භාග්‍යවත් අතීත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝක සත්වයන්ට මහා කරුණාවෙන් පිහිට වූ අවස්ථා බොහෝ ය. ඒ අතරින් අභියෝග වශයෙන් පැමිණි විශේෂිත වූ අවස්ථා අටක් මෛත්‍රී ආදී උතුම් ගුණ බලයෙන් ජයගත් අවස්ථා අටක් අර්ථවත් කොට ආශිර්වාද පෙරටුව සත්‍යක්‍රියා කිරීම් ශීර්ෂයෙන් මෙම ජයමංගල ගාථා වේනෙය්‍ය ජනයාගේ සුබ සිද්ධිය පිණිස පූර්වාචාර්යයන් වහන්සේ නමක් විසින් නිබන්ධනය කර ඇත. මේ ජයමංගල ගාථා සුබ කටයුතුවල දී ගිහි පැවිදි බොහෝ දෙනා භාවිතා කරති. මෙම ගාථා භාවිතයෙහි දී නියම ප්‍රයෝජනය ලැබීමට නම් එහි සැබෑ වූ අර්ථය දැන එය භාවිතා කළ යුතුය. එම ගාථාවන්හි ගැබ් වන අර්ථ ත්‍රිපිටක සාහිත්‍යයෙහි විසිරී පවත්නා සිදුවීම් විවරණ එක් කොට මෙම ගාථා භාවිතා කරන සැමට යහපත පිණිස මෙසේ ග්‍රන්ථයක් සැකසුවෙමි.

අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද මහා ස්වාමීන් වහන්සේගේ 57 වැනි ජන්ම දිනය නිමිත්තෙන් ආයුරාරෝග්‍ය සම්පත් අභිවර්ධනය වී සුවසේම සසුන් කෙතේ උසස් ගුණ දහම් සපුරා නිවන් සුව ලැබීමට හේතු වේවා යන ආශිර්වාදය පෙරටුව ධර්ම පූජාවක් වශයෙන් මෙය පිරිනමමි.

එසේ ම අති පූජනීය මීගොඩ සංඝසෝභන ස්වාමීන් වහන්සේ ප්‍රධාන නා උයන සේනාසනයෙහි වැඩ සිටින ගරු මහ සඟ රුවනට ද ආයුරාරෝග්‍ය සම්පත් අභිවර්ධනය වී සුව සේ සසුන් ගුණ වඩා නිවන් සුව ලැබීමට හේතු වේවා.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමාධිපති ප්‍රධාන අනුශාසක අති පූජනීය පහල විටියල ජනානන්දාභිධාන මහා ස්වාමීන් වහන්සේ ප්‍රධාන ගරු කටයුතු මහ සඟ රුවනට ද, බුරුම රට පා අවුක් භාවනා මාර්ගයෙහි නිර්මාතෘවර අති පූජනීය උ ආචින්න මහා ස්වාමීන් වහන්සේ ප්‍රධාන මහ සඟරුවනට ද ලක් වැසි වූ ද ලෝ වැසි වූ ද ගරු කටයුතු සියලු මහ සඟ රුවනට ද ආයුරාරෝග්‍ය සම්පත් අභිවර්ධනය වී සුව සේ සසුන් ගුණ වඩා නිවන් සුව ලැබීමට හේතු වේවා.

එසේ ම මෙම ග්‍රන්ථය අගය කොට පෙරවදනක් ලියා දුන් අප උපසම්පද සොයුරු කල්‍යාණ මිත්‍ර පූජනීය හීනටිගල පඤ්ඤාරාම ස්වාමීන් වහන්සේට ද නිදුක් නිරෝගී සුව දීර්ඝායුෂ වේවා. සම්බුදු සසුන ආලෝකවත් කරමින් සියලු ප්‍රාර්ථනා ජය ගෙන නිවන්සුව ලබන්නට ම හේතු වේවා. මෙම මහඟු ධර්ම දානමය පින්කමට දායක වූ පුණ්‍යකාමී සැමට ද, මෙය මනා කොට මුද්‍රණය කර දුන් දිමුතු මුද්‍රණාලයේ අධිපති තුමා ප්‍රධාන සැමට ද සියලු ප්‍රාර්ථනා ජය ගෙන නිවන් සුව ලබන්නට හේතු වේවා. මෙය භාවිතා කරන සැමට ද සියලු අර්ථ සිද්ධිය වේවා!

මෙයට මෙතැති

නිකපිටියේ ගුණරතන හිමි.
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම, මැල්සිරිපුර.

# පෙරවදන

## නමො තෙ බුද්ධවීරස්සු

මහා ජයමංගල ගාථා පුරාණාචාර්යයකු අතින් සැකසුණ වටිනා ගාථා අටකි. ආනිසංස සඳහන් ගාථාව සමග ගාථා නවයකි. සිංහල බෞද්ධයන් අතර ඉතා ප්‍රචලිත මෙම සෙත් ගාථා පැරණියන් මෙන්ම නූතනයන්ද විවාහ මංගල්‍යකදී ජයමංගල ගාථා කීම ඇතැම් ප්‍රදේශවල අෂ්ටක කීම ලෙස ද ව්‍යවහාර කරති.

බුද්ධ චරිතයෙහි විශිෂ්ට අවස්ථාවන් අටක් දක්වමින් ගාථා සැකසී ඇත. හැම අවස්ථාවකම බුදුරජාණන් වහන්සේට පැමිණි විපත් කරදර නුවණින් සලකා කරුණා මෛත්‍රී ආදී උතුම් ගුණ පිහිට කොට ඒවා ජයගත් අයුරු දක්වා ඒ තේජසින් යහපතක්ම වේවායි සෙත් ප්‍රාර්ථනා කරයි.

බෞද්ධයන් අතර මෙතෙක් කල් මෙතරම් ගෞරවයෙන් මෙම ගාථා භාවිතා කිරීමෙන් පෙනී යන්නේ මෙහි යම් බලයක් ආනුභාවයක් තිබෙන බවය. මිනිසුන් අතර තිබෙන උසස්ම උත්සවය විවාහ මංගල උත්සවයය. එහි දී මනාල යුවලට මෙම ගාථා කියා සෙත් පැතීම සිංහලයන්ගේ අනිවාර්ය අංගයකි. එවැනි තැනක දී පවා භාවිතා කිරීමෙන් පෙනී යන්නේ අලුත් දිවියට මෙයින් විශාල ආශිර්වාදයක් ලැබෙන බවය. එය එසේම ය.

මෙහිලා මෙම කරුණද මතක් කරනු කැමැත්තෙමි. මංගල උත්සවයකදී ජයමංගල ගාථා කියවා ගැනීම ගෞරවයෙන් කිරීම මැනවි. ඉහල පෝරුවේ සිටින මනාල යුවලට පහල සිට මෙම ගාථා කීම නොමැනවි. පෝරුවට වඩා උස් වූ අසුනක් පනවා එහි සිට මෙම ගාථා කියවා ගැනීමෙන් ධර්ම ගෞරවයද සිදු කලා වන්නේය. වෙනත් සුභ කටයුතු වලදීද මේ අනුව සිතා කටයුතු කිරීම මැනවි.

මහා ජයමංගල ගාථා නම් වූ මෙම ග්‍රන්ථය සම්පාදනය කළ අති පූජනීය නිකපිටියේ ගුණරතන ස්වාමින් වහන්සේ උපසම්පදාවෙන් වස් විසි එකක් සසුන් ගුණ දියුණු කරමින් බුද්ධ පූජා බෝධි පූජා ධර්ම දේශනා ඉතා විසිතුරු ලෙස පවත්වමින්, වටිනා ග්‍රන්ථ සම්පාදනය කරමින් බුදු සසුනට බොහෝ පිහිට වන සේක.

පසුගිය වස් කාලය නේපාලයේ ගත කරන විට බංගලිදේශ දැරියක් ජයමංගල ගාථා කියනු අසා පැහැදී මෙම ගාථා විස්තර කොට පොතක් ලියන්නට තිබේ නම් හොඳයි යන සිතුවිල්ල අද පිටු 175 ක පමණ පොතක් ලෙස මල් පල ගැනෙන්නේ ගිහි පැවිදි බොහෝ දෙනෙකුට ධර්‍ම ලාභයද ලබා දෙමිනි.

පෙළ අටුවා ටීකා සංග්‍රහ පොත් ඇසුරු කරමින් පිරිසිදුව නිවැරදිව කරුණු විස්තර තිබෙන ආකාරය ප්‍රශංසනීයය. කාහටත් කියවා තේරුම් ගත හැකි සරල බස් වහරකින් ග්‍රන්ථය සම්පාදනය වීම බොහෝ දෙනෙකුට ධර්‍ම කරුණු වටහා ගැනීමට පහසුවකි. මෙම පොත අවසානය තෙක් වාර කිහිපයක් වත් කියවා කරුණු වටහාගෙන මෙම ගාථා භාවිතා කිරීමෙන් මහත් සෙතක් සැලසෙනු ඇත.

බුද්ධ ධර්‍ම සංඝ රත්නයේ ගුණ කියන ගුණ ලියන අපේ නිකපිටියේ ගුණරතන ස්වාමින් වහන්සේ තුනුරුවන් අතර දිදුලන තවත් ගුණ රත්නයක්ම වන සේක. තෙරුවන් සරණින් සසුනට පිහිට වෙමින්, සසුන් ගුණ දියුණු කරමින් කරන සියලු කුසල් බලයෙන් තව තවත් මෙවන් වටිනා ග්‍රන්ථ සම්පාදනය කරන්නට ශක්තිය ලැබේවා. නිදුක් නිරෝගී සුව දීර්‍ඝායුෂ වේවා. නිවනින් සැනසීමට මේ කුසලයද උපකාර ධර්‍මයක්ම වේවායි නමස්කාර පූර්‍වකව ප්‍රාර්‍ථනා කරමි.

මීට සසුන් දියුණුව කැමති

හීනටිගල පඤ්ඤාරාම හිමි
නා උයන ආරණ්‍ය,
පන්සියගම, මැල්සිරිපුර.

# පුණ්‍යානුමෝදනය

**"සබ්බදනං ධම්මදනං ජිනාති"**

සියලු දනයන් අතර ධර්‍ම දනය උතුම් වන්නේය. එසේ වූ උතුම් ධර්‍ම දනමය මහඟු පින්කමක් 2020-02-27 දිනට 57 වැනි ජන්ම දිනය යෙදෙන නා උයන ආරණ්‍යයෙහි කෘත්‍යාධිකාරී ප්‍රධාන කර්‍මස්ථානාචාර්‍ය්‍ය අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද මහා ස්වාමින් වහන්සේට චිරාත් කාලයක් නිදුක් නිරෝගී සුවයෙන් පාරමිතා ගුණ සපුරා ප්‍රාර්‍ථනීය බෝධියෙන් නිවන් සුව ලබන්නට හේතු වේවා.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවා වදාළ පූජනීය මහෝපාධ්‍යාය පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාම මහා ස්වාමින් වහන්සේට ද, පූජනීය මහෝපාධ්‍යාය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මහා ස්වාමින් වහන්සේට ද, නා උයන ආරණ්‍ය සේනාසනාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ අති පූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමින් වහන්සේට ද සුවසේම සමත්‍රිංශත් පාරමිතා සපුරා ලොව්තුරා බුදු බව ලැබීමට උපනිඃශ්‍රය වේවා.

අප සැමට මෙවැනි මහා පුණ්‍ය කර්‍මයක් කර ගැනීමට මාර්‍ගය පාද දුන් නිකපිටියේ ගුණරතන මහා ස්වාමින් වහන්සේට ද මෙම ධර්‍ම දනමය පුණ්‍යානුභාවයෙන් සහ රත්නත්‍රයානුභාව බලයෙන් ධර්‍ම ඥාන භාවනා ඥාන සිය දහස් ගුණයෙන් වැඩි දියුණුව විංශත් ශතවර්‍ෂාධික කාලයක් දීර්‍ඝායුෂ ලැබ සසුන් කෙත සරු කරමින් ශාන්ති ලක්‍ෂණ නිර්‍වාණ ධාතුව සුවසේම සාක්‍ෂාත් වේවා.

බෝධිසත්ව පාරමී ගුණ පුරන උතුමන් වහන්සේලාටත් ලෝකවාසී සියලුම ආර්‍ය්‍ය මහා සංඝරත්නයටත් සුවසේම පිළිවෙත් සපුරා නිවන් සුව ලබන්නට හේතු වේවා.

ග්‍රන්ථය සම්පාදනයට සහය වූ සැමටත් මුද්‍රණ බරපැන් දැරූ සැමටත් මුද්‍රණය කරවා දුන් සැමටත් නමින් මියගිය ඤාතීන්ටත්

සුජීවත්ව වෙසෙන ඥාති මිත්‍ර සැමටත්, සදේවක ලෝකවාසී සියලු සත්ව ප්‍රජාවටත් සුවසේම පිළිවෙත් සපුරා නිවන් සුව ලබන්නට හේතු වේවා.

අප සැමට මේ පුණ්‍ය බලයෙන් සතර අපායාදී අභව්‍ය ස්ථානයන්ට නොවැටී ත්‍රිවිධ සත්ව විනාශයන්ට හසු නොවී අෂ්ට දුෂ්ටක්ෂණයෙන් බේරී පඤ්ච විධ අන්තරාවෙන් වෙන් වී පාරමී ගුණ සපුරා ඉතා ඉක්මන් භවයකදීම සුව දයක ලෙස නිවන් මග පෑදේවා.

මෙයට සසුන් දියුණුව කැමති
ධර්ම දානය පිණිස දායක වූ සැම....

# පටුන

ජයමඞ්ගල ගාථා ....................11
1. මාර පරාජය ....................13
2. ආළවක යක්ෂ දමනය .................... 41
3. නාළාගිරි හස්තිරාජ දමනය .................... 73
4. අංගුලිමාල දමනය .................... 86
5. චිඤ්චිමානවිකාවගේ අපහාසය ජයගැනීම ....................105
6. සච්චක වාදිසිංහ දමනය ....................108
7. නන්දෝපනන්ද නාගරාජ දමනය .................... 154
8. බක බ්‍රහ්ම දමනය .................... 160

## ✠ ආශ්‍රිත ග්‍රන්ථ


| | | | |
|---|---|---|---|
| සූත්‍ර පිටකය | මජ්ඣිම නිකාය | - 2 | බු: ජ: මුද්‍රණය |
| ” | සංයුත්ත නිකාය | - | ” |
| ” | සුත්ත නිපාතය | | ” |
| ” | ජාතක පාළි -2 | | ” |
| ” | බුද්ධවංස පාළි | | ” |
| විනය පිටකය | චුල්ලවග්ග පාළි -2 | | ” |
| | මජ්ඣිමනිකායට්ඨකථා | - 1 | |
| | ” | - 2 | |
| | සංයුත්තනිකායට්ඨකථා | - 2 | |
| | ධම්මපදට්ඨකථා | | |
| | සුත්තනිපාතට්ඨකථා | | |
| | නෙත්තිප්පකරණට්ඨකථා | | |
| | ජාතකට්ඨකථා | - 1 | |
| | ” | - 3 | |
| | ” | - 4 | |
| | මජ්ඣිමනිකාය මූලපණ්ණාසක ටීකා | | |
| | සංයුත්තනිකාය සගාථකවග්ග ටීකා | | |
| | විශුද්ධි මාර්ගය | | |
| | පූජාවලිය | | |
| | අමාවතුර | | |
| | පාළි සිංහල ශබ්ද කෝෂය | | |
| | මහා සිංහල ශබ්ද කෝෂය | | |
| | සිංහල ගී සහිත පිරිත් දේශනා | | |

# ❄ ජයමඞ්ගල ගාථා

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

1. බාහුං සහස්ස මභිනිම්මිතසායුධං තං
ගිරිමෙඛලං උදිතඝොර සසෙන මාරං,
දානාදි ධම්ම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

2. මාරාතිරෙක මභියුජ්ඣිත සබ්බ රත්තිං
ඝොරම්පනාලවක මක්ඛ මථද්ධ යක්ඛං,
ඛන්තී සුදන්ත විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

3. නාලාගිරිං ගජවරං අතිමත්ත භූතං
දාවග්ගි චක්ක මසනීව සුදාරුණං තං,
මෙත්තම්බුසෙක විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

4. උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ සුදාරුණං තං
ධාවං තියොජන පථං ගුලිමාලවන්තං,
ඉද්ධීභිසඞ්ඛත මනෝ ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

5. කත්වාන කට්ඨ මුදරං ඉව ගබ්භිනීයා
චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣෙ,
සන්තෙන සොම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

6. සච්චං විහාය මතිසච්චක වාදකෙතුං
වාදාභිරොපිතමනං අති අන්ධභූතං,
පඤ්ඤාපදීප ජලිතො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

7. නන්‍දොපනන්‍ද භුජගං විබුධං මහිද්ධිං
පුත්තෙන ථෙර භුජගෙන දමාපයන්තො,
ඉද්ධූපදෙස විධිනා ජිතවා මුනින්‍දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

8. දුග්ගාහදිට්ඨි භුජගෙන සුදට්ඨ හත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි බකාභිධානං,
ඤාණාගදෙන විධිනා ජිතවා මුනින්‍දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

9. එතාපි බුද්ධ ජයමඞ්ගල අට්ඨ ගාථා
යො වාචකො දින දිනෙ සරතෙ මතන්‍දි,
හිත්වාන නෙක විවිධානි චුපද්දවානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො සපඤ්ඤො’ති.

# 1. මාර පරාජය

අප මහ බෝසතාණන් වහන්සේ දීපංකර සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ පටන් සූවිසි බුදුරජාණන් වහන්සේලා හමුවෙහි දී බුදු බවට නියතව විවරණ ලබාගනිමින් සමත්‍රිංශත් පාරමී ධර්‍ම පූර්‍ණය කොට වෙසතුරු ආත්ම භාවයෙහි දී **"අංග, නේත්‍ර, ධන, රාජ්‍ය, පුත්‍ර-දර"** යන පඤ්ච මහා පරිත්‍යාග කොට සියලු පාරමිතා සම්පූර්‍ණත්වයට පමුණුවා එයින් ච්‍යුතව තුසිත දෙව්ලොව ඉපිද අපමණ දෙව් සැප විඳිමින් සිටින අතර බුද්ධ කෝලාහලය ලොව ඇතිවිය.

ඒ අනුව දස දහසක් ලෝක ධාතූන්හි දෙව් බඹුන් එක්ව බුදු බව ලැබීමට සුදුසු මහා පුණ්‍යවන්තයා කවුද යැයි විමසා බලා මේ උතුම් මංගල සක්වළ තුසිත භවනයෙහි තේජාන්විත ව දෙව් සැප ශ්‍රී සම්පත් විඳිමින් සිටින මහ බෝසතාණන් වහන්සේ නියත වශයෙන් ම බුදු වන බව දැක, එක එක සක්වළට අයත් චාතුර්‍මහාරාජික, සක්ක, සුයාම, සන්තුෂිත, පරනිර්මිතවසවර්ති වැසි දෙවියෝ මහා බ්‍රහ්මයන් සමග එක්ව මේ මංගල සක්වළට පැමිණ මේ සක්වළ වැසි දෙව් බඹුන් සමග බෝසතාණන් වහන්සේ හමුවට ගොස් වැඳ මෙසේ ආරාධනා කරන සේක් :-

**"කාලො'යං තෙ මහාවීර - උප්පජ්ජ මාතු කුච්ඡියා,**
**සදෙවකං තාරයන්තො - බුජ්ඣන්තු අමතං පදං"**

නිඳුකාණෙනි, ඔබ වහන්සේ විසින් දස පෙරුම් දම් පුරන ලද්දේ ශක්‍ර සම්පත්, මාර සම්පත්, බ්‍රහ්ම සම්පත්, සක්විති සම්පත් ආදිය සඳහා නොවේ ය. හුදෙක් ලෝකයා සසරින් එතර කිරීම පිණිස බුද්ධත්වය පතමින් ම පුරන ලද්දේ ය. නිඳුකාණෙනි, දැන් ඔබට බුදු බව සඳහා කාලයය යැයි අයැද සිටියහ.

ඉක්බිති මහ බෝසතාණන් වහන්සේ දෙවියන්ට ප්‍රතිඥා නොදී **කාලය, දීපය, දේශය, කුලය,** මව යන පඤ්ච මහා විලෝකනය බැලූහ.

එහි දී පළමු කොට කාලය බැලූහ. මනුෂ්‍ය ආයුෂය අවුරුදු ලක්‍ෂයකට වැඩි කාලවල දී සත්වයන්ට ඉපදීම, මහලු වීම, මරණය පිළිබඳ නොපෙනෙති. බුදුරජාණන් වහන්සේලාගේ ධර්‍ම දේශනා අනිත්‍යාදී ත්‍රිලක්‍ෂණයෙන් නොමිඳුණේ වෙති. ඔවුහු ත්‍රිලක්‍ෂණය නොහඳුනති. එබැවින් තථාගත ධර්‍මය සැදැහැයෙන් ඇසිය යුතු දහමක් කොට නොසිතත්. එබැවින් එය අවබෝධය පිණිස නොපවතී. ප්‍රකට නොවන බැවින් ද අනිත්‍ය දුක්ඛ ලක්‍ෂණයන් අවබෝධ නොවෙති. එසේම අවුරුදු සියයට වඩා ආයුෂය අඩු වූ කල්හි ද සුදුසු කාලය නොවේ. එකල්හි මිනිසුන්ට කෙලෙස් උස්සන්නව පිහිටති. එලෙස කෙලෙස් උස්සන්න සත්වයන්ට දෙන අවවාද සුදුසු සේ නොපිහිටයි. දියෙහි ඇඳි ඉරක් මෙන් වහා මැකී යයි. එබැවින් මේ කාල දෙක හැර මනුෂ්‍ය ආයුෂය ලක්‍ෂයත් සියයත් අතර පවතින කාලයන්හි ම බුදුරජාණන් වහන්සේලා ලොව පහළ වෙති. අප මහ බෝසතාණන් වහන්සේ මෙලොව පහළ විය යුතු කාලය සියවස් ආයු කාලය බව දැන ගත්හ.

අනතුරුව දීපය බලන බෝසතාණන් වහන්සේ පිරිවර දිවයින් සහිත සතර මහද්වීපය බලා එයින් මහද්වීප තුනක බුදුරජාණන් වහන්සේලා නූපදිති යැයි දැන ජම්බුද්වීපයෙහි ම ඉපදිය යුතු යැයි දැනගත්තේ ය.

දඹදිව වනාහි යොදුන් දසදහසක වර්‍ග ප්‍රමාණයකින් යුක්ත වූ විශාල භූමි ප්‍රදේශයකි. කවර නම් ප්‍රදේශයක බුදුරජාණන් වහන්සේලා උපදිත් ද යැයි බලන සේක් දඹදිව මධ්‍ය ප්‍රදේශය දුටුවේ ය. එම ප්‍රදේශය දිගින් යොදුන් තුන්සියයකි. පළලින් යොදුන් දෙසිය පනසකි. වටින් යොදුන් නවසියයකි. මේ ප්‍රදේශයෙහි බුදු, පසේ බුදු, අග්‍ර ශ්‍රාවක, අසූ මහා ශ්‍රාවක මහා ශ්‍රාවකයන් වහන්සේලා හා සක්විති රජවරු ද අනෙකුත් මහේශාක්‍ය රජ, බමුණු ගෘහපති ආදී ප්‍රභූ ජනයෝ ද උපදිති. දැන් එහි කපිලවස්තු නම් පුරයක් ඇත. මා එහි ඉපදිය යුතුය යැයි බෝසතාණන් වහන්සේ තීරණය කළේය.

කුලය විමසන බෝසතාණන් වහන්සේ බුදුරජාණන් වහන්සේලා වෙළඳ හෝ ශුද්‍රාදී පහත් කුලයක නූපදිති. උසස් යැයි සම්මත රජ කුලයෙහි හෝ බමුණු කුලයෙහි උපදිති. මෙකල රජ කුලය

ලෝක සම්මතය. එම කුලයෙහි උපදිමි යැයි ද, පියා සුද්ධෝදන නම් රජ වන්නේ ය යැයි ද කුලය දුටුවේ ය.

අනතුරුව මව පිළිබඳ ව බලන්නේ බුද්ධ මාතාවෝ නම් සැපයෙහි හෝ සුරාවෙහි ලොල් නොවෙයි. කල්ප ලක්‍ෂයක් පිරූ පාරමී ඇති තැනැත්තියක් විය යුතු ය. උපතෙහි සිට නොකැඩුණු පන්සිල් ඇති තැනැත්තියකි. මේ මහා මායා දේවී තොමෝ ද එම අංග සපුරා සිටින්නී ය. එතුමිය මගේ මව වන්නී ය. ආයුෂය ද දස මස් සත් දිනක් යැයි ද දුටුවේ ය.

මෙසේ පඤ්ච මහා විලෝකනය කොට දෙවියන් අමතා "**නිදුකාණෙනි, මේ බුදු බවට කාලයය**" යැයි රැස්ව සිටි දෙවියන්ට සංග්‍රහ කෙරෙමින් ප්‍රතිඥා දී දෙවියන් පිටත් කර යවා තුසිත පුර දෙවියන් පිරිවරා නන්දන උයනට පිවිසියහ. එහි දී අන් දෙවියෝ බෝසතුන්ට මෙයින් චුතව සුගතියට යන්න යැයි පෙර කුසල විපාක සිහි කරවමින් හැසිරෙති. මේ අතර බෝසතාණන් වහන්සේ "**මෛත්‍රී පූර්වාංගම සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංකාරික**" සිතින් ඒ දෙව් ලොවින් චුතව මහා මායා දේවිය කුස උත්‍රසල් නැකතින් පිළිසිඳ ගත්තේ ය.

බෝසතාණන් වහන්සේ පිළිසිඳ ගත් කල්හි දස දහසක් ලෝක ධාතු කම්පා විය. දෙතිසක් පූර්ව නිමිති පහළ විය. දස දහසක් ලෝකයන්හි මහත් ආලෝකයක් පැතිරුණේ ය. මෙසේ පිළිසිඳ ගත් බෝසතාණන් වහන්සේට හා බෝසත් මවට උවදුරු වැළැක්වීම සඳහා කඩු ගත් අත් ඇතිව දිව්‍ය පුත්‍රයෝ සතර දෙනෙක් ආරක්‍ෂාවට සිටියහ.

බෝසතාණන් වහන්සේගේ පිළිසිඳ ගැනීමෙන් පසු බෝසත් මවට පුරුෂයන් පිළිබඳ රාග සිතකුදු නූපදී. ලාභයෙන් හා යසසින් අග තැන්පත් වන්නී ය. සැපවත්ව ගිලන් කමක් නැති සිරුරින් යුක්ත වන්නීය. කුස හොත් බෝසත් දරුවා මිණි රුවනක ඇමිණූ පඬුවන් නූලක් මෙන් දකින්නී ය. බෝසතාණන් වහන්සේ පිළිසිඳ ගත් මව් කුස සෑයක ඇතුල් ගැබ මෙන් පවිත්‍ර ය. ඉන් පසු වෙනත් කෙනෙකුට විසීමට හෝ පිළිසිඳ ගැනීමට නොහැකිය. එබැවින් බෝසතාණන් වහන්සේ ඉපදී සත් දිනකින් මව කළුරිය කොට තුසිත දෙව්ලොව ඉපදීම

වන්නේය. වෙනත් මව්වරු දස මසට නොපැමිණ ද, ඉක්මවා ද, ඉඳගෙන ද, නිදා සිටියදී ද දරුවන් වදත්. බෝසත් මව දස මසක් කුසෙහි දරා පෝෂණය කොට සිටගෙන සිටියදී ම බෝසත් දරුවා බිහි කරන්නීය. මේ බෝසත් මව පිළිබඳ ධර්මතාවයයි.

මහා මායා දේවිය පිරුණු තෙල් පාත්‍රයක් ගෙන යන්නියක මෙන් කුස හොත් බෝසතාණන් වහන්සේ පරිහරණය කොට දස මසක් ඇවෑමෙන් පිරිපුන් ගැබ ඇතිව ස්වකීය ඥාති කුලයට යනු කැමති ව කිඹුල්වත සිට දෙව්දහ නුවර දක්වා කෙසෙල් තොරණ, පුන්කලස් කොඩි ආදියෙන් විසිතුරු කරන ලද මාර්ගයෙන් රන් සිවිකාවක හිඳුවා ඇමතියන් දහසක් ලවා ඔසවා මහත් පිරිවරින් යන අතර එදා මල් ඵල ආදියෙන් අලංකාර ව පැවති ලුම්බිණි සාල වනෝද්‍යානය දැක එය සිරි විඳ ගැනීමට සිත් ඇති වූ බැවින් දේවිය එහි පැමිණවූවා ය. එහි මංගල සල් රුක මුලට ගොස් එම රුකෙහි අත්තක් අල්ලාගැනීමට කැමති වූවාය. එවිට සල් අත්ත වේබඩක් මෙන් නැවී දේවියගේ අතට පත් විය. එකෙනෙහි දේවියගේ විළි වාතය සෙලවින. පිරිවර ජනයා දේවිය තිරයකින් වට කර ඉවත් වූහ. ශුද්ධාවාස බ්‍රහ්මයෝ සතර දෙනෙක් රන් දැලකින් බෝසතාණන් වහන්සේ පිළිගෙන මව ඉදිරියෙහි තබා **"දේවියනි, සතුටු වන්න ඔබට මහා පිනැති පුතෙකු උපන්නේය"** යැයි කීහ. වෙනත් සත්වයෝ බිහි වන විට පිළිකුල් වූ අපවිත්‍ර දෙයින් තැවරී බිහි වෙති. බෝසතාණන් වහන්සේලා එසේ නොවෙති. බෝසතාණන් වහන්සේලා ධර්මාසනයකින් බසින ධර්ම කථිකයෙකු මෙන් ද, හිනි මගකින් බසින පුරුෂයෙකු මෙන් ද දෙ අත් දෙපා දිගු කොට නැඟී සිට මව් කුසට අයත් අපවිත්‍ර කිසිවක් නොතැවරී පිරිසිදුව පැහැපත් ව කසී වස්ත්‍රයක තබන ලද මැණිකක් මෙන් බබළමින් මව්කුසින් නික්මෙන්නාහ. එසේ වුව ද බෝසතාණන් වහන්සේට ද බෝසත් මවට ද උවටැන් පිණිස අවටින් දිය දහර දෙකක් නික්ම බෝසතාණන් වහන්සේගේ ද, බෝසත් මවගේ ද සිරුරෙහි සිසිල් බව ඇති කළේ ය.

ඉන් පසු රන් දැලින් පිළිගෙන සිටි බ්‍රහ්මයන්ගේ අතින් සතර වරම් දෙව් රජවරු මංගල සම්මත සුව පහස ඇති දෙතුන් පටකින් කළ අඳුන් දිවි සමින් පිළිගත්හ. ඔවුන්ගේ අතින් මිනිස්සු දුහුල් පිළි සුඹුලුවකින් පිළිගත්හ. මිනිසුන්ගේ අතින් මිදුණු මහ බෝසතාණන් වහන්සේ පොළොවෙහි සිට පෙර දිග බැලූ කල්හි දසදහස් ගණන්

සක්වළ එක මිදුලක් මෙන් විය. එහි සිටි දෙව් මිනිස්සු "**මහා පුරුෂෝත්තමයන් වහන්ස, මෙහි ඔබ හා සම කෙනෙකු නැත, ඔබට වඩා උසස් කෙනෙකු කෙසේ ලැබෙත් ද**" යැයි කීහ. අන් දිශා අනු දිසා උඩ යට යන දිශාවන් පිළිබඳව ද මෙසේම ය. මෙසේ මහ බෝසතාණන් වහන්සේ දස දිග් බලා උතුරු දෙසට සත් පියවරක් ගමන් කළේ ය. මහ බඹහු සේසත දරමින් ද, සුයාම දෙව් පුත් වල් විදුනාව දරමින් ද, අනෙකුත් දෙවියෝ උණ්හීසාදී රාජ කකුධ භාණ්ඩ දරමින් මහ බෝසතාණන් වහන්සේ සමග ගමන් කළහ. බෝසතාණන් වහන්සේ සත් වන පියවරෙහි සිට "**අග්ගො හමස්මි ලොකස්ස**" යනාදී සිංහ නාදය කළේ ය. උපන් මොහොතේ මෙන් දෙතිස් පූර්ව නිමිති හට ගැනීම ආදී සියල්ල සිදු විය.

මහ බෝසතාණන් වහන්සේ ඉපදී පස් වන දින නහවා නම් තැබීම සඳහා රජ මැදුර සිව් දෑ ගඳින්[1] පිරි බඩ කොට ලද පස් මල්[2] විසුරුවා දිය නුමුසු කිරිබත් පිසවා ත්‍රී වේද පරප්‍රාප්ත බ්‍රාහ්මණවරු අටෝරාශියක්[3] රජ මැදුරට කැඳවා ප්‍රණීත භෝජනයන් වළඳවා සම්මාන කොට කුමරුන්ට කුමක් සිදු වන්නේ ද යැයි ශරීරාංග ලක්ෂණ විමසූහ. ඔවුන් අතරින් "**රාම, ධජ, ලක්ෂණ, මන්ත්‍රී, කොණ්ඩඤ්ඤ, භෝජ, සුයාම, සුදත්ත**" යන බමුණන් අට දෙනා අංග ලක්ෂණ පරීක්ෂා කොට එයින් සත් දෙනෙක් ඇඟිලි දෙකක් ඔසවා මේ ශරීර ලක්ෂණවලින් යුත් තැනැත්තා ගිහිව සිටිය හෝත් සක්විති රජ වන්නේ ය. පැවිදි වුවහොත් බුදු වන්නේ ය යැයි දෙ විදියකින් කීහ. සැමට ම බාල කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයා ඉතා හොඳින් ශරීර ලක්ෂණ බලා දෙපතුල්හි පිහිටි චක්‍ර ලක්ෂණ දැක එක් ඇඟිල්ලක් ඔසවා මේ කුමරුවාට ගිහිව විසීමට හේතු නැත. වයස තිස් පහේ දී ඒකාන්තයෙන් ම ලොව්තුරා බුදු වන්නේ ය යැයි කීවේ ය. සුද්ධෝදන රජතුමා පුත් කුමරු කුමක් දැක බුදු වන්නේ ද යැයි අසා "**මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක්**" යන පෙර නිමිති සතර දැක පැවිදි වන්නේය යැයි අසා එනුවර එබඳු රූපයක් දැකීමට නොලැබෙන සේ දුරු කොට ගව්වක් පමණ තැන ආරක්ෂා

[1] සඳුන්-කපුරු-කොකුම් තුවරලා යන සතර, කොකුම්-තුවරලා-යොන්පුප්-තුරුක් තෙල් යන සතර, එනසහල්-කුරුඳු පොතු-කොල්ලන් කොළ-නා මල් රේණු යන සතර

[2] අබ, සුදු සහල්, සමන් කැකුළු, ඊ තණ, විලඳ

[3] එකසිය අටක්

සංවිධාන තර කළේ ය. තුන් සෘතුවට ගැළපෙන **"රම්‍ය, සුරම්‍ය, සුබ"** යන තුන් මාලිගාවන්හි සැප විඳිමින් බෝසතාණන් වහන්සේ වැඩී සොළොස් හැවිරිදි වියට පත් වූ විට රජතුමා යශෝධරා කුමරිය සරණ මගුල් කොට දී තවත් සොළොස් දහසක් පරිවාර ස්ත්‍රීන් ද පාවා දී කම් සැපයෙහි පිහිටුවී ය.

එක් දිනක් බෝසතාණන් වහන්සේ උයන් බිමට යනු කැමති ව රියදුරා අමතා රථය සරසන ලෙස කීවේ ය. රියදුරා ද කුමුදු පත්‍ර පැහැති සෛන්ධව අශ්වයන් සිව් දෙනෙකුන් යොදා ඒ බව දැනුම් දුන්නේ ය. එදා දෙවියෝ **"සිදුහත් මහ බෝසතාණන් වහන්සේට අභිංසා බෝධියට දූන් සුදුසු කාලයයි. පෙර නිමිති දක්වන්නෙමු"** යැයි සිතා එක් දිව්‍ය පුත්‍රයෙක් මහලු දිරාපත් වූ, දත් වැටුණු, කෙස් පැසී ගිය, ගොනැස්සක් මෙන් වක් වූ, කඳ කටිය දණ යන තැන්වලින් නැමුණු, සැරයටියක් අතින් ගෙන වෙවුලමින් සිටින මහල්ලෙකු මෙන් පෙනී සිටියේ ය. එම රූපය බොසතාණන් වහන්සේ සහ රියදුරා පමණක් දකී. බෝසතාණන් වහන්සේ රියදුරා අමතා **"යහළුව, මේ පුරුෂයා කවරෙක් ද"** යැයි ඇසුවේ ය. එවිට රියදුරා දේවයන් වහන්ස, **"මොහුට බොහෝ කල් ජීවත් විය නොහැක්කේ ය. මෙසේ වූ තැනැත්තා ජීර්ණ නම් වෙයි"** යැයි කීවේ ය. එවිට බෝසතාණන් වහන්සේ **"කිම යහළු රියදුර, මමත් දිරන සුළු වෙම් ද, දිරන ස්වභාවය නොයික්මවූවෙම් ද?"** යැයි ඇසීය. **"දේවයන් වහන්ස, අපි සියල්ලෝ ම දිරන ස්වභාවයට පත් වන්නේ ය. දිරීම නොයික්මවන ලද්දේ ය"** යැයි කීය. එවිට බෝසතාණන් වහන්සේ **"මෙලොව ඉපදීමට නින්ද වේවා උපන්නා හට මහලු බව පෙනෙන්යන්නේ ය"** යැයි කියා යහළුව, එසේ වී නම් අද උයන් ක්‍රීඩාවෙන් ප්‍රයෝජන නැත. මෙතැනින් ම ආපසු අන්තඃපුරයට යමු යැයි කියා නැවත රජ මාලිගාවට ම ගියේ ය. සුද්ධෝදන රජතුමා මගේ පුතු වහාම ආපසු පැමිණියේ මන්ද යැයි විචාරා මහලු රුවක් දැක යැයි අසා මහල්ලෙක් දැක පැවිදි වන්නේ ය යැයි කී පූර්වයෙහි බමුණන් කී වදනම සිහි කළේ ය. එසේම මා නොනැසුව මැනව යැයි නාට්‍ය සංගීතාදිය පිළියෙල කරවී. සැප සම්පත් විඳින විට පැවිද්ද අමතක වී යන්නේය යැයි ආරක්ෂා කර අඩ යොදුනක් තැන රැකවරණ යෙදවිය.

නැවත ද එක් දිනක් බෝසතාණන් වහන්සේ පෙර සේම උයනට යන්නේ දෙවියන් විසින් මවන ලද රෝගී පුද්ගලයෙකු දැක පෙර

සේම විචාරා කලකිරීමට පත්ව ආපසු රජ මාලිගාවට ම පැමිණියේ ය. එය අසා මහ රජතුමා එවර ගව් තුනක් ආරක්ෂා සංවිධාන තර කළේ ය.

නැවත ද දිනක් උයනට යන බෝසතාණන් වහන්සේ දෙවියන් විසින් මැවූ මෘත ශරීරයක් දක පෙර සේම විචාරා සංවේගයට පැමිණ ආපසු රජ මාලිගාවට ම පැමිණියේ ය. එවර රජතුමා යොදුනක් ප්‍රමාණයේ ආරක්ෂා සංවිධාන තර කළේ ය.

තවත් දිනක බෝසතාණන් වහන්සේ උයනට යන අතර දෙවියන් විසින් මවන ලද මනාව හැඳ පෙරවූ පැවිදි රුවක් දක මේ කවරෙක් ද යැයි රියදුරාගෙන් විචාළේ ය. බුදු සසුනක් නොපවතින කාලයක් බැවින් පැවිද්දෙකු හෝ පැවිදි ගුණයක් ද නොදන්නා වූ රියදුරා දෙවියන්ගේ ආනුභාවෙන් දේවයන් වහන්ස, මේ පැවිද්දෙකි යැයි හඳුන්වා දී පැවිදි ගුණ ද වර්ණනා කළේ ය. බෝසතාණන් වහන්සේ පැවිද්දට සිත නැමී එදවස උයනට ගොස් මඟුල් පොකුණෙන් නා ඉර බැස යන සන්ධ්‍යාවෙහි මඟුල් ගල් පුවරුවෙහි සිට සැරසෙනු කැමති විය. එය දත් සක් දෙවිඳු විශ්ව කර්‍ම දෙව් පුත් කැඳවා දරුව, අද මධ්‍යම රාත්‍රියෙහි දී සිදුහත් කුමරු මහාභිනිෂ්ක්‍රමණය කරන්නේ ය. ඔහු අද සැරසෙනු කැමැත්තේ ය. මේ එතුමාගේ අවසන් සැරසීමයි. එබැවින් ඔබ ගොස් බෝසතාණන් වහන්සේ සරසා එන්න යැයි අන කළේ ය. විශ්කම් දෙව් පුත් බෝසතාණන් වහන්සේගේ මඟුල් කපු වේශයෙන් පැමිණ දිව්‍යමය ඇඳුම් ආභරණ ආදියෙන් දෙව් කුමරෙකු සේ බෝසතාණන් වහන්සේ සරසා දෙව්ලොව ගියේ ය. මෙසේ සියලු ආභරණයන්ගෙන් සැරසුණා වූ මහ බෝසතාණන් වහන්සේ වාදනයෙහි දක්ෂ වූවන් තම වාදන කුසලතා දක්වද්දී, බමුණන් ජය වේවා සතුටු වේවා යන වචන කියද්දී, වන්දි භට්ටයෝ[1] නන් අයුරින් සුබ වචන කියද්දී, සතුන් නාදයෙන් බුහුමන් දක්වද්දී සර්වාලංකාරයෙන් සරසන ලද රථයට නැංගේ ය.

එදවස ම යශෝධරාව පුතෙකු වැදුවා ය. සුද්ධෝදන මහ රජතුමා තම පුතුට සතුට දනවනු පිණිස එය කියා හසුනක් යැවුවේ ය. බෝසතාණන් වහන්සේ එය අසා **"රාහුලො ජාතො බන්ධනං ජාතං"**

[1] ස්තුති ගීතිකා ගායනා කරන්නෝ

යනුවෙන් **"රාහුලයෙක් උපන්නේ ය. එයින් බන්ධනයක් විය"** යැයි කීවේ ය. සුද්ධෝදන රජතුමා සිදුහත් කුමරුගේ ඒ වචනය අසා මෙතැන් පටන් මාගේ මුනුබුරාට **"රාහුල"** යන නාමයම වේවා යැයි කීවේ ය.

බෝසතාණන් වහන්සේ රථයට නැග මහත් යසසින් හා සිත් කළු රූප සම්පත්තියෙන් නුවරට පිවිසියේ ය. මේ අවස්ථාවෙහි කිසා ගෝතමිය නම් රාජ කුමරිය උඩු මහලෙහි සිටින්නී නුවර පැදකුණු කරන බෝසතාණන් වහන්සේගේ රූප සම්පත්තිය දැක පිනා ගිය සිත් ඇතිව :-

**"නිබ්බුතා නූන සා මාතා - නිබ්බුතො නූන සො පිතා,**
**නිබ්බුතා නූන සා නාරී - යස්සායං ඊදිසො'පති"**

මෙබඳු කුමරෙකුට යම් කතක් මව වූවා ද, ඕ තොමෝ නිවුණා යැයි හඟිමි. යම් පුරුෂයෙක් පිය වූයේ ද, හේද නිවුණේ යැයි හඟිමි. යම් ස්ත්‍රියකට මෙවැනි ස්වාමියෙකු සිටී ද, එම බිරිඳ ද නිවුණා යැයි හඟිමි යන මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළා ය.

බෝසතාණන් වහන්සේ මේ උදන වාක්‍යය අසා මෙසේ සිතුවේය. **"මෙවැනි රූප සම්පත්තියක් ඇති ආත්මභාවයක් දකින මවකගේ හදවත නිවෙයි. පියෙකුගේ හදවත ද නිවෙයි. බිරියගේ හදවතද නිවෙයි. එහෙත් කුමක් නිවුණු කල්හි හදවත නිවීමක් වේ ද? රාග ගින්න නිවුණු කල්හි හදවත නිවුණේ වෙයි. මාන දිට්ඨි ආදී කෙලෙස් ගිනි ද නිවුණු කල්හි නියත වශයෙන් ම නිවුණේ වෙයි. එබැවින් ඇය මාහැඟි දහමකින් මා අස්වසන ලද්දේ ය. මම ද නිවීම හෙවත් නිර්වාණය සොයමින් සිටිමි. අද ම මම ගිහිගෙය අතහැර නික්ම පැවිදි ව නිර්වාණය සොයන්නට වටී ය"** යැයි සිතා මෙය ඇයට පඬුරු වේවා යැයි ලක්‍ෂයක් වටිනා ගෙල බැඳි මුතුහර මුදා ඇය වෙත යැවුවේය. එය ලැබූ කිසා ගෝතමිය සිදුහත් කුමරු මෙය තමා වෙත අනුරාගී හැඟීමෙන් එවන ලද්දේ ය යැයි සතුටු වූවා ය.

බෝසතාණන් වහන්සේ මහත් ප්‍රීතියෙන් තම ප්‍රාසාදයට නැඟ තම සිරි යහනෙහි සැතපුණේ ය. එකෙනෙහිම සියලු අලංකාරයෙන්

සැරසුණු වනිතාවන් පැමිණ නොයෙක් තූර්‍යය නාද පවත්වමින් නැටුම් ගැයුම් පැවැත්වීම් ආදියෙන් බෝසතාණන් වහන්සේ සතුටු කිරීමට පටන් ගත්හ. බෝසතාණන් වහන්සේ ක්ලේශයන්ගේ නො ඇලුණු සිත් ඇති බැවින් නැටුම් ගැයුම් ආදියෙහි නො ඇලී මඳ වේලාවකින් නින්දට බැස ගත්තේ ය. ඒ ස්ත්‍රීහු ද අපි කාට නැටුම් ගැයුම් පවත්වම් ද යැයි ඒ ඒ තැන්වල ම වැටී නිද ගත්හ. සුවඳ තෙල් පහනක් පමණක් දැල්වෙමින් පැවතිණ.

බෝසතාණන් වහන්සේ රෑ මැදියම පිබිදී සිය යහනෙහි ම පලක් බැඳ හුන් විට ඒ ස්ත්‍රීන් විප්‍රකාරව නිදනු දිටී ය. ඇතමෙක් කුණුකෙළ වගුරුවමින් සිටිති. ඇතමෙක් තතනති. ඇතමෙක් නන් දෙඩවති. ඇතමෙක් අයාගත් මුඛ ඇත්තෝ ව හොවිති. බෝසතාණන් වහන්සේට ඔවුන්ගේ විප්‍රකාර දැකීමෙන් වඩාත් කාමයන්ගේ ආදීනව දැක නො ඇලුණු සිත් ඇතිව සර්‍වාලංකාරයෙන් පිළියෙල වූ ශක්‍ර භවන හා සමාන වූ මාහැඟි පහය තැන දමන ලද මළකුණු ඇති අමු සොහොනක් මෙන් වැටහී කාම රූප අරූප  භවත්‍රය ම ගිනි ගත් ගෙවල් මෙන් දැනී ගියේ ය. පින්වත්නි! මේ ලෝකය උපද්‍රවයන්ගෙන් පිරී ඇත. මේ ලෝකය පීඩාවලින් පිරී ඇත යැයි හැඟීම් බර වචන මුවෙන් පිටවිය. වඩාත් පැවිද්දට සිත නැමුණේ ය. අද ම මා මහාභිනිෂ්ක්‍රමණය කළ යුතුය යැයි සිතුවේ ය. බෝසතාණන් වහන්සේ සයනයෙන් නැගිට දොර ලඟට ගොස් මෙහි නිදන්නේ කවුද යැයි විමසීය. එහි එළි පත හිස තබා නිදන ඡන්න ඇමති තමන් බව හැඟවිය. බෝසතාණන් වහන්සේ අද තමන් මහාභිනිෂ්ක්‍රමණය කරන බව කියා ඒ සඳහා සුදුසු අශ්වයෙකු සූදනම් කරන ලෙස අණ කළේ ය. එය සතුටින් පිළිගත් ඡන්න ඇමති අශ්වයා සූදනම් කිරීමට අවශ්‍ය උපකරණ ගෙන අස්හලට ගොස් සුවඳ පහන් දැල්වෙද්දී සමන් මල් විසිරුණු වියන යට සිත්කලු බිම සිටි කන්ථක අශ්ව රාජයා දැක අද මොහු ම සැකසිය යුතු ය යැයි සිතා කන්ථක අශ්වයා සැකසුවේ ය. එලෙස සැකසෙන අයුරින් ම කන්ථක අශ්වයාට කාරණය දැණිින. අද සැකසීම ඉතා දැඩි ය. අන් දිනවල උයන් කෙළි ආදිය සඳහා යන ගමනට සැකසීම මෙන් නොවේ. මාගේ ආර්‍යය පුත්‍රයා අද මහාභිනිෂ්ක්‍රමණය කරනු කැමැත්තේ විය යුතු ය යැයි සිතූ අශ්ව රාජයා සතුටු සිතින් මහ සිනාවක් පහළ කළේ ය. ඒ සිනා හඬ මුළු නුවර ම පැතිර ගියේ ය. එහෙත් දෙවියෝ එම ශබ්දය වළකා කිසිවකුට අසන්නට ඉඩ නොදුන්හ.

බෝසතාණන් වහන්සේ ඡන්න ඇමති අසු සැකසීමට යවා පළමු වරට තම පුතු දකිම් යැයි සිතා යශෝධරා දේවිය වෙසෙන ශ්‍රී යහන් ගැබ වෙත ගොස් දෙර විවර කළේ ය. එවේලෙහි ගැබ තුළ සුවඳ තෙල් පහනක් දැල්වෙමින් පැවතුණි. රහල් මව ද දෑ සමන් සීනිද්ද ආදී මල් අමුණක් පමණ අතුරන ලද සැරසූ යහනෙහි පුතු මත අත තබා නිදන්නී ය. බෝසතාණන් වහන්සේ පුතු අතට ගැනීමට ගියේ නම් දේවිය පිබිදෙන්නී ය. එසේ වුවහොත් අභිනිෂ්ක්‍රමණයට බාධා වන්නේය යැයි සිතා එළි පතෙහි සිට ම පුතු බලා අභිසම්බෝධියට පැමිණ ඇවිත් පුතු දකින්නෙමි යැයි පහයෙන් බැස අශ්වයා ළඟට ගොස් **"කන්ථකය, ඔබ මා මේ රැයෙන් ම එතර කරව. ඔබ නිසා මම බුදු වී දෙවියන් සහිත ලෝක සත්වයා එතර කරවන්නෙමි"** යැයි මෙසේ කියා උඩ පැන අසු පිටට නැංගේ ය. ඒ කන්ථක අශ්ව රාජයා වනාහි දිගින් බෙල්ලෙහි පටන් අටලොස් රියනකි. ඊට අනුරූප ව උසින් ද යුක්ත ය. ශක්තියෙන් හා ජවයෙන් යුක්ත ය. ඔප කළ සකක් සමාන මුළු සිරුරම සුදු වන් ය. ඔහුගේ හේෂාරාවය හා පිය ගැටෙන ශබ්දය මුළු නුවර ම පැතිරෙන්නේ ය. එබැවින් දෙවියෝ එම ශබ්ද තමන්ගේ ආනුභාවෙන් කිසිවකුට නො ඇසෙන සේ වළකා අසු තබන තබන පියවරෙහි අත්තල පිරිනැමූහ. බෝසතාණන් වහන්සේ අසු පිට සිටිය දී ඡන්න ඇමති අසුගේ වලිගය අල්ලා ගෙන මැදියම් රැයෙහි නගර දෙරටුව වෙතට පැමිණියහ. පිය මහ රජු සිදුහත් කුමරුට යම්කිසි වේලාවක නගර දෙර ඉක්ම යාමට නොහැකිවීම පිණිස දහසක් පුරුෂයන් විසින් ඇරිය හැකි ලෙස දෙර පියන් දෙකක් තනවා සවි කර වසා තැබී ය. මහ බෝසතාණන් වහන්සේ ඇතුන් කෝටි දහසක ගේ බල ඇත්තේ ය. එය මනුෂ්‍ය ප්‍රමාණයෙන් කෝටි දසදහසක ගේ බලයකි. බෝසතාණන් වහන්සේ දෙරටුව අසලට පැමිණ **"ඉදින් දෙර නො ඇරුණේ නම් තමා අසු පිට සිටියදී ම ඡන්න අසුගේ වලිගය ගෙන සිටියදී ම අසුගේ දෙකලවයෙන් තද කොට ගෙන අටලොස් රියන් උස පවුර උඩින් පැන යන්නෙමි"** යැයි මෙසේ සිතුවේ ය. ඡන්න ඇමති ද **"දෙර නො ඇරුණේ නම් බෝසතාණන් වහන්සේ උරහිසෙහි තබාගෙන කන්ථක අසුගේ කුස දකුණතින් පෙළා කිසිලි අතරෙහි තබාගෙන පවුර පැන යන්නෙමි"** යැයි සිතුවේ ය. අශ්වයා ද **"දෙර නො ඇරුණේ නම් තම ස්වාමියා පිට උඩ සිටියදී ම වලිගය ගෙන සිටින ඡන්න ඇමතිත් සමග උඩට පැන පවුර පැන යන්නෙමි"** යැයි මෙසේ සිතුවේ ය. දෙර නො ඇරුණේ නම් මේ තිදෙනාගෙන් එක්

අයෙකු සිතූ පරිදි සිදු වන්නේ ය. දොරටුවෙහි අධිගෘහිත දෙවියා දොර විවර කර දුන්නේ ය. එවේලෙහි වසවත් මාර දෙව් පුත් බෝසතාණන් වහන්සේගේ ගමන වළක්වමි යැයි සිතා අහසෙහි සිට **"මාරිස, මා නික්ඛම, ඉතො තෙ සත්තමෙ දිවසෙ චක්කරතනං පාතුභවිස්සති, ද්වීසහස්සපරිත්තදීපපරිවාරානං චතුන්නං මහාදීපානං රජ්ජං කාරෙස්සසි, නිවත්ත මාරිස"** යනුවෙන් **"නිදුකාණෙනි, නොයනු මැනවි. මෙයින් සත් වන දින ඔබට සක්විති රාජ්‍යය පහළ වන්නේ ය. දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතර මහද්වීපයට රජ වන්නේ ය. නවතිනු මැනවි"** යැයි මෙසේ කීවේ ය.

බෝසතාණන් වහන්සේ ඔබ කවරෙක් ද යැයි ඇසුවේ ය. මම වසවත් මාරයා වෙමි යැයි හෙතෙමේ කීයේ ය. එවිට බෝසතාණන් වහන්සේ **"මාර, ජානාමහං මය්හං චක්කරතනස්ස පාතුභාවං, අනත්ථිකොහං රජ්ජෙන, දසසහස්සිලොකධාතුං උන්නාදෙත්වා බුද්ධො භවිස්සාමී"** යනුවෙන් **"මාරය, සක්විති රාජ්‍යය ලැබෙන බව මම දනිමි. මට රාජ්‍යයෙන් වැඩක් නැත. දසදහසක් සක්වළ ඒක නාද කොට බුදු වන්නෙමි"** යැයි කීවේ ය. එවිට මාරයා **"හිංසා සහගත සිතුවිල්ලක් සිතුවේ නම් කල යුතු දේ දනිමි"** යැයි බෝසතාණන් වහන්සේගේ අඩුවක් සොයමින් සෙවණැල්ලක් මෙන් ඉවත් නොවී බෝසතාණන් වහන්සේ පසුපස ලුහුබැන්දේ ය.

මෙසේ බෝසතාණන් වහන්සේ අතට පත් සක්විති රාජ්‍යය කෙළ පිඩක් මෙන් ඉවත දමා උතුරුසැළ නැකතින් නගරයෙන් නික්ම තම නුවර ආපසු හැරී බලනු කැමති විය. මේ සිතුවිල්ල උපන් කෙණෙහිම **"මහා පුරුෂය, ඔබ පෙරුම් දම් පිරුවේ නැවත ආපසු හැරී බැලීම සඳහා නොවේය"** යැයි කියන්නාක් මෙන් මහ පොළොව කුඹල් සකක් මෙන් කැරකී බෝසතාණන් වහන්සේ නගරයට මුහුණ ලා සිටින සේ තැබීය. බෝසතාණන් වහන්සේ නුවර බලා එම ප්‍රදේශය කන්ථක අශ්වයා නැවතුණු සෑය වශයෙන් දක්වා නැවත අසු ගමන් මගට අභිමුඛ කොට මහත් සිරි සෝභාවෙන් නික්මුණේ ය. එදින දෙවියෝ මහ බෝසතාණන් වහන්සේට පෙරටුව ද, දකුණුපස ද, වම් පස ද, පසුපස ද ආලෝක වැටි සැට දහසක් බැගින් දැරූහ. ඇතැම් දෙවිවරු සක්වළ මුව විට සිට අපමණ ආලෝක වැටි දැරූහ. අනෙක් දෙවිවරු ද, ගුරුළෝ ද, නාගයෝ ද දිව්‍යමය මල් සුවඳ සුනු ආදියෙන් පිදූහ. ඝන වලාවකින්

වැගිරෙන වැසි ධාරා මෙන් පරසතු මදරා ආදී මල්වලින් අහස වැසිණ. දිව්‍යමය සංගීත හඬ පැතිරිණ. හාත්පස අටවග, සැටවග ආදී බෙර අටසැට දහසක් වාදනය වූහ. මෙසේ මහ බෝසතාණන් වහන්සේ එක් රැයකින් ම රාජ්‍ය තුනක් ඉක්මවා තිස් යොදුන් මගක් ගමන් කොට අනෝමා ගං තෙරට පැමිණියේ ය.

කිම කන්ථක අශ්ව රාජයාට මීට වඩා දුරක් යා නොහැක්කේ ද? නොහැක්කේ නොවෙයි. ඔහු වනාහි එක චක්‍රාවාටයක් මැද අක්ෂයෙහි තබන ලද රිය සකක නිම් වළල්ල වටා යන්නාක් මෙන් කෙළවරට ම ගොස් තමා වෙනුවෙන් සැපයූ භෝජනය බුදීමට සමත්ය. එදවස වනාහි දිව්‍ය, නාග, ගුරුළු ආදීන් විසින් අහසෙහි සිට විසුරුවන ලද සුවඳ මල් ආදියෙහි කළවා පෙදෙස දක්වා ගිලුණු සිරුර ඔසවා මල් ගැට ආදිය ඉවත් කිරීමට ඉතා ප්‍රමාද විය. එම නිසා එක රැයට තිස් යොදුනක් ම ගමන් කළ හැකි විය.

මෙලෙස අනෝමා ගං තෙරට පැමිණි මහ බෝසතාණන් වහන්සේ ඡන්න ඇමතිගෙන් මේ නදිය කුමක් දැයි ඇසුවේ ය. දේවයිනි, අනෝමා නම් වේ යැයි කීවේ ය. එසේ නම් **"අපගේ පැවිද්ද ද අනෝම වේ, ලාමක නොවේ"** යැයි පවසා විලුඹින් අසුට සන් කළේ ය. අශ්වයා ද උඩට නැඟ අට ඉස්බක්[1] පළල් වූ ගඟෙහි පරතෙර පිහිටියේ ය. බෝසතාණන් වහන්සේ අසු පිටින් බැස රිදී පටක් සමාන වැලි තලාවෙහි සිට ඡන්න ඇමති අමතා ඔබ මගේ ආභරණ ද අසු ද රැගෙන යන්න මම පැවිදි වන්නෙමි යැයි කීවේ ය. එවිට ඡන්න ඇමති ද දේවයිනි මම ද පැවිදි වෙමි යැයි කීවේ ය. මෙසේ තෙවරක් ම කියා ආභරණ ද අසු ද ඡන්න ඇමතිට බාර දී ආපසු යන ලෙස අණ කොට යවා නැවත සිතන්නේ මේ කෙස් කළඹ පැවිද්දට සරුප් නොවේ, කෙස් කැපීමට ද කෙනෙකු නැති බැවින් තමා ම දකුණතින් කඩුව ගෙන වම් අතින් සිළුමිණ සහිත කෙස් වැටිය ගෙන කපා ඉදින් මම බුදු වන්නේ නම් මේ කෙස් වැටිය අහසෙහි සිටීවා, නො එසේ නම් බිම වැටේවා යැයි අහසට විසි කළේ ය. බෝසතාණන් වහන්සේ එලෙස කෙස් කළඹ කැපූ පසු හිස මත දැඟුලක් පමණ ව ඉතිරි වූ කෙස් දකුණට කරකැවී උඩු අක් බලා හිස සමග ඇලී පිහිටියේ ය. පෙර දින මඟුල් උයනෙහි

---

[1] මීටර් 712 පමණ

දී කපන ලද රැවුල එපමණ ම විය. බුදුරජාණන් වහන්සේගේ ජීවිත කාලය තුළ කෙස් රැවුල් බෑමේ කෘත්‍යයක් නොවී ය. එම කෙස් කළඹ යොදුනක් පමණ අහසට ගොස් නැවතිණි. සක් දෙවිඳු එය දැක පැමිණ යොදුනක් පමණ රුවන් කරඬුවකින් ගෙන ගොස් තව්තිසා දෙව්ලොව සිළුමිණි සෑය පිහිටුවී ය.

ඉන් පසු බෝසතාණන් වහන්සේ තම වස්ත්‍රාභරණ ගැන සලකා මේ කිසිවක් ශ්‍රමණයන්ට සුදුසු නොවේ යැයි සිතුවේ ය. ඒ ක්ෂණයෙහිම කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි මිත්‍ර වූ ඝටීකාර මහා බ්‍රහ්මයා බුද්ධාන්තරයක් ගෙවුන නමුත් දැඩි මිත්‍ර භාවය නිසා මගේ යහළු මහ බෝසතාණන් වහන්සේ අද මහාභිනිෂ්ක්‍රමණය කළේ ය. එතුමන්ට ශ්‍රමණයන්ට සුදුසු අෂ්ට පරිෂ්කාර ගෙන යමි යැයි සිතා

**"තිචීවරඤ්ච පත්තො ච - වාසී සූචි ච බන්ධනං,**
**පරිස්සාවනෙන අට්ඨෙතෙ - යුත්තයොගස්ස භික්ඛුනො"**

තුන් සිවුර ද, පාත්‍රය ද, කර කැත්ත ද, හිදිකටුව ද, ඉන පටිය ද, පෙරහන ද යන අට පිරිකර පැවිදි භික්ෂුවට සුදුසු වේ.

මෙකී අට පිරිකර බෝසතාණන් වහන්සේට පිළිගැන්වී ය. රහතුන්ගේ ධ්වජය වූ තුන් සිවුර හැඳ පෙරව පැවිදි වෙස් ගත් මහ බෝසතාණන් වහන්සේ තමන් සුවෙන් සිටින බව මව්පියන්ට කියව යැයි කියා ඡන්න ඇමති පිටත් කරවී ය. ඡන්න ඇමති බෝසතාණන් වහන්සේ වැඳ කන්ථක අසු සමග පිටත් විය. ඒ කන්ථක අශ්වයා බෝසතාණන් වහන්සේ ඡන්න ඇමති සමග කළ කථාව අසා **"මින් පසු මගේ හිමියාගේ දැකීමක් මට නැත"** යැයි මහ බෝසතාණන් වහන්සේගේ දර්ශනයෙන් ඉවත් වෙත් ම හට ගත් ශෝකය ඉවසා ගත නොහැකි ව ලය පැළී කළුරිය කොට තව්තිසා දෙව්ලොව කන්ථක නමින් ම දිව්‍ය පුත්‍රයෙකු ව උපන්නේ ය. ඡන්න ඇමතිට පළමු ව පැවතියේ බෝසතාණන් වහන්සේගෙන් වෙන් වීමේ දුක පමණකි. අසුගේ මරණයෙන් දෙවන දුක ද හට ගත්තේ ය. ඔහු හඬමින් වැලපෙමින් කිඹුල්වත් පුර ගියේ ය.

මහ බෝසතාණන් වහන්සේ පැවිදි ව අනෝමා ගංතෙර අවටම සත් දිනක් පැවිදි සුවයෙන් කල් ගෙවා එක් දවසින් ම තිස් යොදුන් මගක් ගෙවා ගෙන රජගහ නුවරට පිවිස ගෙපිළිවෙලින් පිඬු සිඟා වැඩි සේක. ඒ රූප සෝභාව දුටු මුළු නුවර වාසීන් ම ධනපාල හස්තියා පිවිසි රජගහ නුවර මෙන් ද, අසුරේන්ද්‍රයා පිවිසි දෙව් නුවර මෙන් ද කැලඹීමට පත් විය. රාජ පුරුෂයෝ රජු වෙත ගොස් දේවයන් වහන්ස, මෙබඳු පුරුෂයෙක් නුවර පිඬු පිණිස හැසිරෙයි, ඔහු දෙවියෙක් ද, මිනිසෙක් ද, නාගයෙක් ද, ගුරුළෙක් ද හෙතෙම කවරෙක් ද යැයි නොදනිමු යැයි සැල කළේ ය. රජතුමා ප්‍රසාදයෙහි සිට ම මහා පුරුෂයන් වහන්සේ දැක පුදුමයට පත්ව රාජ පුරුෂයන් අමතා **"සගයෙනි, යව්, විමසව්, ඉදින් අමනුෂ්‍යයෙක් නම් නුවරින් නික්ම අතුරුදහන් වන්නේ ය. දෙවියෙක් වේ නම් අහසට නැගී යන්නේ ය. නාගයෙක් වන්නේ නම් පොළොව කිමිද යන්නේ ය. මනුෂ්‍යයෙක් වන්නේ නම් ලැබුණු ආහාර අනුභව කරන්නේ ය"** යැයි සෙවීමට අණ කළේ ය. මහ බෝසතාණන් වහන්සේ ද ගෙපිළිවෙලින් ලැබුණු ආහාර ප්‍රමාණය දැන නුවරට පිවිසි දොරටුවෙන් ම පිට වී ගොස් පාණ්ඩව පර්වත සෙවනෙහි පෙර දිග බලා වැඩ හිඳ ආහාර වැළඳීමට පටන් ගත්තේ ය. එවිට උන් වහන්සේගේ අතුණුබහන් පෙරළී මුවෙන් නික්මෙන්නාක් මෙන් විය. එතෙක් කලක් එවැනි ආහාරයක් ඒ ආත්මභාවය තුළ නුදුටු හෙයිනි. ආහාර පිළිකුල් වුව ද තමාට ම අවවාද කර ගන්නේ **"සිද්ධාර්ථ තවුසාණෙනි, ඔබ තුන් මසකින් පැසෙන සුවඳ හැල් සහල් බත නොයෙක් රස මසවුළෙන් යුක්ත ව අනුභව කරන සුලබ ආහාර ඇති කුලයක උපත ලබා වැරහිළි සිවුර පොරවාගත් පැවිදි කෙනෙක් දැක මම ද මෙබඳු කෙනෙක් වී පිඬු පිණිස හැසිර ආහාර වළඳමි යැයි සිතා රාජ්‍යය අතහැර පැමිණියෙමි. දැන් ඒ ආහාර පිළිකුල් කිරීම සුදුසු ද?"** යැයි අවවාද කොට ගෙන වෙනසක් නැතිව එම ආහාරය වැළඳූ සේක.

රාජ පුරුෂයෝ බෝසතාණන් වහන්සේගේ මේ පිළිවෙත දැක රජතුමාට දැන්වූහ. රජතුමා නුවරින් නික්ම බෝසතාණන් වහන්සේ වෙත ගොස් ඉරියව්වෙහි පැහැදී බෝසතාණන් වහන්සේට තම රාජ්‍ය පැවරීය. එවිට බෝසතාණන් වහන්සේ **"මහ රජ, මට වස්තු කාම සම්පත්තියෙන් හෝ ක්ලේශ කාම වින්දනයෙන් වැඩක් නැත. මම සම්බෝධිය ලබනු පිණිස පැමිණියෙමි"** යැයි කීවේ ය. එවිට රජතුමා

**"එසේ නම් ස්වාමීනි ඔබ මතු බුදු වේවා! බුදු බවට පැමිණ පළමු කොට මගේ රාජ්‍යයට පැමිණේවා"** යැයි ප්‍රතිඥා ගෙන ගියේ ය.

මහ බෝසතාණන් වහන්සේ රජතුමාට පිළිවදන් දී පිළිවෙළින් චාරිකා කරන්නේ ප්‍රථමයෙන් ආලාරකාලාම, උද්දකරාම පුත්‍ර යන තවුසන් වෙත ගොස් ධ්‍යාන සමාපත්ති ලබාගෙන එය සත්‍යාවබෝධයට මග නොවේ යැයි ඒවා පිළිබඳ සෑහීමකට නොපැමිණ දෙවියන් සහිත ලෝකයාට තමාගේ කායික හා මානසික ශක්තිය දක්වීම සඳහා මහා වීර්‍ය්‍යය කරනු පිණිස උරුවෙල් දනව්වට ගොස් සිත් කළු භූමි භාගයක් දැක එහි වෙසෙමින් ප්‍රධන් වීර්‍ය්‍යය ඇරඹූ සේක. කොණ්ඩඤ්ඤ තවුසා ප්‍රධාන පස්වග තවුසන් ගම් නියම්ගම් රජදහන්වල ඇවිද එහි දී බෝසතාණන් වහන්සේ හමු වූහ. ඔවුහු මහා ප්‍රධන් වීර්‍ය්‍යය වඩන්නා වූ බෝසතාණන් වහන්සේ දැක දැන් දැන් බුදු වෙති යැයි යන සිතින් පන්සල හැමදීම් ආදී වත් පිළිවෙත් උපස්ථාන කරමින් බෝසතාණන් වහන්සේ සමගම විසූහ. බෝසතාණන් වහන්සේ දුෂ්කර ක්‍රියාවෙහි කෙළවරට ම යමි යැයි එක සහල් ඇටයකින්, එක තල ඇටයකින් කල් ගෙවූයේ ය. සහමුලින්ම ආහාර වර්ජනය ද කළේ ය. දෙවියන් විසින් රෝම කූප මඟින් ආහාර ඇතුළු කලේ ය. බෝසතාණන් වහන්සේ එය ද ප්‍රතික්ෂේප කළේ ය. එසේ ඇති වූ නිරාහාර භාවය නිසා මහා සත්වයන් වහන්සේගේ රන්වන් වූ සිරුර කළු පැහැ විය. දෙ තිස් පුරුෂ ලක්ෂණ සැඟවී ගියේ ය. ඇතැම් දිනවල ආශ්වාස ප්‍රශ්වාස නතර කොට ධ්‍යාන වැඩීම හේතුවෙන් මහත් වේදනාවට පත්ව සිහි සුන් වී සක්මන් කෙළවර වැටුණේ ය. ඒ දුටු ඇතැම් දෙවියෝ ගෞතමයන් මළේය යැයි කීහ. ඇතැම් දෙවියෝ මෙය රහතුන්ගේ එක්තරා විහරණයක් යැයි කීහ. ඇතැම් දෙවි කෙනෙක් බෝසතාණන් වහන්සේ මළේ යැයි සිතා ගොස් සුද්ධෝදන රජතුමාට ද ඒ බව කීහ. එවිට රජතුමා මගේ පුතා කළුරිය කළේ බුදු බවට පත්ව ද, නැතිව ද යැයි ඇසුවේ ය. එවිට **"බුදු වීමට නොහැකි විය. වීර්‍ය්‍යය කරද්දී සක්මන කෙළවර විසඤ්ඤ ව වැටී මළේ ය"** යැයි කීවේ ය. එය ඇසූ රජතුමා **"මම එය නො අදහමි. මගේ පුතු බුදු බවට නොපැමිණ කළුරිය කිරීමක් නොවන්නේය"** යැයි කීවේය. රජතුමා කුමක් හෙයින් මෙසේ කීවේ ද යත්:- බෝසතාණන් වහන්සේ උපන් දවසේ දී අසිත කාලදේවල තවුසා වැන්දවීමට යාමේ දී වූ පෙළහර ද, වප් මඟුල් දින දඹ ගස මුලදී කළ පෙළහර ද දුටු බැවිනි.

අනතුරුව බෝසතාණන් වහන්සේ මේ සිරුරට දුක් දීම නිවනට මග නොවේ යැයි සිතා බත් ආදී ඕලාරික ආහාර වැළඳීම සඳහා ගම් නියම්ගම්හි පිඬු පිණිස හැසිර මිශ්‍ර ආහාර වැළඳුවේ ය. නැවතත් සිරුරෙහි දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ ප්‍රකට ව පෙනෙන්නට විය. සිරුර ද රන්වන් පැහැ විය. පස්වග මහණහු "**මොහු සය වසක් සිරුරට දුක් දෙමින් වත් පිරුව ද සියල්ල දන්නා නුවණ ලැබීමට නොහැකි විය. දැන් ගම් දනව්වල පිඬු පිණිස හැසිර ඕලාරික ආහාර වළඳමින් කෙසේ නම් සියල්ල දන්නා නුවණ ලැබිය හැකි වන්නේ ද? මොහු සිවුපස බහුල බවට පැමිණියේ ය. මොහු වීයඝීයෙන් පිරිහුණේ ය. අප මොහු විශේෂාධිගමයක් ලබති යැයි සිතීම හිස පටන් නහනු කැමති කෙනෙක් පිනි බිඳුවෙන් නහමි යැයි සිතීම වැනිය. මොහුගෙන් අපට ප්‍රයෝජනයක් නැත**" යැයි බෝසතාණන් වහන්සේ අතහැර තම තමන්ගේ පා සිවුරු ගෙන අටලොස් යොදුනක් මග ගෙවා ගොස් ඉසිපතනයට පිවිසියහ.

එසමයෙහි උරුවේලාවෙහි සේනානි නියම් ගම සේනානි කෙළෙඹියාගේ ගෙයි උපන් සුජාතා නම් දැරිය සුදුසු වියට පත් වූ කල්හි එක් නුග රැකක් වෙත ගොස් "**ඉඳින් මම සම ජාතික කුල ගෙයක කුමරෙකු සමග විවාහපත් ව පළමු ව පුතෙකු ලබන්නෙමි නම් වසරක් පාසා කහවනු ලක්‍ෂයක් පරිත්‍යාග කොට පූජාවක් කරමි**" යැයි ප්‍රාථනීාවක් කළා ය. ඇයගේ ප්‍රාථනීාව සඵල විය. මහ බෝසතාණන් වහන්සේගේ දුෂ්කර ක්‍රියා කොට සය වසරක් සම්පූණී වූ වෙසක් මස පුන් පොහෝ දින දේව පූජාව කරනු කැමති වූ සුජාතාව පළමු කොට දෙනුන් දහසක් වැල් මී වනයක කවා ඒ දෙනුන්ගේ කිරි දෙවා පන්සියයක් දෙනුන්ට පොවා ඒ දෙනුන්ගෙන් කිරි දෙවා ඉන් අඩකට පොවා මේ ආදී වශයෙන් දෙනුන් අට දෙනෙක් දක්වා පොවා කිරෙහි ඝන බව මිහිරි බව ඔදවත් බව ඇති කරමින් කිරෙන් කිරි මාරු කිරීම නම් ක්‍රියාව කළා ය. ඉන් පසු ඇය වෙසක් පොහෝ දින ඉතා අලුයම නැගිට ඒ දෙනුන් අට දෙනාගෙන් කිරි දෙවුවා ය. වසු පැටව් දෙනුන්ගේ සමීපයට නොපැමිණියහ. අලුත් භාජන තන මුලට ළං කළ විට ස්වභාවයෙන් ම කිරි භාජන පිරී ගියේ ය. මේ අසිරිය දුටු සුජාතාව සියතින් ම කිරි ගෙන අලුත් භාජනවල බහා සියතින් ම ගිනි අවුළුවා ආහාර පිසීමට පටන් ගත්තා ය. මේ කිරිබත පැසෙන කල්හි මහත් මහත් බුබුළු පැන නැඟී දකුණට කරකැවෙමින් ඒ මේ අත හැසිරිණ. එක

බිඳුවක් වත් පිටතට නොවැගිරුණේ ය. ලිපෙහි සුළු දුමක් වත් නොනැංගේ ය. එකෙනෙහි ලෝක පාලක සතර වරම් දෙවියෝ උදුනට ආරක්ෂා ගත්හ. මහා බ්‍රහ්මයා සේසත දැරුවේ ය. සක් දෙවිඳු ගිනි පෙනෙලි පෙරළමින් ගිනි දැල්වීය. දෙවියෝ දෙදහසක් දිවයින් පිරිවර වූ සතර මහද්වීපයෙහි දෙවි මිනිසුන්ගේ පරිභෝගයට සුදුසු වූ ඕජාව තම දේවානුභාවයෙන් දඬුවල් බෑ මී වදයක් මිරිකා පැණි ගන්නාක් මෙන් කැටි කොට ගෙන එම කිරිබතට යෙදූහ. අන් දිනයන්හි භාග්‍යවතුන් වහන්සේ දන් වළඳන විට දෙවියෝ බත් පිඩක් පිඩක් පාසා දිව්‍ය ඕජස් බහාලති. සම්බුදු පදවියට පත්වන දිනයෙහි සහ පිරිනිවන් පානා දිනයෙහි වළඳන ආහාරයට පිසින සැළියෙහිදී ම දිව්‍ය ඕජස් බහාලති.

සුජාතාව එක දවසක් තුළ දී සිදු වූ මේ අසිරිමත් දේ දැක පුණ්ණා දසිය අමතා "**දුව පුණ්ණාවෙනි, අද අපගේ දෙවියෝ වඩාත් ම පහන් වූ සේය. මම මෙතෙක් කල් මෙබඳු අසිරියක් නුදුටුයෙමි. වහා ගොස් දේවාලය පිළිදැගුම් කරව**" යැයි කීවා ය. පුණ්ණා දසිය එසේ ය යැයි සතුටින් පිළිගෙන රුක් මුල වෙත ගියා ය. මහ බෝසතාණන් වහන්සේ එදින ඉකුත් රැයෙහි පඤ්ච මහා සිහින දුටුවේ ය. පශ්චිම භවික මහ බෝසතාණන් වහන්සේලා බුදු වන දවස පෙර දින චාතුද්දසී රාත්‍රියෙහි පූර්ව නිමිති වශයෙන් සිහින පසක් දකින්නාහ. එබැවින් එම සිහින මහා සුපින යැයි කියනු ලැබේ. එදින මහ බෝසතාණන් වහන්සේ "**හෙට මැදි පොහෝ දවස ය. වෛශාඛ නැකැත් යෝගයත් යෙදිණ. මාගේ උත්පත්තිය වූයේ ද මෙදිනම ය. දුෂ්කර ක්‍රියාවෙන් දැන් අවුරුදු සයක් සම්පූර්ණ විය. එබැවින් හෙට දින ලොවුතුරා බුදු බව ලබන්නෙම් නම් යෙහෙක**" යැයි සිතා දකුණැලයෙන් සිංහ සෙය්‍යාවෙන් සැතපුණේ ය. එහි දී මෙම සිහින පස දුටුවේ ය. එනම්:-

මේ සා මහ පොළොව ශ්‍රී යහනය කොට හිමාල පර්වතය කොට්ටය කොට දකුණු සාගරයෙහි දෙපය තබා පෙරදිග හා බටහිර සාගරයන්හි දෑත තබා ඇඟිලි අගින් සක්වළ ගල පිරිමදිමින් නිදනවා දුටුවේ ය. මෙය පළමු සිහිනයයි. මෙය බුදු බවට පැමිණ තුන් ලොව පුරාවට තමන් වහන්සේගේ ධර්මචක්‍ර අනසක පවත්වන බවට පෙර නිමිත්ත ය.

ඊ තණ ගසක් තම නාභි මණ්ඩලයෙන් නැගී බඹලොව දක්වා වැඩීමට පත්ව සියලු සක්වළ වැසී ගියා දුටුවේ ය. මෙය දෙවන සිහිනයයි. මෙය තුන් ලෝ වැසියන් නිවන් පුරයට පමුණුවන බවට පෙර නිමිත්ත ය.

ඒ ඒ දිගින් කළු හිස ඇති සුදු කය ඇති පණුවන් විශේෂයක් සිය දහස් ගණනින් පැමිණ තමන් වහන්සේ ගේ දෙපතුලෙහි පටන් දණහිස දක්වා පැන නැංගා දුටුවේ ය. මෙය තෙවන සිහිනයයි. මෙය බොහෝ වේනෙය්‍ය ජනයා නොයෙක් දිශාවන් ගෙන් පැමිණ තමන් වහන්සේ සරණ ගොස් ශ්‍රාවක වන බවට පෙර නිමිත්ත ය.

නොයෙක් වර්ණ ඇති ලිහිණින් සතර දෙනෙක් සතර දිගින් ඇවිදින් තමන් වහන්සේගේ පාද මූලයෙහි හිඳ ඇසිල්ලකින් ඉතා සුදු පැහැ වූවා දුටුවේ ය. මෙය සිවුවන සිහිනයයි. මෙය ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර යන සතර කුලයෙන් ම පිරිස් පැමිණ ඒ කුල ගොත් සියල්ල අතහැර තමන් වහන්සේගේ ශ්‍රාවක බවට පත්වන බවට පෙර නිමිත්තය.

යොදුනක් පමණ වූ අසුචියෙන් පිරුණු පර්වතයක් මතට නැගී ඔබිනොබ සක්මන් කළේ ය. එහෙත් එම අසූචි කිසිවක් තම ශ්‍රී පාදයෙහි නොගැවුණා දුටුවේ ය. මෙය පස් වන සිහිනයයි. මෙය තමන් වහන්සේට හා තම ශ්‍රාවකයන් වහන්සේලාට අපමණ සිවුපස ප්‍රත්‍ය ලැබෙන නමුත් ඒ කිසිවක නො ඇලෙන බවට පෙර නිමිත්ත ය.

මහ බෝසතාණන් වහන්සේ එම සිහිනයන්හි අර්ථ විමසා අද මම බුදු වෙමි යැයි දැන එම අධිෂ්ඨානයෙන් යුක්ත ව අලුයම සිරුර පිළිදැගුම් කොට පිණ්ඩපාත කාලය එළඹෙන තෙක් ඒ වෘක්ෂ මූලයෙහි වැඩ හුන්නේ ය. බෝසතාණන් වහන්සේගේ ශරීරාලෝකයෙන් නුග රුක ආලෝකමත් විය. පුණ්ණාව අවුත් බලන්නී මුළු නුග වෘක්ෂය ම ශරීරයෙන් නික්මෙන රැස් දහරින් රන්වන් කරමින් පෙරදිග බලා වැඩ හුන් මහ බෝසතාණන් වහන්සේ දැක රුක් දෙවියා ගසින් බැස සියතින් ම පූජාව පිළිගැනීමට සිටිනවා විය යුතුය යැයි සිතා බියට පත්ව වහාම ආපසු නිවසට ගොස් සුජාතාවට එම කාරණය සැල කළා ය. සුජාතාව ඇයගේ වදන් අසා සතුටු ව නුඹ අද පටන් මාගේ දෙටු දියණිය වන්නී ය යැයි දියණියට සුදුසු සියලු ආභරණ දුන්නා ය.

මහ බෝසතාණන් වහන්සේට බුදු වන දින කහවනු ලක්ෂයක් අගනා රන් බඳුනක් ලැබිය යුතු බැවින් සුජාතාව එබඳු රන් බඳුනක් ගෙන කිරිබත ඒ භාජනයට බෙදනු කැමති ව පිසූ බඳුන යටිකුරු කළා ය. එවිට සියලු කිරිබතින් රන් තලිය පිරී ගියේ ය. එය වෙනත් රන් බඳුනකින් වසා වස්ත්‍රයකින් ඔතා ගෙන තමා ද සර්වාභරණයෙන් සැරසී රන් පාත්‍රය හිස මත තබාගෙන මහත් සිරියාවෙන් නුග වෘක්ෂ මූලයට ගොස් බෝසතාණන් වහන්සේ දෙස බලා රුක් දෙවියා යන හැඟීමෙන් සතුටු ව දුටු තැන් පටන් නැමී නැමී ගොස් හිසින් පාත්‍රය ගෙන පියන විවෘත කොට රන් කෙණ්ඩියෙන් සුවඳ ගැල්වූ පැන් ගෙන බෝසතාණන් වහන්සේ ඉදිරියෙහි සිටියා ය. පැවිදි වන දින ඝටීකාර බ්‍රහ්මයා විසින් දෙන ලද මැටි පාත්‍රය එතෙක් කල් අත් නො හැර තිබී ඒ මොහොතෙහි අතුරුදහන් විය. බෝසතාණන් වහන්සේ පාත්‍රය නැති බැවින් දකුණු අත දිගු කොට පැන් පිළිගත්තේ ය. සුජාතාව රන් පාත්‍රය සමගම කිරිබත බෝසතාණන් වහන්සේගේ අතෙහි තැබුවා ය. එවිට මහ බෝසතාණන් වහන්සේ සුජාතාව දෙස බැලූ ආකාරයෙන් ම කාරණය වටහා ගත් සුජාතාව **"උතුමාණෙනි, මා විසින් රන් පාත්‍රය ඔබ වහන්සේට පිරිනැමුවෙමි. කැමති සේ එය රැගෙන යනු මැනවි"** යැයි කියා වැඳ නැවත ද **"මගේ මනදෙළ සපිරුණාක් මෙන් ඔබ වහන්සේගේ පැතුම් සඵල වේවා"** යැයි පවසා ලක්ෂයක් වටිනා රන් පාත්‍රය දිරාපත් එකක් මෙන් සිතින් අතහැර අපේක්ෂා රහිතව ගියා ය.

මහ බෝසතාණන් වහන්සේ වැඩ හුන් තැනින් නැගිට ගස පැදකුණු කොට පාත්‍රය රැගෙන නේරංජරා ගං තෙරට වැඩ පාත්‍රය ගං ඉවුරෙහි තබා පූර්වයෙහි ලක්ෂ ගණන් මහ බෝසතාණන් වහන්සේලා බුදු වන දින ස්නානය කරන ලද සුප්‍රතිෂ්ඨිත නම් නහන තොටින් ගඟට බැස ස්නානය කොට නොයෙක් ලක්ෂ ගණන් බුදුරජාණන් වහන්සේලාගේ චීවරය වූ අර්හත් ධජය පොරවාගෙන පෙර දිගට අභිමුඛව වැඩ හිඳ ඩෙබර ගෙඩි පමණ වන ලෙස ඒ කිරිබත එකුන්පණස් පිඩක් කොට වැළඳූ සේක. එම ආහාරයම බුදු වී සත් සති ගෙවීම තෙක් ම බෝ මැඩ වැඩ විසීමට ආහාරය විය. එම කාලය තුළ අන් ආහාරයක් නොවිය. ස්නානය කිරීමක් මළ මුත්‍ර බැහැර කිරීමේ කෘත්‍යයක් ද නොවිය. ධ්‍යාන මාර්ග ඵල සුවයෙන් කල් ගත කළේ ය. බෝසතාණන් වහන්සේ එම ආහාරය වළඳා රන් පාත්‍රය ගෙන "අද මම **බුද්ධත්වයට පත් වන්නේ නම් මේ පාත්‍රය උඩුගං දහර අනුව යේවා.**

**නොහැකි වන්නේ නම් ගඟ දිය පහර අනුව යේවා"** යැයි සිතා ගඟ දියට දැමුවේ ය. එම පාත්‍රය ගඟ සැඩ පහර සිඳිමින් ගඟ මැදට ගොස් ජව සම්පන්න අශ්වයෙකු මෙන් මැදින් ම අසූ රියනක් පමණ තැන ගොස් දිය සුළියක ගිලී මහාකාල නම් නා රජුගේ නාග භවනයට ගොස් පෙර තුන් බුදුරජාණන් වහන්සේලාට පරිත්‍යාග කළ රන් පාත්‍රයන්හි කිටි කිටි යන ශබ්දය නංවමින් ඒ පාත්‍ර තුනට යටින් පිහිටියේ ය. ඒ නා ලොවට එක් අන්තර් කල්පයක් එක් දවසකි.

බෝසතාණන් වහන්සේ එම ගඟ අසබඩ මලින් ගැවසුණු සල් වනයෙහි දහවල් කාලය ගත කොට සවස මල් නටුවෙන් ගිලිහෙන කාලයෙහි දෙවියන් විසින් සරසන ලද අට ඉස්බක් පමණ වූ පැතිරී ගිය මාර්ගයෙන් සිංහයෙකු මෙන් අභීතව ඇසතු බෝධි වෘක්ෂය වෙත වැඩි සේක. නාග, යක්ෂ, ගුරුළු ආදීහු දිව්‍යමය සුවඳ මල් ආදියෙන් පූජා කළහ. දිව්‍ය සංගීතාදිය පැවැත්වූහ. දස දහසක් ලෝක සුවඳ මල් මාලාවක් මෙන් විය. සාධුකාර හඬ පැවැත්විණ.

ඒ වේලාවෙහි සොත්ථිය නම් තෘණ වෙළෙන්ද තෘණ ගෙන ඉදිරියට එන්නේ බෝසතාණන් වහන්සේගේ ආකාරය දැන තෘණ අට මිටක් දුන්නේ ය. බෝසතාණන් වහන්සේ එය ද ගෙන බෝ මැඩට නැඟ දකුණු දිසාවෙන් උතුරට මුහුණ ලා සිටියේ ය. එවේලෙහි සක්වළෙහි දකුණු පැත්ත ගිලී අවීචි නිරයට පැමිණියාක් මෙන් විය. උතුරු සක්වළ භවාග්‍රයෙහි පිහිටියාක් මෙන් විය. බෝසතාණන් වහන්සේ මේ දිසාව සම්බෝධියට සුදුසු දිසාව නොවේ යැයි සලකා පැදකුණු කරමින් බටහිර දිසාවට ගොස් පෙර දිගට මුහුණ ලා සිටියේ ය. ඒ දිසාව ද පෙර මෙන් ම විය. මෙලෙස බෝසතාණන් වහන්සේ සිටි තැන නැබින් තිබූ චක්‍රයක් නේමියෙන් මඩනා කලක් මෙන් මහ පොළොව උස් පහති විය. එම ස්ථානය ද සම්බෝධියට සුදුසු ස්ථානය නොවේ යැයි සලකා උතුරු දිසාවට ගොස් දකුණට මුහුණ ලා සිටියේ ය. එම දිසාව ද එසේම විය. ඒ දිසාව ද ජය භූමිය නොවේ යැයි සිතා පෙර දිගට ගොස් බටහිර දිසාව බලා සිටියේ ය. ඒ පෙරදිග දිසාව සියලු බුදුරජාණන් වහන්සේලාගේ සම්බෝධි අසුන පිහිටන තැන වේ. එම ස්ථානය උස් පහත් නොවේ. නො සැලේ.

බෝසතාණන් වහන්සේ මෙම ස්ථානය සියලු බුදුරජාණන් වහන්සේලාගේ අත් නොහරින ලද නොසෙල්වෙන කෙලෙස් මැදිරි විනාශ කරන ස්ථානය යැයි දැන ඒ තෘණ අගින් ගෙන සෙලවිය. ඒ සමගම තුදුස් රියන් වජිරාසනය පැන නැගුණේ ය. ඒ තෘණ ඒ ආකාරයෙන් ම පිහිටියේ ය. ඉතා දක්ෂ වූ සිත් කරුවෙකු විසින් ද මේ ආසනය සිතුවම් කරන්නට සමර්ථ නොවේ. බෝසතාණන් වහන්සේ බෝධි වෘක්ෂයෙහි කඳට පිට දී පෙර දිගට අභිමුඛව දැඩි සිත් ඇතිව **"මගේ ශරීරයෙහි සම, නහර, ඇට විසිරේවා. මස් ලේ වියළේවා. සම්මා සම්බුද්ධත්වයට නොපැමිණ මේ බද්ධාසනය නොහරින්නෙමි"** යැයි සිය ගණන් හෙන පහත් වුව ද නොබිඳිය හැකි, පරාජය කළ නොහැකි පර්‍යංකය බැඳ වැඩ හුන්නේ ය.

එකෙනෙහිම මාර දිව්‍ය පුත්‍රයා **"සිදුහත් කුමරු මගේ බලය ඉක්මවනු කැමැත්තේ ය, මම දැන් ඔහුට මා මැඩ පවත්වන්නට නොදෙමි"** යැයි මර සෙනග වෙත ගොස් එම කරුණ කියා වම් පසින් ද, දකුණු පසින් ද, ඉදිරි පසින් ද දෙළොස් යොදුනක් තරම් පැතිරුණු පිටුපසින් සක්වළ කෙළවර කොට ඇති මාර සේනාවක් පිරිවර කොට එකසිය පනස් යොදුන් උසැති ගිරිමේඛලා ඇතුපිට නැගී නික්මුණහ. ඒ මාර සේනාවෙහි එක් වෙස් ගත් දෙදෙනෙකු නොවූහ. ඇතමෙක් ඇත් වෙස් ගෙන දුවයි. ඇතමෙක් අශ්ව වෙස් ගෙන දුවයි. ඇතමෙක් සිංහ වෙස් ගෙන දුවයි. ඇතමෙක් මහිෂ වෙස් ගෙන දුවයි. ඇතමෙක් වෘෂභ වෙස් ගෙන දුවයි. ඇතමෙක් සුනඛ වෙස් ගත්තේ ස. ඇතමෙක් ගුරුළු වෙස් ගෙන දුවයි. ඇතමෙක් කපුටු වෙස් ගෙන දුවයි. ඇතමෙක් ලිහිණි වෙස් ගෙන දුවයි. ඇතමෙක් නාග වෙස් ගෙන දුවයි. ඇතමෙක් පොළොන් වෙස් ගෙන දුවයි. ඇතමෙක් පිඹුරු වෙස් ගෙන දුවයි. ඇතමෙක් රාක්ෂ වෙස් ගෙන දුවයි. ඇතමෙක් යක් හඬ පතුරවමින් දුවයි. ඇතමෙක් පර්වත ගසා දුවයි. ඇතමෙක් සර්පායුධ ගෙන දුවයි. ඇතමෙක් මහා වෘක්ෂ උපුටා හිස වට කරකවමින් දුවයි. ඇතමෙක් ගිනි වැටි කරකවමින් දුවයි. එම මාර සේනාවෙහි ගුගුරන ශබ්දය පොළොව ගුගුරන කලක් මෙන් යොදුන් දහසක් දුර ඇසෙයි. වසවත් මාර දිව්‍ය පුත්‍රයා එකසිය පනස් යොදුන් උසැති ගිරිමේඛලා ඇති පිට නැගී අත් දහසක් මවා ඒ අත්වලින් නොයෙක් ආයුධ ගෙන බෝසතාණන් වහන්සේ මැඩගෙන යන්නාක් මෙන් ඉදිරියට පැමිණියහ.

ඒ වන විට දස දහසක් සක්වළ දෙවි බඹුන් මහ බෝසතාණන් වහන්සේට තුති ගී ගයමින් බෝධි මණ්ඩලය පිරිවරා සිටියහ. සක් දෙව් රජ එකසිය විසි රියන් දිග විජයුත්තර නම් සංඛය පිඹිමින් සිටියේ ය. එය එක් වරක් පිඹි කල සිව් මසක් රැව් දී නිහඬ වෙයි. මහා කාල නාග රාජයා සිය ගණන් ගීත කියමින් බෝසතාණන් වහන්සේගේ ගුණ වණිනා කරමින් සිටියේ ය. මහා බ්‍රහ්මයා බෝසතාණන් වහන්සේට සුදු සේසත දරමින් සිටියේ ය. මර සෙනග උතුරු දෙසින් පැමිණ බෝ මැඩට ළං වෙත් ම ඔවුන්ගෙන් එක් අයෙකුටවත් සිටීමට නොහැකි වූහ. හිස් ලූ ලූ අත පලා ගියහ. මහාකාල නාග රාජයා පොළොව කිමිද යොදුන් පන්සියයක් දිග පළල ඇති මාඤ්ජේරික නාග භවනයට ගොස් දෑතින් මුහුණ වසාගෙන හොත්තේ ය. සක් දෙව් රජ විජයුත්තර සංඛය පිට තබාගෙන සක්වළ මුවවිටට ගොස් සිටියේ ය. මහා බ්‍රහ්මයා ශ්වේතඡත්‍රය සක්වළ කෙළවර තබා බඹ ලොවට ම ගියේ ය. එක දෙවියෙකුට හෝ සිටීමට නොහැකි වූහ. බෝසතාණන් වහන්සේ එකලාව ම සිටියේ ය. වසවත් මාරයා සිය පිරිස අමතා "**දරුවනි, සුද්ධෝදන පුත්‍ර සිද්ධාර්ථ සමාන අන් කෙනෙක් නැත. මුහුණට මුහුණ ලා යුද කිරීමට අපි සමත් නොවෙමු. පසුපසින් ගොස් යුද කරමු**" යැයි කීවේ ය.

බෝසතාණන් වහන්සේ තුන් පැති බලා සියලු දෙවියන් පලා ගිය බැවින් බෝ මැඩ හිස් ව ඇති බව දැන නැවත උතුරු දෙසින් මාර සේනාව තමා මැඩීමට එන බව දැක මේ විශාල සෙනග එකලා වූ මා සඳහා උත්සාහ කරති. මෙහි මාගේ මව්පිය සොහොයුරෝ හෝ අන් කිසිවකු හෝ නැත. මේ දස පාරමිතාවෝ මා විසින් දිගු කලක් පෝෂණය කළ සේවකයෝ වැන්නාහ. මා විසින් සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරා පුරන ලද සත්‍ය පාරමිතාව මා හට මෑණියෝ වන්නේ ය. ගැඹුරු වූ මාගේ ප්‍රඥා පාරමිතාව මා හට පියා වන්නේ ය. මා විසින් දැනගත් ධර්මය මා හට බාල සොහොයුරා වන්නේ ය. මාගේ මෛත්‍රී පාරමිතාව මා හට පරම කල්‍යාණ මිත්‍රයා වන්නේ ය. මාගේ අචල වූ ශ්‍රද්ධාව ප්‍රිය කාන්තාව වන්නේ ය. මාගේ ඉවසීම මා හට අනුබල දෙන පුත්‍රයා වන්නේ ය. මෙසේ වූ මාගේ මේ පාරමිතා නෑයින් සය දෙනාට මා විසින් මෙතෙක් කල් එක් ක්‍ෂණයකුදු අහිතක් නොකොට රක්‍ෂා කළෙමි. එබැවින් දැන් මා හට මේ මොහොතේ ජීවිතය හා සමාන ඥාතීන් පිහිට පිණිස ඇත්තේ වේ. තව ද මා විසින් පුරුදු කරන ලද

සම තිස් පාරමිතා ධර්ම අද මා හට මහා යෝධයන් තිස් දෙනෙකු ව මා ආරක්‍ෂා කරයි. එබැවින් මට බල යෝධයෝත් ඇත. තව ද මා විසින් මෙතෙක් කල් පුරුදු කරන ලද සත් තිස් බෝධිපාක්‍ෂික ධර්ම අද මාගේ මන්ත්‍රී සමූහය වෙයි. තව ද මා විසින් මේ සා දිගු කලක් කාය වාක් සංයමයෙන් පුරුදු කරන ලද නවදහස් එකසිය අසූ කෝටි පනස් ලක්‍ෂ සතිස් දහසක් පමණ වූ සංවර සීලස්කන්ධය අද මා අත් නොහැර පිහිට වන බල සේනාව වෙති. තවද මා විසින් මෙතෙක් කල් වැඩූ ගම්භීර වූ ගුණ සමූහය අද මාගේ ආරක්‍ෂාව සලසන හාත්පස පිහිටි අගල වෙයි. මා විසින් පුරුදු කළ මෛත්‍රී පාරමිතාව ඒ අගල පුරා පිරී ඉතිරී පවතින පර සතුරන්ට ආක්‍රමණය නොකළ හැකි දිය කඳ වෙයි. එසේ හෙයින් අද මේ මහා දිය අගල සතුරන්ට මා වෙත ළං වීමට ඉඩ නොදෙයි. තව ද මාගේ පාරමිතා නැමති හුයින් (නූලෙන්) බඳනා ලද මහා තේජෝ ප්‍රාකාරය බඹලොව දක්වා උස්ව නැගී මා වට කොට පිහිටියේ වේ. එසේ හෙයින් අද සතුරාට එම ප්‍රාකාරය පැන ඒමට නොහැක්කේම ය. තව ද මා විසින් විශේෂයෙන් රක්‍ෂා කරන ලද චතු පාරිශුද්ධි සීලය අද මා හට සතර වාසල මහ දොරටු සතර වේ. මාගේ ඉන්ද්‍රිය සංවර සීලය මා හට පක්‍ෂපාතී වූ දොරටු පාලකයා වී වාසල් දොර නොහැර මා ආරක්‍ෂා කරයි. මාගේ මේ වජ්‍රාසනය මා හට හස්ති වාහනය වෙයි. මේ ජය ශ්‍රී මහ බෝධි රාජ වෘක්‍ෂය සතුරන් පරදවන මාගේ ජය සේසත වෙයි. එසේ හෙයින් මා නිසාම උපන් මේ මහ බෝධිය හා වජ්‍රාසනය අද මා නොහැර නොයයි. එහෙයින් පාරමී ධර්ම පලිහක් කොට පාරමී නැමති ආයුධයෙන් ම මේ මාර පිරිස විසුරුවා හැරිය යුතු වන්නේ ය යැයි සිතා දස පාරමිතා ගුණ සිහි කරමින් වැඩ හුන්නේ ය.

මාර දිව්‍ය පුත්‍රයා සිද්ධාර්ථයන් මෙයින් ම පලාපියම් යැයි සිතා මහා සුළඟක් මැවිය. ඒ සුළං වර්ෂාවෙන් සියලු දිසාවෙන් වා මඬුලු හටගෙන යොදුන් දෙ යොදුන් තුන් යොදුන් පමණ වූ මහා පර්වත බිඳිමින් මහා ගස් මුලිනුපුටා දමමින් සියලු ගම් නියම්ගම් සුණු විසුණු කරමින් පැමිණිය ද බෝසතාණන් වහන්සේගේ සිවුරු කොනක් හෝ සෙලවීමට සමත් නොවිය.

ඉන් පසු මාරයා බෝසතාණන් වහන්සේ යට කොට මරමි යැයි යොදුන් ගණන් වළා පටල නැඟී මහා ජල වර්ෂාවක් වැස්සවිය. ඒ වැසි ධාරා වේගයෙන් පොළොව සිදුරු විය. වන රැක් යට කොට ගලා ආ

මහා මේඝයෙන් බෝසතාණන් වහන්සේගේ සිවුරු කොනක් තෙමන්නට අසමත් විය.

අනතුරුව ගල් වර්ෂාවක් වැස්සවිය. මහත් වූ පර්වත මෙන් ගල් ගිනි ගෙන දුම් දමමින් අහසින් අවුත් බෝසතාණන් වහන්සේ වෙත පැමිණ දිව්‍ය මල් බවට පත් විය.

අනතුරුව ආයුධ වර්ෂාවක් වැස්සවිය. එක් පස මුවහත ඇති දෙපැත්තෙහි මුවහත් ඇති කඩු, අඩයටි, ඊතල ආදිය ගිනි ගෙන දිලිසෙමින් දුම් දමමින් අහසින් බෝසතාණන් වහන්සේ වෙත අවුත් දිව්‍ය කුසුම් බවට පත් විය.

අනතුරුව අඟුරු වර්ෂාවක් වැස්සවිය. කිණිහිරි මල් වන් ගිනි අඟුරු අහසින් අවුත් බෝසතාණන් වහන්සේ පාමුල දිව්‍ය කුසුම් මෙන් විසිරිණ.

අනතුරුව අළු වර්ෂාවක් වැස්සවිය. ඉතා උණුසුම් වූ ගිනි ගත් අළු අහසින් අවුත් බෝසතාණන් වහන්සේගේ පාමුල සඳුන් සුණු මෙන් වැටිණ.

අනතුරුව වැලි වර්ෂාවක් වැස්සවිය. ඉතා සියුම් වැලි ගිනි ගෙන දුම් දමමින් අහසින් අවුත් දිව්‍යමය මල් බවට පත් විය.

අනතුරුව මඩ වර්ෂාවක් වැස්සවිය. ගිනි ගෙන දිලිසෙන මඩ අහසින් අවුත් බෝසතාණන් වහන්සේගේ පාමුල දිව්‍ය විලවුන් බවට පත් විය.

අනතුරුව මෙයින් බෝසතාණන් වහන්සේ බිය ගන්වා පළවා හරිමි යැයි ගනඳුරක් මැවිය. චතුරංග සමන්වාගත රාත්‍රියක මෙන් වූ මහා ඝන අන්ධකාරය බෝසතාණන් වහන්සේ වෙත පැමිණ සූර්‍ය්‍යාලෝකයෙන් මෙන් අතුරුදහන් විය.

මෙසේ නව විධ මහා වර්ෂාවක් වස්සවා ද බෝසතාණන් වහන්සේ පලවා හරින්නට නොහැකි ව මර සෙනග අමතා **"කොල**

**බලා සිටින්නේ ඇයි? සිද්ධාර්ථයන් අල්ලා ගනිව්, නසව්, පලවා හරිව්"** යැයි අන කොට තමා ද ගිරිමේඛලා ඇතු පිට සිට චක්‍රායුධය ගෙන බෝසතාණන් වහන්සේ සමීපයට අවුත් **"සිදුහත් කුමරුනි, පලඟින් නැගිටිනු, එය ඔබට අයිති නැත, එය පැමිණිය යුත්තේ මා වෙතය"** යැයි කීවේ ය. බෝසතාණන් වහන්සේ ඔහුගේ වචනය අසා **"මාරය, ඔබ දසපාරමිතා දස උපපාරමිතා දස පරමත්ථ පාරමිතා නොපිරුවෙහිය. එසේම ඔබ අංග, නේත්‍ර, ධන රාජ්‍ය, පුත්‍ර-දර යන පඤ්ච මහා පරිත්‍යාග නොකෙළෙහි ය. එසේම ඤාතත්ථ චර්‍යා, ලෝකත්ථ චර්‍යා, බුද්ධත්ථ චර්‍යාවන් හි නොහැසිරුණෙහි ය. එබැවින් මේ පළඟ මා සතු ය. ඔබට අයත් නොවේ"** යැයි වදාළේ ය. එයින් අතිශයින් කිපුණු මාරයා කෝපය දරා ගත නොහැකි ව බෝසතාණන් වහන්සේ වෙත චක්‍රායුධයෙන් දමා ගැසීය. එම සියුම් මුවහත් ඇති චක්‍රායුධය අන් දිනවල කිපුණු මරු විසින් විහිදුවා හලේ නම් කළුගල් ටැඹක් වුව ද හුණ බඩක් මෙන් සිඳෙන්නේ ය. එදින එය දස පෙරුම් දම් සිහි කරමින් සිටි මහ බෝසතාණන් වහන්සේගේ හිස මත මල් වියනක් මෙන් පිහිටියේ ය. එකල්හි මර සෙනග බෝසතාණන් වහන්සේ දැන් පලඟින් නැගිට පලා යයි යැයි මහත් ගල්කුළු පෙරලා හැරියහ. ඒවා ද මහ බෝසතාණන් වහන්සේගේ පාරමී බලයෙන් මල් ගුලා බවට පත්ව බිම වැටිණ.

දෙවියෝ සක්වළ ගැබ මුව විටෙහි සිට ගෙල ඔසවා හිස් උස් කොට බලන්නේ මහ බෝසතාණන් වහන්සේගේ රුවින් අගතැන්පත් ශරීරය දැක දැන් කුමක් වේද යැයි විමසමින් සිටිති. අනතුරුව බෝසතාණන් වහන්සේ **"දස පෙරුම් දම් පිරූ මහ බෝසතාණන් වහන්සේලාට ලැබෙන පළඟ අද මට හිමි විය. මාරය, ඔබ දාන පාරමිතාව පිරූ බවට කවරෙක් සාක්ෂි ද"** යැයි ඇසුවේ ය. එවිට මාරයා **"මෙතෙක් දෙනා මට සාක්ෂිය"** යැයි මර සෙනග දෙසට අත දිගු කළේය. මර සෙනග ද **"මම සාක්ෂි වෙමි, මම සාක්ෂි වෙමි"** ඔවුන් වෙන වෙනම නැගූ හඬ මහ පොළොව ගුගුරන ශබ්දය මෙන් විය. මාරයා ද බෝසතාණන් වහන්සේගෙන් **"සිද්ධාර්ථ කුමාරයානෙනි, ඔබ දාන පාරමිතාව පිරූ බවට කවරෙක් සාක්ෂි ද?"** යැයි ඇසුවේ ය. එවිට බෝසතාණන් වහන්සේ **"මාරය, ඔබට දාන පාරමිතාව පිරූ බවට සජීවී සාක්ෂි ඇත. මට මෙහි සජීවී සාක්ෂියක් නැත. නොයෙක් ආත්මභාවයන්හි දී පිරූ දාන පාරමිතාව තිබේවා, එකම වෙස්සන්තර**

**ආත්ම භාවයෙහි දී සත්තසතික මහා දානය දුන් බවට මේ සිත් පිත් නැති මහ පොළොව සාක්ෂි වෙයි"** යැයි කියා සිවුරු ගැබ අතරින් දකුණු අත එළියට ගෙන **"වෙස්සන්තර කාලයෙහි දුන් ඒ මහා දානයට ඔබ සාක්ෂි ද? නැද්ද?"** යැයි මහ පොළොව දෙසට දිගු කළේ ය. එවිට මහ පොළොව **"ස්වාමීනි, මම ඔබ වහන්සේට සාක්ෂි වෙමි"** යැයි කියන්නාක් මෙන් ලක්ෂ වාර මහහඬ පතුරවමින් මාර බලය යට කරමින් රාවය පැතිරිණි. මෙසේ මහ බෝසතාණන් වහන්සේ එම දානය නැවත නැවතත් සිහි කරන විට ගිරිමේඛලා ඇතු මහ බෝසතාණන් වහන්සේ ඉදිරියෙහි දණ ගැසීය. මාර සෙනග ඒ ඒ දිසාවන්ට පලා ගියහ. දෙදෙනෙක් එක මගින් නොගියහ. හිස් වෙළුම් ද හැඳි වස්ත්‍ර ද අතහැර ඒ ඒ දිසාවෙන් පැන දිවූහ. දේව සමූහයා එලෙස පැන යන මාර පිරිස දැක **"මාරයා පරාජය වූයේ ය. සිදුහත් කුමාරයන්ට ජය අත් විය. අපි ජය පූජා කරමු"** යැයි සුවඳ මල් ආදිය අතැති ව බෝධි මණ්ඩලය වෙත පැමිණ දේව, බ්‍රහ්ම, නාග, ගරුඬ සමූහයා මහ බෝසතාණන් වහන්සේට පූජා කළහ.

මෙසේ මහ බෝසතාණන් වහන්සේ හිරු බැස යාමට පෙර ම මාර බලය පරාජය කොට රන් පබළු දලකින් පුදන්නාක් මෙන් සිවුර මත බෝ අංකුර වැටෙද්දී පළමු යාමයෙහි දී පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ ද, මධ්‍යම යාමයෙහි දී දිවැස් නුවණ ද ලබා පශ්චිම යාමයෙහි දී පටිච්ච සමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් බලමින් හේතුඵල දර්ශනය ලබා ගත්තේ ය. මෙහි දී මහ බෝසතාණන් වහන්සේ අවිද්‍යා ආදී පද දෙළොසකින් යුත් පටිච්ච සමුප්පාදය පැවැත්ම නොපැවැත්ම වශයෙන් ද, මුල සිට අගට ද, අග සිට මුලට ද යන ක්‍රමයෙන් විමර්ශනය කරද්දී දසදහසක් ලෝක ධාතුන් ජලය කෙළවර කොටැති ව දෙළොස් වරක් ම කම්පා විය.

මෙසේ මහ බෝසතාණන් වහන්සේ දස දහසක් ලෝක ධාතු කම්පා කොට අලුයම් වෙලෙහි සියල්ල දන්නා නුවණ වූ සර්වඥතා ඥාණය අවබෝධ කරන කල්හි දස දහසක් සක්වළ සියලු අලංකාරයෙන් සැරසුණේ ය. ඒ ඒ සක්වළ පෙරදිග මුව විටෙහි එසවූ ධජ කෙළවරින් නිකුත් වන රැස් දහර බටහිර මුවවිටෙහි වැදිණි. මේ අයුරින් උතුරු දකුණු දිසාවන්හි එසවූ ධජ කෙළවරින් නිකුත් වන රැස් දහරවල් ප්‍රතිවිරුද්ධ දිසා මුවවිටෙහි වැදේ. පොළොවෙහි ඔසවන ලද ධජ

කෙළවර බඹ ලොව හැපෙයි. බඹ ලොව එසවූ ධජ කෙළවර පොළොවෙහි හැපෙයි. එසේම දස දහසක් සක්වළ මල් ගෙඩි හට ගන්නා ගස් වැල්හි මල් ගෙඩි හට ගත්හ. රුක් කඳන්හි ද මල් පිපුණහ. අතු රිකිළි ලිය වැල්වල මල් පිපුණේ ය. අහසෙහි එල්බෙන පියුම් පිපුණේ ය. ගල් තලා බිඳ ගෙන එක නටුවෙහි මල් සතක් සතක් වන සේ දඬු පියුම් පැන නැගිණි. දස දහසක් සක්වළ වට කොට ඇති මල් ගුළියක් මෙන් ද මනාව සකස් කළ මල් ඇතිරියක් මෙන් ද විය. සක්වළ තුනක් අතර පිහිටි කිසි ද ආලෝකයක් නොවැටෙන ලෝකාන්තරික නරකය ද සූර්‍ය්‍ය මණ්ඩල සතක් පෑයුවා සේ ආලෝකමත් විය. යොදුන් සුවාසූ දහසක් ගැඹුරු වූ කර දියෙන් පිරුණු මහා සමුද්‍රය මිහිරි රස ඇති පැන් බවට පත් විය. ඇල දොල ගංගා ගලා නොබැස්සාහ. ජාති අන්ධයෝ රූප දක්කාහ. ජාති ගොළුවෝ කථා කළහ. ජාති බිහිරෝ ශබ්ද ඇසූහ. උපතින් කොර වූවෝ දෙපයින් ගමන් කළහ. සිරගත වූවෝ බන්ධනවලින් නිදහස් වූහ. මෙසේ අපමණ සිරි සැපතින් පිදුම් ලබද්දී විවිධ අසිරිමත් දේ පහළ වෙද්දී මහ බෝසතාණන් වහන්සේ සර්‍වඥතා ඥානාධිගමනයෙන් සම්මා සම්බුද්ධත්වයට පැමිණ සියලු බුදුරජාණන් වහන්සේලා විසින් අත් නොහරින ලද ප්‍රීති වාක්‍ය පහළ කළ සේක.

**අනෙකජාතිසංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං,**
**ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං.**

භවයෙහි නැවත නැවත උත්පත්තිය යම් හෙයකින් දුකක් වේද, එහෙයින් ආත්මභාව සංඛ්‍යාත ගෙය සදන තෘෂ්ණාව නැමති වඩුවා සොයන මම යම් නුවණකින් ඔහු දකින්නට හැකි වේ ද, ඒ බෝධි ඥානාධිගමය පිණිස දීපංකර බුදුරජාණන් වහන්සේ පා මුලදී කරන ලද අභිනීහාර ඇත්තේ ම මෙතෙක් කල් මුළුල්ලෙහි නොයෙක් ජාති කෝටි සහස්‍ර යැයි කියන ලද සසර වැටෙහි ඒ බෝධි ඥානය නොලැබ ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් නැවත ඇවිද්දෙමි.

**ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි,**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසඞ්ඛතං,**
**විසඞ්ඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා**

"ආත්මභාවය නැමති මේ ගෙය කරන තෘෂ්ණාව නැමති වඩුව, සර්වඥතා ඥානය ප්‍රතිවේධ කරන මා විසින් දන් නුඹ ව දක්නා ලද්දෙහිය. නැවත ආත්මභාවය නැමති ගෙයක් නුඹ මට නොකරන්නෙහි ය. තාගේ සියලු කෙලෙස් නැමති පරාල නම් වූ ගෘහ උපකරණ මා විසින් සිඳ බිඳ දමන ලදි. තා කළ ආත්මභාව නැමති ගෙයෙහි අවිද්‍යා නැමති කැණිමඩල මා විසින් රහත් මග නුවණ නැමති පොරවෙන් පළා විසුරුවා හරින ලදි. දන් මාගේ සිත අරමුණු කිරීම් වශයෙන් නිවනට පිවිසියේ ය. තෘෂ්ණාවගේ ක්‍ෂය කිරීම යැයි කියන ලද රහත් ඵලයට පැමිණියෙමි" යැයි උදන ප්‍රීති වාක්‍යයක් පහළ කළේ ය. මෙය වනාහි බුදු මුවින් පිට වූ ප්‍රථම බුද්ධ වචනය වේ.

මෙසේ අප මහ බෝසතාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරාවට අතරක් නැර පිරුවා වූ සමත්‍රිංශත් පාරමිතා ගුණ බලයෙන් විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අරා වැඩ සිට සපරිවාර මාර පරාජය කොට ලොව්තුරා බුදු බවට පැමිණ වදාළ සේක.

මෙය අර්ථ වශයෙන් ගෙන සත්‍යක්‍රියා කොට සෙත් පැතීම මෙම ගාථාවෙන් ප්‍රකාශ කොට දක්වන්නේ ය.

**බාහුං සහස්ස මභිනිම්මිතසායුධං තං**
**ගිරිමෙඛලං උදිතඝොර සසෙන මාරං,**
**දනාදි ධම්ම විධිනා ජිතවා මුනින්‍දො**
**තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.**

දහක් තරම් අවිවලින් - දිලි අත් මවාලා
ගිරිමේකබලා ඇත් රජුන් - ගොර මාර සෙන් හා
දන් ආදි පාරමී බෙලෙන් - දිනු වීරයාණෝ
ඒ ආනුභාව බලයෙන් - සුව සෙත් සැදේවා.

# 2. ආළවක යක්ෂ දමනය

පෙර අලව් නුවර රාජ්‍යය කල ආළවක රජතුමා නොයෙක් නෘත්‍ය විඳීමාදිය හැර දමා සොර සතුරන් වැළැක්වීම පිණිසත් විරුද්ධ රජවරුන් වැළැක්වීම පිණිසත් ව්‍යායාම පිණිසත් සත් දිනකට වරක් මුව දඩයමෙහි යන්නේ ය. මේ අතර එක් දිනක් **"යම් කෙනෙකුන්ගේ පැත්තෙන් මුවෙකු පැන යයි ද ඔහුට ම ඒ මුවා අල්ලා ගැනීමට භාරය"** තම සේනාව සමග කතිකාවක් කර ගත්තේ ය. ඉන් පසු රජතුමා සිටි අසලින් ම මුවෙකු පැන ගියේ ය. රජතුමා ද ජව සම්පන්න බැවින් දුනු ර්තල ගෙන එම මුවා ලුහුබැඳ ගියේ ය. එම මුව විශේෂය තුන් යොදුනක් දිවීමට ජවය ඇති බැවින් තුන් යොදුනක් දුර දිව ගොස් ජලය ඇති තැනක නතර විය. ඉක්බිති රජතුමා ද මහත් ජව ඇති බැවින් තුන් යොදුනක් දුව ගොස් එසේ නතර වූ ඒ මුවා දෙකඩ කොට කපා මරා තමාට මාංශයෙන් ප්‍රයෝජන නැති වුවත් කතිකාව අනුව මුවා ගෙන ඒමට නොහැකි විය යන අපවාදයෙන් මිදෙනු පිණිස කදක් බැඳ රැගෙන එන අතර අළව් නගරයට ආසන්නයෙහි බොහෝ පත්‍රවලින් යුත් මහත් නුග ගසක් දැක වෙහෙස නිවා ගැනීම පිණිස එහි මුලට පැමිණියේ ය. එම නුග වෘක්ෂයෙහි සෙවනට මද්දහන වේලාවෙහි පැමිණෙන සතුන් අල්ලාගෙන කෑමට වෛශ්‍රවණ දිව්‍ය රාජයාගෙන් වරයක් ලැබ සිට ආළවක නම් යක්ෂයෙක් එම වෘක්ෂය විමානය කරගෙන වාසය කළේ ය. මේ ආළවක රජතුමා එම රුක් සෙවනට පැමිණි රජතුමා දැක ඔහු අල්ලාගෙන කෑමට ළඟට පැමිණියේ ය.

එකල්හි රජතුමා ආළවක යක්ෂයා අමතා **"මා මුදා හරව, මම නුඹට දවසක් පාසා මිනිසෙකු හා බත් සැළියක් එවන්නෙමි"** යැයි කීවේ ය. එවිට ආළවක යක්ෂයා **"නුඹ රජ සැපතින් ප්‍රමාද වී මෙය අමතක කර දමයි. මම මේ භවනයට නොපැමිණියවුන් හා වෛශ්‍රවණ දිව්‍ය රාජයාගෙන් අනුමැතිය නොලත් කිසිවෙකු කෑමට නොලබමි. එබැවින් මම නුඹ අත් නො හරිමි"** යැයි කීවේ ය. එවිට රජතුමා **"යක්ෂය, යම් දවසක මා විසින් නුඹට කිසිවෙකු නො එවන්නෙමි ද ඒ දවසෙහි මා මෙහි එමි. එදට නුඹ මා අනුභව කරව"** යැයි ගිවිසගෙන එම යක්ෂයාගෙන් නිදහස් වී නගරයට අභිමුඛව ගියේ ය.

බල සේනාව මඟ කඳවුරු බැඳ සිට රජතුමා දැක ඉදිරියට ගොස් **"කිම මහරජ හුදු අපකීර්තියට බියෙන් වෙහෙස වන්නාහු ද"** යැයි කියා රජු පිළිගත්හ. රජතුමා ඒ කිසිවක් නොකියා නගරයට ගොස් උදය බත අනුභව කොට නගරාරක්‍ෂකයා කැඳවා මේ කරුණ පැවසීය. එවිට නගරාරක්‍ෂකයා "කිම මහ රජතුමනි, කාල පරිච්ඡේදයක් වෙන් කරන ලද ද" යැයි ඇසුවේ ය. එකල්හි රජතුමා "එසේ කාල සීමාවක් වෙන් නොකරන ලද්දෙමි" යැයි කීවේ ය. එවිට නගරාරක්‍ෂකයා "මහ රජ, නුඹ වහන්සේ නුසුදුස්සක් කර ඇත. අමනුෂ්‍යයෝ වනාහි වෙන් කරනු ලැබූවෙකුම ලබති. වෙන් නොකළ කල්හි ජනපදයට හිරිහැර වන්නේය. **"දේවයන් වහන්ස, වේවා. අල්පෝත්සාහී වී එසේ කළේ වුව ද නුඹ වහන්සේ රජ සැප විඳිනු මැනවි. මම මෙහි දී කළ යුක්ත කරන්නෙමි"** යැයි කීවේ ය. ඉන් පසු දොරටුපාලයා කල් ඇතිව නැගිට බන්ධනාගාර දොරටුවෙහි සිට යම් යම් කෙනෙක් මරණ දඬුවම ලැබිය යුත්තෙක් වෙයි ද ඒ අය අමතා **"යමෙක් ජීවත් වීමට කැමැත්තෙහි නම් එළියට එව්"** යැයි කියයි. බන්ධනාගාරයෙන් කිසිවෙකු පිට වෙයි නම් ඔහු තම නිවසට කැඳවාගෙන ගොස් නහවා ආහාර අනුභව කිරීමට සලස්වා **"මේ බත් මුල යකුට දෙව"** යැයි කියා යවයි. ඔහු රුක් මුලට පැමිණි කල්හි ක්‍ෂණයකින් යක්‍ෂයා භ්‍රාන්ත සිරුරක් මවා අලයක් මෙන් ඔහු කා දමයි. ඒ යක්‍ෂයාගේ ආනුභාවයෙන් එම පුරුෂයාගේ කෙස් ලොම් ඇට ආදී සියල්ලම වෙඬරු පිඩක් මෙන් වේ. මෙසේ යක්‍ෂයාට බත් ගෙන ගිය මිනිස්සු එය දැක බියට පත්ව එම කාරණය තම මිතුරන්ට දැන්වූහ. එතැන් පටන් රජතුමා සොරුන් ගෙය යක්‍ෂයාට දෙයි යැයි මිනිස්සු සොරකම් නො කළහ. එයින් පසු කලෙක අලුත් සොරුන් නොමැති බැවින් ද පෙර විසූ සොරුන් අඩු වීමෙන් ද බන්ධනාගාරය හිස් විය.

ඉක්බිති නගරාරක්‍ෂකයා ඒ බව රජතුමාට දැන්වීය. එවිට රජතුමා **"කැමති කෙනෙක් ලෝභයෙන් ගතහොත් මැනවි"** යැයි ධනය නගර වීථීන්හි දැම්මවීය. එහෙත් කිසිවෙකු ඒවා දැක පයින් වත් ස්පර්‍ශ නොකළේ ය. ඉන් පසු නගරාරක්‍ෂකයා ඒ බව ඇමතිවරුන්ට දැන්වීය. එකල්හි අමාත්‍යවරු පවුල් පිළිවෙලින් එක් එක් මහල්ලෙකු යවමු. ඔවුහු ස්වභාවයෙන් ම මරණ මාවතේ සිටින්නේ ය යැයි කීවේ ය. එකල්හි ජනපද වාසීහු **"රජතුමා අපගේ සීයා යවති, අපගේ සීයා යවති"** යැයි කලබල කරන්නට වූහ. ඉන් පසු එය වැළැක්වූවේ ය. ඉක්බිති නගරාරක්‍ෂකයා "දේවයන් වහන්ස, එසේ නම් උඩුකුරු ව හෝනා

ළදරුවෙකු බැගින් යවමු. එබන්දෙකුට මේ මගේ මව, මේ මගේ පියා යැයි ස්නේහයක් නැත" යැයි කීවේය. රජතුමා එයට අනුමැතිය දුන්නේය. ඉන් පසු නගරාරක්‍ෂකයා දිනක් පාසා කුඩා ළදරුවෙකු බැගින් යැවී ය. එකල්හි නගර වැසි දරුවන් ඇති මව්වරුන් ද, ගර්භිණීහුද නුවරින් වෙනත් ජනපදයන්ට පැන ගොස් දරුවන් සාදගෙන පසුව පැමිණෙති. මෙලෙස දෙළොස් වසක් ගෙවී ගියේ ය. ඉන් පසු දිනක් මුළු නගරය ම පරීක්‍ෂා කොට ද එකම දරුවකු හෝ සොයා ගැනීමට නොලැබ "**දේවයන් වහන්ස, ඔබ වහන්සේගේ ආළවක කුමාරයා හැර වෙනත් කිසි දරුවෙකු නුවර නැත**" යැයි රජතුමාට දැන්වීය. එවිට රජතුමා "**යම් සේ මාගේ පුත්‍රයා ප්‍රිය වේ ද, එසේම සියලු ලෝකයාට තමාට වැඩි ප්‍රියයෙකු නැත, යව් ඔහු හෝ දී මාගේ ජීවිතය ආරක්‍ෂා කරව්**" යැයි කීවේය. ඒ වේලාවෙහි ආළවක කුමාරයාගේ මව කුමාරයා නහවා සරසා රෙදි දරණුවේ ඔතා ඇකයෙහි නිදි කරවමින් සිටියා ය. රාජ පුරුෂයෝ රජතුමාගේ අණින් එහි ගොස් රජ බිසව ද, දෙළොස් දහසක් කිරි මව්වරුන් ද වැලපෙද්දී කුමාරයා උදුරාගෙන හෙට දින යක්‍ෂයාගේ ආහාරය වන්නේය යැයි නික්ම ගියහ.

එදින භාග්‍යවතුන් වහන්සේ අලුයම අවදි ව උපස්ථායකයන් විසින් පිළිගැන්වූ දැහැටි වළඳා මුව ධෝවනය කරගෙන සැවැත් නුවර ජේතවනාරාමයේ මහා සුගන්ධ කුටියෙහි පෙරදිග බලා බද්ධ පයර්‍යංකයෙන් වැඩ හිඳ දෙළොස් කෝටි ලක්‍ෂ වාරයක් මහා කරුණාවට සම වැදී "**අද දින දස දහසක් ලෝක ධාතුන්හි මාගේ පිහිට ලැබීමට පූර්ව බුදු සසුන්හි දී පිළිවෙත් පිරූවන් ඇත් ද**" යැයි තමන් වහන්සේ වැඩ සිටින සුගන්ධ කුටි දොර පටන් දස දහසක් ලෝක ධාතුව කෙළවර දක්වා බුදු ඇසින් බලා වදාළ සේක. එසේ බලන තථාගතයන් වහන්සේට ආළවක කුමාරයාට අනාගාමී මාර්ග ඵල ලැබීමට ඇති වාසනාව හා ආළවක යක්‍ෂයාට සෝවාන් මාර්ග ඵල ලැබීමට ඇති වාසනාව ද, එම සමාගමයෙහි දී පවත්වන ධර්ම දේශනාව ශ්‍රවණය කොට සුවාසූදහසක් සත්වයන් මාර්ග ඵල නිවන් සුවයට පැමිණෙන බව ද දැක වදාළ සේක.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ඒ රැය පහන් වීමෙන් පසු පෙර බත් කිස නිමවා මැනවින් නිමවන ලද පසු බත් කිස ද ඇතිව අමාවක දින හිරු අවරට ගිය කල්හි හුදකලාව ම තමන් වහන්සේගේ පාත්‍ර චීවර ගෙන සැවැත් නුවරින් පිටත්ව පා ගමනින් ම තිස් යොදුන් මග ගෙවා

අළව් නුවරට වැඩ ආළවක යක්ෂයාගේ භවනයට වැඩි සේක. යම් සේ යක්ෂයෝ තම භවනය දකිත් ද භාග්‍යවතුන් වහන්සේ ද එම භවනය දකිති. භාග්‍යවතුන් වහන්සේ එම යක්ෂ භවනයෙහි දොරටුවෙහි සිටි සේක. එදින ආළවක යක්ෂයා හිමවත යක්ෂ සමාගමට ගියේ ය. ආළවක යක්ෂයාගේ "ගද්‍රභ" නම් දොරටුපාලයා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, විකාලයෙහි කුමක් නිසා වැඩි සේක් ද" යැයි ඇසුවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "ගද්‍රභය, එසේය පැමිණියෙමි. ඔබට බරක් නොවේ නම් අද රාත්‍රියෙහි ආළවක යක්ෂයාගේ භවනයෙහි වාසය කරමි" යැයි වදාළ සේක.

එවිට ගද්‍රභ යක්ෂයා "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට නම් කිසි බරක් නැත. එහෙත් ඒ ආළවක යක්ෂයා කර්කශය. පරුෂය. මව්පියන්ට ද වැඳීමාදියක් නොකරයි. එබැවින් භාග්‍යවතුන් වහන්සේට මෙහි විසීම රුචි නොවේවා" යැයි කීවේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "ගද්‍රභය, මම ඔහුගේ කර්කශ බව දනිමි. මට කිසිඳු අන්තරායක් නොවන්නේ ය. ඉදින් ඔබට අපහසුවක් නොවන්නේ නම් මෙහි එක් රැයක් වසමි" යැයි වදාළ සේක. දෙවනුව ද ගද්‍රභ යක්ෂයා භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට නම් කිසි බරක් නැත. එහෙත් ඒ ආළවක යක්ෂයා ගින්නෙන් රත් කළ කබලක් සමානය. මව්පියෝ ය කියා හෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ය කියා හෝ ධර්මය කියා හෝ නොදනී. මෙහි පැමිණි අයගේ සිත් වියරු බවට පමුණුවයි. හෘදය පවා පලයි. පාදයන්ගෙන් ගෙන සමුද්‍රයෙන් පරතෙරට හෝ පිට සක්වළට විසි කරයි" යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "ගද්‍රභය, මම එය දනිමි. නුඹට බරක් නොවේ නම් මම මෙහි එක් රැයක් වාසය කරන්නෙමි" යැයි තෙවනුව ද වදාළ සේක. එකල්හි ගද්‍රභ යක්ෂයා "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට නම් බරක් නැත. එසේ වුවත් ඒ යක්ෂයා තමාට නොදන්වා මෙහි වාසය පිණිස අනු දැනීම හේතුවෙන් මා ජීවිතයෙන් තොර කරනු ඇත. එබැවින් ස්වාමීනි මම ඔහුට මෙය දන්වමි" යැයි කීවේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "ගද්‍රභය නුඹ කැමති පරිදි දන්වව" යැයි වදාළ සේක. ඉක්බිති ගද්‍රභ යක්ෂයා "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එසේ නම් භාග්‍යවතුන් වහන්සේ විසින් කළ යුත්ත දැන වදාරණ සේක්වා" යැයි කියා වැඳ අවසර ගෙන හිමවත බලා ගියේය.

භාග්‍යවතුන් වහන්සේ ආළවක යක්‍ෂයාගේ භවනයට ඇතුල් වීමට සිතත් ම ඉබේම එහි දොර විවර වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ යක්‍ෂ භවනට පිවිස ආළවක යක්‍ෂයා තම මංගල දින ආදියෙහි අසුන් ගෙන සිරිය විඳින දිව්‍යමය වූ රත්නමය පර්‍යංකයෙහි වැඩ හිඳ ස්වර්‍ණමය බුද්ධ රශ්මි මාලාවක් විහිදුවා ලූ සේක. ඒ බුද්ධ රශ්මි මාලාව දුටු ආළවක යක්‍ෂයාගේ ස්ත්‍රීහු පැමිණ භාග්‍යවතුන් වහන්සේ පිරිවරා හිඳ ගත්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ එම ස්ත්‍රීන් අමතා "**නුඹලා පෙර භවයන්හි දන් දී සිල් සමාදන් වී පිදිය යුත්තන් පුද කළ කුසල් හේතුවෙන් දුන් මේ සැපතට පත් වූවාහු ය. එබැවින් දැනුදු එසේ කුසල් කරව්, එකිනෙකා කෙරෙහි ඊර්ෂ්‍යායාවෙන් මසුරුකමින් මැඩී නොහැසිරෙව්**" යනාදී වශයෙන් ධර්‍ම කථාවක් කොට වදාළ සේක. එම යක්‍ෂ ස්ත්‍රීහු භාග්‍යවතුන් වහන්සේගේ අෂ්ටාංග සමන්වාගත බ්‍රහ්ම ස්වර විහිදුවා වදාළ මිහිරි වදන් අසා පැහැද දහස් ගණන් වාර සාධුකාර පවත්වා භාග්‍යවතුන් වහන්සේ පිරිවරා වාඩි වී සිටියහ.

ගද්‍රභ යක්‍ෂයා හිමවතට ගොස් ආළවක යක්‍ෂයා හමුව "**නිදුකාණනි, නුඹගේ විමානයෙහි ශ්‍රමණ ගෞතම බුදුරජාණන් වහන්සේ වැඩ සිටිති**" යැයි කීවේ ය. එකල්හි ආළවක යක්‍ෂයා එහි සිටි යක්‍ෂ සමූහයා මධ්‍යයෙහි පුරුෂ මානයෙන් ලැජ්ජාවට පැමිණ කිසිවක් නොකියා ගද්‍රභ යක්‍ෂයා දෙස බලා "**නිශ්ශබ්ද වෙව, මම එහි ගොස් කළ යුත්ත කරන්නෙමි**" යැයි සඥ්ඥාවක් කළේ ය.

එකල්හි සාතාගිර හේමවත යන යක්‍ෂයින් දෙදෙනා සැවැත් නුවර ජේතවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ ධර්‍මය ශ්‍රවණය කොට සපිරිවරින් නොයෙක් යානයන්ගෙන් හිමවත බලා ආකාශයෙන් ගමන් කරමින් සිටියහ. ආකාශයෙහි සියලු තැන් ගමන් මාර්‍ගය නොවේ. ආකාශයෙහි පිහිටි දේව යක්‍ෂ විමාන මග හැර යා යුතු ගමන් මාර්‍ගය පිහිටියේ ය. ආළවක යක්‍ෂයාගේ විමානය වනාහි බිම පිහිටියේ ය. එය වනාහි ප්‍රාකාරයන්ගෙන් වටව මැනවින් රැකවල් යෙදූ මනාව සරසන ලද දොර හා මුර ගෙවල් දොර කොටු ආදියෙන් යුක්තය. මුදුනෙහි රන් දැලකින් වසන ලද්දේ ය. තුන් යොදුනක් උසය. එම ආළවක යක්‍ෂයාගේ භවනයට ඉහළින් යක්‍ෂයන්ගේ ගමන් මාර්‍ගය විය. සාතාගිර හේමවත දෙදෙනා ආකාශයෙන් යමින් සිටියේ එම ප්‍රදේශය ඉක්මවා යාමට නොහැකි විය. යම් තැනක භාග්‍යවතුන් වහන්සේ වැඩ

සිටින සේක් නම් එම ස්ථානයට ඉහළින් භවාග්‍රය දක්වා කිසිවකුටත් යා නොහැක. ඔවුහු මේ කිමෙක් ද යැයි විමසා බලන විට භාග්‍යවතුන් වහන්සේ දැක අහසට විසි කළ දඬු මුගුරු ආදියක් නැවත පොළොවටම පතිත වන්නා සේ ආකාශයෙන් බැස භාග්‍යවතුන් වහන්සේ වැඳ ධර්ම ශ්‍රවණය කොට ප්‍රදක්ෂිණා කොට **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, හිමවත යක්ෂ සමාගමට යන්නෙමු"** යැයි කියා රත්නත්‍රයට ප්‍රශංසා කොට නික්ම ගියහ. ආළවක යක්ෂයා එන්නා වූ සාතාගිර හේමවත යක්ෂයින් දෙදනා දැක හුන් අසුනෙන් නැඟිට පසුපසට ගොස් ඉඩ ලබා දුන්නේ ය. ඉක්බිති සාතාගිර හේමවත දෙදෙනා එහි අසුන් ගෙන ආළවක යක්ෂයා අමතා **"ආළවකයනි, නුඹට මහත් ලාභයකි. ඔබගේ විමානයෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටිති. ඇවැත්නි ගොස් භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරව"** යැයි දැන්වූහ.

ශ්‍රද්ධාව නැති කෙනෙකුන්ට ශ්‍රද්ධාව පිළිබඳව කරන කථා නුසුදුසු නපුරු කථා ලෙස හැඟෙයි. දුසිල්වන්තයෙකුට සීලාදිය පිළිබඳව කරන කථා නුසුදුසු නපුරු කථා ලෙස හැඟෙයි. එසේම සාතාගිර හේමවත යක්ෂයින් ඒ යක්ෂ සමාගමයෙහි දී පිරිස මැද කළ භාග්‍යවතුන් වහන්සේට කළ පැසසුම් අසා ගින්නෙහි දමන ලද ලුණු කැටයක් මෙන් හද තුළ ඇවිළෙන කෝපයෙන් වෙවුලමින් ගැහෙමින් **"මාගේ විමනට පිවිස ඇතැයි කියන ඒ ගෞතමයෝ නම් තැනැත්තා කවරෙක් ද"** යැයි ඇසුවේ ය. එවිට සාතාගිර **"ඇවැත්නි ආළවකය, අපගේ ශාස්තෲන් වහන්සේ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ ඔබ නොදන්නෙහි ද?"** යැයි කියා මහ බෝසතාණන් වහන්සේ තුසිත දෙව්ලොව සිට බුදු බව ලැබීම පිණිස මෙලොව පිළිසිඳ ගත් තැන් පටන් උත්පත්තිය, මහාභිනිෂ්ක්‍රමණය, මාර පරාජය කොට ලොව්තුරා බුදු බවට පැමිණීම, බ්‍රහ්මාරාධනය පිළිගෙන බරණැස ඉසිපතනයට වැඩ පස්වග තවුසන්ට දහම් දෙසූ සේක. එම දේශනාව අසා කොණ්ඩඤ්ඤ තාපස තුමා සෝවාන් ඵලයට පත්ව ඒහි භික්ෂු භාවයෙන් පැවිදි විය. අටලොස් කෝටියක් බ්‍රහ්මයෝ රහත් වූහ. අසංඛ්‍ය බැගින් දෙවියෝ සෝවාන් ආදී යට මාර්ගයන්ට පත් වූහ. **"ඇවැත්නි, නුඹ මේ පුදුම අසිරිය නොදුටුවෙහි ද?"** යැයි දෙස් නැගූහ.

එකල්හි ආළවක යක්ෂයා එම අසිරිය දැක තිබුණ ද, කෝපය නිසා නොදුටු බව කීවේ ය. එවිට හේමවත යක්ෂයා "ඇවැත්නි

ආළවකය, "ඇවැත්නි ආළවකය, නුඹ ඒ අසිරිය දුටුව ද නොදුටුව ද නුඹට එහි ඇති ඵලය කුමක් ද, නුඹ දැන් අපගේ ශාස්තෲන් වහන්සේට කුමක් කරන්නෙහි ද? ඒ භාග්‍යවතුන් වහන්සේ හා සම කරන විට නුඹ සෙලවෙන මොල්ලියක් ඇති මහ ගොනෙකු ළඟ එදින උපන් ළදරුවෙකු වැනිය. තුන් පොලකින් මද වැගිරෙන මත් ඇතෙකු ළඟ කුඩා කුකුළු පැටියෙකු වැනිය. බබළමින් පහළට වැටෙන කෙසුරුවලින් ගැවසුණු මනරම් සිරුරැති සිංහ රාජයෙකු ළඟ කැනහිලෙකු වැනිය. එකසිය පනස් යොදුන් වට සිරුරැති ගුරුළු රාජයෙකු ළඟ පියාපත් සිඳුණු කුරුලු පැටියෙකු වැනිය. යව, නුඹට කළ හැකි දෙයක් වෙතොත් කරව" යැයි කීවේ ය. හේමවත යක්‍ෂයා මෙසේ කී කල්හි ආළවක යක්‍ෂයා කිපී නැගිට මනෝසිලා තලයෙහි වම් පාදය තබා "මහත් ආනුභාව ඇත්තේ නුඹලාගේ ශාස්තෘ වූ බුදුන්ට ද, නැති නම් මට ද යැයි බලව්" යැයි කියා සැට යොදුනක් පමණ වූ කෛලාශ කූට පර්වතයට මහත් කුළුගෙඩියකින් ගසන්නාක් මෙන් දකුණු පාදයෙන් පහර දී එහි පතුරු ගලවා "මම ආළවක" යැයි මහත් හඬින් හඬ නැගීය. එම ශබ්දය මුළු ජම්බුද්වීපය පුරා පැතිර ගියේ ය. මෙසේ සියලු ජම්බුද්වීපයට ඇසුණු ශබ්ද සතරක් වෙති. ඒවා මෙසේ ය.

- ✠ පූර්ණක නම් යක්‍ෂ සේනාපතියා ධනඤ්ජය කෝරව්‍ය රජතුමාගේ සූදුව දිනා අත්පොළොසන් දී මම දිනුවෙමි යැයි කළ හඬ සියලු දඹදිව පැතිර ගියේ ය.

- ✠ කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ ශාසනය පිරිහීගෙන යන කාලයෙහි එය දුටු දෙදෙව් දෙව් ලොවට අධිපති වූ ශක්‍ර දේවේන්ද්‍රයා විසින් විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා සුනඛ වේශයෙන් යවා "මම පාපී වූ අධර්මවාදී අවිනයවාදී භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් සියලු දෙනා කමි" යැයි කියා කළ උද්ඝෝෂණය සියලු දඹදිව පැතිර ගියේ ය.

- ✠ කුස ජාතකයෙහි කුස රජතුමා හැර නැවත සාගල නුවරට ගිය පභාවතී කුමරිය නිසා රජවරු සත් දෙනෙක් පැමිණ නගරය වට කළ කල්හි කුස රජතුමා පභාවතී කුමරිය ඇතු පිට නංවාගෙන නගරයෙන් නික්ම "කුස රජු නම් මමය" යැයි කළ මහා නාදය සියලු දඹදිව පැතිර ගියේ ය.

✠ ආළවක යක්ෂයා කෛලාශ කූට පර්වතයට මහත් කුළුගෙඩියකින් ගසන්නාක් මෙන් දකුණු පාදයෙන් පහර දී එහි පතුරු ගලවා "මම ආළවක" යැයි මහත් හඬින් හඬ නැගීය. එම ශබ්දය මුළු ජම්බුද්වීපය පුරා පැතිර ගියේ ය. එකල්හි සියලු දඹදිව දෙර දෙර සිට මහ හඬ නැගුවා සේ විය. එම යක්ෂයාගේ ආනුභාවෙන් තුන් දහසක් යොදුන් පැතිරී පවත්නා හිමාලය කම්පා විය.

ඉන් පසු ආළවක යක්ෂයා ඒ ශ්‍රමණ ගෞතමයන් මෙයින් ම පලවා හරින්නෙමි යැයි මහත් වායු මණ්ඩලයක් හට ගැන්වීය. එම වායු වේගය පෙරදිග ආදී වශයෙන් පැන නැගී අඩ යොදුන්, යොදුන් දෙයොදුන්, තුන් යොදුන් පමණ පර්වත කූට පලමින් වන පැළෑටි වෘක්ෂ ලතා ආදිය උදුරමින් වහල සෙවිලි අහසෙහි පා කරමින් අළව් නුවරට අභිමුඛව පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ එයින් කිසිවකුටත් අන්තරායක් නොවේවා යැයි අධිෂ්ඨාන කළ සේක. එම වාතය පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ සිවුරු කොනක් හෝ සෙලවීමට සමත් නොවීය.

ඉන් පසු යක්ෂයා ජලයෙන් යට කොට ශ්‍රමණයා මරමි යැයි මහත් වර්ෂාවක් හට ගැන්වීය. යක්ෂානුභාවෙන් ආකාශයෙහි වලා පටල සියය දහස ආදී වශයෙන් එක්රැස් වී එක පිට එක නැගී වසින්නට පටන් ගත්තේ ය. ඒ වැසි දහර හේතුවෙන් පෘථිවිය සිදුරු විය. ඒ මහා ජල ඕඝය වෘක්ෂ පර්වත ආදිය යට කොට පැමිණි නමුත් භාග්‍යවතුන් වහන්සේගේ සිවුරු කොනක් හෝ තෙමීමට අසමත් විය.

ඉන් පසු ගල් වර්ෂාවක් ඇති කළේ ය. එයින් මහත් මහත් වූ පර්වත කූට දුම් දමමින් දිදුලමින් අහසින් පැමිණ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දිව්‍යමය මල් පොකුරු බවට පැමිණ පතිත විය.

ඉන් පසු ආයුධ වර්ෂාවක් වැස්සවිය. එක් පැත්තක මුවහත ඇත්තා වූ ද, දෙපැත්තෙහි ම මුවහත ඇත්තා වූ ද කඩු සැත් (පිහි) ඊතල ආදිය දුම් දමමින් ගිනි ඇවිළෙමින් අහසින් අවුත් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දිව්‍යමය මල් පොකුරු මෙන් වී පතිත විය.

ඉක්බිති ගිනි අඟුරු වර්ෂාවක් නංවාලීය. එරබදු මල් පැහැති රතු වන් වූ ගිනි අඟුරු අහසින් අවුත් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දිව්‍යමය මල් මෙන් විසිර ගියහ.

ඉන් පසු උණු අළු වර්ෂාවක් ඇති කළේ ය. ඉතා උණුසුම් වූ උණු අළු අහසින් ඇවිත් භාග්‍යවතුන් වහන්සේ පාමුල සඳුන් සුණු බවට පත්ව බිම පතිත විය.

ඉන් පසු වැලි වර්ෂාවක් වැස්සීය. ඉතා සියුම් වූ වැලි දුම් දමමින් ගිනි ඇවිළෙමින් අහසින් අවුත් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දිව්‍යමය මල් මෙන් විසිර ගියහ.

ඉන් පසු මඩ වර්ෂාවක් වැස්සීය. ඒ මඩ දුම් දමමින් ගිනි ඇවිළෙමින් අහසින් අවුත් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි සුවඳ සඳුන් කලල් බවට පත්ව බිම පතිත විය.

ඉන් පසු මේ ශ්‍රමණයා බිය ගන්වා පලවා හරින්නෙමි යැයි මහා අන්ධකාරයක් මවාලීය. චතුරංග සමන්වාගත රාත්‍රියක් මෙන් වූ ඒ මහා ඝන අන්ධකාරය බෝසතාණන් වහන්සේ වෙත පැමිණ සූර්‍යයාලෝකයෙන් අඳුර දුරු වන්නාක් මෙන් අතුරුදහන් විය.

මෙසේ ආළවක යක්ෂයා **සුළං වර්ෂාවක්, ජල වර්ෂාවක්, ගල් වර්ෂාවක්, ආයුධ වර්ෂාවක්, අඟුරු වර්ෂාවක්, උණු අළු වර්ෂාවක්, වැලි වර්ෂාවක්, මඩ වර්ෂාවක්, අන්ධකාර වර්ෂාවක්** යන නවවිධ වර්ෂාවක් වැස්සුවද භාග්‍යවතුන් වහන්සේ පලවා හැරීමට නොහැකිව නොයෙක් ආකාර වූ විසුළු පෙනුමෙන් යුත් භූතයන් පිරිවරා සිවුරඟ සෙනග සමග භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගියේ ය. ඒ භූත පිරිස නොයෙක් ආකාර වෙස් මවා පාමින් **"අල්ලා ගනිව්, වනසව්"** ආදිය කියමින් භාග්‍යවතුන් වහන්සේට ඉහළින් පැමිණෙන්නාක් මෙන් විය. එහෙත් රත් කර පිරිසිදු කරන ලද ලෝහ පිඬක මැස්සන් නොවසන්නාක් මෙන් ඒ කිසිවකුට භාග්‍යවතුන් වහන්සේට ළං වීමට නොහැකි වූහ.

මහ බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණි වෙසක් පොහෝ දින අභියෝගයට පැමිණි වසවත් මාර දිව්‍ය පුත්‍රයා සපිරිවරින්

පැමිණ පරාජය වී මොහොතකින් නික්ම ගියහ. එහෙත් මේ ආළවක යක්ෂයා එසේ නො ගොස් රාත්‍රියෙන් අඩක් පමණ නොයෙක් වෙස් මවා පාමින් නොයෙක් දේ කරමින් භාග්‍යවතුන් වහන්සේට හිංසා කිරීමට උත්සාහ කළ නමුත් භාග්‍යවතුන් වහන්සේ සොලවාලීමට ද සමත් නොවී ය. ඉන් පසු ආළවක යක්ෂයා "**ඉදින් මම කිසිවෙකු විසින් හෝ ජය ගත නොහැකි දූස්සායුධය මේ ශ්‍රමණයා වෙත මුදා හරින්නේ නම් මැනව**" යැයි සිතුවේ ය.

ලොව ශ්‍රේෂ්ඨ ආයුධ සතරක් වෙති. එනම් **ශක්‍ර දේවේන්ද්‍රයාගේ වජ්‍රායුධය, වෛශ්‍රවණ දිව්‍ය රාජයාගේ ගදායුධය, යම රජුගේ නයනායුධය, හා ආළවක යක්ෂයාගේ දූස්සායුධය** යන මේ සතර ය.

✠ ශක්‍ර දේවේන්ද්‍රයා කිපී වජ්‍රායුධය මහා මේරුව මතුයෙහි දමා ගසන ලද්දේ නම් අටසැට දහසක් යොදුන් උසැති මහාමේරු පර්වතය විනිවිද යන්නේ ය. ගිලා බැස්සාක් මෙන් මහා මේරුව යටට බසින්නේ ය.

✠ වෛශ්‍රවණ දිව්‍ය රාජයා පෘථග්ජන කාලයෙහි කුපිත වී දමා ගසන ලද ගදායුධය දහස් ගණන් යක්ෂයින්ගේ හිස් පලා හෙළා නැවත තමන් සමීපයට පැමිණෙයි.

✠ යම රජු විසින් කිපී නයනායුධය (පාරා වළල්ල) දෙස බැලූ කල්හි දහස් ගණන් කුම්භාණ්ඩයින් රත් වූ කබලක දැමූ තල පුපුරන්නා සේ වැනසී යති.

✠ ආළවක යක්ෂයා කිපී දූස්සායුධය අහසට මුදා හළහොත් දොළොස් වසක් වැසි නොවසී. පෘථිවියට මුදා හළ හොත් සියලු ගස් තෘණ ආදිය වියලී ගොස් දොළොස් වසක් යන තෙක් නැවත ඒවා නොවැඩෙයි. එය සමුද්‍රයට මුදා හරී නම් රත් වූ කබලක දැමූ ජල බින්දු මෙන් සියලු සමුද්‍ර ජලය සිඳී යයි. මහාමේරු පර්වතය වැනි පර්වතයකට ගැසුව හොත් එය සුනු විසුනු වී විසිර යයි.

ආළවක යක්ෂයා මෙබඳු ආනුභාව සම්පන්න දූස්සායුධය දමා ගසන්නට සූදනම් ව අතට ගත්තේ ය. ඒ මොහොතෙහි දස දහසක් ලෝකධාතු වැසි අප්‍රමාණ දෙවියෝ "**අද භාග්‍යවතුන් වහන්සේ ආළවක**

**දමනය කරන්නාහ. අපි එහි දී දහම් අසන්නෙමු"** යැයි වහා රැස් වූහ. ඇතැම් දේවතාවෝ යුද්ධය දැකීමට කැමති ව එහි රැස් වූහ. මුළු අහස් තලය ම දේවතාවන්ගෙන් පිරී ගියේය.

ඉක්බිති ආළවක යක්ෂයා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් එහා මෙහා ඇවිද දුස්සායුධයෙන් දමා ගැසීය. එය හෙන පුපුරන්නාක් මෙන් බිය උපදවන හඬ නංවමින් දුම් දමමින් ගිනි ඇවිළෙමින් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ යක්ෂයාගේ උඩඟු බව මඩිනු පිණිස පා පිස්නා රෙදි කඩක් මෙන් ශ්‍රී පාද මූලයෙහි වැටිණ. එය දුටු ආළවක යක්ෂයා අං සිඳුණ ගොනෙකු මෙන්, දළ උදුරා දැමූ සර්පයෙකු මෙන් වී තෙද සිඳී, බල රහිත වී ගොස් මානය නම් කොඩිය පහත හෙලන ලදුව **"දුස්සායුධය ද ශ්‍රමණයා මැඩීමට නො සමත්ය, එයට හේතු මොනවාද"** යැයි සිතුවේ ය. එවිට ආළවක යක්ෂයාට **"මේ ශ්‍රමණයා මෙත් සිතින් වාසය කරයි. එබැවින් කෝප ගන්වා මෙත් සිත ඉවත් කරමි"** යැයි සිතා **"නික්කම සමණ"** යනුවෙන් **"ශ්‍රමණය, කුමක් නිසා මාගේ අනු දැනීමකින් තොරව මගේ විමනට පිවිස ගෙහිමියා මෙන් ගැහැණුන් වසන තැනට වී හුන්නෙහි ද? නුඹුන් දෙය පරිහරණය කිරීමට හා ගැහැණුන් සමග එක්ව විසීමට මහණෙකුට සුදුසු වේ ද? ශ්‍රමණය, ඔබට මහණකමක් ඇත්තේ නම් නික්ම යව"** යැයි කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"කෝපයෙන් පිරුණු තැනැත්තෙකු කෝප වීමෙන් හික්මවිය නොහැකිය. නැවත ඔහු සමග කෝප වීම වනාහි සැඩ පරුෂ සුනඛයෙකුගේ නාසයෙහි පිත ඉව වැටුණු විට වූ වඩාත් අධික ලෙස චණ්ඩ වීම දැඩි වීම ද වේ. එබැවින් මෘදු බැවින් ම මොහු දමනය කිරීමට හැකි වෙයි"** යැයි දැන **"සාධු ආවුසො"** යනුවෙන් **"මැනවි ඇවැත්නි"** යැයි පිළිවදන් දී නික්මුණු සේක.

එවිට ආළවක යක්ෂයා **"මේ ශ්‍රමණයා සුවච කීකරු කෙනෙකි, එක් වචනයෙන් ම නික්මුණේ ය. මෙසේ පහසුවෙන් හික්මවිය හැකි ශ්‍රමණයා කෙරෙහි මම අකාරණයෙහි සියලු රෑ යුද්ධ කළෙමි"** යැයි මොලොක් සිත් ඇතිව **"මේ ශ්‍රමණයා සුවච භාවයෙන් නික්මුණේ ද, නැති නම් ක්‍රෝධයෙන් නික්මුණේ ද යැයි විමසා බැලිය යුතුය"** යැයි සිතා නැවත ද **"පවිස සමණ"** යනුවෙන් **"ශ්‍රමණය විමන ඇතුළට පිවිසෙව"** යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ ආළවක යක්ෂයාගේ

අදහස දන **"සාධු ආවුසො"** යනුවෙන් **"එසේය ඇවැත්නි"** යැයි කියා විමන තුළට පිවිසි සේක. නැවත ද ආළවක යක්ෂයා භාග්‍යවතුන් වහන්සේගේ සුවච බව විමසනු පිණිස දෙවන වර ද, තෙවන වර ද එසේම කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහුගේ අදහසට අවනතව එසේ ම කළ සේක.

භාග්‍යවතුන් වහන්සේ **"ඉදින් මම මේ යක්ෂයා විසින් කී දේ නොකරන්නෙහි නම් ස්වභාවයෙන් ම දරදඬු වූ ඔහුගේ සිත තවත් දරදඬු වී ධර්ම කථාවට ඇහුම්කම් නො දෙන්නේ ය. යම් සේ මවක් විසින් හඬන දරුවාට කැමති දෙයක් දී අවනත කර ගනී ද, එසේම කෙලෙස් හැඬීමෙන් හඬන යක්ෂයා සනසවන්නෙමි"** යැයි සිතා ඔහු කී දෙය කළ සේක. එසේ ම කිරි මවක් විසින් කිරි නොබොන දරුවාට යමක් දී සුරතල් කරවා කිරි පොවයි ද, එසේ ම භාග්‍යවතුන් වහන්සේ යක්ෂයාට ලෝකෝත්තර ධර්ම නමැති කිරි පෙවීමට ඔහු විසින් කැමති වූ දේ සිදු කොට ඔහු සනසවනු පිණිස මෙසේ කළ සේක. තව ද යම් සේ පුරුෂයෙකු ලබු කබලක චතුමධුර පුරවනු කැමති ව එය සෝදයි ද, එසේම භාග්‍යවතුන් වහන්සේ ආළවක යක්ෂයාගේ සිතෙහි ලෝකෝත්තර ධර්ම නමැති චතුමධුර පුරවනු කැමති ව ඔහුගේ අභ්‍යන්තරයෙහි පැවති ක්‍රෝධ මල සේදීම පිණිස තෙවන වර දක්වා පිටතට නික්මීම හා ඇතුළට පිවිසීම කළ සේක.

ඉක්බිති ආළවක යක්ෂයා **"මේ ශ්‍රමණයා ඉතා කීකරු ය. නික්මෙව යැයි කී කල්හි නික්මෙයි. පිවිසෙව යැයි කී කල්හි පිවිසෙයි. ඉදින් මම මේ ශ්‍රමණයා මුළු රැයම වෙහෙස කරවා දෙපයින් ගෙන ගඟෙන් එතරට විසි කරන්නෙම් නම් මැනව"** යැයි පවිටු සිතුවිල්ලක් උපදවා සිව්වැනි වාරයෙහි ද **"නික්ඛම සමණ"** යනුවෙන් **"ශ්‍රමණය පිටතට නික්මෙව"** යැයි කීවේ ය. ආළවක යක්ෂයාගේ සිතෙහි හටගත් ඒ පවිටු සිතුවිල්ල දන්නා වූ භාග්‍යවතුන් වහන්සේ **"නඛ්වාහං තං නික්ඛමිස්සාමි"** ඇවැත්නි නුඹගේ සිතෙහි හටගත් පවිටු සිතුවිල්ල දන ගත්තෙමි, එබැවින් මම නො නික්මෙන්නෙමි. **"යං තෙ කරණීයං තං කරොහි"** "එබැවින් නුඹ විසින් යමක් කිරීමට සිතන්නෙහි නම් එය කරව" යැයි වදළ සේක.

මේ ආළවක යක්ෂයා මින් පෙර ද ඔහුගේ භවනට ඉහළින් යන ඍද්ධිමත්හු මේ මනරම් භවන දැක **"මෙය ස්වර්ණ විමානයක් ද, රිදී විමානයක් ද, මැණික් විමානයක් ද කියා බලන්නෙමු"** යැයි ආකාශයෙන් බැස තමාගේ විමානයට පැමිණි ඍද්ධි සම්පන්න තාපසයන්ගෙන් ප්‍රශ්න අසා විසඳීමට නොහැකි වූ කල්හි සිත ව්‍යාකුල කරවා වෙහෙසට පත් කරයි. එහෙයින් එදින භාග්‍යවතුන් වහන්සේ ද වෙහෙසට පත් කරන්නෙමි යැයි යන සිතින් යුක්තව **"පඤ්හං තං සමණ පුච්ඡාමි. සචෙ මෙ න ව්‍යාකරිස්සසි චිත්තං වා තෙ ඛිපිස්සාමි, හදයං වා තෙ පාලෙස්සාමි, පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගං ඛිපිස්සාමි"** යනුවෙන් **"ශ්‍රමණය, මම නුඹගෙන් ප්‍රශ්න අසන්නෙමි. ඉඳින් ඒ ප්‍රශ්න නොවිසඳන්නෙහි නම් නුඹගේ සිත වික්ෂේපයට පමුණුවමි. නැතිනම් නුඹගේ හදවත හෝ පලමි. එසේත් නැතිනම් නුඹගේ දෙපාවලින් ගෙන ගඟෙන් එතෙරට විසි කරමි"** යැයි කීවේ ය.

මේ ආළවක යක්ෂයාගේ මව්පියෝ මේ මහා භද්‍ර කල්පයෙහි තුන් වෙනි අන්තර් කල්පයෙහි ලොව පහළ වී වදාළ කාශ්‍යප දසබලධාරී සම්මා සම්බුදු රජාණන් වහන්සේට උපස්ථාන කොට විසඳුම් සහිතව ප්‍රශ්න අටක් ඉගෙන ගත්හ. ඔවුහු ඒ ප්‍රශ්න මේ ආළවක යක්ෂයා ළදරු කාලයෙහි ඔහුට ද ඉගැන්වූහ. කල් යාමේ දී ඔහුට ඒවා අමතක විය. එබැවින් ඒ ප්‍රශ්න අභාවයට නොයනු පිණිස රන් පටක රත් සිරියලින් ලියවා විමානයෙහි තැබීය. මෙම ප්‍රශ්න බුදුරජාණන් වහන්සේ උගන්වා වදාළ ප්‍රශ්න බැවින් ඒවා බුද්ධ විෂයට ම අයත් ය. අන්‍යයන්ට විෂය නොවේ.

මේ සියලු කාරණාවන් සියල්ල දැන වදාළ භාග්‍යවතුන් වහන්සේ ආළවක යක්ෂයාගේ ඒ කීම අසා භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයට හෝ භාග්‍යවතුන් වහන්සේ වෙනුවෙන් ලැබෙන සිවුපස ප්‍රත්‍ය ලාභයට හෝ සර්වඥතා ඥානයට හෝ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ට හෝ ව්‍යාමප්‍රභා කේතුමාලාලංකාරාදී බුද්ධ රශ්මි මණ්ඩලයට හෝ කිසිවකුටත් අන්තරායක් නොකළ හැකි බැවින් ලොවට අසමාන බුද්ධානුභාවය දක්වන සේක් **"න ඛ්වාහං ආවුසො පස්සාමි, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මක සස්සමණ බ්‍රාහ්මණියා යො චිත්තං වා ඛිපෙය්‍ය, හදයං වා පාලෙය්‍ය, පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගායං වා ඛිපෙය්‍ය"** යනුවෙන් **"ඇවැත්නි, යමෙක් මාගේ සිත කලඹන්නේ හෝ**

**හෘදය පළන්නේ හෝ පාදයෙන් ගෙන මහ ගඟින් එතර දමන්නේ හෝ වේ ද, එබන්දකු දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, බමුණන් සහිත ලොව දේව මනුෂ්‍ය ප්‍රජාවෙහි මම නොදකිමි**" යැයි වදරා නැවත ද "**අපි ච ඤං ආවුසො පුචඡ යද කඞ්ඛසි**" යනුවෙන් "**එසේ වුව ද, ඇවැත්නි, නුඹ යමක් අසනු කැමත්තෙහි ද එය අසව. ප්‍රශ්න විසඳීමෙහිලා මට බරක් නැත. සියල්ල නුඹට විසඳ දෙන්නෙමි**" යැයි සර්වඥ පවාරණයෙන් පැවරූ සේක.

පසේ බුදුරජාණන් වහන්සේලා හා අග්‍ර ශ්‍රාවක මහා ශ්‍රාවක රහතන් වහන්සේලාට මෙය අවිෂය ය. (මෙසේ පැවරීම කළ නොහැකි වෙති). පසේ බුදුරජාණන් වහන්සේලා සහ රහතන් වහන්සේලා කැමති නම් අසන්න යැයි නොකියා ඇසූ කල්හි විසඳමි යැයි කියති.

ඉක්බිති ආළවක යක්ෂයා භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ කීවේ ය.

**"කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං
කිංසු සුචිණ්ණො සුඛමාවහාති,
කිංසු හවෙ සාදුතරං රසානං,
කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨ'න්ති"**

මෙලොව සත්වයාට කුමක් නම් ශ්‍රේෂ්ඨ ධනය වේ ද? මැනවින් පුරුදු කරන ලද කුමක් සැප ගෙන දෙයි ද? රසයන් අතුරෙන් කුමක් ඉතා මිහිරි වේ ද? කෙසේ ජීවත් වන්නකුගේ ජීවිතය ශ්‍රේෂ්ඨ යැයි කියනු ලැබේ ද? යන මේ ප්‍රශ්න සතර විමසුවේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ විසින් විසඳන ලද ආකාරයට ම ඔහුට විසඳ දෙමින් මෙසේ පිළිතුරු දී වදාළ සේක.

**"සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං,
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
සච්චං හවෙ සාදුතරං රසානං,
පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨ'න්ති**

යනුවෙන් පිළිතුරු දී වදාළ සේක.

එහි "**සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං**" යන මෙයින් යම් සේ රන් රුවන් ආදී ධනය උපභෝග සැපය ගෙන දෙයි ද, සා පිපාසා ආදී දුක් වළක්වයි ද, දිළිඳු කම තුරන් කරයි ද, මුතු ආදී රත්න ලැබීමට හේතු වෙයි ද, ලෝක පැවැත්ම ගෙන දෙයි ද එසේ ම ලෞකික ලෝකෝත්තර ශ්‍රද්ධාව ද ලෞකික ලෝකෝත්තර සැප ගෙන දෙයි. ශ්‍රද්ධා ධුරයට පිළිපන්නහුගේ ජාති ජරා ආදී දුක් වළක්වයි. ගුණ දිළිඳුකම තුරන් කරයි. සති සම්බොජ්ඣංගාදී රත්න ප්‍රතිලාභයට හේතු වෙයි. ශ්‍රද්ධා සම්පන්නයා සීලයෙන් යුක්ත වේ. එබැවින් කීර්තිය හා භෝග සම්පත් ආදියෙන් සමන්විත වෙයි. ඔහු යම් යම් ප්‍රදේශයක වසයි ද ඒ ඒ තැන්හි දී දෙව් මිනිසුන්ගෙන් පුද පූජා ලබයි. මේ ශ්‍රද්ධා ධනය ඇති තැනැත්තා රජ සොරු ආදීන්ගේ ග්‍රහණයට ලක් නොවන අනන්‍ය සාධාරණ වූ සියලු සම්පත් ලබයි. ශ්‍රද්ධාව ඇති තැනැත්තා ම දනාදී පින්කම් කරන බැවින් එහි ආනිශංස වශයෙන් ලෞකික වූ රන් රුවන් ආදී සියලු ධන ලබයි. අශ්‍රද්ධාවන්තයාගේ ධනය අනර්ථය පිණිස පවතියි. එබැවින් **සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං** යනුවෙන් "**මෙලොව පුරුෂයා හට ශ්‍රද්ධාව ශ්‍රේෂ්ඨ ධනය වෙයි**" යැයි වදාළ සේක.

"**ධම්මො සුචිණ්ණො සුඛමාවහාති**" යන මෙයින් ප්‍රාණඝාත අදත්තාදන කාමමිථ්‍යාචාර කයින් සිදුවන අකුසලයන් ද, මුසාවාද පිසුනාවාච ඵරුසාවාච සම්ඵප්‍රලාප යන වචනයෙන් සිදුවන අකුසලයන් ද, අභිද්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි යන මනසින් සිදුවන අකුසලයන් ද, යන මේ දස අකුසලයන්ගෙන් වැළකී දස කුසල ධර්ම පුරුදු කිරීම ද, දාන සීල භාවනා ධර්මයන් මැනවින් පුරුදු කිරීම ද යන සුචරිත ධර්ම පුරුදු කිරීමෙන් කෝළිවිස සිටු පුත්‍රයා හා රට්ඨපාල සිටු පුත්‍රයා ආදීන්ට මෙන් මිනිස් ලොව සැපය ද, සක් දෙව් රජතුමා ආදීන්ට මෙන් දෙව්ලොව සැපය ද අවසාන වශයෙන් පද්මාවතී දේවියගේ පුත් මහා පදුම කුමාරයා දිව්‍ය සැප බඳු වූ රජ සැප අනුභව කොට ඒ සියල්ල අතහැර පසේ බුදු බවට පැමිණියාක් මෙන් නිර්වාණ සුවය ද ගෙන දෙයි. එබැවින් "**ධම්මො සුචිණ්ණො සුඛමාවහාති**" යන්නෙන් "**සුචරිත ධර්මයෙහි හැසිරෙන්නාට ලෞකික ලෝකෝත්තර සියලු සැප ගෙන දෙයි**" යැයි වදාළ සේක.

**"සච්චං හවෙ සාධුතරං රසානං"** යන මෙයින් සත්‍ය වචන කථා කිරීම ද, ප්‍රාණඝාත අදත්තාදනා දී කයින් සිදුවන අකුසලයන්ගෙන් හා මුසාවාද ඵරුසාවාචා දී වචනයෙන් සිදුවන අකුසලයන්ගෙන් වැළකීමේ චේතනාවෙන් යුක්ත වන තැනැත්තාගේ සිතෙහි යෙදෙන සම්මා වාචා සම්මා කම්මන්ත සම්මා ආජීව යන විරති සීලය ද, චතුරාර්‍ය්‍ය සත්‍යාවබෝධය කිරීමෙන් ලැබෙන පරමාර්ථ සත්‍යය ද සත්‍ය නම් වේ. මෙහි දී පරමාර්ථ සත්‍ය වූ නිර්වාණයත් විරති සත්‍යයෙහි ඇතුළත් කොට වාක් සත්‍යය අපේක්‍ෂා කරන ලදි.

මෙසේ මැනවින් සත්‍යයෙහි පිහිටි තැනැත්තා මහා කප්පින රජතුමා[1] මෙන් එම සත්‍යානුභාවයෙන් දියෙහි නො ගිලී මතුපිට ගමන් කරයි. පණ්ඩිතයෝ කණ්හදීපායන[2] ආදීන් මෙන් එම සත්‍යානුභාවයෙන් විෂ පවා නසයි. එම සත්‍යය ආවර්ජනා කොට මත්ස්‍ය ජාතකයෙහි මෙන් ගිගිරුම් සහිත වැසි වස්සවයි. සත්‍යයෙහි පිහිටිය තැනැත්තා ම බෝසත්වරුන් තිදෙනා මෙන්[3] නිවන ප්‍රාර්ථනා කරයි. මේ ලෝක ධාතුවෙහි ඵල රසය, මුල් රසය, මල් රසය, පොතු රසය, කඳ රසය ආදී විඳිය යුතු යම් රස ජාති වේ නම් ඒ සියල්ල අතර සත්‍ය නම් වූ ධර්මයෙහි පිහිටීම උසස් ම රසය වේ. ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සත්‍යය වූ සීලාදී ගුණයන්හි පිහිටා පරමාර්ථ සත්‍යය ඇසුරු කොට ජාති ජරා මරණාදී සියලු දුකින් අත මිදෙති. එබැවින් **"සච්චං හවෙ සාදුතරං රසානං"** යන මෙයින් **"රසයන් අතුරෙන් හේතු ප්‍රත්‍යයන් නිසා සංස්කාරයන්ගේ හට ගැනීම ද, හේතු ප්‍රත්‍යයන්ගේ අභාවයෙන් සංස්කාරයන්ගේ නිරෝධය ද යන මේ විමුත්ති රසය නම් වූ සත්‍යය රසය ඒකාන්තයෙන් ඉතා මියුරු රසය වෙයි"** යැයි වදාළ සේක.

**"පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති"** යන මෙයින් ලෞකික ලෝකෝත්තර අර්ථයන් නොදන්නා තැනැත්තා අන්ධයෙකි. ලෞකික අර්ථය පමණක් දන්නා තැනැත්තා එක් ඇසක් පෙනෙන තැනැත්තෙකු වැනිය. ලෞකික ලෝකෝත්තර උභයාර්ථයම දන්නා තැනැත්තා දෑසම පෙනෙන්නකු වැනිය. පරමාර්ථය හා ආත්මාර්ථය නොදන්නා තැනැත්තා

---

[1] ධම්මපදය පණ්ඩිත වග්ග

[2] සත පණ්ඩිත ජාතකය

[3] මහා සුතසෝම ජාතකය

අන්ධයෙකු වැනිය. ආත්මාර්ථය පමණක් දන්නා තැනැත්තා එක් ඇසක් ඇත්තෙකු වැනිය. ආත්මාර්ථය හා පරමාර්ථය යන උභයාර්ථයම දන්නා තැනැත්තා දෑසම පෙනෙන්නකු වැනිය. එසේ ප්‍රඥා චක්ෂුසය ඇති තැනැත්තා ගිහියෙකු වේ නම් කර්මාන්තයන් හි උත්සාහවත් වීම, සරණ සීලයෙහි පිහිටීම, දන් දීම, උපෝසථ කර්මයෙහි යෙදීමාදී ගිහි ප්‍රතිපදාවන්හි මනාව යෙදෙයි. පැවිද්දෙකු වේ නම් චිත්ත විපිළිසරය ඇති නොවන ලෙස උසස් සීලයක පිහිටීම, සම සතළිස් කර්මස්ථාන ඇසුරු කොට සමාධි භාවනාව වැඩීම, විදර්ශනා භාවනාව ප්‍රගුණ කොට ආධ්‍යාත්මික පාරිශුද්ධිය ඇති කර ගැනීම තුළින් ශ්‍රමණ ධර්මයෙහි යෙදී මනා ලෙස නුවණින් ජීවිතය හසුරුවන්නෙකු වෙයි. එබැවින් "**පඤ්ඤා ජීවිං ජීවිතමාහු සෙට්ඨං**" යනුවෙන් "**නුවණින් ජීවත් වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨ යැයි කියනු ලැබේ**" යැයි වදාළ සේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රශ්න සතර මනා කොට විසඳා දීමෙන් සතුටට පත් ආළවක යක්ෂයා අවශේෂ ප්‍රශ්න සතරක් ද අසමින් ගාථාවකින් මෙසේ ඇසුවේ ය.

**"කථංසු තරති ඕඝං - කථංසු තරති අණ්ණවං,**
**කථංසු දුක්ඛං අච්චෙති - කථංසු පරිසුජ්ඣති"**

ඕඝය කෙසේ තරණය කෙරේ ද? සසර සයුර කෙසේ තරණය කෙරේ ද? කෙසේ සංසාර වට්ට දුක ඉක්ම යයි ද? සත්වයා කෙසේ පිරිසිදු වේද?''

භාග්‍යවතුන් වහන්සේ එයට මෙසේ පිළිතුරු දී වදාළ සේක.

**"සද්ධාය තරති ඕඝං - අප්පමාදෙන අණ්ණවං,**
**වීරියෙන දුක්ඛං අච්චෙති - පඤ්ඤාය පරිසුජ්ඣති"**

ශ්‍රද්ධාවෙන් දෘෂ්ටි ඕඝය තරණය කරයි. අප්‍රමාදයෙන් සසර සයුර තරණය කරයි. වීර්‍ය්‍යය කරණ කොට ගෙන අනාගාමී මාර්ගයෙන් කාම ඕඝ දුක තරණය කරයි. අර්හත් මාර්ග ප්‍රඥාවෙන් අවිද්‍යා ඕඝය තරණය කොට පිරිසිදු වේ.

යම් පාප ධර්මයක බලවත් බව හේතුවෙන් කාම භව දිට්ඨි අවිද්‍යා යන සතර ඕඝය තරණය කිරීමට නොහැකි වේ ද, එය අශ්‍රද්ධාව හේතුවෙන් ම සිදු වේ. අශ්‍රද්ධාව ඇති විට පඤ්ච කාමගුණික රාගයෙහි සිත ලැගී ප්‍රමාදයෙහි ඇලී පැටලී සසර සයුර තරණය කිරීමට නොහැකිව එහි රැඳෙයි. ඒ හේතුවෙන් කුසීත බවට පත්ව දුක සේ වෙසෙයි. අකුසල ධර්මවලින් ගැවසී ගෙන ප්‍රඥාව නැති වී යාමෙන් කෙලෙසුන්ගෙන් පිරිසිදු වන මාර්ගය හා අමාර්ගය සොයා ගැනීමට නොහැකි වීමෙන් කෙලෙසුන්ගෙන් පිරිසිදු වීම සිදු නොවේ. එබැවින් එයට ප්‍රතිපක්ෂ මාර්ගය දක්වන භාග්‍යවතුන් වහන්සේ "**සද්ධාය තරති ඕඝං...**" යන ගාථාව වදාළ සේක.

සසර දුකින් නිදහස් ව නිවන් සුව ලැබීම පිණිස ආසන්න කාරණා වශයෙන් "**සත්පුරුෂ සේවනය, සද්ධර්ම ශ්‍රවණය, කල්‍යාණමිත්‍ර ආශ්‍රය, ධර්මානුධර්ම ප්‍රතිපදාව**" යන ධර්ම සතර ඇසුරු කළ යුතුය. රත්නත්‍රය කෙරෙහි සිත පහදවා මෙලොව පරලොව අභිවෘද්ධිය සලස්වා නිර්වාණාවබෝධයට පහසුවෙන් මග සලස්වන බැවින් මේ ධර්ම සතර "**සෝතාපත්ති අංග**" නම් වේ. තව ද යම් කෙනෙකුන්ට ශ්‍රද්ධාව ඇත්තේ වේ ද, ඔහු තෙරුවන් ඇසුරු කිරීමට පැමිණෙයි. එසේ පැමිණීම හේතුවෙන් බුදු රජාණන් වහන්සේ ද, ශ්‍රාවක වූ සංඝරත්නය ද ඇසුරු කරයි. එසේ ඇසුරු කිරීම නිසා සවන් යොමු කරයි. සවන් යොමා ධර්මය ශ්‍රවණය කරයි. ශ්‍රවණය කළ ධර්මය මතක තබා ගනී. මතක තබා ගත් ධර්මයෙහි අර්ථය විමසා බලයි, අර්ථ විමසා බලන කල්හි වැටහෙන නුවණ ලබයි. වැටහෙන නුවණ ඇති කල්හි එහි යෙදීමෙහි කැමැත්ත ඇතිවෙයි, කැමැත්ත ඇති විට උත්සාහය ඇති වෙයි. උත්සාහය ඇතිව අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් සසඳා බලයි. සසඳා බලා තමා තුළින් ම ඇති තතු (මාර්ග ඥාණයෙන්) අවබෝධ කරයි. තියුණු නුවණින් ද (ප්‍රත්‍යවේක්‍ෂා ඥාණයෙන්) සත්‍යය විනිවිද දැක ගනී.

භාග්‍යවතුන් වහන්සේ මෙම කරුණු අර්ථවත් කොට දක්වීම් වශයෙන් පිළිතුරු ගාථාවේ පළමු පදය වන "**සද්ධාය තරති ඕඝං**" යන්නෙන් දිට්ඨි ඕඝය තරණය කිරීම ද, සෝවාන් මාර්ගය ලැබූ පුද්ගලයාද, සෝවාන් ඵලයට පැමිණි ආර්‍ය්‍යය පුද්ගලයා ද දක්වා වදාළ සේක.

මෙසේ සෝවාන් මාර්ග ඵල නිවන අවබෝධ කළ ආර්‍යයීය පුද්ගලයා ප්‍රත්‍යවේක්‍ෂා ඥාණයෙන් කාම භවයෙහි සත් වරක් ඉපදීමට ඉඩ ඇති බව දැක **සාතච්චකාරිතා**[1] සංඛ්‍යාත අප්‍රමාදය ඇති හෙයින් දෙවන ආර්‍ය්‍ය මාර්ගය වන සකෘදගාමී මාර්ගයට පැමිණ නැවත එක් වරක් පමණක් මිනිස් ලොවට උත්පත්ති වශයෙන් පැමිණීම් වශයෙන් සෝවාන් මාර්ගයෙන් තරණය නොකරන ලද භව ඕඝය තරණය කරයි. එබැවින් එම ගාථාවෙහි දෙවන පදයෙන් "**අප්පමාදෙන අණ්ණවං**" යන්නෙන් භව ඕඝය තරණය කරන්නා වූ සකෘදගාමී මාර්ගය ද, සකෘදගාමී ඵලයට පත් ආර්‍ය්‍ය පුද්ගලයා ද දක්වා වදාළ සේක.

මෙලෙස සකෘදගාමී මාර්ග-ඵල ප්‍රාප්ත ආර්‍ය්‍ය පුද්ගලයා ප්‍රත්‍යවේක්‍ෂා ඥාණයෙන් කාමරාග ව්‍යාපාද සංයෝජනයන් ප්‍රහීණ කිරීමට ඉතිරිව ඇති බව දැක සකෘදගාමී මාර්ගයෙන් තරණය නොකරන ලද ඒ කාම ඕඝ සංඛ්‍යාත වස්තු හා කාම දුක්ඛයත් වීර්‍යයාධිෂ්ඨාන කොට තෙවන මාර්ගය ඥාණයෙන් තරණය කරයි. එබැවින් භාග්‍යවතුන් වහන්සේ එම ගාථාවේ තෙවන පදයෙන් "**විරියෙන දුක්ඛං අච්චෙති**" යන්නෙන් කාම ඕඝය තරණය කරන්නා වූ අනාගාමී මාර්ගය ද අනාගාමී ඵලයට පත් ආර්‍යයීය පුද්ගලයා ද දක්වා වදාළ සේක.

මෙසේ අනාගාමී මාර්ග ඵල නිවන අවබෝධ කළ ආර්‍ය්‍ය පුද්ගලයා ප්‍රත්‍යවේක්‍ෂා ඥාණයෙන් කාම සඤ්ඤා සම්පූර්ණයෙන් පහව ගිය ද රූප භවයෙහි හා අරූප භවයෙහි ඉපදීමට හේතුවන අවිද්‍යා සංයෝජනය ඉතිරිව ඇති බව දැක එය ප්‍රහීණ කිරීම පිණිස කාම සඤ්ඤාවෙන් අමිශ්‍ර ඒකාන්ත පිරිසිදු චතුර්ථ මාර්ග ප්‍රඥාව දැක අනාගාමී මාර්ගයෙන් ප්‍රහීණ නොවූ සියලු අකුසලයන්ට මූලය වූ අවිද්‍යා ඕඝය චතුර්ථ මාර්ග ප්‍රඥාව අර්හත් මාර්ග ඥාණයෙන් ප්‍රහීණ කරයි. එබැවින් භාග්‍යවතුන් වහන්සේ එම ගාථාවේ සිවුවන පදයෙන් "**පඤ්ඤාය පරිසුජ්ඣති**" යන්නෙන් අවිද්‍යා ඕඝය තරණය කරන්නා වූ අර්හත් මාර්ගය ද, අර්හත් ඵලයට පත් ආර්‍යයීය පුද්ගලයා ද දක්වා වදාළ සේක.

මෙලෙස භාග්‍යවතුන් වහන්සේ අර්හත්වයෙන් පරම උත්කෘෂ්ට පාරිශුද්ධිය දක්වා සියලු කෙලෙස් ගිනි නිවීම දක්වමින් මෙම ගාථාව

---

[1] කුසල ධර්මයන්හි නිරන්තරයෙන් පිහිටීම

වදාළ කල්හි ආළවක යක්ෂයා සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. ඉන් පසු ආළවක යක්ෂයා භාග්‍යවතුන් වහන්සේගේ මෙම දේශනාව අසා ඒ ලෞකික හා ලෝකෝත්තර ප්‍රඥාව කෙසේ ලබන්නේ ද යැයි දැන ගැනීමේ අපේක්ෂාව ඇතිව මෙසේ ඇසුවේ ය.

**"කථංසු ලභතෙ පඤ්ඤං - කථංසු වින්දතෙ ධනං,**
**කථංසු කිත්තිං පප්පොති - කථං මිත්තානි ගන්ථති,**
**අස්මා ලොකා පරං ලොකං - කථං පෙච්ච න සොචතී''ති"**

"කෙසේ නුවණ ලබයි ද? කෙසේ ධනය ලබයි ද? කෙසේ කීර්තියට පැමිණේ ද? කෙසේ මිත්‍රයන් ලබයි ද? මෙලොවින් පරලොවට ගොස් කෙසේ ශෝක නො කෙරේ ද?" යැයි ප්‍රශ්න පසක් ඇසුවේ ය.

භාග්‍යවතුන් වහන්සේ හේතු සතරකින් ප්‍රඥාව ලබන බව දක්වමින් මෙසේ පිළිතුරු දී වදාළ සේක.

**"සද්දහානො අරහතං - ධම්මං නිබ්බානපත්තියා,**
**සුස්සූසා ලභතෙ පඤ්ඤං - අප්පමත්තො විචක්ඛණො.**

යමෙකු විසින් ප්‍රථමයෙන් කාය සුචරිත ආදිය පුරුදු කිරීමෙන්ද, පසුව සත් තිස් බෝධිපාක්ෂික ධර්‍ම වැඩීමෙන් ද ලොවුතුරා බුදු බවට පසේ බුදු බවට ශ්‍රාවක බවට පැමිණ අර්හත්වයෙන් නිවනට පැමිණියාහු වෙත් ද, ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාට හිමි ධර්‍මය වන නිර්‍වාණය විශ්වාසයෙන් පිළිගෙන අනුගමනය කිරීමෙන් ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව ලබයි. එය ද ශ්‍රද්ධා මාත්‍රයකින්ම ය. යම් හෙයකින් හටගත් ශ්‍රද්ධාව ඇතිව එළඹෙයි ද, එළඹ ඇසුරු කරයි ද, ඇසුරු කරමින් කන් යොමු කරයි ද, යොමන ලද කන් ඇතිව බණ අසයි ද එබැවින් "**සුස්සූසා ලභතෙ පඤ්ඤං**" යනුවෙන් "**කන් යොමු කිරීම නිමිති කොට ප්‍රඥාව ලබයි**" යැයි වදාළ සේක.

ඒ ධර්‍මය විශ්වාස කොට ද එයින් නො නැවතී ආචාර්‍ය්‍ය උපාධ්‍යන් වහන්සේලා හමුවට කලින් කල පැමිණ ධර්‍ම ගෞරවයෙන් යුක්තව වත් පිළිවෙත් දක්වා ඇසුරු කොට සතුටු කරවා, ආචාර්‍ය්‍ය උපාධ්‍යන් වහන්සේලා විසින් යමක් කියනු කැමති වෙත් ද, එකල්හි

ශ්‍රවණය කිරීමේ කැමැත්ත ඇතිව කන් යොමා භාග්‍යවතුන් වහන්සේ වදාළ පාලි ධර්මයත් එහි අර්ථයත් අසා පරීක්ෂා කොට බැලීම පෙරදැරිව රූපාරූප විභාගය ද, පරමාර්ථ ධර්මයන්ගේ ඇති පඨවි ධාතුවෙහි කර්කශ ලක්ෂණය ආපෝ ධාතුවෙහි වැගිරෙන ලක්ෂණය ආදී වූ ස්ව ලක්ෂණ ද එසේම අනිත්‍ය දුක්ඛ අනාත්ම යන සාමාන්‍ය ලක්ෂණයන් ද පරීක්ෂා කොට බලයි. විමසයි. මෙසේ අනු පිළිවෙලින් දත යුතු දේ දැනීමෙහි සමත් **ඤාත පරිඤ්ඤාවට** පැමිණෙයි. ඉන් පසු එසේ දුටු සියලු සංස්කාර ධර්මයන් දස ආකාර වූ අනිත්‍ය ලක්ෂණ වශයෙන් ද, විසිපස් ආකාර වූ දුක්ඛ ලක්ෂණ වශයෙන් ද, පස් ආකාර වූ අනාත්ම ලක්ෂණ වශයෙන් ද විමසා බලා ඒවා **ආශ්වාද ආදීනව නිස්සරණ** වශයෙන් විමසා බැලීම නම් **තීරණ පරිඤ්ඤාවට** පැමිණෙයි. ඉන් පසු සංස්කාරක ධර්මයන් කෙරෙහි ඡන්ද රාගය දුරු කිරීම නම් වූ **ප්‍රහාණ පරිඤ්ඤාවට** පැමිණ මාර්ග පිළිවෙලින් පරමාර්ථ වශයෙන් නිර්වාණ ධාතුව සාක්ෂාත් කරයි. එබඳු තැනැත්තා ම ප්‍රඥාව ලබයි.

එසේ ගරු වශයෙන් වත් පිළිවෙත් දැක්වීම් ආදිය කොට අසා දැන ඉගෙන ගත් දෙය බැහැර නොකොට අමතක නොකොට ඇසුරු කිරීමට සමත් අප්‍රමාදී වූ විචක්ෂණ පුද්ගලයා ම සුභාෂිත දුර්භාෂිත අවබෝධය පිළිබඳ හැඟීම් ඇති බැවින් ප්‍රඥාව ලබයි. අනිකෙකු නොලබයි. එබැවින් "**අප්පමත්තො විචක්ඛණො**" යනුවෙන් "**නොපමා වූ නුවණැති පුද්ගලයා ම ප්‍රඥාව ලබයි**" යැයි වදාළ සේක.

ආළවක යක්ෂයා විසින් "**කථංසු ලභතෙ පඤ්ඤං**" යනුවෙන් ඇසූ ප්‍රශ්නයට භාග්‍යවතුන් වහන්සේ "**සද්දහනො අරහතං**" යන ගාථාවෙන් "**ශ්‍රද්ධාවෙන් යුක්තව ප්‍රඥාව ලැබීම පිණිස පවත්නා වූ පිළිවෙත පිළිපදියි ද, කීකරු ව කියන ලද දෙය නුවණ ලැබීමේ අපේක්ෂාවෙන් ම සකස් කොට අසයි ද, එලෙස නො පමාව ඉගෙන ගන්නා ලද දෙය සිත්හි ධාරණය කර ගනියි ද, දක්ෂ බැවින් අමතක නොකොට නො අඩුව නොවැඩිව සැක සිඳ නොවිසිරුණු සිතින් විස්තර වශයෙන් දැන ගනී ද**" යන මේ කරුණු සතර හේතුවෙන් ප්‍රඥාව ලබයි යනුවෙන් වදාළ සේක.

තව ද "**කීකරු බැවින් සවන් යොමු කොට නුවණ හා දැනුම ලබනු කැමති ව ධර්මය අසයි. අප්‍රමාදී ව අසා සිත්හි දරා ගනී. එසේ දරා**

**ගත් ධර්මයෙහි අර්ථ විමසා බලයි. ඉක්බිති අනු පිළිවෙලින් අනුගමනය කොට උතුම් චතුරාර්ය්‍ය සත්‍ය ධර්මය අවබෝධ කරයි"** මෙම කරුණු සතර ද දක්වමින් පිළිතුරු දී වදාළ සේක.

ආළවක යක්‍ෂයා විසින් "**කතංසු වින්‍දෙත ධනං**" කෙසේ ධනය ලබයි ද? "**කතංසු කිත්තිං පප්පොති**" කෙසේ කීර්තියට පැමිණෙයි ද? "**කතං මිත්තානි ගන්‍ථති**" කෙසේ මිත්‍රයන් ලබයි ද? "**අස්මා ලොකා පරං ලොකං - කථං පෙච්ච න සොචති**" මෙලොවින් පරලොවට ගොස් කෙසේ ශෝක නොකෙරේ ද? යනුවෙන් ඇසූ ප්‍රශ්න සතරට පිළිතුරු වදරන භාග්‍යවතුන් වහන්සේ මෙම ගාථාව වදාළ සේක.

**"පතිරූපකාරී ධුරවා - උට්ඨාතා වින්‍දතෙ ධනං,**
**සච්චෙන කිත්තිං පප්පොති - දදං මිත්තානි ගන්‍ථති,**
**අස්මා ලොකා පරං ලොකං - එවං පෙච්ච න සොචති"**

යම් දේශයක යම් කාලයක යම් සහායකයින් ඇසුරු කොට යම් සත්‍යයක් තීරණය කළ යුතු ද, එකී දේශය කාලය සහායකයින් නො ඉක්මවා තමාගේ අභිවෘද්ධිය කැමති වන්නා වූ ලෞකික ලෝකෝත්තර ධනය ලැබීම පිණිස ක්‍රියා කරන්නා වූ අත් නො හළ වීර්ය්‍යය ඇති තැනැත්තා ලෞකික ලෝකෝත්තර ධනය ලබයි. සත්‍යය වචනය කරණ කොට ගෙන කීර්තියට පැමිණෙයි. දන් දෙන තැනැත්තා මිත්‍රයන් ලබයි.

මෙම ගාථාවේ "**පතිරූපකාරීධුරවා**" යන මෙහි "**පතිරූපකාරී**" යන්නෙන් ලෞකික අභිවෘද්ධිය කැමති වන තැනැත්තා විසින් ප්‍රථමයෙන් "**මේ මා වාසය කරන දේශයය, මේ වෙළඳම් ආදියට සුදුසු කාලයය, මොවුහු මට මිත්‍රයෝ ය, මොවුහු අමිත්‍රයෝ ය, අය සහ වැය මෙසේ ය. මම ද මෙබඳු ජාති කුල ප්‍රදේශ බල භෝග පිරිවර ඇත්තෙක් වෙමි. එබැවින් දැන් ලෞකික ධනය ඉපදවීමට මේ සුදුසු කාලය ය, මේ නුසුදුසු කාලය ය**" යැයි සියල්ල ලෞකික වශයෙන් පටන් ගත යුතු ය. මෙසේ පිළිපන් පුද්ගලයා ලෞකික ධනය ඉපයීමට සුදුසු උපාය කරන්නේ නම් වේ.

"ධුරවා" යන්නෙන් වීර්‍ය්‍යය කියන ලදි. එය වනාහි ලෝකෝත්තර ධනය ඉපදවීම පිණිස සීල පාරිශුද්ධිය ආදී චේතනා වශයෙන් ඉසිලිය යුතු ධුරයක් බරක් මෙන් වන බැවින් "ධුර" නම් වේ.

"**උට්ඨාතා වින්‍දතෙ ධනං**" යන්නෙන් ලෞකික ලෝකෝත්තර ධනය ඉපදවීම පිණිස ඇති කර ගත යුතු චෛතසික වීර්‍ය්‍යය කියන ලදි. එනම් "**දූන් සීතලය, දූන් උෂ්ණය**" යනාදී ලෙස ඒ කිසිවක් තණ පතක් තරමට වත් නො සලකා සිත කය වෙහෙසවා අත් නො හළ දැඩි වීර්‍ය්‍යය ඇතිව "**මළ මීයෙකු ලැබ ඒ මීයා විකිණීමෙන් නොබෝ කලකින් ම උපායශීලී ව කහවණු දෙලක්‍ෂයක් උපයා ගත් චුල්ල අන්තේවාසිකයා**" මෙන් ලෞකික ධනය ඉපයීම කියන ලදි. එය මෙසේ ය.

පූර්‍වයෙහි අප මහ බෝසතාණන් වහන්සේ සිටු කුලයක ඉපද වැඩි විය පැමිණ සිටු තනතුර ලැබ "**චුල්ල සිටාණෝ**" යැයි ප්‍රසිද්ධ විය. ඒ සිටුතුමා නුවණැත්තේ ය. ව්‍යක්ත ය. සියලු නිමිති ශාස්ත්‍ර දන්නේ වේ. දිනක් ඒ සිටුතුමා රාජ සේවයට යන්නේ මල මීයෙකු දැක නක්ෂත්‍ර යෝග පරීක්‍ෂා කොට බලා "**නුවණැති පුරුෂයෙකුට මේ මළ මීයා වෙළඳම් කොට පුත්‍රදාරාවන් පෝෂණය කිරීමට හෝ කර්මාන්තයක යෙදවීමට හැකිය**" යැයි මෙසේ කීවේ ය. එක්තරා දුගී කුල පුත්‍රයෙක් බෝසතාණන් වහන්සේගේ එම වචනය අසා "**සිටාණන් මෙය නොදැන කියන ලද්දක් නොවේය**" යැයි සිතා ඒ මීයා රැගෙන ගොස් එක් සල්පිලක බළලෙකුගේ ආහාරය පිණිස විකුණා කාකණිකයක්[1] ලබා ගත්තේ ය. ඔහු එයින් හකුරු හා පැණි කලයක් මිලට ගෙන වනයෙන් මල් නෙලාගෙන එන මල් කරුවන්ට කුඩා හකුරු කැබැල්ලක් හා හැන්දෙන් පැන් දුන්නේ ය. ඒ සැවොම පැහැද ඔහුට මල් මිටිය බැගින් දී ගියහ. හෙතෙම ඒ මල් විකුණා එයින් ලැබූ මුදලින් හකුරු හා පැන් කලයක් ගෙන දෙවැනි දින ඒ මල් කරුවන්ගේ උයනට ම ගොස් හකුරු හා පැන් දුන්නේ ය. එයින් සතුටු වූ මල් කරුවෝ උයනෙහි මල් ගස්වලින් අඩක් දී ගියහ. ඒවා ද විකුණා දින කිහිපයකින් කහවණු අටක් උපයා ගත්තේ ය. නැවත සුළං සහිත වැසි දිනයක රජ උයනෙහි වියලි දර හා අතුපතර වැටුණේ ය. උයන් ගොව්වා ඒවා අස් කිරීමට උපායක් නො දනී. ඔහු ඒ දැක උයනට ගොස් "**ඉඳින් මේ දර හා අතුපතර මට**

[1] ඉතා සුළු මුදලක්

**දෙන්නේ නම් මම මේ සියල්ල ඉවත් කර දෙන්නෙමි**" යැයි කීවේ ය. උයන් පාලකයා "**මිත්‍රය, යහපත අර ගෙන යව**" යැයි කීවේ ය. ඉන් පසු ඔහු දරුවන්ගේ කෙළිමඬලට ගොස් උක් සකුරු දී ඒ දරුවන්ගේ සහාය ඇතිව සුළු මොහොතකින් ඒ සියල්ල ඉවතට ගෙන උයන් දොරටුව අසල රැස් කොට තබා උයන ශුද්ධ කළේ ය.

එදින ම රජ නිවසට මැටි බඳුන් සාදන කුඹල්කරුවා දර සොයමින් ඇවිදින අතර උයන් දොරට පැමිණ ඒ දර ගොඩ දැක ඒවා ඔහුගෙන් මිල දී ගත්තේ ය. ඒ දර විකිණීමෙන් ඔහුට කහවණු සොළොසක් ද මැටි බඳුන් පසක් ද ලැබුණේ ය. මෙසේ කහවණු සූවිස්සක් ලැබුණු පසු ඔහු "**මට උපායක් ඇත**" යැයි සිතා නගර දොරටුව අසල පැන් සැළියක් තබා පන්සියයක් පමණ තෘණ කපන්නන්ට පැනින් සංග්‍රහ කළේ ය. ඔවුහු "**මිත්‍රය, නුඹ අපට බොහෝ උපකාරී විය. අපගෙන් කිනම් උපකාරයක් අවශ්‍ය ද**" යැයි ඇසූහ. ඔහු "අවශ්‍ය විටෙක කියන්නෙමි" යැයි කියා ඔබිනොබ හැසිරෙන විට ගොඩ වෙළෙන්දකු හා ජල යාත්‍රික වෙළෙන්දකු සමග මිත්‍ර විය. ඒ ගොඩ යාත්‍රිකයා "නොබෝ දිනකින් අශ්වයන් පන්සියයක් ගෙන අශ්ව වෙළෙන්දෙක් මේ නගරයට පැමිණෙති" යැයි කීවේ ය. එය අසා ඔහු තෘණ ගෙනෙන්නන් වෙත ගොස් අද මට එක එක තෘණ මිටිය බැගින් දෙන්න. මා තෘණ විකුණන තුරු තෘණ නො විකුණන්න යැයි ගිවිසගෙන තෘණ මිටි පන්සියයක් ගෙනවිත් තම නිවසෙහි තබා ගත්තේ ය. අශ්ව වෙළෙන්දන් පැමිණ මුළු නුවරම ඇවිද තෘණ නොලැබ ඔහුට කහවණු දහසක් දී ඒ තෘණ මිටි පන්සියය ගෙන ගියහ.

දින කිහිපයකට පසු මුහුදු වෙළෙන්ද "මිත්‍රය විශාල වෙළඳ නැවක් තොටට පැමිණ ඇත" යැයි කීවේ ය. චුල්ල අන්තේවාසිකයා උපායක් ඇත යැයි සිතා කහවණු අටක් වියදම් කොට පිරිවර ජනයා සමග තාවකාලික යානයක් ලබාගෙන මහත් හරසරින් නැව් තොටට ගොස් ඇඟිලි මුදුවක් නැවට අත්තිකාරම් වශයෙන් දී නුදුරු තැනක තිරයකින් වට කරවා රැකවල් තුනකින් වට කොට එහි හිඳ සමීපයෙහි සිටි චර පුරුෂයන් අමතා "**පිටතින් වෙළෙන්දන් පැමිණෙත් නම් මා සමීපයට කැඳවාගෙන එව්**" යැයි කීවේ ය. එකල්හි නැව් තොටට වෙළඳ නැවක් පැමිණ ඇත යැයි අසා බරණැස් නුවර සිට සියයක් පමණ වෙළෙන්දෝ ඒ නැව සමීපයට බඩු මිල දී ගැනීම පිණිස පැමිණියහ.

නැවියෝ ඔවුන්ට "**නුඹලා බඩු නොලබන්නාහුය. අසවල් තැන සිටින මහ වෙළෙන්ද විසින් අත්තිකාරම් දෙන ලදි**" යැයි කීහ. එවිට ඒ බරණැස් නුවර සියයක් වෙළෙන්දෝ චුල්ල අන්තේවාසිකයා වෙත පැමිණ කහවණු දහස බැගින් ලක්ෂයක් දී ඔහු සමග ගොස් නැවෙහි කොටස් කරුවන්ට ද තවත් දහස බැගින් ලක්ෂයක් දී සියලු බඩු වෙන් කරවා ගත්හ.

චුල්ල අන්තේවාසිකයා මෙලෙස කහවණු දෙලක්ෂයක් උපයා ගෙන බරණැසට පැමිණ "මා විසින් කෘතවේදි විය යුතුය" යැයි සිතා කහවණු ලක්ෂයක් රැගෙන චුල්ල සිටාණන් වෙත ගියේ ය. එවිට චුල්ල සිටාණෝ "**දරුව, නුඹ කුමක් කොට මේ ධනය ලබන ලද්දේ ද**" යැයි ඇසුවේ ය. එවිට චුල්ල අන්තේවාසිකයා "**ස්වාමීනි, නුඹ වහන්සේ විසින් කියන ලද උපායෙහි පිහිටා සිව් මසක් ඇතුළත ලබන ලද්දෙමි**" යැයි කියා මළ මීයාගේ පටන් සියලු කථා පුවත් ඉදිරිපත් කළේ ය. චුල්ල සිටුවරයා ඒ වදන් අසා "**මෙබඳු දරුවෙකු අන් සතු කිරීම නොවටීය**" යැයි සිතා සුදුසු වියට පැමිණ සිටි තම දියණිය අවාහ කොට දී තම සියලු වස්තුව ඔහුට හිමි කර දුන්නේ ය. ඒ චුල්ල සිටුවරයාගේ ඇවෑමෙන් චුල්ලන්තේවාසිකයා ඒ නුවර සිටු තනතුරට පත් වූයේ ය.

මෙසේ නුවණැති තැනැත්තා ස්වල්ප වූ ගින්නක් උපදවා වියලි ගොම, දර කෝටු ආදිය එහි දමා කටින් පිඹ මහත් ගින්නක් ඇති කරන්නේ යම් සේද, නුවණැති පුරුෂයා ස්වල්ප වූ බඩු මිලයක් ලැබ නොයෙක් උපායෙන් වෙළඳාම් කොට ධනය හා කීර්තිය ලබන්නේ ය.

එසේ ම චෛතසික වීර්‍ය්‍යයෙන් යුතුව "**මහල්ලකමහාතිස්ස තෙරුන් වහන්සේ**" මෙන් ලෝකෝත්තර ධනය ලබන ලද්දේ ය.

මහල්ලකමහාතිස්ස මහ තෙරුන් වහන්සේ සයන ඉරියව්ව අතහැර අන් ඉරියව් තුනෙන් වසන්නෙමි යැයි අධිෂ්ඨාන කොට ගෙන පර්‍ය්‍යංකයෙන් වැඩ හිඳ භාවනාවට පටන් ගනී. යම් වේලාවක ථීනමිද්ධය පැමිණෙයි ද, එවිට පිදුරු දරණුවක් තෙමා එය හිස මත තබාගෙන කර වටක් පමණ ජලයෙහි ගිලී වැඩ හිඳ ථීනමිද්ධය දුරු කොට භාවනා වඩා දස වසරකින් අර්හත්වයට පත් වූහ.

"**සච්චෙන කිත්තිං පප්පොති**" යන මෙයින් සත්‍ය වචන කථා කිරීම කියන ලදි. මුසා බස් නොකියා වචී සත්‍යයෙන් ද පරමාර්ථ සත්‍යයෙන් ද යුක්තව ඇදහිය යුතු වූ සත්‍යය ම වදරන්නා වූ බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා පරම සත්‍යය පහදා දෙති. එසේ වූ සත්‍යවාදී භාවය නිසාම කීර්තියට පත් වෙති.

"**දදං මිත්තානි ගන්ථති**" යන මෙයින් දන් දෙන තැනැත්තා මිත්‍රයන් ලබයි යැයි කියන ලදි. යම් ප්‍රතිග්‍රාහකයෙක් විසින් යමක් ලැබීමට කැමති වන්නේ ද බලාපොරොත්තු වන්නේ ද, දායකයා විසින් ඒ දෙයම ය දෙන්නේ වේ ද, එසේ කැමති වන බලාපොරොත්තු වන දෙයම දන් දෙන තැනැත්තා මිත්‍රයන් ලබයි යැයි වදාළ සේක. මෙහි දී දීම යනුවෙන් "**දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව**" යන සතර සංග්‍රහ වස්තුව අදහස් කරන ලදි.

මෙසේ ආළවක යක්ෂයා විසින් අසන ලද ගිහි පැවිදි සැමට පොදු වූ ලෞකික ලෝකෝත්තර වශයෙන් මිශ්‍ර වූ ප්‍රශ්න සතරක් විසඳා දී භාග්‍යවතුන් වහන්සේ ඔහු විසින් "**අස්මා ලොකා පරං ලොකං - කථං පෙච්ච න සොචති**" මෙලොවින් පරලොවට ගොස් කෙසේ ශෝක නොකෙරේ ද? යනුවෙන් අසන ලද පස් වන ගෘහස්ථ ප්‍රශ්නයට පිළිතුරු වදරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ මෙම ගාථාව වදාළ සේක.

**"යස්සෙතෙ චතුරො ධම්මා - සද්ධස්ස ඝරමෙසිනො,**
**සච්චං ධම්මො ධිති චාගො - ස වෙ පෙච්ච න සොචති"**

ගිහිගෙයි වසන්නා වූ ශ්‍රද්ධා ඇති යමෙකු හට සත්‍යයත්, ධර්මයත්, ප්‍රඥාවත්, ත්‍යාගයත් යන මේ ධර්ම සතර වෙත් නම් හෙතෙම පරලොව ගොස් ශෝක නොකරයි.

මෙහි දී ගිහි ජීවිතයක් ගත කරමින් පඤ්ච කාමගුණික සැප සම්පත් සොයන්නා වූ තැනැත්තා විසින් සියලු යහපත් ගුණ ධර්ම දියුණුවට කාරණා වන ශ්‍රද්ධාවෙන් යුක්තව කීර්තිය ඇති කර ගැනීම පිණිස සත්‍යයෙහි පිහිටීම ද, ප්‍රඥාව ඇති කර ගැනීම පිණිස ධර්මය ඇසීමට හා විමසීමට කැමති වීම ද, අකුසල් බැහැර කොට ලෞකික ලෝකෝත්තර ධනය ලැබීම පිණිස වැඩිය යුතු කුසල ධර්ම වැඩීම පිණිස

අත නොහරින ලද වීර්‍යයෙන් හා ඉවසීමෙන් යුක්ත වීම ද, කල්‍යාණ මිත්‍රයන් ලැබීම පිණිස හේතුවන පරිත්‍යාගය පුරුදු කිරීම ද යන මේ කරුණු සතර මෙලොව දී දියුණු කර ගන්නා වූ තැනැත්තා පරලොවට ගොස් ශෝක නොකරයි යනුවෙන් වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙලෙස ආළවක යක්ෂයා විසින් අසන ලද මේ පස් වන ප්‍රශ්නය විසඳා දී ආළවක යක්ෂයා තවත් ප්‍රශ්නයක් ඇසීමට පොළඹවන සේක් මෙම ගාථාව වදාළ සේක.

**"ඉඞ්ඝ අඤ්ඤෙපි පුච්ඡස්සු - පුථූ සමණබ්‍රාහ්මණෙ,**
**යදි සච්චා දම්මා චාගා - ඛන්ත්‍යා භියෙ‍්‍යාධ විජ්ජතී'ති"**

ආළවකය, මා විසින් සත්‍යයට වඩා කීර්තියට පත්වීමට අන් හේතු ඇත්තේ නම් හෝ, ධර්‍මය ඇසීමට වඩා ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව ලැබීමට අන් හේතු ඇත්තේ නම් හෝ, ලෞකික ලෝකෝත්තර ධනය ලැබීම පිණිස වැඩිය යුතු කුසල ධර්‍ම වැඩීම පිණිස අත නොහරින ලද වීර්‍යය හා ඉවසීම හැර වෙනත් හේතු ඇත්තේ නම් හෝ මිතුරන් ලැබීමට ත්‍යාගයට වඩා වෙන හේතු ඇත්තේ නම් ඒවා මොනවාද යැයි නුඹ **පූර්‍ණ කාශ්‍යප, මක්ඛලිගෝසාල, අජිතකේසකම්බලි, පකුධ කච්චායන, සංජය බෙලට්ඨපුත්ත, නාථපුත්‍ර නිගණ්ඨ** යන අන් මහණ බමුණන්ගෙන් විචාරව යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි ආළවක යක්ෂයා යම් සැකයකින් යම් ප්‍රශ්නයක් විමසන්නේ ද, එසේ වූ සැක පහව ගිය බැවින් දැන් අන් මහණ බමුණන්ගෙන් කුමට විමසන්නෙම් ද යැයි කියා නැවත ප්‍රශ්න විචාරීමක් නොකරන හේතුව යම් කෙනෙක් නො දනී නම් ඔවුන්ට ද එය දැන ගැනීමට සලස්වමින් මෙම ගාථාව කීවේ ය.

**"කථං නු දනි පුච්ඡෙය්‍යං - පුථූ සමණබ්‍රාහ්මණෙ,**
**සොහං අජ්ජ පජානාමි - යො අත්‍ථො සම්පරායිකො"**

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙලොව නුවණ ලැබීම ආදී වූ අභිවෘද්ධිය හේතුවන යම් කරුණක් වේ නම් **"සුස්සූසා ලභතෙ පඤ්ඤං"** ඇසීම විචාරීම මුල්කොට ප්‍රඥාව වැඩීම වෙයි යනාදී වශයෙන් එය ද,

පරලොව අභිවෘද්ධිය පිළිබඳ යම් අර්ථයක් වේ නම් "**යසෙසතෙ චතුරො ධම්මා**" යනාදී ලෙස සත්‍යය, ධර්මය, ධෘතිය, ත්‍යාගය යන එය ද මා විසින් අද දැන ගත්තෙමි. එසේ වූ අර්ථ සැක සිඳ සියල්ල දන්නා නුවණින් යුත් භාග්‍යවතුන් වහන්සේ වෙතින් දැන ඉගෙන ගත් ආකාරයට ම මම පෞද්ගලිකව දනිමි. එසේ දැනගත් මම දන් අන් මහණ බමුණන්ගෙන් කුමකට විචාරන්නෙම් ද? යැයි කීවේ ය.

එසේ කියා ආළවක යක්ෂයා "**මා හට ඒ සියලු දේ දැන ගැනීමට මූල කාරණාව වූයේ සියලු අර්ථයන් ප්‍රකට කරන ඥාණයෙන් හා අනේක විධ වූ ගුණ විශේෂයන් ගෙන් සමන්වාගත අග්‍ර දක්ෂිණාහී වූ භාග්‍යවතුන් වහන්සේ නිසාම ය. මෙලොව පරලොව දෙකෙහි තථාගතයන් වහන්සේ හා සමාන හෝ ඊට වැඩි තරම් කෙනෙක් හෝ දක්නට නැත. සදේවක ලෝකවාසී සියලු සත්වයන්ගේ ප්‍රත්‍ය පිළිගැනීමට සුදුසු වූ ලොව විද්‍යමාන වන එකම පුද්ගලයා භාග්‍යවතුන් වහන්සේම ය. පින් කැමතියවුන්ගේ ඒ පුණ්‍ය චේතනා මහත් ඵල මහත් ආනිශංස කර දීමෙහි භාග්‍යවතුන් වහන්සේට වඩා සමර්ථ වූවෙකු ලොව නැත**" යැයි පෙන්වමින් මෙම ගාථාව කීවේ ය.

**"අත්ථාය වත මෙ බුද්ධො - වාසායාළවිමාගමා,**
**සොහං අජ්ජ පජානාමි - යත්ථ දින්නං මහප්ඵලං"**

ඒකාන්තයෙන් මට හිත පිණිස ම, අභිවෘද්ධිය පිණිස ම වැඩ පිණිස ම අග්‍ර දක්ෂිණාහී වූ භාග්‍යවතුන් වහන්සේ වාසය පිණිස අළවි නුවරට වැඩි සේක්ම ය. එහෙයින් යම් පින් කෙතක පුදන ලද දෙය මහත් ඵල මහත් ආනිශංස ගෙන දෙන්නේ වේ ද, ඒ පින් කෙත අද මා විසින් දැන ගත්තෙමි. භාග්‍යවතුන් වහන්සේ මා හට මෙසේ අනුග්‍රහ දැක්වීමට අලව් නුවරට වැඩීම හේතුවෙන් මා හට යහපතක්ම සිදු වූවේය යැයි කීවේ ය.

ආළවක යක්ෂයා මෙම ගාථාවෙන් තමාට සිදු වූ අර්ථය යහපත දක්වා අන්‍යයන්ගේ අභිවෘද්ධි කර ප්‍රතිපත්තිය විදහා පාමින් මෙම ගාථාව කීවේය.

**"සො අහං විචරිස්සාමි - ගාමා ගාමං පුරා පුරං,**
**නමස්සමානො සම්බුද්ධං - ධම්මස්ස ච සුධම්මත'න්ති"**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා කෙරෙහි මහත් කරුණා උපදවා මෙහි වැඩම කොට මා හට කළා වූ යහපත හේතුවෙන් ලෞකික සැපයෙන් හා ලෝකෝත්තර සැපයෙන් සුවපත් වූ ඒ මම දේව ග්‍රාමයෙන් දේව ග්‍රාමයට ද, දේව නගරයෙන් දේව නගරයට ද යමින් **"නිසැකව ම ඒ භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය, භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් ප්‍රත්‍යක්‍ෂ කොට වදාළ වදාළා වූ සපර්‍යාප්තික නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය සර්‍ව සම්පූර්‍ණ බැවින් ස්වාක්ඛාතය, පිළිවෙත් සරු වූ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක මහා සංඝරත්නය සුපටිපන්නය"** යැයි අගය කොට ප්‍රශංසා කරමින් දහම් පණිවුඩය පතුරුවන දූතයෙකු ව කියා ඇවිදිමින් හැසිරෙන්නෙමි යැයි කීවේ ය.

මෙසේ මෙම ගාථාවේ අවසානයත් රාත්‍රිය පහන් වීමත් සාධුකාර ශබ්ද නැගීමත් එදින ආළවක යක්‍ෂයාට ආහාරය පිණිස බිලි දීමට ආළවක කුමාරයා යක්‍ෂ භවනට රැගෙන ඒමත් එකම මොහොතෙහි දී සිදු වූහ. රාජ පුරුෂයෝ එම සාධුකාර ශබ්දය අසා "මේ ආකාරයේ සාධුකාර ශබ්දයක් සම්මා සම්බුදු රජාණන් වහන්සේට හැර අන් කෙනෙකුට පහළ නොවේ, කිමෙක් ද, ඒ භාග්‍යවතුන් වහන්සේ පැමිණියේ ද" යැයි සිතා විමසා බලන්නාහු භාග්‍යවතුන් වහන්සේගේ ශරීර ප්‍රභාව දැක අන් දිනයන්හි දී මෙන් පිටත නොසිට සැක සංකා රහිතව යක්‍ෂ භවන ඇතුළට පිවිස ආළවක යක්‍ෂයාගේ භවනයෙහි වැඩ සිටින භාග්‍යවතුන් වහන්සේ ද, ඇඳිලි බැඳ සිටින ආළවක යක්‍ෂයා ද දුටුහ. දැක යක්‍ෂයා අමතා **"මහා යක්‍ෂයාණෙනි, මෙම කුමාරයා නුඹට බිලි පිණිස ගෙනෙන ලද්දේ ය. ඔහු කනු මැනවි. නැතහොත් බුදිනු මැනවි. නැතහොත් කැමති දෙයක් කරනු මැනවි"** යැයි කියූහ. භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා සෝවාන් ඵලයට පැමිණ සිටින මේ යක්‍ෂයා විශේෂයෙන් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි දී මෙසේ පවසනු ලබන කල්හි අතිශයින් ලැජ්ජාවට පැමිණියේ ය. ඉක්බිති ආළවක යක්‍ෂයා බිලි පිණිස ගෙනෙන ලද ආළවක කුමාරයා දෑතින් පිළිගෙන භාග්‍යවතුන් වහන්සේට පිරිනමා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙම කුමාරයා මා හට එවා ඇත, මා**

**විසින් එම කුමාරයා භාග්‍යවතුන් වහන්සේට පිරිනමමි. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලා හිතානුකම්පා ඇත්තෝය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙම කුමාරයා පිළිගන්නා සේක්වා”** යැයි මෙසේ මෙම ගාථාව කීවේ ය.

**“ඉමං කුමාරං සතපුඤ්ඤ ලක්ඛණං**
**සබ්බඞ්ගුපෙතං පරිපුඤ්ඤබ්‍යඤ්ජනං,**
**උදග්ගචිත්තො සුමනො දදාමි තෙ**
**පටිග්ගණ්හ ලොකහිතාය චක්ඛුමා”**

“සිය ගණන් පුණ්‍ය ලක්ෂණයන්ගෙන් හෙබියා වූ පිරිපුන් සියලු අඟපසඟින් යුක්ත වූ මේ කුමාරයා සතුටින් ඔද වැඩීගිය සිතින් භාග්‍යවතුන් වහන්සේට පිළිගන්වමි. සියලු තැන්හි පැතිරුණා වූ නුවණින් සමන්වාගත පසැස්[1] ඇත්තා වූ භාග්‍යවතුන් වහන්ස, ලොවට හිත සුව පිණිස මේ කුමරුවා පිළිගන්නා සේක්වා” යැයි කියා භාග්‍යවතුන් වහන්සේට එම ආළවක කුමාරයා පිළිගැන්වූවේ ය.

භාග්‍යවතුන් වහන්සේ එම කුමාරයා පිළිගත් සේක. එසේ පිළිගන්නා ගමන් ම ආළවක යක්ෂයාට ද, එම ආළවක කුමාරයාට ද යහපත පිණිස ගාථාවක පේළි තුනක් වදාළ සේක. සිවුවන පේළිය “මේ කුමාරයා බුදුරජාණන් වහන්සේ ද, ධර්මය ද, සංඝයා ද සරණ යන්නේය” යැයි “බුද්ධං, ධම්මං, සඞ්ඝං” යන වචන තුන යොදා ආළවක යක්ෂයා විසින් තුන් වතාවක් කීවේය.

**“දීඝායුකො හොතු අයං කුමාරො,**
**තුවඤ්ච යක්ඛ සුඛිතො භවාහි,**
**අබ්‍යාධිතා ලොකහිතාය තිට්ඨථ**
**අයං කුමාරො සරණමුපෙති බුද්ධං”**

“මේ කුමාරයා දීර්ඝායුෂ ඇත්තෙකු වේවා! යක්ෂය, නුඹ ද සුවපත් වේවා! ලෝ සත්නට කරදර ආදිය කිරීමකින් තොරව ලෝ වැඩ පිණිස

---

[1] බුද්ධචක්ෂු, ධම්මචක්ෂු ඤාණචක්ෂ, දිබ්බචක්ෂු, සමන්තචක්ෂු යන ඤාණ පස

පවතුව. මේ කුමාරයා බුදුරජාණන් වහන්සේ ද, ධර්මය ද, මහා සංඝයා ද සරණ යයි"

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ **"මේ කුමාරයා ඇති දැඩි කොට මා හටම දෙන්න"** යැයි වදරා ආළවක කුමාරයා රාජ පුරුෂයන්ට දුන් සේක. මෙලෙස ඒ ආළවක කුමාරයා රාජ පුරුෂයන් අතින් ආළවක යක්ෂයා අතට ද, ආළවක යක්ෂයා අතින් භාග්‍යවතුන් වහන්සේ අතට ද නැවත භාග්‍යවතුන් වහන්සේ අතින් රාජ පුරුෂයන් අතට ද මෙසේ අතින් අතට හුවමාරු වී ගිය බැවින් **"හත්ථක ආළවක කුමාරයා"** යැයි නමක් ඇති වී එම නමින් ම ප්‍රසිද්ධියට පත් විය.

ඉන් පසු ඒ ආළවක කුමාරයා නැවත රැගෙන එන රාජ පුරුෂයන් දැක ගොවීහු ද වනයෙහි වැඩ කරන මිනිස්සු ආදීහු **"කිම මේ කුමාරයා ඉතා ළදරු හෙයින් යක්ෂයා නොකැමැති වූයේ ද?"** යැයි බියපත් ව ඇසූහ. එවිට රාජ පුරුෂයෝ **"බිය නොවව්. භාග්‍යවතු අර්හත් සිද්ධාර්ථ ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් මේ කුමාරයාට අභය ලබා දෙන ලද්දේ ය"** යැයි කියා සියල්ල විස්තර වශයෙන් කීහ. ඒ මොහොතෙහි සියලු අළව් නුවරම එකම සාධුකාර නාදය ඇති විය. කෝලාහලයක් බඳු විය. ඒ සියලු ජනයා කිසි බියක් තැතිගැන්මක් නැතිව යක්ෂයා ඉදිරියට ගියහ.

ආළවක යක්ෂයා භාග්‍යවතුන් වහන්සේට පිඬු පිණිස වැඩීමට කාලය පැමිණි කල්හි භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍ර චීවර ගෙන මඳ දුරක් පසු ගමන් කොට නැවතුණේ ය. භාග්‍යවතුන් වහන්සේ අළව් නුවර පිඬු සිඟා වැඩ දන් වළඳ අවසන් ව නගර දෙරටුවෙහි විවේකයට සුදුසු එක් ගසක් මුල පනවන ලද බුදු අසුනෙහි වැඩහුන් සේක. එහි දී මහ ජනයා සමග මහ රජතුමා ද, නුවර වාසීහු ද භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිට **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙබඳු වූ දරුණු යක්ෂයෙකු කෙසේ දමනය කළ සේක් ද?"** යැයි ඇසූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මෙසේ නව ආකාරයකින් වැසි වැස්සීය. මෙසේ බිහිසුණු දේ කළේ ය. මෙසේ ප්‍රශ්න විචාළේ ය මම ඒවා මෙසේ විසඳුවෙමි"** යැයි වදරා ආළවක යක්ෂයා විසින් සිදුකළ යුද්ධය මුල සිට සියල්ල වදරා ආළවක සූත්‍රය වදාළ සේක.

එම දේශනාව අවසානයෙහි දී සුවාසූදහසක් සත්වයන් මග ඵල නිවන් සුව ලැබූහ.

ඉන් පසු අළව් රජතුමා ද, නුවර වාසීහු ද එකතුව වෛශ්‍රවණ දිව්‍ය රාජයාගේ විමානය අසල ආළවක යක්ෂයාට ද විමනක් කරවා මල් සුවඳ ආදී සත්කාර සහිතව ආහාර ආදියෙන් නිති පූජා පැවැත්වූහ. හත්ථාළවක කුමාරයා ද වැඩි වියට පැමිණි පසු **"දරුව නුඹ භාග්‍යවතුන් වහන්සේ නිසා දිවි ලැබුවෙහි ය. එබැවින් භාග්‍යවතුන් වහන්සේ ම ඇසුරු කරව"** යැයි කියා භාග්‍යවතුන් වහන්සේ වෙත යැවූහ. ඒ ආළවක කුමාරයා ද භාග්‍යවතුන් වහන්සේ ද, මහා සංඝයා වහන්සේ ද ඇසුරු කරමින් නොබෝ කලකින් ම අනාගාමී මාර්ගයෙහි පිහිටියේ ය. ඉන් පසු සියලු ත්‍රිපිටක බුද්ධ වචනය ඉගෙන පන්සියයක් උපාසකයන් පිරිවර ඇතිව විසුවේ ය.

පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ **"එතදග්ගං, භික්ඛවෙ, මම සාවකානං උපාසකානං චතුහි සඞ්ගහවත්ථූහි පරිසං සඞ්ගණ්හන්තානං යදිදං හත්ථකො ආළවකො"** යනුවෙන් **"මහණෙනි, මාගේ ශාසනයෙහි උපාසකයන් අතර සතර සංග්‍රහ වස්තුවෙන් පිරිසට සංග්‍රහ කරන්නවුන් අතර මේ හත්ථාළවක උපාසක තෙමේ අග්‍ර වන්නේය"** යැයි අග තනතුරක් ද පිරිනමා වදාළ සේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ කුරිරු ගති ඇතිව මහත් බල සම්පන්න ව සිටි ජනයා පෙළීමට ලක් කල ආළවක යක්ෂයා දමනය කොට සෝවාන් ඵලයෙහි පිහිටුවා සසර දුකින් එතර කර වූ සේක.

මෙය අර්ථ වශයෙන් ගෙන සත්‍යක්‍රියා කොට සෙත් පැතීම මෙම ගාථාවෙන් ප්‍රකාශ කොට දක්වන්නේ ය.

**මාරාතිරෙක මභියුජ්ඣිත සබ්බ රත්තිං**
**ඝොරම්පනාලවක මක්ඛ මථද්ධ යක්ඛං,**
**ඛන්තී සුදන්ත විධිනා ජිතවා මුනින්දෝ**
**තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.**

මරුවෙක් වගේ දෙවැනි වූ - මුළු රෑ සටන් පත්
ආළවක යැයි පතල වූ - රුදු යක්‍ෂයා ඒ
ඉවසුම් බෙලෙන් දිනූ - තිලෝගුරු වීරයාණෝ
ඒ ආනුභාව බලයෙන් - සුවසෙත් සැදේවා!

## 3. නාළාගිරි හස්තිරාජ දමනය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ අනුපිය නම් නියම් ගම අනුපිය මල්ල රජුන්ගේ අඹ වනයෙහි වැඩසිටි සේක. එකල්හි බොහෝ ශාක්‍ය කුමාරයෝ භාග්‍යවතුන් වහන්සේ අනුව පැවිදි වෙති. එතෙක් පැවිදි නොවී සිටි "**භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත**" යන ක්‍ෂත්‍රිය කුමාරවරු උපාලි කපු මහතා ද සමග අනුපිය අඹ වනයට ගොස් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි පැවිදි වූහ. ඒ පිරිස අතරින් භද්දිය තෙරණුවෝ ත්‍රී විද්‍යා ඥාණ සහිතව රහත් වූයේ ය. අනුරුද්ධ තෙරණුවෝ දිබ්බචක්ෂු ඥානය ලබා භාග්‍යවතුන් වහන්සේගෙන් මහා පුරිසවිතක්ක සූත්‍රය අසා රහත් වූයේ ය. ආනන්ද තෙරණුවෝ ප්‍රතිසම්භිධා ප්‍රාප්තව සෝවාන් විය. භගු කිම්බිල තෙරුන් වහන්සේලා ද මඳ කලක් ගෙවා රහත් වූහ. දේවදත්ත තෙරුන් ලෞකික අභිඥා පමණක් ලැබීය. මේ පිරිස පැවිදි වූ පසු භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝයාත් සමග කොසඹෑ නුවරට වැඩි සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේට බොහෝ ලාභ සත්කාර ලැබුණාහ. රෑ දහවල නිරන්තරයෙන් ජනයා චීවර, ගිතෙල්, මී පැණි, හකුරු, සුවඳ මල් ආදිය රැගෙන විහාරයට ගොස් භාග්‍යවතුන් වහන්සේ කොතැන වැඩ සිටින සේක් ද? යැයි අසා සොයා ගෙන ගොස් පුද සත්කාර කරති.

එසේම සාරිපුත්‍ර, මහ මුගලන්, මහා කාශ්‍යප, භද්දිය, ආනන්ද, භගු, කිම්බිල ආදී තෙරුන් වහන්සේලා මහා පිරිස් ඇතිව වෙසෙති. මේ සාරිපුත්‍ර තෙරුන්ගේ පිරිසය, මේ මුගලන් තෙරුන්ගේ පිරිසය මේ මහා කාශ්‍යප තෙරුන්ගේ පිරිසය ආදී ලෙස මහා පිරිවරින් ප්‍රසිද්ධ ය. ජනයාද අසවල් රහතන් වහන්සේ කොතැන වැඩ සිටින සේක් ද? යැයි අසති. කුටියෙන් කුටියට සොයා ගොස් පුද සත්කාර කරති. එහෙත් දේවදත්ත තෙරුන් කොතැන සිටින්නේ ද යැයි කිසිවෙකු නො අසයි.

පූජා සත්කාර කිසිත් නොකරයි. එබැවින් මම ද පිරිසක් ඇති කරගෙන ප්‍රසිද්ධ විය යුතුය යැයි සිතුවේ ය. නැවත ද මෙසේ සිතුවේ ය. ලාභ සත්කාර නැතිව පිරිසක් සාද ගැනීම නොකළ හැකිය. මම ප්‍රථමයෙන් ලාභ සත්කාර ලැබෙන මගක් ඇති කර ගත යුතුය.

තව ද දෙව්දත් තෙරුන් මෙසේ සිතුවේ ය. "මම ද පැවිදි වූයේ මේ පිරිසත් සමගම ය. මේ පිරිස ද ක්‍ෂත්‍රියයෝ ය. මම ද ක්‍ෂත්‍රිය වෙමි. එහෙත් ජනයා චීවර පරිෂ්කාරාදිය රැගෙන විත් අසවලා කොතැන ද යැයි අසමින් මොවුන්ට ම පූජා කරති. මා ගැන කිසිවෙක් නො අසති. කිසිත් පූජා නොකරති. එබැවින් මට ද චීවරාදිය පූජා කරන්නෙකු සොයා ගත යුතුය. ඒ සඳහා කවරෙකු පහදවා ගනිම් ද? බිම්බිසාර රජතුමා බුදුරජාණන් වහන්සේ දුටු දිනයෙහිදී ම එක් ලක්‍ෂ විසි දහසක් පිරිස සමග සෝවාන් වූහ. එබැවින් ඔහු පහදවා ගැනීමට නොහැකිය. පසේනදි කොසොල් රජතුමා ද පහදවා ගැනීමට නොහැකිය. මේ බිම්බිසාර රජුගේ පුත් අජාසත්ත කුමාරයා කිසිවකුගේ හොඳ නරක කිසිවක් නොදනී. එබැවින් ඒ කුමාරයා පහදවා ගැනීමට උත්සාහ කළ යුතුය" යැයි සිතා කොසඹෑ නුවරින් රජගහ නුවරට ගොස් රාජ සභාවෙහි පිරිවර ජනයා සමග හුන් අජාසත්ත කුමාරයා වෙත ගොස් ඍද්ධි බලයෙන් කුඩා දරුවෙකුගේ වේශයක් ගෙන, අත් - පා - ඉන - බෙල්ල ආදියෙහි සර්පයන් වෙලාගෙන සර්ප ඔටුන්නක් පැළඳගෙන අජාසත්ත කුමාරයාගේ උකුලෙහි පහළ විය. එයින් බියට පත් අජාසත් කුමරු මේ කවරෙක් දැයි කෑ ගැසුවේ ය. රාජ කුමාරය, බිය නොවෙව, මම දෙව්දත් තෙරුන්ය යැයි කියා තමන්ගේ ස්වභාවයෙන් පෙනී සිට කුමරු පහදවා ගත්තේ ය. එතැන් පටන් උදේ සවස රිය පන්සියයකින් උපස්ථානයට එන අජාසත්ත කුමාරයා අතිශයින් විශ්වාසවන්ත වූ බව දැන භික්‍ෂු සංඝයා පරිහරණය කිරීමට සිතක් උපන්නේ ය. ඒ ක්‍ෂණයෙහිම දේවදත්ත තෙරුන්ගේ අභිඥා ගුණ පිරිහී ගියේය.

ඉන් පසු දෙව්දත් තෙරුන් බිම්බිසාර මහ රජතුමා ප්‍රධාන පිරිවර ජනයාට ධර්ම දේශනා කරමින් සිටි භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ඇඳිලි බැඳ වැඳ මෙසේ කීවේ ය.

**"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් මහලු ය. දීර්ඝ කාලයක් ගත කොට දැන් අන්තිම වයසෙහි සිටින සේක.**

**එබැවින් දැන් මන්දෝත්සාහී ව ඵල සමාපත්ති සුවයෙහි යෙදී වැඩ සිටින සේක්වා. මම භික්ෂු සංඝයා පරිහරණය කරමි. මට එය කළ හැකිය. භාග්‍යවතුන් වහන්සේ මා හට භික්ෂු සංඝයා භාර දෙන සේක්වා, මම භික්ෂු සංඝයා පාලනය කරන්නෙමි"** යනුවෙන් ඉල්ලා සිටියේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"දේවදත්තය කම් නැත, භික්ෂු සංඝයා ඔබට බාර නොදෙමි. මම සාරිපුත්ත, මොග්ගල්ලාන දෙදෙනාට ද භික්ෂු සංඝයා බාර නොදෙන්නෙමි. කිමෙක් ද ලාමක වූ කෙළ බුදින[1] ඔබට භික්ෂු සංඝයා බාර නොදෙමි"** යැයි තෙරුන්ට කෙළතොලු වාදයෙන් ගැහී කොට ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කොට වදාළ සේක. එයින් නොසතුටට පත්ව භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ, **"භාග්‍යවතුන් වහන්සේ රජුන් සහිත පිරිසෙහි මට කෙළතොලු වාදයෙන් පහත් කොට කථා කරති. සැරියුත් මුගලන් තෙරුන් උසස් තැන තබති"** යැයි කිපී නොසතුටුව භාග්‍යවතුන් වහන්සේ වැඳ නික්ම ගියේය. මේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දේවදත්ත තෙරුන්ගේ පළමු වෛර බැඳීමයි.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්‍ර මහ රහතන් වහන්සේට අණ කොට දේවදත්ත තෙරුන්ට ඤත්ති දුතිය කර්මයෙන් ප්‍රකාශනීය කර්මය[2] කර වූහ.

ඉන් පසු දේවදත්ත තෙරුන් අජාසත් කුමරු සමීපයට ගොස් **"කුමරුනි! පෙර කාලේ මිනිස්සු දීර්ඝායුෂ ඇත්තෝ වූහ. දැන් මිනිස්සු අල්පායුෂ්ක ය. එබැවින් ඔබ පියා මරා රජ වන්න. මම බුදුන් මරා බුදු වන්නෙමි"** යැයි මෙසේ කියා අජාසත් කුමරු පියා මැරවීමට පෙළඹවීය.

අජාසත් කුමරු ද **"දෙව්දත් තෙරුන් මහානුභාව ඇත්තේ ය ඔහු නොදන්නා දෙයක් නම් නැත සත්‍යයක් ම කීවේය"** යැයි සිතා කලවයෙහි පිහියක් බැඳගෙන, උදෑසන බියට පත්ව කලබලයෙන් යුතුව, සැකයෙන් දළදඬු බැවින් යුතුව, ඇතුළු නුවරට පිවිසියේ ය. ඇමතියන්

---

[1] මිථ්‍යාජීවයෙන් ජීවත් වන

[2] පෙර දෙව්දත් තෙරුන්ගේ ප්‍රකෘති ස්වභාවය එකකි. දැන් අන්‍ය ස්වභාවයකි. දෙව්දත් තෙරුන් කයින් වචනයෙන් යමක් කරයි ද එය මේ සසුන් පිළිවෙතක් යැයි නොපිළිගත යුතුය. එයින් දෙව්දත් තෙරුන්ගේ විකෘතියක්ම බව දත යුතුය.

ඔහු අල්ලාගෙන පරීක්ෂා කොට කලවයෙහි බැඳි පිහිය දැක, කරුණු විමසා මේ සඳහා කවුරුන් විසින් ඔබ මෙහෙයවන ලද්දේ ද යැයි ඇසූහ. දේවදත්ත තෙරුන් විසින් යැයි කීවේ ය. එකල්හි ඇමතිවරු මේ කුමාරයා ද මැරිය යුතු ය. දේවදත්ත තෙරුන් ද මැරිය යුතු ය. සියලු භික්ෂූන් ද මැරිය යුතු ය යැයි සම්මත කරගෙන, මහ රජතුමාගේ අවසරය පරිදි කරන්නෙමු යැයි මහ රජතුමාට එය දැන්වූහ.

රජතුමා කුමරු හා භික්ෂූන් මැරිය යුතුය යැයි කී ඇමතිවරු එම තනතුරුවලින් ඉවත් කරවා නො මරනු කැමති ඇමතියන් උසස් තනතුරුවල පිහිටුවා අජාසත්ත කුමාරයා අමතා **"ඔබ මා මරනු කැමැත්තේ කුමක් පිණිස ද"** යැයි අසා රාජ්‍ය වෙනුවෙන් යැයි කී කල්හි කුමාරයාට රාජ්‍ය ලබා දුන්නේ ය. එයින් කුමරු මගේ මනෝ රථය සපිරුණේ ය යැයි සතුටු වූයේ ය.

ඉන් පසු අජාසත් කුමරු දේවදත්ත තෙරුන් වෙත ගොස් පියාගෙන් රාජ්‍යය ලැබුණු බව කීවේය. එවිට දේවදත්ත තෙරුන් කුමරු අමතා **"ඔබ මීයෙකු ඇතුළට දමා බෙරය වසා බඳිනා මිනිසෙකු මෙන් කටයුතු කරන බව සිතමි. කීප දවසකින් ඔබගේ පියා ඔබ කළ අවමානය ගැන සිතා ඔහු ම රජ වන්නේ ය"** යැයි කීවේය. එසේ නම් කුමක් කළ යුතු ද යැයි කුමරු ඇසුවේ ය. පියා ඝාතනය කරන්න යැයි තෙරුන් කීවේය. මා විසින් පියා කෙසේ ඝාතනය කරන්නෙම් ද යැයි කුමරු ඇසූ විට ආහාර නොදී මරවන්න යැයි තෙරුන් කීවේය.

ඉන් පසු කුමරු ගොස් පිය මහ රජු දුම් ගෙයෙහි දමා මගේ මව හැර අන් කිසිවෙක් එහි නොයා යුතුය යැයි අණ කළේ ය. දේවිය රන් බඳුනකින් ආහාර උකුලෙහි තබා ගෙන යයි. රජතුමා එය අනුභව කොට යැපෙයි. කුමරු මගේ පියා කෙසේ යැපෙන්නේ ද යැයි අසා ඒ බව දැන මගේ මවට උකුලෙහි තියා ආහාර ගෙන යාමට නොදෙවු යැයි අණ කළේ ය. එතැන් පටන් දේවිය හිස් වැසුමෙහි සඟවා ආහාර ගෙන යයි. කුමරු එය ද අසා මවට හිස් වැස්ම පැළඳ පිවිසෙන්නට නොදෙවු යැයි අණ කළේ ය. එතැන් පටන් දේවිය රන් මිරිවැඩි සඟලෙහි සඟවා ආහාර ගෙන යයි. කුමරු එය ද අසා මවට රන් මිරිවැඩි පැළඳ යෑමට නොදෙවු යැයි අණ කළේ ය. දේවිය එතැන් පටන් සුවඳ පැනින් නා සිරුරෙහි චතුමධුර ගල්වා පොරවා ගෙන යයි. රජතුමා ඇයගේ සිරුර

ලෙව කා යැපෙයි. කුමරු එය අසා මෙතැන් පටන් මගේ මවට එහි යෑමට නොදෙවු යැයි අණ කළේ ය. දේවිය දොර ළඟ සිට "**හිමියනි මොහු ළදරු කළ මරවන්න නොදුන්නෙහි ය. තමාගේ සතුරා තමා විසින් ම පෝෂණය කෙළෙහිය. දැන් මේ ඔබ තුමාගේ අවසන් දැක්මය. මම මින් පසු ඔබතුමා දක්නට නො ලබමි. මාගේ දෙසක් ඇතොත් සමා වනු මැනව**" යැයි  කියා හඬා වැලපී නික්ම ගියා ය.

එතැන් පටන් රජතුමාට අහරක් නැත. රජතුමා මාර්ග - ඵල සුවයෙන් සක්මන් කරමින් යැපෙයි. ධර්ම ප්‍රීතියෙන් කල් ගෙවන රජතුමාගේ ශරීරය අතිශයින් බබළයි.

අජාසත් කුමරු මගේ පියාගේ තතු කෙසේ ද යැයි අසා දේවයන් වහන්ස සක්මනින් යැපෙයි යැයි සේවකයන් කී විට දැන් ඔහුගේ සක්මන නවත්තමි යැයි සිතා "**මගේ පියාගේ පාද දැලි පිහියෙන් පලා ලුණු තෙලින් අතුල්ලා කිහිරි අඟුරුවලින් චිටි චිටි යන හඬ ඇතිවෙන සේ පුළුස්සව්**" යැයි අණ කොට කරනැවැමියන් යැවීය. රජතුමා ඔවුන් දැක "**ඒකාන්තයෙන් මගේ පුත්‍රයා කවුරුන් හෝ මගේ තොරතුරු දන්වන ලදුව මගේ රැවුල කැපීමට මොවුන් එවන්න ඇත**" යැයි සිතුවේ ය. ඔවුහු ගොස් රජතුමාට වැඳ සිටියහ. කුමක් පිණිස පැමිණියෙහි ද යැයි රජතුමා ඇසුවේ ය. ඔවුහු රජ හසුන දැන්වූහ. එවිට රජතුමා තොපගේ රජුගේ අණ කරව් යැයි කීවේය. ඔවුහු හිඳිනු මැනවි දේවයන් වහන්ස, යැයි කියා රජතුමා වැඳ අවසර ගෙන කියන්නේ "දේවයන් වහන්ස, අපි රජ අණ කරමු. අපට නො කිපෙනු මැනව. මේ නම් නුඹ වහන්සේ වැනි ධාර්මික රජුන්ට නොවිය යුතු දෙයකි" යැයි කියා වම් අතින් ගොප් මස ගෙන දකුණතින් දැලිපිහිය ගෙන පතුල් පළා ලුණු තෙල් ගා කිහිරි අඟුරු මත චිටි චිටි යන හඬ ඇසෙන තෙක් පිළිස්සූහ.

පූර්වයෙහි මේ රජතුමා චෛත්‍ය මළුවක පාවහන් සහිතව ගියේය. හිඳීම පිණිස පනවන ලද ඇතිරිල්ලක් දූවිලි සහිත පයින් පෑගීය. මේ එහි විපාකය වේ.

එසේ පිළිස්සීමෙන් රජතුමාට මහත් වේදනා ඇතිවිය. එතුමා "**භාග්‍යවතුන් වහන්සේ ඓශ්වර්යය, ධර්මය ඓශ්වර්යය**" යනුවෙන් සිහි

කරමින් සිට චෛත්‍ය මළුවක දැමූ මල් දමක් වියළෙන්නා සේ වියළී මියගොස් චාතුර්මහාරාජික දෙව්ලොව වෛශ්‍රවණ දිව්‍ය රාජයාගේ පිරිවරෙහි "ජනවසභ" නම් යක්ෂ සේනාපතියෙකු ව උපන්නේය.

දේවදත්ත තෙරුන් අජාසත් කුමරු වෙත ගොස් බුදුරජාණන් වහන්සේ ඝාතනය කරවන්නට පුරුෂයන් ඉල්ලීය. කුමරු ද පුරුෂයන්ට දේවදත්ත තෙරුන් කියන ලෙස කරව් යැයි අණ කළේ ය. තෙරුන් එයින් කෙනෙකු අමතා **"නුඹ මේ මගින් ගොස් ගිජ්ඣකූට පර්වතයෙහි සිටින ගෞතමයන් නසා මේ මගින් පැමිණෙව"** යැයි අණ කළේ ය. ඔහු එන මගට ඔහු නැසීමට අණ කොට දෙදෙනෙකුන් යැවූහ. ඒ ඒ දෙදෙනා එන මගට ඔවුන් නැසීමට සිව් දෙනෙකුන් යැවූහ. ඒ සිව්දෙනා එන මගට ඔවුන් නැසීමට අණ කොට අට දෙනෙකුන් යැවූහ. ඒ අට දෙනා එන මගට ඔවුන් නැසීමට අණ කොට සොළොස් දෙනෙකුන් යැවූහ.

එසේ අණ ලැබූ පුරුෂයා කඩු පලිස් දරා දුන්න හා ඊතල මිටිය බැඳගෙන භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සිට බියට පැමිණ තැති ගෙන කැලඹුණු සිත් ඇතිව ගල් ගැසී ගිය කය ඇතිව සිටියේ ය. එය දුටු භාග්‍යවතුන් වහන්සේ **"පුරුෂය මෙහි එව, බිය නොවෙව"** යැයි වදාළ සේක.

එවිට ඒ පුරුෂයා එම ආයුධ පසෙක දමා ගොස් භාග්‍යවතුන් වහන්සේ පා මුල හිස නමා වැඳ **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, නුවණ මඳ බැවින් මුලා වී දුෂ්ට සිත් ඇතිව භාග්‍යවතුන් වහන්සේට වධ කරන්නට මෙහි පැමිණියෙමි ද, ඒ වරද මා ඉක්මවා ගියේ ය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස මාගේ මතු සංවරය පිණිස මාගේ ඒ වරද වරද වශයෙන් පිළිගෙන මාහට සමාවන සේක්වා"** යැයි කීවේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"පුරුෂය නුඹ වරද වරද වශයෙන් දැක එයට පිළියම් කොට ආයති සංවරයෙහි පිහිටන්නේ ද, මෙය ආර්‍ය්‍යය විනයෙහි වැඩි දියුණුවක් ය"** යැයි වදාළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට ධර්‍ම දේශනා කොට සෝවාන් ඵලයට පමුණුවා, "**පුරුෂය නුඹ මේ මගින් නොගොස් මේ මගින් යව**" යැයි ඔහු වෙනත් මගකින් යැවූ සේක.

ඔහු මැරීම පිණිස මග රැක සිටි දෙදෙනා ද එම පුරුෂයා නොපැමිණෙන බැවින් ඉදිරියට යන්නාහු රුකක් මුල වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් වැඳ බණ අසා සෝවාන් වූහ. ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ "**මේ මගින් නොගොස් මේ මගින් යවු**" යැයි වෙනත් මගකින් යැවූ සේක.

ඔවුහු දෙදෙනා මැරීම පිණිස මග රැක සිටි සිව්දෙනා ද එම පුරුෂයන් දෙදෙනා නොපැමිණෙන බැවින් ඉදිරියට යන්නාහු රුකක් මුල වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් වැඳ බණ අසා සෝවාන් වූහ. ඔවුන්ට ද භාග්‍යවතුන් වහන්සේ "**මේ මගින් නොගොස් මේ මගින් යවු**" යැයි වෙනත් මගකින් යැවූ සේක.

ඔවුහු සිව්දෙනා මැරීම පිණිස මග රැක සිටි අට දෙනා ද එම පුරුෂයන් සිව්දෙනා නොපැමිණෙන බැවින් ඉදිරියට යන්නාහු රුකක් මුල වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් වැඳ බණ අසා සෝවාන් වූහ. ඔවුන්ට ද භාග්‍යවතුන් වහන්සේ "**මේ මගින් නොගොස් මේ මගින් යවු**" යැයි වෙනත් මගකින් යැවූ සේක.

ඔවුහු අට දෙනා මැරීම පිණිස මග රැක සිටි සොළොස් දෙනා ද එම පුරුෂයන් අට දෙනා නොපැමිණෙන බැවින් ඉදිරියට යන්නාහු රුකක් මුල වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් වැඳ බණ අසා සෝවාන් වූහ. ඔවුන්ට ද භාග්‍යවතුන් වහන්සේ "**මේ මගින් නොගොස් මේ මගින් යවු**" යැයි වෙනත් මගකින් යැවූ සේක.

මුලින් ම භාග්‍යවතුන් වහන්සේ නැසීමට ගිය පුරුෂයා දේවදත්ත තෙරුන් වෙත ගොස් ස්වාමීනි, ඒ භාග්‍යවතුන් වහන්සේ දිවියෙන් තොර කරන්නට මට නොහැක්කෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ මහත් සෘද්ධි ඇති සේක. මහත් ආනුභාව ඇති සේක යැයි කීවේය.

එවිට දේවදත්ත තෙරුන් "කම් නැත නුඹ සිටුව. මම ම ඒ ගෞතමයන් දිවියෙන් තොර කරන්නෙමි" යැයි කියා ගිජ්ඣකූට පර්වතයට නැඟ එහි පාමුල සෙවනෙහි සක්මන් කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ ගේ හිස මතට මහත් ගලක් පෙරළීය. එවිට පොළොවෙන් ගල් දෙකක් මතුව ඒ පෙරලූ ගල පිළිගත්තේ ය. ඒ පෙරළු ගලෙහි පතුරක් ගැලවී ඇවිත් භාග්‍යවතුන් වහන්සේගේ දකුණු පාදයෙහි වැදී ලේ නික්මිණ.

එවිට භාග්‍යවතුන් වහන්සේ උඩ බලා "**හිස් පුරුෂය නුඹ නපුරු සිතින් වධක චේතනාවෙන් යුක්තව තථාගත සිරුරෙන් ලේ සෙලවිය. එයින් නුඹ බොහෝ පව් රැස් කරන ලද්දෙහි ය**" යැයි වදාළ සේක.

එසේ ගල් පතුර වැදීමෙන් භාග්‍යවතුන් වහන්සේට මහත් වේදනාවක් ඇතිවිය. ජීවක වෛද්‍යාචාර්ය්‍ය තුමා පැමිණ තථාගතයන් වහන්සේගේ පාදය පලා නරක් වූ ලේ මුදා හැර සෝද බෙහෙත් ගල්වා එය සුව කළේ ය.

ඉක්බිති භික්ෂූන් වහන්සේලා ඒ කරුණ දැන "**අපි භාග්‍යවතුන් වහන්සේට ආරක්ෂාව සපයන්නෙමු**" යැයි ඒ හාත්පස රැස් වූහ. එය දැන භාග්‍යවතුන් වහන්සේ "**අට්ඨානමෙතං, භික්ඛවෙ, අනවකාසො, යං පරූපක්කමෙන තථාගතං ජීවිතා වොරොපෙය්‍ය. අනුපක්කමෙන, භික්ඛවෙ, තථාගතා පරිනිබ්බායන්ති**" යනුවෙන් "**මහණෙනි පරෝපක්‍රමයෙන් තථාගතයන් වහන්සේ දිවියෙන් තොර කරන්නේය යන මෙය සිදු නොවන්නකි. එය වන්නට කරුණක් නැත. මහණෙනි තථාගතයන් වහන්සේලාගේ පරිනිර්වාණය පරෝපක්‍රමයකින් තොරවම සිදු වෙති**" යැයි වදරා නැවත ද "**මහණෙනි නුඹලා තම තමන්ගේ සෙනසුන් වලට යවු. තථාගතයන් වහන්සේලා අන්‍යයන් විසින් නොරැක්ක යුත්තෝ ය**" යැයි වදාළ සේක.

ඉන් පසු තථාගතයන් වහන්සේ මහත් භික්ෂු සංඝයා පිරිවරා ගෙන මහත් වූ බුද්ධ ලීලාවෙන් රජගහ නගරයට වැඩි සේක.

ඉක්බිති දේවදත්ත තෙරුන් භාග්‍යවතුන් වහන්සේ දැක මෙසේ සිතුවේ ය. ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේගේ රූප සෝභාවෙන් අග

තැන්පත් සිරුර දැක කිසි කෙනෙකුන්ට උන් වහන්සේ වෙත ලංවිය නොහැකි වෙයි. රජුගේ නාළාගිරි ඇතා චණ්ඩ ය. පරුෂය. මනුෂ්‍ය ඝාතකයෙකි. ඒ ඇතා බුද්ධ ධම්ම සංඝ ගුණ නොදනී. එබැවින් ඒ ඇතා ගෞතමයන් වහන්සේ ව ජීවිතක්ෂයට පමුණුවන්නේය. මෙසේ සිතා රජ මාලිගයට ගොස් අජාසත් රජතුමාට එය කීවේය. රජතුමා යහපති යැයි පිළිගෙන ඇත්ගොව්වා කැඳවා මිත්‍රය, හෙට නාළාගිරි ඇතා මත් කොට උදෑසනම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ පිළිපන් මාර්ගයට පිටත් කොට හරිව් යැයි අණ කළේ ය. ඇත් ගොව්වා යහපත යැයි එය පිළිගත්තේ ය. එවිට දේවදත්ත තෙරුන් අන් දිනවල ඇතා කොපමණ සුරා පානය කරන්නේ ද යැයි අසා කළ අටක් යැයි කී කල්හි එසේ නම් හෙට ඇතාට සුරා කළ සොළොසක් පොවා ගෞතමයන් වහන්සේ ඉදිරියට මුදා හරව යැයි කීවේය.

අජාසත් රජතුමා එදින නගරයෙහි බෙර හසුරුවා හෙට නාළාගිරි ඇතා මත් කොට නගරයට පමුණුවන්නේ ය. නුවර වාසීන් උදෑසන කළමනා කටයුතු නිමවත්වා. අතුරු වීථියට නොපැමිණෙත්වා යැයි කීවේය. දේවදත්ත තෙරුන් රජ මාලිගයෙන් බැස ඇත්හලට ගොස් ඇත් ගොව්වන් අමතා **"අපි උසස් තනතුරු පහත් කරන්නට ද, පහත් තනතුරු උසස් කරන්නට ද දක්ෂයෝ වෙමු. ඉදින් නුඹලා කීර්තිමත් වූයේ හෙට උදෑසනම ඇතුට පැසුණු රා කළ සොළොසක් පොවා, උල් තෝමරයෙන් (හෙණ්ඩුවෙන්) ඇන ඇතු කොප කරවා, ඇත්හල බිඳවා, ඇතා මුදා හැර ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ජීවිතක්ෂයට පමුණුවව්"** යැයි කීවේය.

මේ පුවත මුළු නුවර පුරා ප්‍රසිද්ධ විය. රත්නත්‍රය මාමක උපාසකයෝ ශාස්තෲන් වහන්සේ වෙත ගොස් වැඳ මෙසේ කීහ. **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දේවදත්ත තෙරුන් රජතුමා සමග එකතුව හෙට භාග්‍යවතුන් වහන්සේ පිළිපන් වීථියට නාළාගිරි ඇතා මත් කොට පමුණුවන්නේය. හෙට පිඬු පිණිස නොවැඩ මෙහි ම වැඩ හිඳින සේක්වා. අපි විහාරයෙහිදී ම බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට දන් දෙන්නෙමු"** යැයි කීහ. එකල්හි ශාස්තෲන් වහන්සේ හෙට පිඬු පිණිස නුවරට නොවඩින්නෙමි යැයි නොවදරා **"හෙට මම නාළාගිරි ඇතා දමනය කර ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා තීර්ථකයන් මැඩ රජගහ පුර පිඬු පිණිස නොහැසිර භික්ෂු සංඝයා පිරිවරා නගරයෙන් නික්ම වේළුවනාරාමයට**

**යන්නෙමි. නුවර වාසීහු දනය රැගෙන වේළුවනාරාමයට පැමිණෙන්නාහ. හෙට විහාරයෙහි ම දන් වැළඳීම වන්නේ ය"** යැයි ඉවසා වදාළ සේක.

ශාස්තෘන් වහන්සේ එදින රාත්‍රී ප්‍රථම යාමයෙහි භික්ෂූන් වහන්සේලාට හා භික්ෂුණීන් වහන්සේලාට දහම් දෙසා, මධ්‍යම යාමයෙහි දෙවියන්ගේ ප්‍රශ්න විසඳා දහම් දෙසා, පශ්චිම යාමයේ ප්‍රථම කොටසෙහි සිංහ සෙය්‍යාවෙන් සැතපී, දෙවන කොටසෙහි මහා කරුණාවෙන් ධර්මාවබෝධයට සුදුසු වේනෙය්‍ය ජනයන් බලා වදාරණ සේක්, නාළාගිරි දමනයෙහි දී සුවාසූදහසක් සත්වයන් මඟ ඵල නිවන්සුව ලබන බව දැක ආනන්ද තෙරුන් අමතා **"ආනන්දය, රජගහ නුවර හාත්පස අටළොස් විහාරයන්හි වැඩ සිටින සියලු භික්ෂූන් වහන්සේලාට, අද මා සමග පිඬු පිණිස වැඩීමට දැනුම් දෙන්න"** යැයි වදාළ සේක. ආනන්ද තෙරුන් එසේ කළේ ය. සියලු භික්ෂූන් වහන්සේලා වේළුවනයට රැස් වූහ. ශාස්තෘන් වහන්සේ සියලු භික්ෂු සමූහයා පිරිවරා ප්‍රාතිහාර්‍යයෙන් යුක්තව රජගහ නුවරට වඩිනු පිණිස පිළිපන් සේක. ඇත් ගොව්වෝ කැමති ලෙස තම කාර්‍යය කළහ. එය බැලීමට මහත් සේනාවක් රැස් වූහ. සැදැහැති බුද්ධිමත් බෞද්ධයෝ **"අද වනාහී බුද්ධ නම් මහ හස්ති රාජයෙකු තිරිසන් ගත ඇතෙකු සමග යුද්ධයක් වන්නේ ය. උපමා රහිත බුද්ධ ලීලාවෙන් නාළාගිරි දමනය බලන්නෙමු"** යැයි ප්‍රාසාද සැදවිය. ගෙවල් පියසි ආදියට නැගී සිටියහ. සැදැහැ නැති මිසදිටුවෝ **"මේ නාළාගිරි චණ්ඩ ය පරුෂය මනුෂ්‍ය ඝාතකයෙකි. බුදුවරුන්ගේ ගුණ නොදන්නෙකි. අද ඇතා විසින් ශ්‍රමණ ගෞතමයන්ගේ රන්වන් සිරුර සුනු විසුනු කොට ජීවිතක්ෂයට පමුණුවන්නේය. අද අපගේ පසමිතුරා පිටු දකින්නෙමු"** යැයි ගස් ගල් ගෙවල් ආදියට නැගී සිටියහ.

එදින පෙරවරුවෙහි භාග්‍යවතුන් වහන්සේ සතළිස් දහසක් පමණ භික්ෂු සංඝයා පිරිවරා ගෙන ප්‍රාතිහාර්‍යයෙන් යුක්තව පිඬු පිණිස රජගහ නුවර වීථියට පිළිපන් සේක.

ඇත් ගොව්වෝ ද ඒ බව දැන ඇතාට රා කළ දහසයක් පොවා කුලප්පු කොට වීථියට මුදා හැරියේ ය. ඇතා දුරින් වඩින්නා වූ

භාග්‍යවතුන් වහන්සේ දැක සොඬය හා වලිගය ඔසවා ගෙන කන් විදහා ගෙන ගෙවල් බිඳිමින් භාග්‍යවතුන් වහන්සේ වෙත දිවිය.

භික්ෂූන් වහන්සේලා එලෙස දිව එන ඇතා දැක භාග්‍යවතුන් වහන්සේ අමතා ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මිනිසුන් මරණ නපුරු වූ නාළාගිරි ඇතා මේ වීථියට පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්ස නැවත හැරී වඩින සේක්වා, සුගතයන් වහන්ස නැවත හැරී වඩින සේක්වා යැයි කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ "**මහණෙනි එව්, බිය නොවව්, පරෝපක්‍රමයෙන් තථාගතයන් වහන්සේ දිවියෙන් තොර කරන්නේ ය යන මෙය සිදු නොවන්නකි. එය වන්නට කරුණක් නැත. මහණෙනි පරෝපක්‍රමයකින් තොරවම තථාගතයන් වහන්සේලාගේ පරිනිර්වාණය සිදු වෙති**" යැයි වදාළ සේක. එවිට සාරිපුත්‍ර මහරහතන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින සේක්වා මම ඇතා දමනය කරමි**" යැයි කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්‍රය බුද්ධ බලය අනිකකි. ශ්‍රාවක බලය තව එකකි. නුඹ සිටින්න මම ඇතා දමනය කරමි යැයි වදාළ සේක. අනෙකුත් අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා ද ඉදිරිපත් වූහ. ශාස්තෘන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේලාම වැළැක්වූ සේක.

ඒ ඇතා දැක බියපත් වූවෝ සඳළු ප්‍රාසාද පියසි ගස් ආදියට නැඟී ගත්හ. බුදු සසුනෙහි නො පහන් වූවෝ "**අද විශිෂ්ට රූප සෝභා ඇති මහා ශ්‍රමණයා ඇතු විසින් නසනු ලැබේ ය**" යැයි කීහ. බුදු සසුනෙහි පහන් වූ ශ්‍රද්ධා සම්පන්න බුද්ධිමත්හු "**පින්වත්නි, කළකට පසු අද නාගයන් (ශ්‍රේෂ්ඨයන්) දෙදෙනෙකු ගේ සටනක් දැකිය හැකි වන්නේ ය**" යැයි කීහ. ඇතා ලංවත්ම ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට අනතුරක් වීම මට බලා සිටිය නොහැකිය යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ තම ඍද්ධියානුභාවයෙන් පොළොව කරකවා ආනන්ද තෙරුන් පසුපසට කළ සේක.

එක් ස්ත්‍රියක් මරණ බියෙන් යුතුව තම ඇකයෙහි සිටි කුඩා දරුවා වීථියෙහි දමා පලා ගියා ය. ඇතු ඇය ලුහුබැඳ ගොස් ඒ දරුවා වෙතට ආවේය. දරුවා මහ හඬින් හැඬීය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දස දහසක් ලෝක ධාතුන්ට පතුරවන මෙත් සිත එම ඇතාට

පතුරවා සුමිහිරි බ්‍රහ්ම ස්වරය විහිදුවා ඇතු අමතා "**නාලාගිරිය, නුඹට සොළොස් කළයක් පිරුණු රා පොවා මත්කරවූයේ අනෙකකු ගැන්වීමට නොවේ, නිකරුණේ පාද වෙහෙසීමට පත් නොකොට මෙහි පැමිණෙව**" යැයි වදාළ සේක. ශාස්තෘන් වහන්සේගේ ඒ මධුර නාදය ඇසෙත් ම ඇතා ගේ වෛරී මත සිඳී ගොස් නෙත් කුඩා කොට භාග්‍යවතුන් වහන්සේගේ රූප සෝභාවය බලා සංවේගයට පැමිණ සොඬය පහත දමා කන් සොලවමින් ශාන්ත ඉරියව්වෙන් ගොස් භාග්‍යවතුන් වහන්සේ ගේ පාද මූලයෙහි වැටුණේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඇතු අමතා "**නාලාගිරිය නුඹ තිරිසන් ගත ඇතෙකි. මම බුද්ධ නැමති ඇතා ය. නුඹ මෙතැන් පටන් චණ්ඩ නොවෙව. පරුෂ නොවෙව. මනුෂ්‍ය ඝාතකයෙකු නොවෙව. මෛත්‍රී සිත් ඇත්තෙකු වෙව**" යැයි වදරා දකුණු අතින් ඇතාගේ කුම්බස්ථලය පිරිමදිමින් ගාථාවලින් මෙසේ වදාළ සේක.

**"මා කුඤ්ජර නාගමාසදෙ**
**දුක්ඛඤ්හි කුඤ්ජර නාගමාසදෙ,**
**න හි නාගහතස්ස කුඤ්ජර**
**සුගති හොති ඉතො පරං යතො.**

"හස්තිය, බුද්ධ නාගයන් වහන්සේට පීඩා කරන්නකුට මෙයින් මතු සුගතියක් නොවන්නේ ද, එහෙයින් හිංසා කිරීමේ සිතින් බුද්ධ නාගයන් වහන්සේ වෙත ළං නොවෙව. බුද්ධ නාගයන් වහන්සේට හිංසා කිරීමේ සිතින් ළං වීම ඒකාන්තයෙන් දුකට හේතු වේ"

**"මා ච මදෙ මා ච පමාදෙ**
**න හි පමත්තා සුගතිං වජන්ති තෙ,**
**ත්වඤ්ඤෙව තථා කරිස්සසි**
**යෙන ත්වං සුගතිං ගමිස්සසී'ති"**

"හස්තිය මත් නොවෙව. පමා නොවෙව. පමා වූවෝ සුගතියට නොයති. එබැවින් යමකින් නුඹ සුගතියට යන්නෙහි ද නුඹ ම එලෙසට දැනගෙන කරව" යැයි වදාළ සේක.

ඒ උපදේශයන් අසා ඇතාගේ මුළු සිරුරම සතුටින් පිනා ගොස් එයින් නිරතුරුව පැතිරුණේ විය. ඒ ඇතු තිරිසනෙකු නොවූනේ නම් එදින සෝවාන් ඵලයෙහි පිහිටන්නේ ය. රැස්ව සිටි ජනයා ඒ ප්‍රාතිහාර්‍යය දැක සාධුකාර පැවැත්වූහ. මහ හඬින් නාද කළහ. අත්පොළසන් ගැසූහ. හටගත් සොම්නසින් රන් රිදී ආදී නොයෙක් ආභරණ ඇතුට විසි කළහ. ඒවා ඇතුගේ ඇඟෙහි වැදී ගියහ. එතැන් පටන් ඒ ඇතාගේ නාළාගිරි යන නාමය වෙනස් ව "**ධනපාල ඇතා**" යැයි නමක් විය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ එම ඇතා පාලි භාෂා වචනයෙන් තෙරුවන් සරණ ගන්වා පඤ්ච සීලයෙහි පිහිටුවා ලූ සේක. එයින් ඇතා දමනය වී තෙරුවන් සරණ පිහිටා අතිශයින් සංවර විය.

ඉන් පසු ඇතා සොඬින් භාග්‍යවතුන් වහන්සේගේ පා දූවිලි ගෙන හිස මුදුනෙහි වගුරුවාගෙන භාග්‍යවතුන් වහන්සේ නොපෙනී යන තාක් පසුපසට ගොස් ආපසු හැරී ගියේය. එතැන් පටන් ඇතා කිසි කලෙකවත් ස්වල්ප මාත්‍ර වූ ද කලබලයක් හෝ හානියක් නොකළ විරූය.

ශාස්තෘන් වහන්සේ ඇතු හික්මවා පිරිපුන් මනෝ රථය ඇතිව "**යමෙකු විසින් යම් ධනයක් ඇතු වෙත විසි කරන ලද්දේ ද, ඒ ධනය ඔවුන්ට ම වේවා**" යැයි අධිෂ්ඨාන කොට "**අද මා විසින් මහත් ප්‍රාතිහාර්‍යයක් කරන ලද්දේ වෙමි. එබැවින් මේ නගරයෙහි පිඬු පිණිස හැසිරීම නුසුදුසු ය**" යැයි සිතා භික්ෂු සංඝයා පිරිවරා ආපසු විහාරයට වැඩ නුවර වාසීන් පිළිගැන්වූ ප්‍රණීත දානය වළඳ පැමිණ සිටි රජගහ නුවර වැසි අටළොස් කෝටියක් ජනයාට දාන කථා ආදී පිළිවෙළ කථාව වදරා ඔවුහු එකඟ වූ සිතින් යුක්ත වූ කල්හි චතුරාර්‍ය සත්‍යයන් කුළු ගන්වා ධර්ම දේශනා කිරීමෙන් සුවාසූදහසක් දෙනා මග - ඵල නිවන්සුව ලැබූහ. එය "**ධනපාල හස්ති සමාගමය**" නම් වේ.

මෙලෙස දෙව්දත් තෙරුන් විසින් නාළාගිරි හස්ති රාජයා සුරා මදින් මත් කරවා භාග්‍යවතුන් වහන්සේ නැසීමට එවූ කල්හි භාග්‍යවතුන් වහන්සේ මහා කරුණාවෙන් එම ඇතා ඉතා කීකරු සත්වයෙකු කොට මතු භවයන්හි දී ද සුගතිගාමී ව නිවන් සුවයට පැමිණ සසර දුක් අවසන් කරන්නෙකු කොට හික්මවා වදාළ සේක.

මෙය අර්ථ වශයෙන් ගෙන සත්‍යක්‍රියා කොට සෙත් පැතීම මෙම ගාථාවෙන් ප්‍රකාශ කොට දක්වන්නේ ය.

**නාලාගිරිං ගජවරං අතිමත්ත භූතං**
**දවග්ගි චක්ක මසනීව සුදරුණං තං,**
**මෙත්තම්බුසෙක විධිනා ජිතවා මුනින්‍දො**
**තං තෙජසා භවතු තෙ ජයමඞගලානි.**

ලැව් ගින්න මෙන් දරුණු වූ - හෙන සේ බිරම් වූ
නාලාගිරී ඇත් රජුන් - මත් වූ සුරායෙන්
මෙත් නම් මහා ජල කඳින් - නිව් වීරයාණෝ
ඒ ආනුභාව බලයෙන් - සුව සෙත් සැදේවා.

# 4. අංගුලිමාල දමනය

මේ අංගුලිමාල තෙරුන් වහන්සේ පූර්ව බුදු සසුන්හි දී කුසල් කොට කරන ලද ප්‍රාර්ථනා ඇතිව ඒ ඒ භවයන්හි දී සසරට පිහිට වන්නා වූ කුසල් රැස් කොට අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි කොසොල් රට කොසොල් රජතුමාගේ පුරෝහිත බ්‍රාහ්මණයා වන "**භග්ගව**" බ්‍රාහ්මණයාට දව "**මන්තානි**" බැමිණිය කුස පිළිසිඳ ගත්තේ ය. දස එකඩ මසක් ඇවෑමෙන් එම දරු ගැබ මේරීමට පත්ව එක් දිනක රාත්‍රියෙහි දරු ප්‍රසූතිය සිදු විය. එම දරුවා උපදින වේලාවෙහි සැවැත් නුවර පුරා තිබුණු සියලු ආයුධ දිලිසුණහ. කොසොල් රජතුමාගේ මාලිගාවෙහි සිරි යහන මත තිබූ මඟුල් කඩුව ද දිලිසුණේ ය. එවිට එය දැක බියපත් වූ රජතුමා තැති ගෙන නො නිද සිටියේ ය.

එවිට භග්ගව පුරෝහිත බ්‍රාහ්මණයා ගෙයින් නික්ම අහස නැකත් තරු පරීක්‍ෂා කොට බලා එම උත්පත්තිය චෞර නැකතින් සිදු වී ඇති බව දැන රජතුමා සමීපයට ගොස් රාත්‍රියෙහි සුවෙන් සැතපුණේද යැයි ඇසුවේ ය. එවිට රජතුමා "**ආචාර්ය්‍ය, මට සැප නින්දක් කොයින්ද? මගේ මඟුල් කඩුව ඊයේ රාත්‍රියෙහි දිලිසුණේ ය. මාගේ රාජ්‍යයට හෝ ජීවිතයට අනතුරක් ද?**" යැයි ඇසුවේ ය. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා

**"මහ රජතුමනි, බිය නොවන්න. මාගේ නිවසෙහි කුමරුවෙක් උපන්නේ ය. ඔහුගේ ආනුභාවෙන් ඔබගේ රජ නිවසෙහි පමණක් නොව සියලු සැවැත් නුවර ආයුධ දිලිසුණේ ය"** යැයි කීවේ ය. එවිට රජතුමා **"ආචාර්යයි එයින් කුමක් වන්නේ ද?"** යැයි ඇසුවේ ය. **"මහරජ, ඔහු සොරෙකු වන්නේය"** යැයි පුරෝහිතයා කීවේ ය. එවිට රජතුමා **"ආචාර්යයි කිමෙක් ද ඔහු එක් සොරෙක් ද, එසේ නැතිනම් රාජ්‍යය වනසන සොරෙක් ද"** යැයි ඇසුවේ ය. **"මහරජ, එක සොරෙක් පමණකි"** යැයි ඔහු කීවේ ය. එම පුරෝහිත බ්‍රාහ්මණයා රජතුමාගේ සිත දිනා ගනු පිණිස **"මහ රජ, ඔහු මරා දමන්න ද?"** යැයි ඇසුවේ ය. එවිට රජතුමා **"බ්‍රාහ්මණය, එක් සොරෙකු කුමක් කරන්න ද, සියක් කිරියක් වපුරන කුඹුරක එක වී කරලක් මෙන් වෙයි. ඔහු පෝෂණය කරව"** යැයි කීවේ ය. එම කුමරුවාට නම් තබන දිනයෙහි රජතුමාගේ සිත පීඩාවට පත් කරමින් උපන් බැවින් **"හිංසක"** යැයි නම් තබා **"අහිංසක"** යැයි ව්‍යවහාර කළේ ය. ඔහු වැඩි විය පැමිණි පසු පූර්ව කර්ම බලයෙන් ඇත්තු සත් දෙනෙකුගේ බලය ඇති විය.

පූර්වයෙහි අබුද්ධොත්පාද කාලයක මොහු ගොවියෙකු ව ඉපද සිටියේ ය. එකල්හි එක් පසේ බුදුරජාණන් වහන්සේ නමක් වැස්සෙන් තෙමී තෙත් වූ සිවුරෙන් යුතුව තම ගොවි පොල ආසන්නයට වැඩි බව දැක **"මට පින් කෙතක් පහළ වූයේ ය"** යැයි සතුටු සිතින් ගිනි දල්වා දුන්නේ ය. ඔහු එම කර්ම බලයෙන් උපනුපන් තැන්හි දී මහත් කාය බල ඇතිව ඉපද මේ අවසන් ආත්ම භාවයෙහි දී ඇත්තු සත් දෙනෙකුගේ බල ඇත්තෙකු විය.

පසුව ඔහු ශිල්ප උද්ග්‍රහණය පිණිස තක්ෂිලා නුවරට පිටත් කොට හැරියේ ය. ඔහු ගොස් දිසාපාමොක් ඇදුරු තුමාගේ සමීපයෙහි අතවැසියෙකු ලෙස වතින් සරු, කීකරු මනාපචාරී සිසුවෙකු වී ඒ ඇදුරු තුමාට හා ඇදුරු භාර්යාවට හොඳින් ඇප උපස්ථාන කරමින් ශිල්ප ඉගෙනීම කළේ ය. එබැවින් ඒ ඇදුරු භාර්යාව තම නිවසට ලැබෙන ආහාර ආදියෙන් එම සිසුවාට සංග්‍රහ කරයි. එය නො ඉවසන්නා වූ අන් තරුණයෝ ඔහු ගුරුවරයා සමග භේද කරවීමට සිතා කතිකා කරගෙන අන් සියල්ලන්ට ම වඩා ප්‍රඥාවන්ත හෙයින් මෝඩයෙකු යැයි කිව නොහැක. හොඳින් වත් පිළිවෙත්හි යෙදෙන බැවින් නරක පැවතුම් ඇත්තෙකු යැයි කිව නොහැක. ජාති සම්පන්න

හෙයින් කුල හීනයෙකු යැයි කිව නොහැකිය. එබැවින් අපි කුමක් කරන්නෙමු ද යැයි සාකච්ඡා කොට "**අපි ඔහු ගුරු පතිනිය හා සම්බන්ධ කොට එයින් ඔහු බිඳවමු**" යැයි කතිකා කරගෙන ඔවුහු කොටස් තුනකට බෙදුනාහ. එයින් පළමු ව එක් පිරිසක් ගුරුවරයා වෙත එළඹ වැඳ සිටියාහුය. එවිට ආචාර්යවරයා "දරුවනි කිමෙක් ද?" යැයි ඇසුවේ ය. එවිට ඔවුහු "ආචාර්යයන් වහන්ස, මේ ගෙයි එක් කථාවක් ඇසෙයි" යැයි කීහ. ආචාර්යවරයා "ඒ කුමක් ද දරුවනි" යැයි ඇසූ විට "අහිංසක මානවකයා නුඹ වහන්සේගේ පතිනිය හා එක්ව නුඹ වහන්සේ මැරීම සඳහා කුමන්ත්‍රණය කරන බවක් හැඟෙයි" යැයි කීහ. එවිට ආචාර්යවරයා "වසලයනි යව්, මාගේ පුත්‍රයා හා මා නොබිඳවව්" යැයි කියා ඔවුහු එළවා දැමූවේ ය. ඉන් පසු අනෙක් කණ්ඩායම් දෙකම ඇවිත් එසේ ම කියා "අප කී දේ නො අදහන්නේ නම් පරීක්‍ෂා කොට බලා දැන ගනු මැනව" යැයි කීහ. ආචාර්යවරයා පළමු ව ඔවුහු කී දේ නො පිළිගත්තේ ය. එහෙත් නැවත නැවත කියන කල්හි එය විශ්වාස කොට තමන්ට ස්නේහයෙන් මොවුන් කියන්නාහ යැයි අදහා ඔහු මරමි යැයි සිතුවේ ය. ඉන් පසු නැවත මම මොහු ඝාතනය කරන්නේ නම් දිසාපාමොක් ආචාර්යවරයා තමන් හමුවට ශිල්ප ඉගෙනීමට පැමිණෙන ශිෂ්‍යයෙකු ද්වේෂ උපදවා ඝාතනය කළේ ය යැයි නැවත කිසිවෙකු ශිල්ප ඉගෙනීමට මා හමුවට නො පැමිණෙයි. එසේ වුවහොත් මාගේ ලාභ පිරිහෙන්නේ ය. එසේ ම මහා බල සම්පන්න වූ මේ සිසුවා කිසිවෙකු විසින් මරන්නට නොහැක්කේ ය. එබැවින් යම්කිසි උපායකින් අනුන් ලවා ඔහු මොහු මරවන්නෙමි" යැයි සිතා ශිල්ප හදරා අවසන් ව තමන්ට ගමට යාමට අවසර ඉල්ලූ කල්හි "දරුව අහිංසකය, ශිල්ප හදරා අවසන් වූ ශිෂ්‍යයා විසින් ගුරුවරයාට පුද පඬුරු දිය යුතු ය. එබැවින් එය මට දෙන්න" යැයි කීවේ ය. එවිට අහිංසක "ගුරුතුමනි, දිය යුත්තේ මොනවා ද?" යැයි ඇසුවේ ය. එවිට ආචාර්යවරයා "**එසේ නම් දරුව, නුඹ මිනිසුන් දහසක් මරා දකුණු අතෙහි ඇඟිලි දහසක් රැගෙන එව. එවිට නුඹ ශිල්පයට උපහාර කළා වන්නේ ය**" යැයි කීවේ ය.

එවිට අහිංසක මානවකයා "**ගුරුතුමනි, අපි අහිංසක කුලයෙහි උපන්නෝ වෙමු. එබැවින් එය කළ නොහැකිය**" යැයි කීවේ ය. එවිට ආචාර්යවරයා "**දරුව, උපහාර නොලබන ශිල්පය ඵල නොදෙයි**" යැයි කීවේ ය.

එවිට අහිංසක මානවකයා ආචාර්‍යවරයාට වැඳ ආයුධ පසකින් සන්නද්ධව කොසොල් රජතුමාගේ රාජ්‍යයෙහි **"ජාලින"** නම් වනයට පිවිස වනයට ඇතුල් වන දෙරටුවෙහි ද මහ වන මැද ද වනයෙන් පිටවෙන දෙරටුවෙහි ද සිට මිනිසුන් මැරුවේ ය. එසේ මරණ මිනිසුන්ගේ වස්ත්‍රයක් හෝ හිස් වෙළුම් ආදී වූ කිසිවක් හෝ නොගනී. එක් එක් ඇඟිල්ල කපා එකයි දෙකයි යනුවෙන් ගිණුම් පමණක් කරමින් යයි. එසේ කළ ගණනය ද සිතෙහි නො රැඳෙයි. ප්‍රකෘතියෙන් ම මොහු ප්‍රඥවන්තයෙකු බැවින් ප්‍රාණඝාත සිතක් සිතෙහි නොපිහිටයි. එබැවින් මරණ මිනිසුන්ගේ ගණන ද නොසළකයි. ඔහු මහා මාර්ගය අසල ගල් පර්වත අතර වෙසෙමින් කඳු මුදුනට නැග මග යන එන මිනිසුන් බලා වේගයෙන් දුව ගොස් ඇඟිලි කපාගෙන අවුත් ගසක එල්ලයි. ඒවා ගිජු ලිහිණියෝ ද කවුඩෝ ද කති. බිම දැමූ ඒවා කුණු වී යයි. මෙසේ ඇඟිලි ගණන සම්පූර්ණ නොවන බැවින් පසුව එලෙස කපාගන්නා වූ ඇඟිලි විද වැලක අමුණා මාලාවක් මෙන් කොට යාගයකට එකතු කලාක් මෙන් පසෙක එල්ලා ගත්තේ ය. එතැන් පටන් ඔහුට **"අංගුලිමාල"** යන නම ව්‍යවහාර විය. මෙසේ ඔහු මිනිසුන් මරණ කල්හි මාර්ගය හිස් විය. ඉන් පසු ඔහු මාර්ගයෙහි මිනිසුන් හමු නොවන බැවින් ගම සමීපයට ගොස් සැඟවී සිට පැමිණි පැමිණි මිනිසුන් මරා ඇඟිලි කපාගෙන යයි. පසුව ඔහු රාත්‍රී කාලයෙහි ඇතුළු ගමට වැද පයින් පහර දී දෙර හැර මිනිසුන් මරා ඇඟිල්ලක් බැගින් කපාගෙන යයි. එයින් බියට පත් මිනිස්සු ගම අතහැර ගියහ. ගම ජන ශූන්‍ය විය. අවට නියම් ගම් ජනපද ද ජන ශූන්‍ය විය. මෙසේ ඒ පලාත ඔහු විසින් බිය වද්දවන ලදි. ඒ අවට තුන් යොදුන් ප්‍රදේශයෙහි කිසිවෙකු නොවිසූහ. සියල්ලෝ ම තම අඹු දරුවන් අතින් ගෙන සැවැත් නුවරට පැමිණ නුවර වට කොට කඳවුරු බැඳ රජ මිදුලෙහි රැස්ව **"දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ විජිතයෙහි අංගුලිමාල නම් සොරෙක් සිටී"** යැයි කියා විලාප නගයි. එකල්හි රජතුමා උදැසනින් ම **"වහාම අංගුලිමාල සොරාව අල්ලා ගනිමු. බල සේනාව රැස් වෙත්වා"** යැයි නුවර බෙර හැසිරවීය.

එවිට භග්ගව පුරෝහිත බ්‍රාහ්මණයා **"මේ මාගේ පුත්‍රයා විය යුතුය"** යැයි සිතා නිවසට පැමිණ මන්තානි බැමිණිය අමතා **"සොඳුර, අංගුලිමාල නම් සොරෙක් උපන්නේ ය. හෙතෙමේ අනිකෙකු නොවේය. තිගේ පුත්‍රයා වන අහිංසක කුමාරයා ය. දැන් රජතුමා ඔහු**

**අල්ලන්නට නික්මෙන්නේ ය. කුමක් කරන්න ද?"** යැයි බැමිණියට කීවේ ය.

එවිට බැමිණිය **"ස්වාමීනි, යන්න ඔහු කැඳවාගෙන එන්න"** යැයි කීවා ය. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා **"සොඳුර, මම උත්සාහ නොකරමි. ජනයන් සිව් දෙනෙකු පිළිබඳව විශ්වාසයක් නම් නැත. එනම්:-**

1. **සොරා මාගේ පුරාණ මිත්‍රයෙකුය යැයි විශ්වාස නොකළ යුතුය.**
2. **කොල ඇතිරිය පෙර මාගේ ඇතිරිය යැයි විශ්වාස නොකළ යුතුය.**
3. **රජු මට පුදති යැයි විශ්වාස නොකළ යුතුය.**
4. **ස්ත්‍රිය මාගේ වසඟයට පැමිණියාය යැයි විශ්වාස නොකළ යුතුය"** යැයි කියා මට ඔහු විශ්වාස නැත යැයි කීවේ ය.

එහෙත් මවකගේ හදවත මෘදුය. එබැවින් ඒ මන්තානි බැමිණිය දරු සෙනෙහසේ බලවත් කමින් මගට අවශ්‍ය දේ සූදනම් කරගෙන **"මාගේ පුත්‍රයාට කරුණු කියා දී කැඳවාගෙන එමි"** යැයි කියා නික්ම ගියා ය.  මේ වන විට අංගුලිමාල හට ඇඟිලි එකුන් දහසක්[1] එකතුව තිබුණේ ය. දහස පුරවා ගුරු පූජාව කිරීමට එකක් අඩුව තිබුණේ ය. එබැවින් තම මව හෝ මරා ඒ අඩුව පිරවීම ඔහු කරන්නේ ය.

එදින භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් අලුයම නැඟී සිට දැහැටි වළඳ මුව ධෝවනය කොට නැගෙනහිර දිසාභිමුඛ ව පර්‍යංකයක් බැඳ වැඩ හිඳ තමන් වහන්සේ වැඩ සිටින ගඳකිළි දොර පටන් දස දහසක් ලෝකධාතු කෙළවර කොට මහා කරුණාවෙන් අද කා හට පිහිට වන්නේ දෝ හෝයි බලා වදාරණ සේක් අංගුලිමාල දැක **"අද මා එහි ගිය කල්හි ඔහුට යහපතක් වන්නේය. සිව්පද ගාථාවක් අසා මා සමීපයෙහි පැවිදි ව ෂට් අභිඥා සාක්ෂාත් කරන්නේ ය. ඉදින් මා එහි නොයන්නෙම් නම් අද ඔහු ඇඟිලි දහස සම්පූර්ණ කරන්නෙමි තම මව ද මරන්නේ ය. ඔහු ද කල්ප ලක්ෂයක් පුරන ලද පාරමිතා ඇතිව පශ්චිම භවයෙහි සිටින්නෙකි. ඉදින් මම එහි**

---

[1] එකක් අඩු දහසකි. එනම් නවසිය නව අනූවකි.

**නොයන්නෙම් නම් මහත් අවැඩක් වන්නේ ය. ඔහු බැරෑරුම් කර්‍මයක් කොට එය නූගුළුවාළිය හැකි වන්නේ ය. එබැවින් ඔහුට සංග්‍රහ කරන්නෙමි"** යැයි සිතා පෙරවරු කාලයෙහි අඳනය හැඳ පටි ධාතුව බැඳ රත් පැහැති සඟල චීවරය පෙරව පිඬු පිණිස හැසිර කරන ලද බත්කිස ඇති සේක් අංගුලිමාලට අනුග්‍රහ කරනු කැමති ව එකලාව විහාරයෙන් නික්මුණු සේක.

ගව පාලකයෝ ද, සිව්පා සතුන් පාලකයෝ ද, ගොවියෝ ද, මාර්‍ගයෙහි ගමන් කරන්නෝ ද, එසේ වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුටුවාහු ය. දැක භාග්‍යවතුන් වහන්සේට "ශ්‍රමණයන් වහන්ස, මේ මාර්‍ගයෙහි නොගිය මැනව. ශ්‍රමණයන් වහන්ස, මේ මාර්‍ගයෙහි රෞද්‍ර වූ අංගුලිමාල නම් සොරෙක් ඇත. ඔහු දරුණු ය. ලේ තැවරුණු අත් ඇත්තේ ය. අනුන් නැසීමෙහි හා වැනසීමෙහි යෙදුණේ ය. සත්වයන් කෙරෙහි කරුණාව නැත්තේ ය. ඔහු විසින් ගම් නියම් ගම් ජනපද විනාශ කරන ලද්දේ ය. හෙතෙම මිනිසුන් මරා ඇඟිලි කපා මාලයක් කොට දරයි.

ශ්‍රමණයන් වහන්ස, මේ මගෙහි වනාහි පුරුෂයෝ දස දෙනා, විසි දෙනා - තිස් දෙනා - හතළිස් දෙනා - පනස් දෙනා ආදී වශයෙන් කණ්ඩායම් වශයෙන් ගමන් කරති. ඔවුහු ද අංගුලිමාල සොරාගේ අතට පැමිණ විනාශයට පැමිණෙති යැයි කීහ. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩි සේක. මෙලෙස ඒ ජනයා භාග්‍යවතුන් වහන්සේට තුන් වතාවක් ම කීහ. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩි සේක.

ඔවුහු භාග්‍යවතුන් වහන්සේ හැඳින මෙසේ කියත් ද? නැතහොත් නොහැඳින මෙසේ කියත් ද? නොහැඳින ම මෙසේ කීහ. භාග්‍යවතුන් වහන්සේ බුද්ධ රශ්මි මාලා හා දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ හකුළුවා ගෙන සාමාන්‍ය භික්‍ෂුවක් මෙන් වැඩි සේක.

අංගුලිමාල ද මේ වන විට අපථ්‍ය ආහාරයෙන් ද, නිදි වැරීමෙන් ද කලකිරුණේ වෙයි. මේ වන විට එකක් අඩු දහසක් (999) ඇඟිලි එකතුව ඇති බැවින් දහස පිරවීමට එකක් ඇති බැවින් එය පිරවීම පිණිස ඉදිරියට එන කවරෙකු හෝ මරා ඒ ඇඟිල්ලත් සම්පූර්‍ණ කොට

ශිල්පයට උපහාර පූජාව සිදු කොට රැවුල කපා නා පිරිසිදු වී වස්ත්‍ර හැඳ මව්පියන් දකින්නෙමි යැයි සිතා වන මැදින් වනයෙහි කෙළවරට පැමිණ එකත් පසකට වී ඒ මේ අත බලමින් සිටියේ ය.

ඒ ක්‍ෂණයෙහි ම ඔහු තම මව දකින ලද්දේ ය. එවිට ඔහු **"මව හෝ මරා ඇඟිලි දහස සම්පූර්ණ කරන්නෙමි"** යැයි සිතා කඩුව ඔසවා ගෙන ඉදිරියට දිවුවේ ය. මේ දෙදෙනා අතර භාග්‍යවතුන් වහන්සේ පෙනී සිටි සේක. එවිට අංගුලිමාල භාග්‍යවතුන් වහන්සේ දැක **"ඒකාන්තයෙන් ආශ්චර්යයකි. ඒකාන්තයෙන් පුදුමයකි. මේ මගෙහි වනාහි පුරුෂයෝ දස දෙනා - විසි දෙනා - තිස් දෙනා - හතළිස් දෙනා - පනස් දෙනා එකතු වී ගමන් කරත්. ඔවුහු ද මාගේ අතට පැමිණ විනාශයට යති. එතකුදු වුවත් මේ ශ්‍රමණයා තනිව ම දෙවැන්නෙකු නැතිව නිර්භීතව මෙහි සිටී. ඇඟිල්ලක් කපා ගැනීමට මාගේ මව මරන්නේ කුමකට ද? මාගේ මව ජීවත් වේවා! මේ ශ්‍රමණයා මරා ඇඟිලි දහස සම්පූර්ණ කරමි"** යැයි සිතා කඩුව අමෝරාගෙන භාග්‍යවතුන් වහන්සේ පසුපස ලුහුබැඳ ගියේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ප්‍රකෘති ගමනින් වඩින්නා තමන් වහන්සේ කරා වේගයෙන් පැමිණෙන අංගුලිමාලට තමන් වහන්සේට ළං නොවිය හැකි වන සේ අධිෂ්ඨාන කළ සේක. එහි දී මහ පොළොව උල්පත් නංවන්නාක් මෙන් වී වළ ගොඩැලි ඇති වී සම විෂම වෙයි. භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මහත් වූ එළිමහනක් මවා දක්වා එහි මැද සිටි සේක. අංගුලිමාල එහි කෙළවර සිටී. එවිට ඔහු දුන් මේ ශ්‍රමණයා වෙත දිව ගොස් ඔහු අල්ලා ගන්නෙමි යැයි සිතා හැකි වීර්යය යොදා දුවයි. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ එළිමහනෙහි කෙළවර වැඩ සිටී. අංගුලිමාල එහි මධ්‍යයෙහි සිටී. එවිට ඔහු මේ ශ්‍රමණයා මෙහි පැමිණ අල්ලා ගන්නෙමි යැයි හැකි වීර්යය යොදා වේගයෙන් දුවයි. භාග්‍යවතුන් වහන්සේ ඔහු ඉදිරියෙහි ඇලක් හෝ ගොඩ බිමක් දක්වති. මෙම ක්‍රමයෙන් තුන් යොදුනක් දුර ගියහ. අංගුලිමාල තෙමේ කාය බල සිඳී ගොස් පිරිහුණු වේගය ඇතිව සුරු සුරු යන හඬ ඇතිව හුස්ම ගනිමින් හෙළමින් කිහිලිවලින් දහදිය වගුරුවමින් පා ඔසවන්නට වත් නොහැකිව නතර විය. එකල්හි අංගුලිමාල **"භවත්නි, ඒකාන්තයෙන් ආශ්චර්යයකි. ඒකාන්තයෙන් පුදුමයකි. මම වනාහි පෙර දුවන ඇතා ලුහුබැඳ අල්ලා ගණිමි. දුවන අශ්වයා ලුහුබැඳ අල්ලා ගණිමි. වේගයෙන්**

ධාවනය වන රථය ලුහුබැඳ අල්ලා ගණිමි. දුවන මුවා ලුහුබැඳ අල්ලා ගණිමි. එතකුදු වුවත් ප්‍රකෘති ගමනින් යන්නා වූ මේ ශ්‍රමණයා කරා සියලු ශක්තියෙන් දුවන්නා වූ මට ළං වන්නට නොහැකි වෙමි" යැයි සිතුවේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේට "ශ්‍රමණය සිටුව, ශ්‍රමණය සිටුවයි" කීවේය. එවිට භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ "අංගුලිමාලය, මම සිටියෙමි වෙමි. නුඹ ද සිටුව" යැයි වදාළ සේක.

ඉක්බිති අංගුලිමාලට "ශාක්‍ය පුත්‍ර වූ මේ ශ්‍රමණයෝ වනාහි සත්‍ය වචන ඇත්තාහ. සත්‍ය වූ ප්‍රතිඥා ඇත්තාහ. එතකුදු වුවත් මේ ශ්‍රමණ තෙම යමින් ම "අංගුලිමාලය මම සිටියෙමි. නුඹ ද සිටුව" යැයි කියන්නේ ය. මම මේ ශ්‍රමණයාගෙන් මෙහි අර්ථය අසන්නෙම් නම් යෙහෙක" යැයි මෙබඳු අදහසක් විය.

ඉක්බිති අංගුලිමාල සොර තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙසේ කීවේය.

**"ගච්ඡං වදෙසි සමණ ඨිතොම්හි**
**මමඤ්ච බ්‍රෑසි ඨිතමට්ඨිතොති,**
**පුච්ඡාමි තං සමණ එතමත්ථං,**
**කථං ඨිතො ත්වං අහමට්ඨිතොම්හී'ති"**

"ශ්‍රමණය, යමින් ම සිටියෙමි යැයි කියන්නෙහි ය, සිටියා වූ මට නොසිටියෙහිය යැයි කියන්නෙහි ය. ශ්‍රමණය, මේ කාරණය ඔබගෙන් අසමි. 'කෙසේ නම් ඔබ සිටියෙහි ද, කෙසේ නම් මම නොසිටියේ ද යැයි' ඇසීය.

එවිට භාග්‍යවතුන් වහන්සේ අංගුලිමාල හට මෙසේ වදාළ සේක.

**"ඨිතො අහං අඞ්ගුලිමාල සබ්බදා,**
**සෙබ්බසු භූතෙසු නිධාය දණ්ඩං,**
**තුවඤ්ච පාණෙසු අසඤ්ඤතොසි,**
**තස්මා ඨිතොහං තුවමට්ඨිතොසී'ති"**

"අංගුලිමාලය, මම සැමදා සියලු කල්හි ම සියලු සත්වයන් කෙරෙහි දඬුවම අතහැර බැහැර කරන ලද දඬුවම් ඇතිව ඈත් කරන ලද ආයුධ ඇතිව ලැජ්ජාශීලී වූයේ දයාවෙන් යුතුව වෙනස් නොවන ස්වභාවයෙන් යුක්තව සිටින්නෙම් වෙමි. නුඹ වනාහි සත්වයන් කෙරෙහි සංයමයෙන් තොර වූවෙහි ය. නපුරු වූයේ ලේ තැවරුණු අත් ඇතිව සත්ව ඝාතනයෙහි යෙදුණේ දයාවෙන් තොර වූයේ ය. නුඹ සිහියෙන් හා නුවණින් තොර බැවින් ඒ ඒ ගතියෙහි හැසිරෙන්නා වූ නුඹ දැන් ඉරියව් වශයෙන් සිටියේ නමුත් සසර ගමනෙහි නොනැවතී සිටින්නෙහි ය. මම වනාහි කියන ලද ආකාරයෙන් ඉරියව් වශයෙන් ගමන් කරන නමුත් සසර ගමනින් නැවතී සිටියේ වෙමි" යැයි වදාළ සේක.

එය අසා අංගුලිමාල ස්වභාවික ගුණයෙන් ප්‍රභාවත් වූ ජලය මතුපිට තෙල් මෙන් සියලු ලෝකය පුරා පැතිර සිටියා වූ භාග්‍යවතුන් වහන්සේගේ කීර්තිය අසා ඇති බැවින් ද, සත්‍යය අවබෝධය පිණිස පුරන ලද පාරමී සම්භාර ඇතිව හේතු සම්පත් ඇතිව සිටින බැවින් ද නුවණ මේරීමට පැමිණ ඇති බැවින් ද මේ ඒ භාග්‍යවතුන් වහන්සේ යැයි හටගත් සතුට ඇතිව "මේ මහා සිංහනාදය මේ මහා ගර්ජනාව වෙන කෙනෙකුගේ නොවන්නේ ය. මේ මහා ගර්ජනාව ඒ ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ යැයි හඟිමි. මහාර්ෂී වූ ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේ මා විසින් දුටුවෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ මට උපකාර පිණිස මෙහි වැඩි සේක" යැයි සිතා දමනය වූ මෘදු වූ සිත් ඇත්තෙකු වී භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේ ය.

**"චිරස්සං වත මෙ මහිතො මහෙසී,**
**මහාවනං සමණොයං පච්චුපාදි**
**සොහං චිරස්සාපි පහාස්සං පාපං,**
**සුත්වාන ගාථං තව ධම්මයුත්තං"**

"බොහෝ කලකින් මට ම අනුග්‍රහ පිණිස වැඩ පිණිස දෙවියන් සහිත ලෝකයා විසින් මහා පූජාවෙන් පුදන ලද්ද වූ නසන ලද පාපයන් ඇත්තා වූ මහාර්ෂි වූ ශ්‍රමණයන් වහන්සේ මේ මහා වනයට වැඩි සේක. ස්වාමීනි, මම නුඹ වහන්සේගේ ධර්මසාර වූ ගාථාව ඇසුවෙමි. ඒ මම ඒ ගාථාව අසා බොහෝ කාලයක් රැස් කළ බොහෝ කාලයක් ප්‍රගුණ කළ

පාප සහස්‍රය දුරු කරන්නෙමි. ස්ථිරව ම අත හරින්නෙමි” යැයි කීවේ ය.

මෙසේ කියා අංගුලිමාල කඩුව ද, ඉතිරි ආයුධ ද, හාත්පසින් කැඩී ගිය ඉවුරු ඇති ප්‍රපාතයක ද, පොළොව පැළී ගැඹුරු ව හැරී ගිය මහ වළක ද නැවත කිසිවකුට ගත නොහැකි වන ලෙස දැමූවේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාද සමීපයෙහි හිස තබා මනාකොට වැඳ ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා පැවිදි කරන සේක්වා යැයි භාග්‍යවතුන් වහන්සේගෙන් පැවිද්ද ඉල්ලුවේ ය.

මෙසේ අංගුලිමාල විසින් පැවිද්ද ඉල්ලූ කල්හි භාග්‍යවතුන් වහන්සේ ඔහුට ඒහි භික්ෂු භාවයෙන් පැවිද්ද ලැබීමට හේතු ඇත්තේද යැයි බලා හේතු වාසනාව ඇති බව දැක වදරා දක්ෂිණ ශ්‍රී හස්තය ඉදිරියට දිගු කොට “**එහි භික්ඛු, ස්වාක්ඛාතො ධම්මො චරහි සම්මා දුක්ඛස්ස අන්තකිරියාය**” යනුවෙන් “**මහණ මෙහි එව, ධර්මය මනාකොට දෙසන ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කිරීම පිණිස බ්‍රහ්මචර්‍යාවෙහි හැසිරෙව**” යැයි වදාළ සේක. එම බුද්ධ වචනය හාම ඔහුට සෘද්ධිමය වූ පාත්‍ර චීවර ඇතිව ඒහි භික්ෂු භාවයෙන් පැවිද්ද හා උපසම්පදාව ලැබුණේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පසු පසින් යන ආයුෂ්මත් අංගුලිමාල ස්ථවිරයන් සමග ජේතවනාරාමයට වැඩි සේක. අංගුලිමාල තෙරුන් වහන්සේගේ මව අට ඉස්බක් පමණ දුර කැලයෙහි ඇවිද “**දරුව අහිංසකය, නුඹ සිටියේ කොහේ ද, හුන්නේ කොහේ ද, ගියේ කොහේ ද, මා සමග කථා නොකළේ මන් ද**” යැයි කියමින් ඇවිද ඔහු නො දැක එතැනින් ම හැරී ගියා ය.

එකල්හි වනාහි පසේනදි කොසොල් රජුගේ මාලිගා දොරටුවෙහි මහජන සමූහයා රැස්ව “දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ රටෙහි රෞද්‍ර වූ ලේ තැවරුණු අත් ඇත්තා වූ සතුන් නැසීමෙහි වැනසීමෙහි නියුක්ත වූ, ප්‍රාණීන් කෙරෙහි කරුණාවක් නැත්තා වූ අංගුලිමාල නම් සොරෙක් වෙයි. ඔහු විසින් ගම් ද, නියම් ගම් ද, ජනපද ද විනාශ කරන ලද්දේ ය. හෙතෙම මිනිසුන් මර මරා ඇඟිලි මාලාවක් දරයි. දේවයන්

වහන්සේ ඔහු වළක්වන සේක්වා” යැයි කියා උස් වූ මහත් වූ ඝෝෂා ඇතිව වෙසෙති.

එකල්හි පසේනදි කොසොල් රජතුමා “ඉදින් සොරාට පරාජය වන්නේ නම් ලුහුබැඳ ඔහු අල්ලා ගන්නෙමි. ඉදින් මා හට පරාජය වන්නේ නම් වේගයෙන් පලා යන්නෙමි” යැයි පන්සියයක් පමණ අශ්ව යානාවන් ගෙන් යුත් පිරිසක් සමග සැහැල්ලු බලයකින් නික්මුණහ. මේ රජතුමා වනාහි සොරාට බය ය. ඔහු ඇල්ලීම පිණිස යෑමට සිතක් නොවීය. එහෙත් ජනයාගෙන් පැමිණෙන අපවාද බිය ඇති බැවින් බියෙන් නික්මුණේ ය. එවිට රජුට මෙසේ සිතක් ඇති විය. “මම ආරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ හිඳ ගන්නෙමි. එවිට භාග්‍යවතුන් වහන්සේ මහරජ, බලය ගෙන කුමක් හෙයින් නික්මුණේ ද?” යැයි මාගෙන් අසන්නේ ය. එවිට මම මෙම කාරණය දන්වන්නෙමි. එවිට භාග්‍යවතුන් වහන්සේ මා හට සම්පරායික අර්‍ථයෙන් පමණක් නොව දිට්ඨධම්මිකාර්‍ථයෙන් ද සංග්‍රහ කරන සේක. ඉදින් මා හට ජය වන්නේ නම් මාගේ ඒ ගමන ඉවසන සේක. ඉදින් මා හට පරාජය වන්නේ නම් මහරජ නුඹ කුමකට එක් සොරෙකු නිසා යන්නෙහි ද යැයි වදරණ සේක. ඉන් පසු ජනයා විසින් රජතුමා සොරා ඇල්ලීමට නික්මුණු කල්හි සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් වළක්වන ලද්දේ ය. එවිට මම ගර්‍හාවෙන් මිදෙන්නේ ය” යැයි මෙසේ සිතා ගර්‍හාවෙන් මිදීමේ අපේක්‍ෂාවෙන් ම සපිරිවරින් දහවල් කාලයෙහි සැවැත් නුවරින් නික්ම ජේතවනාරාමය වෙත පැමිණ, යානාවන් ගෙන් යාමට සුදුසු තැන් දක්වා ගොස් යානාවන් ගෙන් බැස පා ගමනින් ම භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසක හුන්නේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ “කිමෙක් ද මහරජ, නුඹට මගධ රටට අධිපති වූ බිම්බිසාර රජු හෝ කිපුණේ ද? නොහොත් විසාලා මහනුවර වැසි වූ ලිච්ඡවි රජ දරුවෝ හෝ කිපුණාහු ද? නොහොත් අන් සතුරු රජ කෙනෙක් හෝ කිපුණාහුද” යැයි අසා වදාළ සේක.

“ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට බිම්බිසාර රජතුමා කිපුණේ නැත. ලිච්ඡවි රජ දරුවෝ ද නොකිපුණහ. අන් සතුරු රජ කෙනෙක් ද නොකිපුණහ. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මාගේ ජනපදයෙහි රෞද්‍ර වූ ලේ තැවරුණු අත් ඇති සතුන් නැසීමෙහි හා වැනසීමෙහි

නියුක්ත වූ ප්‍රාණීන් කෙරෙහි කරුණාවක් නැත්තා වූ අංගුලිමාල නම් සොරෙක් ඇත. ඔහු විසින් ගම් ද නියම් ගම් ද ජනපද ද නසයි. මිනිසුන් මර මරා ඇඟිලි මාලාවක් දරයි. මම ඔහු වැළැක්වීමට යන්නෙමි" යැයි කීවේ ය.

"මහරජ, ඉදින් නුඹ ඒ අංගුලිමාල සොරා කෙස් රැවුල් කපා කසා වත් හැඳ ගිහි ගෙයින් නික්ම සසුනෙහි පැවිදි ව, සතුන් මැරීමෙන් වැළකී සොරකම් කිරීමෙන් වැළකී, බොරු කීමෙන් වැළකී, එක් වේලක් අනුභව කරමින්, බ්‍රහ්මචය්‍යීාව ඇතිව සිල්වත් ව යහපත් ගුණ ඇතිව සිටිනු දකින්නෙහි නම් ඔහුට කුමක් කරන්නෙහි ද" යැයි ඇසූ සේක.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එසේ සිටිනු දකින්නේ නම් වැඳීම ද, දැක හුනස්නෙන් නැගිටීම ද අසුන් පනවා දීම ද කරමි. තවද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් පැවරීම හෝ කරමි. ධාර්මික වූ ආරක්‍ෂාව ද පිළියෙල කරමි" යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ හේතු සම්පත් බලා ඔහු ගෙනවිත් පැවිදි කරන සේක් ද යැයි සිතා භාග්‍යවතුන් වහන්සේට අපහාස වශයෙන් "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දුස්සීල වූ ලාමක ස්වභාව ඇත්තා වූ මොහුට වනාහි මෙබඳු වූ සීල සංවරයක් කොයින් වන්නේ ද?" යනුවෙන් කීවේ ය.

එවිට අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට සමීපයෙහි හුන්නේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දකුණු අත දිගු කොට 'මහරජ, මේ තෙමේ අංගුලිමාල" යයි වදාළ සේක.

ඉක්බිති පසේනදි කොසොල් රජහට බිය තැති ගැනීම ලොමු ඩැහැ ගැනීම වූයේ ය. රජතුමා සමග භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණි සෙසු මහ ජනයා ද බියට පත්ව පලිස් ආයුධ ආදිය ඉවත දමා හමු වූ හමු වූ තැනම පලා ගොස් නගරයට පිවිස දොර වසා අට්ටාලයන්ට නැග බලමින් සිටියහ. තව ද "අංගුලිමාල රජතුමා සමීපයට පැමිණෙයි යැයි දැන පළමු ව පැමිණ ජේතවනාරාමයෙහි හුන්නේ ය. කොසොල් මහ රජු අංගුලිමාල විසින් අල්ලා ගන්නා ලද්දේය. අපි පලා ගොස් මිදුණෙමු" යැයි මෙසේ ද කීහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ බියපත් වූ, තැති ගත්තා වූ, ලොමු ඩැහැ ගත්තා වූ රජු දැක **"මහරජ, බිය නොවෙව, මහරජ බිය නොවෙව. නුඹට මොහු දැන් කුරු කුහුඹියෙකු වත් නො මරයි. දැන් මොහුගෙන් ඔබට හයක් නැත"** යැයි වදාළ සේක.

ඉන් පසු කොසොල් රජහට බිය තැති ගැනීම ලොමු ඩැහැ ගැනීම සංසිඳුණේ ය. ඉක්බිති කොසොල් රජතුමා **"පැවිද්දෙකු දරුණු කර්මයක් නිසා උපන් නම් ගොත් ගෙන ව්‍යවහාර කිරීම යුතු නැත. එබැවින් මව් පියන්ගේ නාම ගෝත්‍ර වශයෙන් ඔහුට කථා කරන්නෙමි"** යැයි සිතා අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ වෙත පැමිණ **"ස්වාමීනි, ආයුෂ්මතුන් වහන්සේ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ ද"** යැයි ඇසීය. එවිට තෙරුන් වහන්සේ "මහරජ, එසේය" යැයි ප්‍රකාශ කළේ ය. ඉන් පසු රජතුමා "ස්වාමීනි ආයුෂ්මතුන් වහන්සේගේ පිය තෙම කෙබඳු ගෝත්‍ර ඇත්තේ ද, මව් තොමෝ කෙබඳු ගෝත්‍ර ඇත්තී ද" යැයි ඇසීය. එවිට තෙරුන් වහන්සේ "මහරජ මාගේ පිය තෙම භග්ගව නම් ගෝත්‍ර ඇත්තේ ය. මව් තොමෝ මන්තානි නම් බැමිණිය ය" යැයි ප්‍රකාශ කළේ ය. එවිට රජතුමා **"ස්වාමීනි, මන්තානි පුත්‍ර වූ ආයුෂ්මත් භග්ගයන් වහන්සේ ශාසනයෙහි සිත් අලවා වාසය කෙරෙත්වා. මම ආයුෂ්මතුන් වහන්සේට චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් උපකාර කරන්නෙමි"** යැයි කියා බඩ බැඳි සළුව මුදා තෙරුන් වහන්සේගේ පාමුල තැබුවේ ය.

පැවිදි වූ තැන් පටන් අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ ධූතාංග සියල්ලම ද සමාදන්ව රක්නේ ය. එබැවින් අංගුලිමාල තෙරුන් වහන්සේ කොසොල් රජහට "මහරජ, කම් නැත. මා හට තුන් සිවුර සම්පූර්ණය" යැයි කීවේය.

ඉන් පසු කොසොල් රජතුමා භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හිඳ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඓශ්වර්‍යය, පුදුමය, දුවන අශ්වයා  පසුපස වුව ද දුව ගොස් ගනිමි යැයි පැමිණි විට රජු විසින් මොහු වට කොට අල්ලා ගනිව් යැයි කියා ඇත් අස් රථ පාබළ සේනා බොහෝ වර නොයෙක් කණ්ඩායම් යැවී ය. ඔවුහු එසේ ගිය කල්හි "බොලව් මම අංගුලිමාල වෙමි" යැයි කියා නැඟිට හඬ නඟද්දී එක්

අයෙකු වත් ආයුධයක් ලෙළවන්නට සමතෙක් නොවී ය. ඔහු විසින් සියලු දෙනාම කොටා මැරීය. ඉන් පසු ඒ ඇත්තු වල් ඇත්තු වූහ. අශ්වයෝ වල් අශ්වයෝ වූහ. රිය ද එතනම බිඳී ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ දරුණු වූ දමනය කළ නොහැකි වූවන් දමනය කරන්න සේක. නොසංසුන් සත්වයන් සංසිඳුවන සේක. කෙලෙස් නිවීම නො කළා වූ සත්වයන් නිවන සේක. අපි විසින් වනාහි යමෙක් දඬුවලින් ද, ආයුධවලින් ද දමනය කරන්ට නොහැකි වෙමු ද, ඒ පුද්ගල තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් දණ්ඩෙන් තොරව, ආයුධයෙන් තොරව දමනය කරණ ලද්දේ ය යැයි ප්‍රශංසා වශයෙන් කීවේ ය.

ඉන් පසුව ද අංගුලිමාල තෙරුන් වහන්සේ පිඬු සිඟා වඩින විට මිනිස්සු තෙරුන් වහන්සේ දැක බිය වෙති. පලා යති. නිවෙස්වලට පිවිස දෙර ජනේල වසා ගනිති. දැක පලා යාමට නොහැකි වූවන් පිටුපස හරවා සිටිති. තෙරුන් වහන්සේට කැඳ කෝප්පයක් හෝ බත් සැන්දක් තරම් වත් නො ලැබෙයි. ආහාරයෙන් ක්ලාන්ත වෙයි. මෙසේ පිටතින් පිණ්ඩපාත ආහාරය නොලැබෙන කල්හි නගරයට වඩින්නේ ය. එවිට ද ගල් කුළු දහසක් බිඳින්නාක් මෙන් නගරය ඇලළී යයි.

පසු කාලයෙහි අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ දිනක් පෙරවරු කාලයෙහි මනා කොට හැඳ පෙරව පාත්‍රය ගෙන සැවැත්නුවරට පිඬු පිණිස වැඩියේ ය. සැවැත් නුවර ගෙපිළිවෙලින් පිඬු පිණිස යන්නා වූ තෙරුන් වහන්සේට දරු ගැබක් හරස් වී ප්‍රසූත වේදනාවෙන් විලාප නගන එක්තරා ස්ත්‍රියක් දුටුවේ ය. දැක "ඒකාන්තයෙන් සත්වයෝ කෙලෙසන්නාහුය. ඒකාන්තයෙන් සත්වයෝ කෙලෙසෙන්නාහුය" යැයි සිතුණේ ය. ඉක්බිති අංගුලිමාල තෙරුන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස හැසිර දන් වළඳා සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසක වැඩ හිඳ "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර චීවර ධාරීව සැවැත්නුවරට ගොස් පිඬු පිණිස ගෙපිළිවෙළින් යන කල්හි දරු ගැබක් හරස් වී ප්‍රසූත වේදනාවෙන් විලාපප නගන එක්තරා ස්ත්‍රියක් දුටුවෙමි. දැක ඒකාන්තයෙන් සත්වයෝ කෙලෙසෙන්නාහුය. ඒකාන්තයෙන් සත්වයෝ කෙලෙසෙන්නාහුය යන සිතක් පහළවූයේය" යැයි කීවේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ අංගුලිමාලය, එසේ වී නම් නුඹ ඒ ස්ත්‍රිය කරා එළඹ **"නැගණිය, මම යම් දිනක මේ ජාතියෙහි උපන්නෙම් ද, එතැන් පටන් දැන දැන සතෙකු ජීවිතයෙන් තොර කළ බව නො දනිමි. ඒ සත්‍ය වචනය කරණ කොට ගෙන නුඹට සැප වේවා. නුඹගේ දරු ගැබට ද සැප වේවා"** යනුවෙන් සත්‍යක්‍රියා කරව යැයි වදාළ සේක. එවිට අංගුලිමාල තෙරණුවෝ **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා විසින් දැන දැන බොහෝ ප්‍රාණීහු ජීවිතයෙන් තොර කරණ ලද්දෙමි. එහෙයින් මාගේ ඒ කීම ඒකාන්තයෙන් බොරු කීමක් වන්නේය"** යැයි කීවේය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ අංගුලිමාලය, එසේ වී නම් නුඹ එම ස්ත්‍රිය කරා ගොස් **"නැගණිය, මම යම් දිනක ආර්‍ය්‍ය ජාතියෙහි උපන්නේ වෙම් ද, එතැන් පටන් දැන දැන සතෙකු ජීවිතයෙන් තොර කළ බව නො දනිමි. ඒ සත්‍ය වචනය හෙතු කොට ගෙන නුඹට සැප වේවා, නුඹ කුස හොත් දරු ගැබට ද සැප වේවා"** යනුවෙන් ඒ ස්ත්‍රියට කියව යැයි වදාළ සේක. එවිට අංගුලිමාල තෙරුන් වහන්සේ "එසේය" යැයි භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී ඒ ස්ත්‍රිය වෙසෙන නිවස වෙත ගියේ ය.

ස්ත්‍රීන්ගේ දරු ප්‍රසූතියකට පුරුෂයෙකුට එළඹිය නොහැකිය. තෙරුන් වහන්සේ කුමක් කරන්න ද? අංගුලිමාල තෙරුන් වහන්සේ සත්‍යක්‍රියා කොට යහපතක් කිරීම පිණිස පැමිණියේ ය යැයි දැන්වීය. ඉන් පසු ඔවුහු තිරයකින් එම ස්ත්‍රිය වට කොට එම තිරයෙන් පිටත තෙරුන් වහන්සේට අසුනක් පනවා තෙරුන් වහන්සේට දැන්වීය. එවිට තෙරුන් වහන්සේ එහි වැඩම කොට පනවන ලද අසුනෙහි වැඩ හිඳ "සොහොයුරිය, මම සර්‍වඥ බුදුරජාණන් වහන්සේගේ ආර්‍ය්‍ය ජාතියෙහි උපන්නෙමි" යැයි කියා **"යතොහං, භගිනි, අරියාය ජාතියා ජාතො, නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා, තෙන සච්චෙන සොත්ථි තෙ හොතු, සොත්ථි ගබ්භස්සා'ති"** යනුවෙන් **"නැගණිය, මම යම් දිනක ආර්‍ය්‍ය ජාතියෙහි උපන්නෙම් ද, එතැන් පටන් දැන දැන සතෙකු ජීවිතයෙන් තොර කළ බව නො දනිමි. ඒ සත්‍ය වචනය හෙතු කොට ගෙන නුඹට සැප වේවා. නුඹගේ කුස හොත් දරු ගැබට ද සැප වේවා"** යැයි සත්‍යක්‍රියා වශයෙන් කීවේය. එම සත්‍යක්‍රියාව සමගම

කෙණ්ඩියකින් වැහෙන දියත්තක් මෙන් ඉතා පහසුවෙන් දරු ප්‍රසූතිය සිදු විය. ඒ ස්ත්‍රියට සැප වූයේ ය. දරු ගැබට ද සැප වූයේ ය.

මේ පිරිත අන් කිසිඳු බලයකින් මැඩලිය නොහැකි බල සම්පන්න මහ පිරිතක් වේ. අංගුලිමාල තෙරුන් වහන්සේ වැඩ හිඳ සත්‍යක්‍රියා කළ තැන පීඨිකාවක් තැනූහ. විලි රුදවෙන් මුසපත් වූ තිරිසන් ගත ස්ත්‍රීන් ද මෙහි ගෙනවිත් වැද හොවති. එකෙනෙහිම සැප සේ ප්‍රසූතිය සිදු වේ. යම් ස්ත්‍රියක් දුර්වල නම් මෙහි ගෙන ඒමට නොහැක්කේ නම් එම පීඨිකාව සේදූ ජලය ගෙන ගොස් හිසට වත් කරති. එකෙනෙහිම සැප සේ ප්‍රසූතිය සිදු වේ. වෙනත් රෝග ද සන්සිඳේ. මෙය වනාහි කල්පය පවත්නා තාක් තිබෙන ප්‍රාතිහාර්‍යයකි.

මෙහි ලා ප්‍රශ්නයකි. භාග්‍යවතුන් වහන්සේ අංගුලිමාල තෙරුන් වහන්සේ ලවා වෙදකම් කරවන සේක් ද? නැත. එසේ නොකරවූ සේක. තෙරුන් වහන්සේ දැක මිනිස්සු බිය වී පැන යති. එයින් තෙරුන් වහන්සේ ආහාර නැතිව ක්ලාන්ත වෙයි. මහණ දම් පිරීමට නොහැකි වෙයි. එබැවින් තෙරුන් වහන්සේට පහසුවෙන් ලැබෙන ප්‍රත්‍ය ඇතිව මහණ දම් පූර්‍ණය පිණිස අනුග්‍රහ කිරීම් වශයෙන් සත්‍යක්‍රියා කර වූ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූ සේක. "දැන් අංගුලිමාල ස්ථවිරයන් මෛත්‍රී චිත්තය ලැබ සත්‍යක්‍රියා කිරීමෙන් මිනිසුන්ට යහපතක් කරති යැයි මිනිස්සු තෙරුන් වහන්සේ වෙත එළඹිය යුතුය යැයි සිතන්නාහ. එයින් ආහාරයෙන් ක්ලාන්ත නොවී මහණ දම් පිරීමට හැකි වන්නේ ය. සත්‍යක්‍රියා කිරීම වෙදකම් කිරීමක් ද නොවන්නේ ය" යැයි සත්‍යක්‍රියා කර වූ සේක.

අංගුලිමාල තෙරුන් වහන්සේ දන් වළඳා මහණ දම් පුරන්නෙමි යැයි මූල කර්මස්ථානය ගෙන රාත්‍රී ස්ථාන දිවා ස්ථානයන්හි හිඳ උත්සාහ කළ නමුත් සිත කර්මස්ථානය හි නොපිහිටයි. වනයෙහි සිට මිනිසුන් මැරූ තැනම සිතට නැගෙයි. "මම දුගියෙක්මි, කුඩා දරුවන් ඇත්තෙක්මි, මට ජීවිත දානය දෙනු මැනවි හිමියනි" ආදී වශයෙන් මරණ බියෙන් බියපත් වූවන් කියන ආකාරය ද, අත් පා විකාරයන් ද සිතට නැගි නැගී එයි. එවිට සිත විපිළිසර බවට පත් වී එයින් නැගිට

යයි. ඒ කාරණය දන වදාළ භාග්‍යවතුන් වහන්සේ ඔහුට එම ජාතිය ව්‍යවහාර වශයෙන් නොගෙන විදර්ශනා වඩා අර්හත්වයට පැමිණිය හැකිය යැයි ආර්‍ය්‍ය ජාතිය පිළිබඳව සත්‍ය ක්‍රියා කර වූ සේක.

ඉක්බිති අංගුලිමාල තෙරුන් වහන්සේ පිරිසෙන් වෙන් වීම් වශයෙන් කාය විවේකයෙන් එකලා බවට පත් වූයේ, වස්තු කාම ක්ලේශ කාම අතහැරීම් වශයෙන් චිත්ත විවේකයෙන් ද හුදකලා වූයේ කර්මස්ථානය හි සිහිය නොහැරීමෙන් පමා නොවූයේ කායික චෛතසික වීර්‍ය්‍ය නම් වූ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ කය පිළිබඳව හා ජීවිතය පිළිබඳ වූ අපේක්ෂා අතහැර කර්මස්ථානය වැඩීම පිණිස උපකාර ඉරියව් පවත්වමින් වාසය කළේ ය.

නොබෝ කලකින් ම යම් අර්හත්වයකින් සසර දුක් අවසන් කිරීම පිණිස ඉපදීමෙන් ජරා මරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් කායික දුක්ඛයෙන් මානසික දුක්ඛයෙන් දැඩි වෙහෙසට පත්ව මඩනා ලද්දේ වෙමි. දුකට බැස ගත්තෙම් වෙමි. දුකින් පීඩිත වූයෙම් වෙමි. මේ දුක්ඛස්කන්ධයාගෙන් නික්ම යෑමක් පෙනෙන්නේ නම් මැනවි යැයි හේතු සහිතව කරුණු සහිතව සිතා කෘෂි කර්මාන්ත කුටුම්බ පෝෂණාදී වූ බොහෝ කර්මාන්ත ඇති ගිහි ගෙයින් නික්ම, එසේ කෘෂි වාණිජාදී කිසිවක් නැති බැවින් අනගාර්‍ය්‍ය නම් වූ නම් වූ පැවිද්දට ද භික්ෂු භාවයට ද එළඹියේ ද, ඒ අනුත්තර වූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි අවසානය වූ අර්හත් ඵල විමුක්තිය මේ ආත්මභාවයෙහි දී ම තමාගේ ම ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කොට තම විසින් විශේෂයෙන් දන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කළේ ය.

එසේ නුවණින් දන වාසය කරන කල්හි පෙර භවයට අදාළ කර්ම සිඳලන තෙක් අතීත ඉපදීම් සබඳතා නැති වූයේ නොවේ. සෝවාන් ආදී මාර්ග ඥාන සතර ලැබීම පිණිස සිත නො වැඩූ විට කාම, රූප, අරූප භවයන්හි යම් ඉපදීමක් වන්නේ ද, එය ඒක වෝකාර භවයෙහි හෝ චතු වෝකාර භවයෙහි හෝ පඤ්ච වෝකාර භවයෙහි හෝ උත්පත්ති වශයෙන් සිදු වේ. තමා විසින් සෝවාන් ආදී මාර්ගයන් ලැබීම පිණිස සසරෙහි වඩන ලද සිත් ඇති බැවින් අනුත්පාද ස්වභාවයට පැමිණීමෙන් ක්ෂය වූයේ ය. මෙලෙස මාර්ග භාවනාවෙන් ප්‍රහීණ වූ

කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂා කොට කෙලෙස් නැති කල්හි භවයෙහි පිළිසිඳීම සිදු නොවන්නේය යැයි දැන ගත්තේ ය.

මාර්ග ඵල නිවන අවබෝධය පිණිස සිත කය වචනය මෙහෙයවා වැඩිය යුතු වූ අධි සීල, අධි චිත්ත, අධි පඤ්ඤා සංඛ්‍යාත උතුම් හැසිරීම නිමවන ලදි. දුක පිළිබඳ ප්‍රත්‍යක්‍ෂ අවබෝධය, දුක හටගන්නා හේතුව වූ සමුදය ප්‍රහාණය දුක්ඛ, නිරෝධය වූ නිවන සාක්‍ෂාත් කිරීම, ඒ සඳහා ආර්‍ය මාර්ගය වැඩීම යන සෝවාන් සකෘදගාමී අනාගාමී අර්හත් යන සිවු මගින් කළ යුතු වූ සොළොස් ආකාර කටයුතු කොට නිමවන ලද්දේ ය. නැවත ඒ සඳහා කළ යුතු කිසිවක් ඉතිරිව නැත. මේ භවයෙහි ඇසුරු කර පවත්වා ගනු ලබන්නා වූ පඤ්චස්කන්ධය පරම්පරා වශයෙන් මතු භවයකට යෑමක් නැත. මේ පඤ්චස්කන්ධය සිඳින ලද මුල් ඇති ගසක් මෙන් කරන ලද්දේය යැයි දැන ගත්තේ ය. අංගුලිමාල තෙරුන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ රහතන් වහන්සේලා අතර එක් රහතන් වහන්සේ නමක් වූයේ ය.

මෙසේ අංගුලිමාල තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි ඒහි භික්‍ෂු භාවයෙන් පැවිද්ද හා උපසම්පදාව ලැබ විදර්ශනාව සඳහා ක්‍රියා කරන්නේ අර්හත්වයට පැමිණ විමුක්ති සුවය විඳිමින් හටගත් සතුට ඇතිව සොම්නස ඇතිව මෙසේ උදාන ප්‍රීති වාක්‍යය වදාළේ ය.

**"යො ච පුබ්බෙ පමජ්ජිත්වා - පච්ඡා සො නප්පමජ්ජති,**
**සො ඉමං ලොකං පභාසෙති - අබ්භා මුත්තොව චන්දිමා"**

යම් පුද්ගලයෙක් ගිහියෙකු හෝ වේවා පැවිද්දෙකු හෝ වේවා කල්‍යාණ මිත්‍ර සේවනයට පෙරාතුව පාප මිත්‍ර සේවනයෙන් හෝ තමාගේ නුවණින් සළකා බැලීමෙන් තොරව හෝ ප්‍රමාදව වාසය කොට, මනා පිළිවෙතෙහි ප්‍රමාද වී පසුව කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් ද, නුවණින් ද මතු වී ප්‍රමාද නොවෙයි ද මනාව පිළිපදී ද, සමථ විපස්සනා භාවනාවන්හි යෙදී ත්‍රී විද්‍යාවන්ට හා ෂට් අභිඥාවන්ට පැමිණේ ද, ඔහු වැසි වළා ආදියෙන් මිදුණු චන්ද්‍රයා මෙන්, තමා විසින් අවබෝධ කර ගත්තා වූ ආත්මභාව සංඛ්‍යාත ස්කන්ධ ලෝකය ත්‍රී විද්‍යා හා ෂට් අභිඥා ආදියෙන් බබුළුවයි.

**"යස්ස පාපං කතං කම්මං - කුසලෙන පිධීයති,**
**සො ඉමං ලොකං පභාසෙති - අබ්භා මුත්තොව චන්දිමා"**

යම් කෙනෙකු විසින් කරගන්නා ලද පාප කර්මයෝ කර්මක්ෂය කරන්නා වූ විපාක නොදෙන බවට පත් වූ බැවින් විපාක උපදවන්නා වූ දෙර පියන් ලෝකෝත්තර කුසලයෙන් වසනු ලැබේ ද, ඔහු වැසි වළා ආදියෙන් මිදුණු චන්ද්‍රයා මෙන්, තමා විසින් අවබෝධ කර ගත්තා වූ ආත්මභාව සංඛ්‍යාත ස්කන්ධ ලෝකය ත්‍රී විද්‍යා හා ෂට් අභිඥා ආදියෙන් බබුළුවයි.

**"යො හවෙ දහරො භික්ඛු - යුඤ්ජති බුද්ධසාසනෙ,**
**සො ඉමං ලොකං පභාසෙති - අබ්භා මුත්තොව චන්දිමා"**

යම් භික්ෂුවක් තරුණ බැවින් යුක්තව සීල සමාධි ප්‍රඥා යන ත්‍රී ශික්ෂාවන්හි යෙදීමට ශක්ති සම්පන්න ශරීරය ඇත්තේ වෙයි ද, ඔහු වනාහි හටගත් සුළඟින් අව්වෙන් පීඩාවට පත්වන පරිසරය අභිභවනය කොට බුදු සසුනෙහි සීල සමාධි ප්‍රඥාවන්හි යෙදීමට සමත් වෙයි. ඔහු වැසි වළා ආදියෙන් මිදුණු චන්ද්‍රයා මෙන්, තමා විසින් අවබෝධ කර ගත්තා වූ ආත්මභාව සංඛ්‍යාත ස්කන්ධ ලෝකය ත්‍රී විද්‍යා හා ෂට් අභිඥා ආදියෙන් බබුළුවයි.

මෙලෙස කිසි සත්වයෙකුට හිංසාවක් නොකොට අහිංසකව සිටි හිංසක නම් ඇති තරුණයා ශිල්ප හැදෑරීමට ගොස් තම ගුරුවරයා විසින් නොමග යැවීම හේතුවෙන් බොහෝ සත්වයන් පීඩාවට පත් කරන ලද්දේ ය. මහා කාරුණික සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් මහත් කරුණාවෙන් ඔහු හික්මවා නිර්වාණාවබෝධයෙහි පිහිටුවා සියලු සසර දුකින් අතමුදවාලූ සේක.

මෙය අර්ථ වශයෙන් ගෙන සත්‍යක්‍රියා කොට සෙත් පැතීම මෙම ගාථාවෙන් ප්‍රකාශ කොට දක්වන්නේ ය.

**උක්ඛිත්ත ඛග්ග මතිහත්‍ථ සුදාරුණං තං**
**ධාවං තියොජන පථං ගුලිමාලවන්තං,**
**ඉද්ධීභිසඞ්ඛත මනෝ ජිතවා මුනින්‍දො**
**තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.**

කඩුවක් අරාගෙන අතින් - බෝ සේ බිරම් වූ
දික් වූ මහා මග දිගේ - එළ වූ අඟුල්මල්
සිත්හී සමාධි බලයෙන් - දිනු වීරයාණෝ
ඒ ආනුභාව බලයෙන් - සුව සෙත් සැදේවා.

# 5. චිඤ්චිමානවිකාවගේ අපහාසය ජයගැනීම

සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූ ද පටන් ප්‍රථම බෝධිය වූ විසි වසරක කාලයෙහි බුදු සසුනෙහි පැවිදි වූවන් ගෙන් බොහෝ දෙනෙක් අහීත්වයට පත් වූහ. එසේම අප්‍රමාණ දෙව් මිනිසුන් ආයර්‍ය භාවයට පත් වූහ. එයින් බුදු රජාණන් වහන්සේට හා ශ්‍රාවකයන් වහන්සේලාට පඤ්ච මහා ගංගාවන්ගෙන් ගලන්නා වූ ජල ධාරාවන් සේ මහත් වූ ලාභ සත්කාර බුදු සසුනට ලැබෙන්නට වූහ. තීර්‍ථකයෝ හිරු උදවෙහි දී නිශ්ප්‍රභ වන කලාමැදිරියන් මෙන් වී පැවති ලාභ සත්කාර පිරිහී ගියහ. එයින් තීර්‍ථකයෝ මාවත්වල හැසිරෙමින් ජනයා අමතා "**කිමෙක් ද පින්වත්නි, බුදු වූයේ ශ්‍රමණ ගෞතමයන් පමණක් ද? අපිත් බුදුවරු ය. ගෞතමයන්ට දුන් දෙය පමණක් නොව අපට දෙන දේත් මහත් ඵල ඇත්තේ වේ. එබැවින් අපටත් දන් දෙව්**" යැයි කියා සිවුපස ප්‍රත්‍ය ඉල්ලමින් හැසිරුණහ. එහෙත් ඔවුන්ට ලාභ සත්කාර නොලැබුණහ. එයින් උදහස් වූ තීර්‍ථකයෝ කුමන උපායකින් හෝ ශ්‍රමණ ගෞතමයන් අපකීර්තියට පත් කර ලාභ සත්කාර උපදවමු යැයි සිතා රහසිගතව රැස් වී "**මේ ශ්‍රමණ භවත් ගෞතමයන් බුදු වූ තැන් පටන් අපට පැවති ලාබ සත්කාර පිරිහුණේ ය. එබැවින් අපි යම් උපායකින් ශ්‍රමණ භවත් ගෞතමයන්ට අපකීර්තියක් ඇති කරවමු, එවිට අපට ලාභ සත්කාර ලැබිය හැකිය**" යැයි උපායක් සාකච්ඡා කළහ.

එම කාලයෙහි සැවැත් නුවර චිඤ්චිමානවාකාව නම් රූමත් කාන්තාවක් වූවා ය. ඇය ඉතා රූපවත් ය. ශරීරයෙන් රැස් විහිදෙන්නීය. දිව්‍ය අප්සරාවක් මෙන් බැලූවන්ට ප්‍රසාද එළවන සිත්කලු පෙනුමකින් යුක්තය. තරුණ වයසෙහි වූවා ය. "**අපි මේ චිඤ්ඤ්චිමානවිකාව නිසා ගෞතමයන්ට කිලුටක් උපදවා අපකීර්තියක් ඇති කරවා ඔහුට ලැබෙන ලාභ සත්කාර නසවමු**" යැයි කථා කරමින් සිටියහ. ඒ චිඤ්චිමානවිකාව තීර්ථකාරාමයට ගොස් "**ආයුෂ්යන් වහන්ස, වඳිමි**" යැයි තීර්ථකයන්ට වැඳ සිටියා ය. කිසිවෙක් ඇය සමග කථා නො කළහ. මෙසේ තුන් වතාවක්ම වැන්ද නමුත් කිසිවෙක් ඇය සමග කථා නො කළහ. එවිට චිඤ්චිමානවිකාව "**ආයුෂ්යන් වහන්සේලා, කුමක් හෙයින් මා සමග කථා නොකරන්නාහු ද? මා විසින් කළ වරද කුමක් ද?**" යැයි ඇසුවාය. එවිට තීර්ථකයෝ "**නැගණිය, නුඹ විසින් අපට කළ වරදක් නැත. ශ්‍රමණ භවත් ගෞතමයන් බුදු වූ දවස පටන් අපට ලැබුණු ලාභ සත්කාර පිරිහුණු නියාව නුඹ නොදන්නී ද?**" යැයි ඇසූහ. එවිට චිඤ්චිමානවිකාව "**දනිමි ස්වාමීනි**" යැයි කීවා ය. එකල්හි තීර්ථකයෝ "**එසේ නම් නැගණිය, යම් උපායකින් මිනිසුන්ට දැනෙන ලෙස ශ්‍රමණ ගෞතමයන් අපකීර්තියට පමුණුවන උපායක් කියව**" යැයි කීහ. එවිට ඇය එසේය යැයි කියා පිළිවදන් දී තම නිවසට ගොස් සන්ධ්‍යාවෙහි රතු රෙදි කඩක් ඇඳ ජේතවනාරාමයට යන මාර්ගයෙහි ගොස් රාත්‍රියෙහි තමන්ගේ තීර්ථකයන් ඉන්න ගෙයක ලැග අලුයම අවදි වී එයින් පිටත්ව රාත්‍රියෙහි ජේතවනාරාමයෙහි ලැග එන්නියක මෙන් හඟවා තම නිවසට යන්නීය. මෙලෙස උදේ සවස යන එන ඇය දුටු මනුෂ්‍යයෝ "නුඹ කොහි යන්නීද" යැයි ඇසූ විට "මම කොහේ ගියත් නුඹලාට කුමකට ද" යැයි කියයි. මෙසේ තුන් සාර මසක් ගත වීමෙන් බොහෝ දෙනාට සැක උපන් කල්හි "නුඹ කොහේ ගොසින් එන්නී ද" යැයි ඇසූ විට "**මම ජේතවනාරාමයෙහි බුදුන් සමග එක ශ්‍රී යහනෙහි ලැග එමි**" යැයි කියන්නී ය. මෙසේ කියා උදරයෙහි කෝටු මිටියක් බැඳගෙන ඒ බඩ වසා කඩක් බැඳ දූන් මා කුස හොත් බුදුන්ට දාව උපන් දරුවාට මාස තුනක් පිරුණේ ය. සතරක් පිරුණේ ය යැයි කියා තන පුඩු කළු කොට ගෙරි ඇටින් තවා පා ඉදිමවාගෙන දස මසක් ගිය විට ඒ දර මිටිය මහත් කොට බඩ ඉදිමවාගෙන සර්වඥයන් වහන්සේ වැඩ සිටි ධර්ම ශාලාවට ගොස් බණ පිරිස මධ්‍යයෙහි සිට සම්මා සම්බුදු රජාණන් වහන්සේ අමතා "**ස්වාමීනි, නුඹ වහන්සේ බණ පිරිස් පිරිවරා හිඳ බණ කියන සේක් ද, මාගේ බඩ දරු ගැබ මුහුකුරා දස එකඩ මස පිරී ඇත.**

**මට දරුවා වදන්න ගෙයක් කොහේ ද, හිස් තෙල් පහන් තෙල් කොහේද, නුඹ වහන්සේ දන්නේ මා සමග රාත්‍රියෙහි අභිරමණයෙහි යෙදෙන්නට පමණක් ද, දරුවා වැදූ තොරතුරු නුඹ වහන්සේ නොදන්නා සේක. කොසොල් රජ්ජුරුවන්ට හෝ අනාථපිණ්ඩික මහ සිටාණන්ට හෝ විශාඛා මහ උපාසිකාවට හෝ මා පෝෂණය කිරීමට පවරා නොදී කුමක් කරන සේක් ද, නුඹ වහන්සේ විසින් පෝෂණය නොකරන මා දරුවා කොතැනක දී වදන්නෙම් ද"** කීවා ය. එවිට සම්මා සම්බුදු රජාණන් වහන්සේ දේශනා කරමින් සිටි ධර්‍මය නවත්වා **"නැගණිය, මෙය නුඹ හා මා හැර වෙන කවරෙක් නම් දන්නෙහි ද"** යැයි වදාරා නිහඬ වූ සේක. එවේලෙහි සක්දෙව් රජතුමාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය රත් විය. එකල්හි සක් දෙව් රජතුමා **"චිඤ්චිමානවිකාව බඩ බැඳි දර මිටිය කපව්"** යැයි අණ කොට දිව්‍ය පුත්‍රයන් සතර දෙනෙක් එවුවේ ය. ඒ දිව්‍ය පුත්‍රයා මී වෙස් ගෙන පැමිණ ඒ දරමිටිය බැඳ තැබූ බැමි කපා බිම හෙළූහ. ඒත් සමගම මහත් සුළඟක් ඇති කරවා බඩ බැඳි සළුව ඉවත් කළේ ය. එවිට එහි රැස්ව සිටි ජනයා **"මැය නිශ්කාරණයෙහි භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට කළ අපකීර්තිය බලව්"** යැයි කියා කැට මුගුරු ආදියෙන් ගසා තළා වාසල් දෙරින් පිටතට ඇද දැමූහ. ඒ ක්‍ෂණයෙහි මහ පොළොව විවර වී අවීචි මහ නරකයෙන් ගිනි කඳක් මතුව ඇවිත් ඇය නිරයට ඇදගෙන ගියේ ය.

එයින් පසු සම්බුදු සසුනෙහි පැහැදුණවුන් වැඩියෙන් පැහැදුණහ. නොපැහැදුණන්ගේ පැහැදීම ඇති වූහ. තව තවත් ලාභ සත්කාර වැඩි වූහ. මෙසේ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ චිඤ්චිමානවිකාවගේ අභූත අපහාසය ඉවසීමෙන් ජයගත් සේක.

මෙය අර්ථ වශයෙන් ගෙන සත්‍යක්‍රියා කොට සෙත් පැතීම මෙම ගාථාවෙන් ප්‍රකාශ කොට දක්වන්නේ ය.

**කත්‍ථාන කට්ඨ මුදරං ඉව ගබ්භිනීයා**
**චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣෙ,**
**සන්තෙන සොම විධිනා ජිතවා මුනින්දො**
**තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.**

ගැබ් ගත් විලාශය පපා - දර ලී බැඳීමෙන්
චිඤ්චාව දුන් මෙම නිගා - ජනකාය මැද්දේ
සන්සුන් ලෙසින් ඉවසුවෝ - අප වීරයාණෝ
ඒ ආනුභාව බලයෙන් - සුව සෙත් සැදේවා.

# 6. සච්චක වාදිසිංහ දමනය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහ වනයෙහි වූ කූටාගාර ශාලාවෙහි වැඩ සිටි සේක. එකල්හි කථාවෙහි දක්ෂ වූ, තමා පණ්ඩිතයෙකු යැයි කියාගන්නා වූ, බොහෝ දෙනා විසින් උගතෙකු යැයි කියනු ලබන්නා වූ සච්චක විසාලා මහනුවර වාසය කරයි. හෙතෙම විසාලා මහනුවර පිරිස් මැද "මා සමග වාදයට පැමිණෙන යම් කිසිවෙක් කම්පා නොවෙයි ද, විශේෂයෙන් කම්පා නොවෙයි ද, නො වෙවුලා සිටියි ද, යමෙකුගේ කිහිලි වලින් ඩහදිය නොදමයි ද, එබඳු වූ ශිෂ්‍ය සමූහ නායක වූ, ගණ නායක වූ, ගණ ආචාර්‍ය වූ ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ 'මම අර්හත් සම්‍යක් සම්බුද්ධ යැයි කියාගන්නා කෙනෙකු හෝ නොදකිමි. ඉදින් මම හිත් පිත් නැති කණුවක් හා වාද කරන්නෙම් නම් ඒ කණුව ද කම්පා වන්නේය, විශේෂයෙන් කම්පා වන්නේය. වෙවුලා සිටින්නේ ය. මනුෂ්‍ය වූවෙකු ගැන කියනුම කවරේ ද?" යැයි මෙබඳු කථාවක් කියයි.

එකල්හි අස්සජි මහ රහතන් වහන්සේ පෙරවරු කාලයෙහි, පාත්‍ර චීවර ධාරීව පිඬු පිණිස විසාලා මහනුවරට වැඩියේ ය. එකල්හි විශාල මහනුවර කායික ව්‍යායාම පිණිස ඒ මේ තැන පයින් ඇවිදිමින් සිටි සච්චක වඩින්නා වූ අස්සජි මහ රහතන් වහන්සේ දුර දී ම දුටුවේ ය. දැක, අස්සජි මහ රහතන් වහන්සේ හමුවට ගොස් සතුටු විය යුතු, සිහි කටයුතු කථාවක් කොට නිමවා එකත් පසෙක වාඩි වී අස්සජි මහ රහතන් වහන්සේට "**පින්වත් අස්සජි ස්ථවිරයනි, ශ්‍රමණ ගෞතම තෙම කෙසේ නම් ශ්‍රාවකයන් හික්මවන්නේ ද? ශ්‍රාවකයන් විෂයෙහි ශ්‍රමණ ගෞතමයන්ගේ කෙබඳු අනුශාසනාවක් බහුල කොට පවතී ද?**" යැයි මෙසේ කීවේය.

එවිට අස්සජි මහ රහතන් වහන්සේ "අග්ගිවෙස්සනය[1], භාග්‍යවතුන් වහන්සේ "**මහණෙනි, රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය, සංඥාව අනිත්‍යය, සංස්කාරයෝ අනිත්‍යය, විඥ්ඥාණය අනිත්‍යය, මහණෙනි, රූපය අනාත්මය, වේදනාව අනාත්මය. සංඥාව අනාත්මය, සංස්කාරයෝ අනාත්මය, විඥ්ඥාණය අනාත්මය, සියලු සංස්කාරයෝ අනිත්‍යය, සියලු ධර්මයෝ අනාත්මය**" යැයි මෙසේ ශ්‍රාවකයන් හික්මවන සේක. ශ්‍රාවකයන් විෂයෙහි භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳු අනුශාසනාව බහුල කොට පවතී යැයි කීවේ ය.

එවිට සච්චක "**පින්වත් අස්සජි ස්ථවිරයනි, අපි ශ්‍රමණ ගෞතමයන් මෙබඳු වාද ඇත්තෙකු යැයි ඇසුවෙමු ද, ඒ අපි නො ඇසිය යුත්තක් ම ඇසුවෙමු. කිසියම් විටෙක ඒ භවත් ගෞතමයන් මුණගැසී කථා කිරීමට හැකි වන්නේ නම් ඉතා හොඳ ය. ඒ ලාමක වූ මිථ්‍යාදෘෂ්ටියෙන් ඔහු අත මිදවිය හැකි වන්නේය**" යැයි කීවේ ය.

එකල්හි වනාහි පන්සියයක් පමණ ලිච්ඡවි රජ කුමාරවරු කිසියම් කටයුත්තක් සඳහා ඔවුන්ගේ සන්ථාගාර ශාලාවෙහි රැස් වූහ. ඉක්බිති සච්චක ප්‍රසිද්ධියේ වාද කොට භාග්‍යවතුන් වහන්සේ පැරදවීමේ කැමැත්ත ඇතිව ඒ ලිච්ඡවි කුමාරවරු රැස්ව සිටි සන්ථාගාර ශාලාවට ගොස් "පින්වත් ලිච්ඡවිනි, අප හා එත්වා, අද ශ්‍රමණ ගෞතමයන් සමග මාගේ කථාවක් වන්නේ ය. ඉදින් ශ්‍රමණ ගෞතම තෙම ඔහුගේ ප්‍රසිද්ධ ශිෂ්‍යයන් අතුරෙන් එක්තරා කෙනෙකු වූ අස්සජි නම් භික්ෂුව ප්‍රකාශ කළ පරිදි ම ප්‍රකාශ කළ හොත්, යම් සේ ශක්තිමත් පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවකු ලොම්වලින් අල්ලා ඉදිරියට අදිමින් පසුපසට අදිමින්, හාත්පස එහා මෙහා අදිමින් සොලවන්නාත් මෙන් මම ශ්‍රමණ ගෞතමයන් සමග වාද කොට එම වාද කථාවෙන් සොලවන්නෙමි.

සුරා ධූර්තයෙකු සුරා පාන ස්ථානයෙහි එලන ලද කළාලයක් පිරිසිදු කරණු පිණිස ගැඹුරු දිය වලක බහා දෙකොනින් අල්ලාගෙන

[1] සච්චක අමතන නමකි

ගසා හෙළන්නාක් මෙන් මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාදය නඟා ගසා හෙළන්නෙමි.

සුරා ධූර්තයෙකු සුරා පෙරන පෙරහන කසට හරිනු පිණිස දියෙහි ලා කොනකින් ගෙන උඩු යටිකුරු කොට සොලවා ගසා හෙළන්නාක් මෙන් මම ශ්‍රමණ ගෞතමයන්ට වාදයෙන් සොලවා ගසා හෙළන්නෙමි.

හණ සේදීමෙහි යෙදෙන්නන් දියෙහි ලා තිබූ හණ මිටි ගෙන ගස ගසා සෝදන්නාක් මෙන් මම ශ්‍රමණ ගෞතමයන් සමග වාද කොට සොලවාලන්නෙමි. ගසාලන්නෙමි. පින්වත් ලිච්ඡවිනි, එත්වා, පින්වත් ලිච්ඡවිනි, අද ශ්‍රමණ ගෞතමයන් සමග මාගේ කථාවක් වන්නේය" යැයි මෙසේ කීවේය.

එවිට ඒ පිරිසෙහි ඇතැම් ලිච්ඡවි රජ කුමාරවරු "**කිමෙක් ද? ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සච්චකට වාදය නඟන්නේ ද? නැතහොත් සච්චක නිගණ්ඨ පුත්‍ර තෙම ශ්‍රමණ ගෞතමයන්ට වාදය නගන්නේ ද?**" යැයි කීවාහු ය.

ඇතැම් ලිච්ඡවි කුමාරවරු "**සච්චක භාග්‍යවතුන් වහන්සේ හා වාද කරන්නට ඔහු කවරෙක් ද? භාග්‍යවතුන් වහන්සේ ම නිගණ්ඨ පුත්‍රයාට වදාරෝපණය කරන්නේ ය**" යැයි කීහ.

ඉක්බිති සච්චක තමාගේ හපන්කම් පෙන්වීමට පන්සියයක් පමණ ලිච්ඡවි කුමාරවරු පිරිවරා ගෙන මහ වනයෙහි කූටාගාර සාලාව වෙත ගියේය. එකල්හි බොහෝ භික්ෂූහු එළිමහනෙහි සක්මන් කරමින් සිටියහ. සච්චක ඒ භික්ෂූන් වෙත ගොස් "**පින්වත්නි, දැන් ඒ පින්වත් ශ්‍රමණ ගෞතම තෙම කොහි වෙසේ ද? අපි ඒ පින්වත් ගෞතමයන් දකිනු කැමැත්තෙමු**" යැයි කීවේය. "**අග්ගිවෙස්සනය, භාග්‍යවතුන් වහන්සේ මහ වනයට වැඩ එක්තරා රුකක් සමීපයෙහි දිවා විහරණය පිණිස වැඩ හිඳිති**" යැයි භික්ෂූහු කීහ.

එදින සච්චක ලිච්ඡවි රජ කුමාරවරු පන්සියයක් සමග තමන් වහන්සේ සමග වාද කිරීමට එන බව දුටු භාග්‍යවතුන් වහන්සේ ඒ

සියලු පිරිසට පැමිණ රැස්වීමට ඉඩ ඇති වනු පිණිස මහා වනයට වැඩ ගසක් මුල වැඩ සිටි සේක.

ඉක්බිති සච්චක මහත් ලිච්ඡවි පිරිසත් සමග මහ වනයට ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත් පසෙක වාඩි විය. ඒ ලිච්ඡවි රජ කුමරුවන්ගෙන් ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත් පසෙක වාඩි වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය යුතු වූ සිහි කටයුතු වූ කථා කොට නිමවා එකත් පසෙක වාඩි වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි දිසාවට දෙහොත් නගා වැඳ එකත් පසෙක වාඩි වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි තමන්ගේ නම් ගොත් කියා එකත් පසෙක වාඩි වූහ. ඇතැම් කෙනෙක් නිශ්ශබ්දව ම එකත් පසෙක වාඩි වූහ.

ඉක්බිති සච්චක භාග්‍යවතුන් වහන්සේ අමතා **"භවත් ගෞතමයන් වහන්සේ මට අවසර දෙන්නේ නම් මම භවත් ගෞතමයන්ගෙන් ප්‍රශ්නයක් අසන්නෙමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සනය, නුඹ යමක් අසනු කැමත්තෙහි ද එය අසව. ප්‍රශ්න විසඳීමෙහිලා මට බරක් නැත. සියල්ල නුඹට විසඳා දෙන්නෙමි"** යැයි සර්වඥ පවාරණයෙන්[1] පැවරූ සේක.

එවිට සච්චක **"භවත් ගෞතමයනි, භවත් ගෞතම තෙමේ කෙසේ වනාහි ශ්‍රාවකයන් හික්මවන්නේ ද, කෙබඳු අනුශාසනාවක් ශ්‍රාවකයන් විෂයෙහි බහුල කොට පවත්වන්නේ ද?"** යැයි ඇසුවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ අස්සජි රහතන් වහන්සේ වදාළ ආකාරය ස්වල්පයක් හෝ වෙනස් කොට වදාළ හොත් පරාජයෙන් පසු අස්සජි තෙරුන් කීවේ අනිකකි. ශ්‍රමණ භවත් ගෞතමයන් කියන්නේ අනිකකි. මා පැමිණියේ අස්සජි තෙරුන් කී ලෙස ම ශ්‍රමණ ගෞතමයන් කියුව හොත් වදරෝපණය කිරීමටය යැයි කියා සච්චකට ගැලවී යාමට කිසි ඉඩක් නො ලැබෙනු පිණිස අස්සජි රහතන් වහන්සේ වදාළ

[1] 54 වන පිට බලන්න

ආකාරයට ම "අග්ගිවෙස්සනය, මම මෙසේ වනාහි ශ්‍රාවකයන් හික්මවමි. ශ්‍රාවකයන් විෂයෙහි මගේ මෙබඳු අනුශාසනාව බහුල කොට පවත්වමි.

**"රූපං, භික්ඛවෙ, අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං. රූපං, භික්ඛවෙ, අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා. සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ ධම්මා අනත්තා'ති"**

"මහණෙනි, රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය සංඥාව අනිත්‍යය, සංස්කාරයෝ අනිත්‍යය. විඤ්ඤාණය අනිත්‍යය. මහණෙනි, රූපය අනාත්මය, වේදනාව අනාත්මය, සංඥාව අනාත්මය, සංස්කාරයෝ අනාත්මය, විඤ්ඤාණය අනාත්මය, සියලු සංස්කාරයෝ අනිත්‍යය, සියලු ධර්මයෝ අනාත්මය යැයි මෙසේ වනාහි මම ශ්‍රාවකයන් හික්මවමි. ශ්‍රාවකයන් විෂයෙහි මෙබඳු මාගේ අනුශාසනාව බහුල කොට පවත්වමි" යැයි වදාළ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, මට උපමාවක් වැටහෙයි" යැයි කීවේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, නුඹට වැටහෙන උපමාව කියව" යැයි වදාළ සේක. එවිට සච්චක **"භවත් ගෞතමයනි, යම් බීජ ජාතියක් ගස් වැල් වී වැඩීමට, මහත් වීමට පැමිණෙත් ද, ඒ සියල්ල පොළොවෙහි පිහිටා පැල වෙත් ද, වැඩෙත්ද, මහත් වීමට යත් ද, භවත් ගෞතමයනි, ශරීර ශක්තියෙන් කටයුතු වූ යම්කිසි කර්මාන්තයෝ වෙත් ද, ඒ සියල්ල පොළොවෙහි පිහිටා කරනු ලැබෙත් ද, භවත් ගෞතමයනි, එපරිද්දෙන් ම රූපය ආත්ම කොට ඇති මේ පුරුෂ තෙම තමා ආත්මය යැයි ගත් රූපයෙහි පිහිටා පින් හෝ පව් හෝ රැස් කරයි. වේදනාව ආත්ම කොට ඇති පුද්ගල තෙම වේදනාවෙහි පිහිටා පින් හෝ පව් හෝ රැස් කරයි. සංඥාව ආත්ම කොට ඇති පුද්ගල තෙම සංඥාවෙහි පිහිටා පින් හෝ පව් හෝ රැස් කරයි. සංස්කාරයන් ආත්ම කොට ඇති මේ පුද්ගල තෙම සංස්කාරයන්හි පිහිටා පින් හෝ පව් හෝ රැස් කරයි. විඤ්ඤාණය ආත්ම කොට ඇති මේ පුද්ගල තෙම විඤ්ඤාණයෙහි පිහිටා පින් හෝ පව් හෝ රැස් කෙරේ ය"** යැයි කීවේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සනය, නුඹ රූපය මගේ ආත්මය, වේදනාව මාගේ ආත්මය, සංඥාව මගේ ආත්මය, සංස්කාරයෝ මාගේ ආත්මය, විඤ්ඤාණය මාගේ ආත්මය' යැයි කියන්නේ ද?"** යැයි අසා වදාළ සේක.

එවිට සච්චක **"භවත් ගෞතමයනි මම රූපය මාගේ ආත්මය, වේදනාව මාගේ ආත්මය, සංඥාව මාගේ ආත්මය, සංස්කාරයෝ මාගේ ආත්මය, විඤ්ඤාණය මාගේ ආත්මය යැයි කියමි. මේ මහජන සමූහයා ද එසේ ම කියති"** යැයි කීවේ ය.

තථාගතයන් වහන්සේ සච්චක විසින් කී දෙය නැවත නැවතත් විචාරා ඔහු එම කථාවෙහි ම පිහිට වූ බැවින් ඔහුට එම කීමෙහි යම් වරදක් ඇත්තේ ද? යැයි සැක ඇති විය. සච්චක මහත් කෛරාටිකයෙකු බැවින් යම් වරදක් ඇතොත් එය තමා වෙත පමණක් නොව එක්ව පැමිණි සැම දෙනා පිට ඒ වරද පටවා බේරීමට සිතා අන් අය ද ඔහුගේ අදහසට කැමති කර ගනු පිණිස **මේ මහජන සමූහයා ද එසේ ම කියති"** යැයි කීවේ ය.

සච්චක කොතරම් කෛරාටිකයෙකු වුව ද බුදුරජාණන් වහන්සේ රැවටීමට නොහැකිය. එබැවින් මහ ජනයා පිට වරද පටවා සච්චකට එයින් ගැලවීමට නොහැකි වනු පිණිස භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සනය, මහජන සමූහයාගේ අදහස් කුමට ද? මා සමග වාද කිරීමට පැමිණියේ නුඹ ය. එබැවින් නුඹගේ වාදය ම කියව"** යැයි වදාළ සේක.

එවිට සච්චක **"භවත් ගෞතමයනි, මම වනාහි රූපය මාගේ ආත්මයයි ද, වේදනාව මාගේ ආත්මයයි ද, සංඥාව මාගේ ආත්මයයි ද, සංස්කාරයෝ මාගේ ආත්මයයි ද, විඤ්ඤාණය මාගේ ආත්මයයි ද මෙසේ කියමි"** යැයි කීවේය.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සනය, එසේ නම් මෙහි ලා නුඹ ම විචාරමි. නුඹට වැටහෙන ආකාරයෙන් පිළිතුරු දෙව. අග්ගිවෙස්සනය, අභිෂේක ලත් රජෙකුට මේ පසේනදි කොසොල් රජු මෙන්, මගධ රට වේදේහි පුත්‍ර අජාසත් රජුට මෙන් තමාගේ රටේ**

නැසිය යුත්තෙකු නසන්නට හෝ, ධනය විනාශ කළ යුත්තෙකුගේ ධනය විනාශ කරන්නට හෝ, රටින් නෙරපිය යුත්තෙකු රටින් නෙරපන්නට හෝ බලයක් ඇත්තේ ද, නුඹ මේ ගැන කුමක් හිතන්නෙහිද?" යැයි අසා වදාළ සේක.

සච්චකගේ වාදය බිඳලනු පිණිස තථාගතයන් වහන්සේ විසින් ඉදිරිපත් කළ කරුණ කුමක් පිණිස ඉදිරිපත් කළේ ද යැයි නොදත් බැවින් තමාගේ ගෙල සිඳීමට තමා ම කඩුව මුවහත් කර දෙන්නාක් මෙන් සච්චක භාග්‍යවතුන් වහන්සේ වදාළ කරුණ වණීවත් කරමින් "භවත් ගෞතමයනි, පසේනදි කොසොල් රජු, මගධ රට වේදේහි පුත්‍ර වූ අජාසත් රජු වැනි ක්ෂත්‍රිය රජ කෙනෙකුට තමන්ගේ රටේ නැසිය යුත්තෙකු නසන්නට හෝ, ධනය විනාශ කළ යුත්තෙකුගේ ධනය විනාශ කිරීමට හෝ, රටින් නෙරපිය යුත්තෙකු රටින් නෙරපන්නට හෝ බලය ඇත්තේ ය. භවත් ගෞතමයනි, සමූහ වූ මහ පිරිස් ඇති වැදෑ රට වැසි ලිච්ඡවින්ට ද, මල්ල රජවරුන්ට ද, තමන්ගේ රටේ නැසිය යුත්තෙකු නසන්නට හෝ, ධනය විනාශ කළ යුත්තෙකුගේ ධනය විනාශ කරන්නට හෝ, රටින් නෙරපිය යුත්තෙකු රටින් නෙරපන්නට හෝ බලය ඇත්තේ ය. පසේනදි කොසොල් රජු, මගධ රට අජාසත් රජු වැනි ක්ෂත්‍රිය රජෙකු ගැන කියනුම කවරේද? භවත් ගෞතමයනි, ඔවුන්ට ඒ බලය ඇත්තේම ය" යැයි කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, රූපය මාගේ ආත්මය යැයි නුඹ කියන්නෙහි ය. 'මගේ රූපය මෙසේ වේවා. මගේ රූපය මෙසේ නොවේවා' යැයි ඒ රූපය කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකි ද?" යැයි අසා වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්නය සච්චකට උභතෝකෝටික ප්‍රශ්නයක් විය. කෙලෙස පිළිතුරු සැපයුව ද ගැලවීමක් නැත. ඉදින් "රූපය කෙරෙහි තමාගේ අධිපති බව පැවැත්විය හැකිය" යැයි පිළිතුරු දුන්න හොත් ලිච්ඡවි රජ කුමාරවරු නැගී සිට "ආචාර්‍යයිනි, රූපය කෙරෙහි නුඹගේ අධිපති බව පැවැත්විය හැකි නම් නුඹගේ ඔය විරූපී ශරීරය මේ ලිච්ඡවින්ගේ ශරීර මෙන් ලස්සන කර නොගන්නේ කුමක් නිසා ද" යැයි කියමින් සච්චක පීඩාවට පත් කරන්නාහ. ඉදින් "රූපය කෙරෙහි තමාගේ අධිපති බව පැවැත්විය නොහැකිය" යැයි පිළිතුරු

දුන්න හොත් භාග්‍යවතුන් වහන්සේ "**නුඹ කලින් රූපය මාගේ ආත්මය යැයි කියා දැන් අනිකක් කියන්නේ ය**" යැයි දෙස් නගන්නේ ය. දැන් කෙසේ පිළිතුරු සැපයුව ද ගැලවීමක් නැති බව දත් සච්චක තුෂ්ණිම්භූත වී සිටියේ ය. දෙවනුව ද භාග්‍යවතුන් වහන්සේ සච්චකගෙන් "**අග්ගිවෙස්සනය, මේ ගැන නුඹගේ කල්පනාව කෙසේ ද? රූපය මගේ ආත්මය යැයි නුඹ කියන්නෙහි ය. මාගේ රූපය මෙසේ වේවා. මාගේ රූපය මෙසේ නොවේවා යැයි ඒ රූපය කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකි ද?**" යැයි අසා වදාළ සේක. දෙවනුව ද සච්චක තුෂ්ණිම්භූත ව සිටියේ ය,

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සච්චකට "**අග්ගිවෙස්සනය, වහා පිළිතුරු දෙනු, මේ නුඹට නිහඬව සිටීමට කාලය නොවේ ය. අග්ගිවෙස්සනය, තථාගතයන් විසින් තුන්වැනි වර දක්වා කරුණු සහිතව ප්‍රශ්න කරනු ලබන කල්හි යම් කිසිවෙක් පිළිතුරු නොදෙයි ද, එතැන්හිදී ම ඔහුගේ හිස හත් කඩකට පැළෙන්නේ ය. එසේ නැතිනම් තල් ගෙඩියක් නටුවෙන් ගිලිහී බිම වැටෙන්නාක් මෙන් ඔහුගේ හිස බෙල්ලෙන් ගැලවී බිම පතිත වන්නේ ය**" යැයි වදාළ සේක.

තථාගතයන් වහන්සේ සම්බුද්ධත්වයට පැමිණ සත් සති ගත කරන අතර රාජායතන කිරි පලු නුග රුක මුල වැඩ හිඳ තමන් වහන්සේ අවබෝධ කළ අති ගම්භීර වූ, සියුම් වූ මේ සත්‍ය ධර්මය දේශනා කළ ද සත්වයන්ට නො වැටහෙනු ඇත යැයි සිතා ධර්ම දේශනා කිරීමට මන්දෝත්සාහී වූ විට සහම්පතී මහා බ්‍රහ්ම රාජයා භාග්‍යවතුන් වහන්සේගේ සිත තම සිතින් දැන ඒ ක්ෂණයෙහි ම භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණ දකුණු දණ මඬල බිම ඇණ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට ධර්ම දේශනාව පිණිස ආරාධනා කර සිටියේ ය. ඒ සමග ම පැමිණි සක් දෙව් රජතුමා භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ධර්ම දේශනා කොට වදාරණ සේක්වා. භාග්‍යවතුන් වහන්සේට ධර්ම චක්‍රය වේවා. අපට ආඥා චක්‍රය වේවා. භාග්‍යවතුන් වහන්සේගේ අණට අවනත නොවන යමෙක් වෙතොත් අප විසින් ඔවුහු භාග්‍යවතුන් වහන්සේට හික්මවා දෙන්නෙමු**" යැයි කියා ප්‍රතිඥා දී ගියේ ය. මේ අවස්ථාවෙහි සච්චක භාග්‍යවතුන් වහන්සේ ඇසූ ප්‍රශ්නයට පිළිතුරු නොදී තුෂ්ණිම්භූතව සිටින විට සක්දෙව් රජ එතැනට පැමිණ "**ඉදින් මේ සච්චක නිගණ්ඨ**

**පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් තුන්වැනි වර දක්වා කරුණු සහිතව ප්‍රශ්න විචාරන ලද්දේ පිළිතුරු නො දෙන්නේ ද, මෙහි ම ඔහුගේ හිස සත් කඩකට පළන්නෙමි"** යැයි සිතා හාත්පසින් ගිනි ගෙන දිලිසෙන ගිනි දැල් සහිත වූ අයෝමය වජ්‍රායුධයක් ගෙන සච්චක ගේ හිසට එල්ල කරගෙන ඔහුගේ හිසට උඩින් අහසෙහි පෙනී සිටියේ ය. එම යක්ෂයා පෙනෙන්නේ භාග්‍යවතුන් වහන්සේට හා සච්චකට පමණි. සෙස්සන්ට නො පෙනේ.

එම යක්ෂයා දැකීමෙන් සච්චක බියපත් වූයේ ය. ඇඟ ලේ උණු විය. පපුව ගැහෙන්නට විය. කිහිලිවලින් ද නළල වටින් ද දහදිය ගලන්නට විය. තමන්ට යකෙකු පෙනෙන නමුත් බලා සිටින සෙස්සන්ට එබන්දක් නො පෙනෙන බව පිරිස හැසිරෙන ආකාරයෙන්ම සච්චක තේරුම් ගත්තේ ය. දැන් යකෙකු ගැන කථා කළ හොත් **"නුඹට මෙතෙක් නො පෙනුණු යක්කුත් දැන් පෙනෙන්නට පටන් ගත්තේ ද"** යැයි සෙස්සේ ඔහු අපහාසයට ලැජ්ජාවට පත් කරන්නාහ. ඒ බව දත් සච්චක මා හට භාග්‍යවතුන් වහන්සේගේ පිහිට හැර වෙන පිහිටක් දැන් නැත යැයි සිතා **"භවත් ගෞතමයන් වහන්ස, අසනු මැනවි මම පිළිතුරු දෙන්නෙමි"** යැයි කීවේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ හා සච්චක අතර මෙසේ සංවාසයක් ඇති විය.

භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සනය, නුඹ රූපය මගේ ආත්මය යැයි කියන්නෙහි ය, මගේ රූපය මෙසේ වේවා. මගේ රූපය මෙසේ නොවේවා යැයි ඒ රූපය කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකි ද?"** යැයි අසා වදාළ සේක.

සච්චක **"භවත් ගෞතමයනි, මෙය නොවේමය"** යැයි කීවේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සනය, කල්පනා කරන්න අග්ගිවෙස්සනය, කල්පනා කර පිළිතුරු දෙන්න. නුඹගේ පළමු කීම හා පසු කියන දෙය නොගැළපෙයි"** යැයි වදරා නැවත ද **"අග්ගිවෙස්සනය, වේදනාව මගේ ආත්මය යැයි නුඹ කියන්නෙහි ය, ආත්ම වශයෙන් ගත් ඒ මාගේ වේදනාව මෙසේ වේවා. මාගේ වේදනාව මෙසේ නොවේවා යැයි ඒ වේදනාව කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකි ද?"** යැයි නැවත ද අසා වදාළ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, මෙය නොවේමය**" යැයි කීවේ ය.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ "**අග්ගිවෙස්සනය, කල්පනා කරන්න අග්ගිවෙස්සනය, කල්පනා කර පිළිතුරු දෙන්න. නුඹගේ පළමු කීම හා පසු කියන දෙය නොගැළපෙයි**" යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**අග්ගිවෙස්සනය, සඤ්ඤාව මගේ ආත්මය යැයි නුඹ කියන්නෙහි ය, ආත්ම වශයෙන් ගත් ඒ මාගේ සඤ්ඤාව මෙසේ වේවා. මාගේ සඤ්ඤාව මෙසේ නොවේවා යැයි ඒ සඤ්ඤාව කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකි ද?**" යැයි අසා වදාළ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, මෙය නොවේමය**" යැයි කීවේ ය.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ "**අග්ගිවෙස්සනය, කල්පනා කරන්න අග්ගිවෙස්සනය, කල්පනා කර පිළිතුරු දෙන්න. නුඹගේ පළමු කීම හා පසු කියන දෙය නොගැළපෙයි**" යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**අග්ගිවෙස්සනය, සංස්කාර මගේ ආත්මය යැයි නුඹ කියන්නෙහි ය, ආත්ම වශයෙන් ගත් ඒ මාගේ සංස්කාර මෙසේ වේවා. මාගේ සංස්කාර මෙසේ නොවේවා යැයි ඒ සංස්කාර කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකි ද?**" යැයි අසා වදාළ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, මෙය නොවේමය**" යැයි කීවේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ "**අග්ගිවෙස්සනය, කල්පනා කරන්න අග්ගිවෙස්සනය, කල්පනා කර පිළිතුරු දෙන්න. නුඹගේ පළමු කීම හා පසු කියන දෙය නොගැළපෙයි**" යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "අග්ගිවෙස්සනය, විඤ්ඤාණය මගේ ආත්මය යැයි නුඹ කියන්නෙහි ය, ආත්ම වශයෙන් ගත් ඒ මාගේ විඤ්ඤාණය මෙසේ වේවා. මාගේ විඤ්ඤාණය මෙසේ නොවේවා යැයි ඒ විඤ්ඤාණය කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකි ද?" යැයි අසා වදාළ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, මෙය නොවේමය" යැයි කීවේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, කල්පනා කරන්න අග්ගිවෙස්සනය, කල්පනා කර පිළිතුරු දෙන්න. නුඹගේ පළමු කීම හා පසු කියන දෙය නොගැළපෙයි" යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "අග්ගිවෙස්සනය, රූපය නිත්‍ය ද, අනිත්‍ය ද?" යැයි ඇසූ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, අනිත්‍යය" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "යමක් අනිත්‍ය නම් එය සැපයක් ද දුකක් ද" යැයි ඇසූ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, එය දුකක් ය" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය, මමය මගේය මගේ ආත්මය යැයි සලකන්නට සුදුසු ද?" යැයි ඇසූ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, සුදුසු නොවන්නේය" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "අග්ගිවෙස්සනය, වේදනාව නිත්‍ය ද, අනිත්‍ය ද?" යැයි ඇසූ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, අනිත්‍යය" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**යමක් අනිත්‍ය නම් එය සැපයක් ද දුකක් ද**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, එය දුකක් ය**" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය, මමය මගේය මගේ ආත්මය යැයි සලකන්නට සුදුසු ද?**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, සුදුසු නොවන්නේය**" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**අග්ගිවෙස්සනය, සඤ්ඤාව නිත්‍ය ද, අනිත්‍ය ද?**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, අනිත්‍යය**" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**යමක් අනිත්‍ය නම් එය සැපයක් ද දුකක් ද**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, එය දුකක් ය**" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය, මමය මගේය මගේ ආත්මය යැයි සලකන්නට සුදුසු ද?**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, සුදුසු නො වන්නේය**" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**අග්ගිවෙස්සනය, සංස්කාර නිත්‍ය ද, අනිත්‍ය ද?**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයනි, අනිත්‍යය**" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**යමක් අනිත්‍ය නම් එය සැපයක් ද දුකක් ද**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**හවත් ගෞතමයනි, එය දුකක් ය**" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය, මමය මගේය මගේ ආත්මය යැයි සලකන්නට සුදුසු ද?**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**හවත් ගෞතමයනි, සුදුසු නොවන්නේය**" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**අග්ගිවෙස්සනය, විඤ්ඤාණය නිත්‍ය ද, අනිත්‍ය ද?**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**හවත් ගෞතමයනි, අනිත්‍යය**" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**යමක් අනිත්‍ය නම් එය සැපයක් ද දුකක් ද**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**හවත් ගෞතමයනි, එය දුකක් ය**" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය, මමය මගේය මගේ ආත්මය යැයි සලකන්නට සුදුසු ද?**" යැයි ඇසූ සේක.

එවිට සච්චක "**හවත් ගෞතමයනි, සුදුසු නොවන්නේය**" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ නැවත ද "**අග්ගිවෙස්සනය, අරටුවෙන් ප්‍රයෝජන ඇති කෙනෙක් අරටුවක් සොයමින් තියුණු පොරොවක් ගෙන වනයට පිවිස ඇවිදින්නේ නො මේරූ ඇද නැති අලුත් වූ මහත් කෙසෙල් ගසක් දක්නේ ය. හෙතෙම ඒ කෙසෙල් ගස මුල හා අග සිඳ**

පතුරු ගළවා අරටුවක් සොයන්නේ ය. එයින් හෙතෙම එලයක්වත් නොලබන්නේ ය. හරයක් කොයින් ලබයි ද? අග්ගිවෙස්සනය, එපරිද්දෙන් ම නුඹගේ වාදය මා විසින් එකින් එක විමසූ විට එහි කිසි හරයක් නොලැබුණේ ය. නුඹගේ වාදය ශූන්‍යය. නුඹ පැරදුණෙහි ය" යැයි වදාළ සේක.

අග්ගිවෙස්සනය, නුඹ විශාලාවෙහි පිරිස් මැද "මා වාද කථා කළ හොත් අභීත් සම්‍යක් සම්බුද්ධ යැයි කියාගෙන සිටින්නෙකු වුව ද වෙවුලා යන්නේ ය. ඔහුගෙන් දහදිය ගලන්නට වන්නේ ය. මා වාද කළ හොත් සිත් නැති කණුවක් වුව ද වෙවුලා යන්නේ ය යැයි කියයි. එහෙත් දැන් නුඹගේ නළලින් ගලන දහදිය උතුරු සළුවට වැටී එයත් තෙමාගෙන බිමට වැටෙන්නේ ය. එහෙත් මාගේ ශරීරයෙහි නම් දහදිය බිඳකුදු නැත" යැයි වදාරා සුගත් චීවරය මඳක් ඉවත් කොට දක්වා වදාළ සේක.

මේ සච්චක වනාහි සම්මා සම්බුද්ධ යැයි ප්‍රකට ශාස්තෘවරු වෙත ගොස් වාද කොට ඔවුන් පරදවා ජය ඝෝෂා කරමින් එන්නෙකි. ඔහු සපන කම් කියමින් සිටියේ එම කාරණය නිසා ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ වාදයෙහි නිසරු බව දක්වා පරාජිතයෙකු කොට දැක්වූ කල්හි සච්චක පරාජය පිළිගෙන කර කියා ගත හැකි කිසිවක් නැතිව ලැජ්ජාවෙන් බිම බලාගෙන සිටියේ ය.

මෙසේ සච්චක ලැජ්ජාවෙන් මිරිකී බිම බලාගෙන සිටින විට ඉක්බිති දුර්මුඛ නම් ලිච්ඡවි පුත්‍රයා "භාග්‍යවතුන් වහන්ස මට උපමාවක් වැටහෙයි" යයි කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "කියව දුර්මුඛය" යැයි වදාළ සේක.

එකල්හි ඒ දුර්මුඛ ලිච්ඡවි පුත්‍රයා "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ගමක් අසල පොකුණක් ඇත්තේ ය. ඒ පොකුණෙහි මහත් කකුළුවෙක් වෙසෙයි. දිනක් ඒ ගමේ දරු දැරියන් පිරිසක් ඒ පොකුණට බැස ඒ කකුළුවා දියෙන් ගොඩ ගෙන බිම තැබූහ. එවිට ඒ කකුළුවා අඬු ඉදිරියට දිගු කළේ ය. ගම් දරුවෝ ලී කෑලිවලින් ඒ අඬුව සිඳ දැමූහ. ඉන් පසු ඒ කකුළුවාට පෙර මෙන් පොකුණට බසින්නට නොහැකි විය.

**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එපරිද්දෙන් ම සච්චකගේ වාද නැමති දෘෂ්ටි අඬු වූයේ ද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ විසින් සිඳින ලද්දේ ය. දූන් සච්චකට වාද කරන අදහසින් නැවත භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙන්නට නොහැකි වූයේ ය"** යැයි කීවේ ය.

මේ සච්චක දුර්මුඛ ආදී බොහෝ ලිච්ඡවීන්ගේ ගුරුවරයෙකි. ශාස්ත්‍ර ඉගෙන ගන්නා විට ඔවුහු සච්චකගෙන් නිග්‍රහයට පත්ව ඇත. ඒ හේතුවෙන් සච්චක සමග අමනාපයෙන් සිටි ලිච්ඡවි කුමරුවෝ බොහෝ දෙනෙක් ද මෙහි රැස්ව සිටියහ. සච්චකට නිග්‍රහ කිරීමට මේ හොඳම වේලාව යැයි සළකා ඒ සියල්ලෝ ම දුර්මුඛ කුමාරයාගේ කථාව නිමවන තුරු නො ඉවසිල්ලෙන් සිටියහ. ඒ බව තේරුම් ගත් සච්චක ඔවුන්ට කථා කිරීමට ඉඩ නො ලැබෙනු පිණිස **"නවත්තනු දුර්මුඛය, නුඹ හා අප අතර කථාවක් මෙහි නැත. අප මෙහි කථා කරන්නේ භවත් ගෞතමයන් සමග ය"** යැයි කියා නැවතත් භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ ප්‍රශ්න විචාළේ ය.

**"භවත් ගෞතමයනි, කොපමණකින් භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෙක් ගෞතමයන්ගේ අනුශාසනාව තුළ පිහිටියේ අවවාදයෙහි පිළිපදින්නේ විචිකිච්ඡාවෙන් එතර වූයේ විශාරද බවට පැමිණ ශාස්තෘ ශාසනයෙහි වාසය කරන්නෙක් වන්නේ ද?"** යැයි අසා සිටියේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, මේ ශාසනයෙහි මාගේ ශ්‍රාවකයෙකු අතීත අනාගත වර්තමාන ආධ්‍යාත්මික බාහිර ඖලාරික සුකුම හීන ප්‍රණීත දුර ළඟ යන එකොළොස් ආකාරයෙන් යුත් රූපය මමය මගේය මගේ ආත්මය යැයි නොගත්තේ වේ ද, මෙම යථා ස්වභාවය ඇති සැටියෙන් නුවණින් දක්නේ වේ ද, එසේ ම වේදනාව සඤ්ඤාව සංස්කාර විඤ්ඤාණය යන අතීත අනාගත ආදී ලෙස එකොළොස් වැදෑරුම් වූ නාමස්කන්ධ සතර ද මෙය මම නොවෙයි මෙය මගේ නොවෙයි මෙය මගේ ආත්මය නොවේ යයි මෙසේ ඇති සැටියෙන් නුවණින් දකී ද, මෙපමණකින් මාගේ ශ්‍රාවක තෙම අනුශාසනාව කරන්නේ, අවවාදයට අනුව ක්‍රියා කරන්නේ සැකයෙන් එතර වූයේ විශාරද බවට ද පැමිණියේ සත්‍යාවබෝධය පිණිස අනුන්ගේ පිහිටක් නැවත නො සොයා ශාස්තෘ ශාසනයෙහි වාසය කරන්නෙකු වන්නේ ය" යැයි වදාළ සේක.

ඉක්බිති සච්චක "භවත් ගෞතමයනි, මහණ තෙම කොපමණකින් නැති කළ කෙලෙස් ඇත්තේ, වැස නිමවන ලද බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තේ, කළ කටයුතු ඇත්තේ, බහා තබන ලද කෙලෙස් බර ඇත්තේ අර්හත් බවට පැමිණියේ භව සංයෝජන (සසර බැඳුම්) විනාශ කළේ, අර්හත්වයට පැමිණියේ වේ ද?" යැයි ඇසුවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, මේ ශාසනයෙහි මාගේ ශ්‍රාවකයෙකු අතීත අනාගත වර්තමාන ආධ්‍යාත්මික බාහිර ඖලාරික සුකුම හීන ප්‍රණීත දුර ළඟ යන එකොළොස් ආකාරයෙන් යුත් රූපය මමය මගේය මගේ ආත්මය යැයි නොගත්තේ වේ ද, මෙම යථා ස්වභාවය ඇති සැටියෙන් නුවණින් දක්නේ වේ ද, එසේ ම වේදනාව සඤ්ඤාව සංස්කාර විඤ්ඤාණය යන අතීත අනාගත ආදී ලෙස එකොළොස් වැදෑරුම් වූ නාමස්කන්ධ සතර ද මෙය මම නොවෙයි මෙය මගේ නොවෙයි මෙය මගේ ආත්මය නොවේ යයි මෙසේ ඇති සැටියෙන් නුවණින් දැක සතර උපාදන දුරු කරන්නේ ද මෙපමණකින් මාගේ ශ්‍රාවක තෙම ආශ්‍රවයන් ක්ෂය කළේ නිම කරන ලද බඹසර ඇත්තේ සිවු මගින් කළ යුතු වූ සොළොස් වැදෑරුම් කෘත්‍යයන් ඇතිව කෙලෙස් බර බහා තබන ලද රහත් කෙනෙකු වන්නේ ය.

අග්ගිවෙස්සනය, මෙසේ මිදුණ සිත් ඇති භික්ෂුව දස්සනානුත්තරිය (අර්හත් මාර්ග ඥානය,) පටිපදානුත්තරිය (ඉතිරි මාර්ග ඥාන තුන) විමුත්තානුත්තරිය (අර්හත් ඵලය,) යන අනුත්තරිය ධර්ම තුනකින් යුක්ත වූයේ වෙයි. මෙසේ මිදුණු සිත් ඇති භික්ෂුව ම ඒ භාග්‍යවතුන් වහන්සේ චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කොට චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධය පිණිස අන්‍යයන්ට ධර්මය දෙසනා කරති. දමුණා වූ ඉන්ද්‍රිය ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ට ද ඉන්ද්‍රිය දමනය පිණිස ධර්මය දෙසනා කරති. සියලු කෙලෙස් සංසිඳීමෙන් ශාන්ත වූ ඒ භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ට ද කෙලෙස් සංසිඳීම පිණිස ධර්මය දෙසනා කරති. කෙලෙස් සැඩ පහර තරණය කළා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ට ද කෙලෙස් සැඩ පහර තරණය පිණිස ධර්මය දෙසනා කරති. කෙලෙස් පරිනිර්වාණය කළා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ට ද කෙලෙස් පරිනිර්වාණය පිණිස ධර්මය දෙසනා කරති' යැයි භාග්‍යවතුන් වහන්සේට ම සත්කාර කරයි, ගරු කරයි, බුහුමන් කරයි යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි, සච්චක භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "භවත් ගෞතමයනි, යම් සේ අපි භවත් ගෞතමයන් සමග වාද කිරීමට සිතුවෙමු ද, ඒ අපි ම ගුණයෙන් පිරිහුණෙමු. අපි ම ලාමක වචන ඇත්තෝ වූවෙමු. භවත් ගෞතමයනි, මත් ඇතෙකු සමග ගැටෙන පුරුෂයෙකුට සෙතක් වන්නේ ය. භවත් ගෞතමයන් හා ගැටෙන්නකුට යහපතක් නොවන්නේ ය. භවත් ගෞතමයනි, දරුණු විෂ ඇති සර්පයෙකු ගැටෙන්නෙකුට පුරුෂයෙකුට සෙතක් වන්නේ ය. භවත් ගෞතමයන් හා ගැටෙන පුරුෂයෙකුට යහපතක් නොවන්නේ ය. භවත් ගෞතමයනි, දිලිසෙන ගිනි කඳක් හා ගැටෙන්නා වූ පුරුෂයෙකුට සෙතක් වන්නේ ය. භවත් ගෞතමයන් හා ගැටෙන පුරුෂයෙකුට යහපතක් නොවන්නේ ය.

භවත් ගෞතමයනි, යම් සේ අපි භවත් ගෞතමයන් සමග වාද කිරීමට සිතුවෙමු ද, ඒ අපි ම ගුණයෙන් පිරිහුණෙමු. අපි ම ලාමක වචන ඇත්තෝ වූවෙමු. භවත් ගෞතම තෙම හෙට දවසට භික්ෂු සංඝයා සමග මාගේ බත ඉවසුව මැනව" යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම් භාවයෙන් එය ඉවසා වදාළ සේක.

ඉක්බිති සච්චක භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන ලිච්ඡවින් අමතා "පින්වත් ලිච්ඡවිනි, මාගේ වචනය අසත්වා. මා විසින් ශ්‍රමණ ගෞතම තෙම භික්ෂු සංඝයා සමග හෙට දවසට බතින් පවරන ලදී. යමක් ශ්‍රමණ භවත් ගෞතමයන්ට කැප සරුප් වේ ද, එබඳු ආහාර පාන මා වෙතට එවත්වා" යැයි කීවේ ය.

ඉක්බිති ලිච්ඡවිහු, ඒ රාත්‍රිය ගේ ඇවෑමෙන් සච්චකට පන්සියයක් පමණ බත් සැලි යැවූහ. එවිට සච්චක නිගණ්ඨ පුත්‍ර තෙම සිය අරමෙහි ප්‍රණීත වූ කෑ යුතු බුදිය යුතු දෑ පිළියෙල කරවා "භවත් ගෞතමයනි සුදුසු කාලයයි බත නිමිය ය" යැයි භාග්‍යවතුන් වහන්සේට කාලය දන්වා යැවිය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග පෙරවරු කාලයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙන සච්චකගේ ආරාමය යම් වෙත වැඩ පනවන ලද ආසන්නයෙහි වැඩ හුන් සේක. සච්චක බුද්ධ ප්‍රමුඛ කොට ඇති භික්ෂු සංඝයා ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දැයින් සියතින්

වැළඳ විය. ඉක්බිති සච්චක භාග්‍යවතුන් වහන්සේ වළඳ අවසන් වූ පසු එක්තරා මිටි ආසනයක් ගෙන එකත් පසෙක වාඩි වී භාග්‍යවතුන් වහන්සේට "**භවත් ගෞතමයනි, දනමය පුණ්‍ය ක්‍රියාවෙහි යම් මේ පිනකුත් විපාකයකුත් වේ නම් එය මේ දනය එවූ දයකයින්ට සැප පිණිස වේවා**" යැයි කීවේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "**අග්ගිවෙස්සනය, පහ නොකළ රාගය ඇති, පහ නොකළ ද්වේෂය ඇති, පහ නොකළ මෝහය ඇති යම් බඳු දක්ෂිණාහීයෙකු වෙතට පුදන ලද ඒ පුණ්‍ය විපාකය දයකයින්ට වන්නේ ය. පහ කළ රාගය ඇති, පහ කළ ද්වේෂය ඇති, පහ කළ මෝහය ඇති මා වැනි දක්ෂිණාහීයෙකු වෙත පුදන ලද ඒ පුණ්‍ය විපාකය නුඹට වන්නේ ය**" යනුවෙන් මතුවට සච්චකගේ අපී සිද්ධිය දැක ඔහුට ම එම කුසලයෙහි ආනිශංස වාරය පවරා වදළ සේක.

නැවත ද එක් සමයක භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි ම වැඩ වාසය කරන විටෙක එක් දිනක් පෙරවරු කාලයෙහි විසාලා මහනුවරට පිඬු පිණිස වඩිනු කැමතිව අඳනය මනාව හැඳ කාය බන්ධනය (පටිය) බැඳ පාංශුකූල චීවරය පෙරව වැඩ සිටි සේක.

එවිට සච්චක සක්මන් කිරීම සඳහා ඇවිදින අතර මෙසේ සිතුවේ ය. "**පළමු ව මම නොවියත් බැවින් විශාලා නුවරින් මහ සෙනග පිරිවරා ගෙන ශ්‍රමණ ගෞතමයන් වෙත ගොස් මකු වූයෙමි. ලැජ්ජාවට පත් වූයෙමි. දන් එසේ නොකොට හුදෙකලාව ම ගොස් වාද කරන්නෙමි. ඉඳින් ශ්‍රමණ ගෞතමයන් පරදවන්නට හැකි වුවහොත් එකල්හි මාගේ ලබ්ධිය ප්‍රකාශ කොට ජය ලබන්නෙමි. ඉඳින් ශ්‍රමණ ගෞතමයන් ජය ලැබුව හොත් එවිට එය අඳුරෙහි නැටූ නැටුමක් මෙන් කිසිවෙකු එය නොදන්නේය**" යැයි සිතා නිද්‍රාව පිළිබඳ ප්‍රශ්නයක් ගොතා ගෙන භාග්‍යවතුන් වහන්සේ සමග වාද කරනු කැමතිව කූටාගාර ශාලාව වෙත පැමිණියේ ය.

ආනන්ද තෙරුන් වහන්සේ එන්නා වූ සච්චක දුර දීම දැක සච්චක කෙරෙහි අනුකම්පාවෙන් මෙසේ සිතුවේ ය. "**භාග්‍යවතුන් වහන්සේ පිණ්ඩපාතය පිණිස නො වැඩ මොහොතක් වැඩ හිඳින සේක්**

**නම් මේ සච්චකට බුද්ධ දර්ශනය ද, ධර්ම ශ්‍රවණය ද ලැබෙන්නේ ය. එය ඔහුට ඉතා දීර්ඝ කාලයක් හිත සුව පිණිස වන්නේ ය"** යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ අයැද පාංශුකූල චීවරය සිවු ගුණ කොට අසුනක් පනවා **"ස්වාමීනි, කථාවෙහි දක්ෂ වූ තමා පණ්ඩිතයෙකු යැයි කියාගන්නා වූ, බොහෝ දෙනා විසින් සම්මාන කරණ ලද්ද වූ සච්චක නිගණ්ඨ පුත්‍රයා එන්නේ ය. ස්වාමීනි, මෙතෙම වනාහි බුදුන්ගේ අගුණ කියනු කැමැත්තේ ය. ධර්මයෙහි අගුණ කියනු කැමැත්තේ ය. සංඝයාගේ අගුණ කියනු කැමැත්තේ ය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා උපදවා මොහොතක් වැඩ හිඳිනු මැනව"** ආරාධනා කළේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අස්නෙහි වැඩ හුන් සේක.

ඉක්බිති සච්චක භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වියයුතු සිහිකට යුතු කථාවක් කොට නිමවා එකත් පසෙක වාඩි වී භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

"භවත් ගෞතමයනි, කාය භාවනාවෙහි[1] යෙදී වාසය කරන්නා වූ, එහෙත් චිත්ත භාවනාවක්[2] නො කරන්නා වූ ඇතැම් මහණ බමුණෝ වෙති. ඔවුහු ශරීරයෙහි හටගත් දුක් වේදනාව විඳිත්. භවත් ගෞතමයනි, පෙර වූවක් කියමි. ශරීරයෙහි හට ගත්තා වූ දුක් වේදනා විඳින්නා හට කලව හිරිවැටීම හෝ ළය පැළීම හෝ උණු ලේ වමනය වීම හෝ වන්නේ ය. උමතු බවට ද, සිත අවුල් බවට ද පැමිණෙන්නේ ය. භවත් ගෞතමයනි, ඔහුගේ සිත කය අනුව ගියේ කය අනුව පවතින්නේ වෙයි. ඊට හේතු කවරේද? සිත නො වැඩූ හෙයිනි,

භවත් ගෞතමයනි, චිත්ත භාවනාවෙහි යෙදෙන්නා වූ එහෙත් කාය භාවනාවක් නො කරන්නා වූ ඇතැම් මහණ බමුණෝ වෙති. ඔවුහු චෛතසික දුක් වේදනා විඳිත්. භවත් ගෞතමයනි, පෙර වූවක් කියමි. සිතේ දුක් වේදනාවෙන් පෙළෙන්නා හට කලව තද වීම හෝ ළය පැළීම හෝ උණු ලේ වමනය හෝ වන්නේ ය. උමතු බවට ද, සිත අවුල් බවට ද, පැමිණෙන්නේ ය. භවත් ගෞතමයනි, ඔහුගේ ශරීරය සිත අනුව ගියේ වෙයි. සිතට අනුව පවතියි. ඊට හේතු කවරේද? කය නො වැඩූ

[1] විදර්ශනා භාවනාව
[2] සමථ භාවනාව

බැවිනි, භවත් ගෞතමයනි, ඒකාන්තයෙන් භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ චිත්ත භාවනාවෙහි ද කාය භාවනාවෙහි ද නො යෙදුණාහ යැයි මට මෙසේ සිතෙයි යැයි කීවේ ය.

මේ සච්චක ඇතැම් විට දිවා කාලයෙහි ආරාමයට පැමිණෙයි. ඕ සමයෙහි භික්ෂූන් වහන්සේලා පාත්‍ර චීවර සකස් කොට තබා රාත්‍රී ස්ථාන දිවා ස්ථානයන්ට පැමිණ සමාධියට පැමිණෙති. ඔහු එසේ සමාධියට පැමිණ වෙසෙන භික්ෂූන් දැක **"මොවුහු චිත්ත භාවනාවෙහි යෙදෙති. එහෙත් මොවුන්ට තැවීම් ආදී වූ අත්තකිලමථානුයෝගය කාය භාවනාවක් නැත"** යැයි මෙසේ කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සනය, නුඹ විසින් කාය භාවනාව යනු කුමක් ද යැයි අසා ඇත්තේ ද?"** යැයි අසා වදාළ සේක.

එකල්හි සච්චක භවත් ගෞතමයනි, නන්දවච්ඡය, සංකිච්චය, මක්ඛලිගොසාලය යන මොවුහු වස්ත්‍ර නොහඳින්නෝය, යහපත් පැවතුම් නැත්තෝ ය. අත ලෙවකන්නෝය නොහොත් අතින් මල පිස දමන්නෝ ය. එව, වහන්ස, කියා දුන් දෙය නොපිළිගනිත්. සිටුව, වහන්ස, කියා දුන් දෙය නොපිළිගනිත්. ඉදිරියෙන් ගෙනෙන ලද දෙය නොපිළිගනිත්. ඔවුන් උදෙසා කරන ලද දෙය නොපිළිගනිත්. ආරාධනා කොට දුන් දෙය නොපිළිගනිත්. කළ කටින් ගෙන දුන් දෙය නොපිළිගනිත්. සැලි කටින් ගෙන දුන් දෙය නොපිළිගනිත්. එළි පත අතර කොට දුන් දෙය නොපිළිගනිත්. දණ්ඩක් අතර කොට සිට දුන් දෙය නොපිළිගනිත්. මෝල් ගසක් අතර කොට දුන් දෙය නොපිළිගනිත්. අනුභව කරන්නා වූ දෙදෙනෙකුගෙන් එකෙකු දුන් දෙය නොපිළිගනිත්. ගැබිනිය විසින් දුන් දෙය නොපිළිගනිත්. කිරි පොවන්නිය විසින් දුන් දෙය නොපිළිගනිත්. පුරුෂයෙකු වෙත ගිය තැනැත්තිය විසින් දුන් දෙය නොපිළිගනිත්. සම්මාදම් කළ දෙයින් කිසිවක් නොපිළිගනිත්. යම් තැනක බල්ලෙක් පැමිණ සිටියේ නම් ඌට නොදී එහි දී දුන් දෙය නොපිළිගනිත්. යම් තැනක මැස්සෝ කැටි ව හැසිරෙත් ද, එහි දී දුන් දෙය නොපිළිගනිත්. දිය මස් නොකන්නාහ. ගොඩ මස් නොකන්නාහ. සුරා නොබොන්නාහ. මල් යුෂයෙන් කළ මත් පැන් නොබොන්නාහ. කාඩි දිය නොබොන්නාහ. ඔවුහු එක ගෙයකින් පමණක් පිඬු සිඟන්නෝ හෝ වෙත්. එකම බත් පිඩකින් යැපෙන්නෝ හෝ වෙත්.

ගෙවල් දෙකක පිඬු සිඟන්නෝ හෝ වෙත්. බත් පිඬු දෙකකින් යැපෙන්නෝ හෝ වෙත්. ගෙවල් සතක පිඬු සිඟන්නෝ හෝ වෙත්. බත් පිඬු සතකින් යැපෙන්නෝ හෝ වෙත්. එක් කුඩා බත් තැටියකින් යැපෙන්නෝ හෝ වෙත්. බත් තැටි දෙකකින් යැපෙන්නෝ හෝ වෙත්. බත් තැටි සතකින් යැපෙන්නෝ හෝ වෙත්. එක දවසකට වරක් හෝ ආහාර ගනිති. දෙ දිනකට වරක් හෝ ආහාර ගනිති. සත් දිනකට වරක් හෝ ආහාර ගනිති. මෙසේ අඩ මසකට වරක් ආහාර ගනිමින් ද වාර භෝජනයෙහි යෙදී වාසය කරන්නාහ" යැයි කීවේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, කිමෙක් ද ඔවුහු එපමණකින් ම යැපෙත් ද?" යැයි අසා වදාළ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, එය එසේ නොවෙයි. ඇතැම් දවස්වල ඔවුහු ඉතා ප්‍රණීත කෑම කන්නෝ ය, ඉතා ප්‍රණීත භෝජන වළඳන්නෝ ය, ඉතා ප්‍රණීත දෙය රස විඳින්නෝ ය. ඉතා ප්‍රණීත පාන පානය කරන්නාහුය. ඔවුහු මේ ආහාර කරණ කොට ගෙන ශරීරය බල ගන්වති. වඩති යැයි කීවේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, යම් හෙයකින් ඔවුහු පළමු කළ දුෂ්කර ක්‍රියා අතහැර පසුව ප්‍රණීත ආහාරයෙන් ශරීරය වඩත් ද, මෙසේ මේ ශරීරයාගේ වැඩීම හා නො වැඩීම වෙයි. අග්ගිවෙස්සනය, නුඹ විසින් චිත්ත භාවනාව කුමක් ද යැයි කියා අසන ලද ද?" යැයි අසා වදාළ සේක. එයට පිළිතුරක් සොයා කියන්නට සච්චකට නොහැකි විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සච්චකට "අග්ගිවෙස්සනය, නුඹ විසින් පළමු ව යම් මේ කාය භාවනාවක් කියන ලද ද? එය බුද්ධ ශාසනයෙහි ධර්මයට එකඟ වූ කාය භාවනාවක් නම් නොවෙයි. අග්ගිවෙස්සනය, නුඹ කාය භාවනාවත් නොදන්නෙහි ය. චිත්ත භාවනාව කොයින් දන්නේ ද? එහෙත් අග්ගිවෙස්සනය, යම් සේ නොවඩන ලද කාය භාවනා ඇත්තේ වේද? නොවඩන ලද චිත්ත භාවනා ඇත්තේ වේද, වඩන ලද කාය භාවනා ඇත්තේ වේද, වඩන ලද චිත්ත භාවනා ඇත්තේ වේද, එය අසව. මනාකොට සිහියට ගනුව කියන්නෙමි" යැයි වදාළහ.

"එසේය පින්වතුන් වහන්ස" යැයි කියා සච්චක නිගණ්ඨ පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

අග්ගිවෙස්සනය, කෙසේ නම් නොවඩන ලද කාය භාවනා ඇත්තේ වේද? නොවඩන ලද චිත්ත භාවනා ඇත්තේ වේද? අග්ගිවෙස්සනය, මේ ලෝකයෙහි නූගත් පෘථග්ජනයාට සැප වේදනාවක් උපදියි ද. හෙතෙම සැප වේදනාවෙන් ස්පර්ශ කරන ලද්දේ ම සැපයෙහි ඇලෙයි. ඔහුගේ ඒ සුඛ වේදනා නැති වෙයි ද, සැප වේදනාව නැති වීමෙන් දුක් වේදනාව උපදියි. හෙතෙම දුක් වේදනාවෙන් ස්පර්ශ කරමින් ශෝක වෙයි. ක්ලාන්ත වෙයි, වැලපෙයි, පපුවේ අත ගසමින් හඬයි, මුළාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, ඔහුගේ උපන්නා වූ, සැප වේදනාව කුසල් සිත විනාශ කරයි. කුමක් හෙයින් ද යත්:- කය නො වැඩූ හෙයිනි. උපන්නා වූ ද දුක් වේදනාව කුසල් සිත විනාශ කරයි. සිත නො වැඩූ බැවිනි. අග්ගිවෙස්සනය, යමෙකුට මේ දෙයාකාරයෙන් උපන්නා වූ සුඛ වේදනාව ද, කුසල් සිත විනාශ කරයි. කුමක් හෙයින් ද? කය නො වැඩූ හෙයිනි. උපන් දුක් වේදනාව ද කුසල් සිත විනාශ කරයි කුමක් හෙයින් ද? සිත නො වැඩූ හෙයිනි. අග්ගිවෙස්සනය, මෙසේ වනාහි නොවඩන ලද කය ඇත්තේත් වෙයි. නොවඩන ලද සිත් ඇත්තේත් වෙයි.

අග්ගිවෙස්සනය, කෙසේ නම් වඩන ලද කය ඇත්තේ වේද, වඩනා ලද සිත් ඇත්තේ වේද, අග්ගිවෙස්සනය, මේ ශාසනයෙහි නුවණ ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකයා හට සැප වේදනාව උපදියි ද, හෙතෙම සැප වේදනාවෙන් ස්පර්ශ කරන ලද්දේ ම, සැපයෙහි නො ඇලෙයි, ඔහුගේ ඒ සැප වේදනාව නැති වෙයි, සැප වේදනාව නැති වීමෙන් දුක් වේදනාව උපදියි, හෙතෙම දුක් වේදනාවෙන් ස්පර්ශ කරන ලද්දේ ම, ශෝක නො කෙරෙයි, ක්ලාන්ත නොවෙයි, නො වැලපෙයි, පපුවේ අත ගසමින් නො හඬයි. මුළාවට නො පැමිණෙයි. අග්ගිවෙස්සනය, ඔහුගේ උපන්නා වූ ද, මේ සැප වේදනාව කුසල් සිත විනාශ නොකරයි. කුමක් හෙයින් ද යත්:- කය වැඩූ හෙයිනි, උපන්නා වූ ද, දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි. සිත වැඩූ බැවිනි. අග්ගිවෙස්සනය, යමෙකුට මෙසේ දෙයාකාරයකින් උපන්නා වූ සැප වේදනාව කුසල් සිත විනාශ නොකරයි. කුමක් හෙයින් ද? යත්:- කය වැඩූ හෙයිනි. උපන්නා වූ ද

දුක් වේදනාව ද කුසල් සිත විනාශ නොකරයි. කුමක් හෙයින් ද? සිත වැඩූ හෙයිනි. අග්ගිවෙස්සනය, මෙසේ වනාහි වඩන ලද කය ඇත්තේත් වෙයි, වඩන ලද සිත ඇත්තේත් වෙයි.

එවිට සච්චක "භවත් ගෞතමයනි, මෙයින් මම භවත් ගෞතමයන් කෙරෙහි පැහැදුණේ වෙමි. භවත් ගෞතම තෙම ඒකාන්තයෙන් වඩන ලද කාය භාවනා ඇත්තේ වෙයි. වඩනා ලද චිත්ත භාවනා ඇත්තේ වෙයි." යැයි කීවේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, නුඹ විසින් ඒකාන්තයෙන් ම ගුණ වටහා ගෙන, ගුණ ප්‍රකට කරගෙන මේ වචන කියන ලදී. නැවත ද මම නුඹට විස්තර කරන්නෙමි. අග්ගිවෙස්සනය, යම් කලක පටන් මම ඉසකේ දැලි රැවුළ බහා, කසා වත් හැඳ, ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වූයෙම් ද, ඒකාන්තයෙන් ඒ කාලය මුළුල්ලෙහි මට උපන්නා වූ ද, සැප වේදනාව කුසල් සිත විනාශ කරන්නේය. උපන්නා වූ ද, දුක් වේදනාව කුසල් සිත් විනාශ කරන්නේය' යන මේ කාරණය සිදු නොවෙයි. යැයි වදාළ සේක.

එවිට සච්චක "**භවත් ගෞතමයන්ට යම් බඳු වූ සැප වේදනාවක් කුසල් සිත විනාශ කරයි ද, එබඳු සැප වේදනාවක් නූපන්නා විය හැකිය. යම් බඳු වූ දුක් වේදනාවක් කුසල් සිත විනාශ කරයි ද, එබඳු දුක් වේදනාවක් නූපන්නා විය හැකිය**" යැයි කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, කෙසේ නම් එසේ නොවන්නේ ද, සුඛ දුක් උපන්නේම ය. අග්ගිවෙස්සනය, බුද්ධත්වයට පැමිණීමට පෙර බෝසත් වූ මට මෙබඳු අදහසක් විය. ගිහිගෙයි විසීම අවහිර සහිතය, කෙලෙස් රජස් උපදින මාර්ගයකි. මේ පැවිද්ද වනාහි අවකාශය මෙන් නිදහස් ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් පිරිසිදුව සියලු ආකාරයෙන් සම්පූර්ණ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරීම පහසු නොවෙයි. මම හිස කෙස් දැලි රැවුළ කපා හැර, කසා වත් හැඳ, ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙක යැයි සිත් විය. අග්ගිවෙස්සනය, ඒ මම එයින් ටික කලකට පසු කළු වූ හිස කෙස් ඇති තරුණ වයසෙහිදී ම, ඇත්තේ ම,

මව්පිය ඤාතීන් අඬද්දී ම හිස කෙස් දැලි රැවුල් කපා හැර කසා වත් හැඳ ගිහි ගෙයින් නික්ම අනගාරික ව පැවිදි වීමි.

මෙසේ පැවිදි වූ මම කුසල් මොනවා ද යැයි සොයමින් නිරුත්තර වූ උතුම් නිර්වාණය සොයමින් ආලාරකාලාම නම් තවුසා වෙත ගියෙමි ගොස්, ආලාරකාලාම තාපසයාට "ඇවැත්නි, කාලාමයෙනි, නුඹගේ මේ ශාසනයෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්ට මම කැමැත්තෙමි" යැයි කීවෙමි.

අග්ගිවෙස්සනය, මම මෙසේ කී කල්හි ආලාරකාලාම මට "යම් තැනක නුවණ ඇත්තා වූ පුරුෂයෙක් නොබෝ කලකින් තමන්ගේ ආචාර්‍ය්‍යයන්ගේ ධර්‍මය තමා ම නුවණින් දැන අවබෝධ කොට ඊට පැමිණ වාසය කරන්නේ ද, මේ ධර්‍මය ද එබඳු ය, එහෙයින් ආයුෂ්මත් තෙම වාසය කෙරේවා" යැයි කීවේ ය.

අග්ගිවෙස්සනය, මම ටික කලකින් වහාම ඔවුන්ගේ ඒ ධර්‍මය අසාම ඉගෙන ගත්තෙමි. අග්ගිවෙස්සනය, ඔහු කියන දේ කියන්ට තොල ගැටීම් පමණකින් ම මට ප්‍රගුණ විය. ඉන් පසු මම ආලාරකාලාම වෙත ගොස්, "ඇවැත්නි, කාලාමයෙනි, කොපමණකින් මේ ධර්‍මය තමා ම දැන අවබෝධ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරේ ද" යැයි ඇසුවෙමි.

එවිට ආලාරකාලාම තවුසා ආකිඤ්චඤ්ඤායතනය කෙළවර කොට ඇති සමාපත්තිය මට දැක්වූවේ ය. ඉන් පසු මට මේ සිත විය. "ආලාරකාලාම හට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මට ද ශ්‍රද්ධාව ඇත. ආලාරකාලාම හට පමණක් වීර්‍ය්‍යය ඇත්තේ නොවෙයි, මට ද වීර්‍ය්‍යය ඇත. ආලාරකාලාම හට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මට ද සිහිය ඇත, ආලාරකාලාම හට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි, මට ද සමාධිය ඇත ආලාරකාලාම හට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි, මට ද ප්‍රඥාව ඇත. යම් හේතුවකින් ආලාරකාලාම තෙම යම් ධර්‍මයක් තමා ම නුවණින් දැන ඊට පැමිණ වාසය කරමි යැයි, කියයි නම් ඒ ධර්‍මය අත් කර ගැනීම පිණිස මම උත්සාහ කරන්නෙම් නම් හොඳය" කියායි.

ඉන් පසු මම ටික කලකින් වහාම ඒ ධර්‍මය තමා ම නුවණින් දැන අවබෝධ කොට ඊට පැමිණ වාසය කළෙමි. ඉන් පසු මම ආලාරකාලාම තවුසා වෙත ගොස්, "ඇවැත්නි කාලාමයෙනි, ඔබ දන්නා ධර්‍මය මෙපමණක්ම ද" යැයි ඇසීමි. "ඇවැත්නි, මා දත් ධර්‍මය මෙපමණකි" යැයි ඔහු කීවේ ය. "ඇවැත්නි, මම ද මෙපමණකින් මේ ධර්‍මය දැන අවබෝධ කොට වාසය කරමි" යැයි කීවෙමි. එවිට ආලාරකාලාම තවුසා "ඇවැත්නි, ඔබ වැනි වූ සමාන බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තෙකු දකින්නෙමු ද, ඒ අපට ලාභයකි. උතුම් ලාභයකි. මම යම් ධර්‍මයක් දැන අවබෝධ කොට ප්‍රකාශ කරම් ද, ඔබත් ඒ ධර්‍මය දැන අවබෝධ කොට වාසය කරන්නෙහි ය. ඇවැත්නි, එනු මැනව, දෙදෙනා ම එක්ව මේ පිරිස පාලනය කරමු" යැයි කීවේය. මෙසේ මාගේ ආචාර්‍ය්‍ය වූ ආලාරකාලාම තවුසා අතවැසි වූ මා ඔහු හා සම ස්ථානයෙහි තැබීය. උත්තම වූ පූජාවෙන් මා පිදුවේ ය.

අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ සිතුණේ ය, මේ තාපස ධර්‍මය සසර කලකිරීම පිණිස, නො ඇල්ම පිණිස කෙලෙස් නැති කිරීම පිණිස චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධය පිණිස නිර්‍වාණය පිණිස නොපවතියි. ආකිඤ්චඤ්ඤායතන බ්‍රහ්ම ලෝකයෙහි ඉපදීම පිණිස පමණක් පවතියි. අග්ගිවෙස්සනය, ඒ මම ඒ ධර්‍මය මා බලාපොරොත්තු වන අර්‍ථ සිද්ධිය පිණිස නොවේ යැයි සිතා, ඒ ධර්‍මයෙහි කලකිරී එයින් ඉවත්ව ගියෙමි.

මම කුසල් කුමක් දැයි සොයන්නේ, නිරුත්තර වූ උතුම් නිර්‍වාණය සොයන්නේ උද්දකරාම පුත්‍ර තවුසා හමුවට ගොස් උද්දකරාම පුත්‍ර හට "ඇවැත්නි රාමයෙනි, මේ ධර්‍ම විනයෙහි බ්‍රහ්මචර්‍ය්‍යාව රකින්ට මම කැමැත්තෙමි" කීවෙමි. එවිට උද්දකරාම පුත්‍ර තෙමේ "යම් නුවණ ඇත්තා වූ පුරුෂයෙක් නොබෝ කලකින් තමන්ගේ ආචාර්‍ය්‍යයන්ගේ ධර්‍මය තමා ම නුවණින් දැන අවබෝධ කොට ඊට පැමිණ වාසය කරන්නේ ද මේ ධර්‍මය ද එබඳු ය. එහෙයින් ආයුෂ්මත් තෙමේ වාසය කෙරේවා" යැයි මට කීවේ ය.

ඉන් පසු මම කෙටි කලකින් වහාම ඔවුන්ගේ ඒ ධර්‍මය ඉගෙන ගත්තෙමි. මම ඒ ධර්‍මය කීමට තොල සෙලවූ පමණින්, වචනයක් කී පමණින් ම අවබෝධ විය. ඉන් පසු මම උද්දකරාම පුත්‍ර තවුසා වෙත

ගොස්, "ඇවැත්නි, රාමයෙනි, කොපමණකින් මේ ධර්මය තමා ම දැන අවබෝධ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරේ ද" යැයි ඇසීමි.

එවිට උද්දකරාම පුත්‍ර නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, කෙළවර කොට ඇති සමාපත්තිය දැන්වූයේ ය. එකල්හි මට මේ සිත විය. "රාම හට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මට ද ශ්‍රද්ධාව ඇත. රාම හට පමණක් වීර්‍ය්‍යය ඇත්තේ නොවෙයි. මට ද වීර්‍ය්‍යය ඇත. රාම හට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මට ද සිහිය ඇත. රාම හට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි. මට ද සමාධිය ඇත. රාම හට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි. මට ද ප්‍රඥාව ඇත. යම් හේතුවකින් රාම පුත්‍ර තෙම යම් ධර්මයක් තමා ම නුවණින් දැන ඊට පැමිණ වාසය කරමි යැයි කියයි නම් ඒ ධර්මය තමන් ම ප්‍රත්‍යක්ෂ කර ගැනීම පිණිස වීර්‍ය්‍යය කරන්නෙම් නම් යහපත් ය" කියායි.

ඉන් පසු මම කෙටි කලකින් වහාම ඒ ධර්මය නුවණින් දැන අවබෝධ කොට ඊට පැමිණ වාසය කළෙමි. අග්ගිවෙස්සනය, ඉන් පසු මම උද්දකරාම පුත්‍ර තවුසා වෙත ගොස් මෙසේ කීවෙමි.

"ඇවැත්නි, රාමයෙනි, ඔබ දන්නා ධර්මය මෙපමණක් ම ද යැයි ඇසීමි. 'ඇවැත්නි, මා දන්නා ධර්මය මෙපමණක්ම ය" යැයි උද්දකරාම තවුසා කීවේ ය. එවිට මම "ඇවැත්නි, මම ද මේ ධර්මය දැන අවබෝධ කොට වාසය කරමි" යැයි කීවෙමි.

එකල්හි උද්දකරාම තවුසා "ඇවැත්නි, ආයුෂ්මත් වූ ඔබ වැනි වූ සමාන බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තෙකු දකින්නෙමු ද ඒ අපට ලාභයකි. මහත් ලාභයකි. මෙසේ මම යම් ධර්මයක් දැන අවබෝධ කොට ඊට පැමිණ ප්‍රකාශ කරමි ද, ඔබ ඒ ධර්මය නුවණින් දැන අවබෝධ කොට ඊට පැමිණ වාසය කරන්නෙහි ය. ඇවැත්නි, එව දෙදෙනා ම එක්ව මේ පිරිස පාලනය කරමු" යැයි කීවේය. අග්ගිවෙස්සනය, මෙසේ මාගේ ආචාර්‍ය්‍ය වූම උද්දකරාම පුත්‍ර තෙම අතවැසි වූ මා ඔහු හා සම ස්ථානයෙහි තැබීය. උතුම් වූ පූජාවෙන් මට පිදුවේ ය.

අග්ගිවෙස්සනය, ඉන් පසු මට මෙසේ සිතුණේ ය. මේ තාපස ධර්මය සසර කලකිරීම පිණිස සසර නො ඇල්ම පිණිස කෙලෙස් නැති

කිරීම පිණිස දත යුතු ධර්මයන් දැනීම පිණිස චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිස නිර්වාණය පිණිස නොපවතී. නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්ම ලෝකයෙහි ඉපදීම පිණිස පමණක් පවතියි. අග්ගිවෙස්සනය, මම ඒ ධර්මයෙහි මා බලාපොරොත්තු වන අර්ථය නැති බව දැන කලකිරී ඔහුගෙන් ඉවත්ව ගියෙමි.

අග්ගිවෙස්සනය, ඒ මම කුසල් කුමක් දැයි සොයමින්, නිරුත්තර වූ නිර්වාණය සොයමින් මගධ ජනපදයෙහි පිළිවෙලින් ගමන් කරන්නේ උරුවෙල් දනව්වෙහි සේනානී නම් නියම් ගමට පැමිණියෙමි. එහි සුදු වැලි තලා ඇති යහපත් තොටවල් ඇති ගලා යන ගඟ ඇති අවට ගොදුරු ගම් ඇති ප්‍රසාදය ඇති කරන්නා වූ සිත් සතුටු කරන්නා වූ වනලැහැබක් ඇති බිම් පෙදෙසක් දුටුවෙමි. එවිට මට මේ සිත පහළ විය. ඒකාන්තයෙන් භූමි ප්‍රදේශයෙ සිත් අලවන්නේ ය. වන ළැහැබ සතුට උපදවන්නේ ය, සුදු වැලිතලා ඇති හොඳ තොටුපලවල් ඇති ගංගාව ද සිත් අලවන්නී ය. හාත්පස ගොදුරු ගම ද වෙයි. වීර්යය කරන කුල පුත්‍රයෙකුට වීර්යය කිරීමට මෙය ඒකාන්තයෙන් සුදුසුයි. අග්ගිවෙස්සනය, ඒ මම මේ ස්ථානය වීර්යය කිරීමට සුදුසු යයි සිතා වීර්ය වැඩීම පිණිස එහි ම උන්නෙමි.

අග්ගිවෙස්සනය, මට එහි දී ඓශ්චර්ය වූ, පෙර නො ඇසූ විරූ උපමා තුනක් වැටහුණාහු ය, අග්ගිවෙස්සනය, ගිනි නිපදවීමට අවශ්‍ය පුරුෂයෙක් කිරි සහිත වූ අමු වූ දියේ දමන ලද තෙත් වූ දිඹුල් ලී කැබැල්ලක් හා ගිනි ගානා දණ්ඩක් ගෙන ගිනි නිපදවන්නෙමි යැයි ඒ ජලයෙහි බහාලන ලද ඒ කිරි සහිත අමු දිඹුල් ලී කැබැල්ල ගිනි ගානා දණ්ඩෙන් මදින්නේ ය. අග්ගිවෙස්සනය, ඔහුට ගිනි නිපදවිය හැකි වන්නේ ද? යැයි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, එය සිදු නොවන්නේය යැයි කීවේ ය. ඊට හේතු කවරේද යැයි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. එවිට සච්චක භවත් ගෞතමයනි, දිඹුල් ලී කඩ වනාහි අමු ය, කිරි සහිතය, එපමණක් නොව ජලයෙහි ද බහා ලන ලද්දේ ය. එහෙයිනි. එයින් ඒ පුද්ගලයා ක්ලාන්තයට වෙහෙසට දුකට පත්වීම පමණක් වෙයි යැයි කීවේ ය.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ අග්ගිවෙස්සනය, එපරිද්දෙන් ම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් වස්තු කාමයන් ගෙන් වෙන් ව වාසය නොකරත් ද, කාම වස්තු කෙරෙහි ඔවුන්ගේ යම්කිසි ඇල්මක් වේද, කාම ආසාවක් වේද, කාම මුජීාවක් වේද, කාම පිපාසයක් වේද, කාම දැවිල්ලක් වේද, ඒ ක්ලේශ කාමය තමා තුල මනාව නැති නොවූයේ වේද, මනාව මැඩපවත්වන ලද්දේ නොවේ ද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හට ගත්තා වූ, දුක් වූ, තියුණු වූ, කටුක වූ වේදනාවන් විඳිත්. ඔවුහු ආර්‍ය්‍ය මාර්‍ග ඥාන දර්‍ශනයට ද, නිරුත්තර වූ අවබෝධයට ද නුසුදුස්සෝම ය. අග්ගිවෙස්සනය, ඓශ්චර්‍ය්‍ය වූ පෙර නො ඇසූ විරූ මේ පළමු වන උපමාව මට වැටහිණි.

අග්ගිවෙස්සනය, ඓශ්චර්‍ය්‍ය වූ පෙර නො ඇසූ විරූ අන්‍ය වූ දෙවෙනි උපමාවක් ද මට වැටහිණි. යම් සේ කිරි සහිත වූ අමු දිඹුල් ලීයක් දියෙන් ගෙන ගොඩ බිමෙහි බහා තබන ලද්දේ වෙයි. ඉක්බිති පුරුෂයෙක් තෙම ගිනිගානා දණ්ඩක් ගෙන ගිනි නිපදවන්නෙමි යැයි කිරි සහිත වූ, දියෙන් ගෙන ගොඩ තබන ලද ඒ අමු දිඹුල් ලීය ගිනි ගානා දණ්ඩෙන් මදින්නේ ය. එයින් ඔහු ගිනි උපදවන්නේ ද?" යැයි අසා වදාළ සේක. එවිට සච්චක "භවත් ගෞතමයනි, එය සිදු නොවන්නේය" යැයි කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ ඊට හේතු කවරේද යැයි අසා වදාළ සේක. භවත් ගෞතමයනි, ඒ ලී කඩ ජලයෙන් බැහැර කර ගොඩ බිමෙහි දමා තිබුනත් කිරි සහිතය අමු ය. එහෙයිනි. එයින් ඒ පුරුෂයා ක්ලාන්තයට වෙහෙසට පත්වීම පමණක් සිදු වන්නේ ය" යැයි කීවේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, එපරිද්දෙන් ම යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කාමයන් ගෙන් වෙන් ව වාසය කරත්ද, (එහෙත්) කාම වස්තු කෙරෙහි ඔවුන්ගේ ඇල්මක් වේද, කාම ආශාවක් වේද, කාම මුජීාවක් වේද, කාම පිපාසයක් වේද, කාම දැවිල්ලක් වේද, එය අභ්‍යන්තරයෙහි මනාව නැති නොවූයේ වේද, මනාව මැඩ පවත්වන ලද්දේ නොවේ ද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හට ගත්තා වූ, දුක් වූ තියුණු වූ, කටුක වූ වේදනාවන් විඳිත්. ඔවුහු ආර්‍ය්‍ය ඥාන දර්‍ශනයට ද, නිරුත්තර අවබෝධයට ද නුසුදුස්සෝම ය.

ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හට ගත්තා වූ, දුක් වූ, තියුණු වූ, කටුක වූ වේදනාවන් ඉදින් නොවිඳින්නාහු ද, ඥාන දර්‍ශනය ලැබීමට ද, නිරුත්තර වූ අවබෝධයට ද නුසුදුස්සෝම ය. අග්ගිවෙස්සනය, මේ වනාහි මට වැටහුණු පුදුම වූ, පෙර නො ඇසුවා වූ දෙවෙනි උපමාවයි යැයි වදාළ සේක.

අග්ගිවෙස්සනය, පුදුම වූ පෙර නො ඇසුවා වූ තුන් වෙනි වූ අන්‍ය උපමාවක් ද මට වැටහුණේ ය. අග්ගිවෙස්සනය, වියළුණා වූ, කිරි සිඳුණා වූ, දියෙන් ඈත් කොට ගොඩ බිමෙහි තබන ලද වියලි දර ලීයක් වේද, එකල්හි පුරුෂයෙක් ගිනිගානා දණ්ඩ ගෙන ගිනි උපදවන්නෙමි යැයි වියළුණා වූ කිරි සිඳුණා වූ, දියෙන් ඈත් කොට ගොඩ තබන ලද ඒ ලීය ගිනි ගානා දණ්ඩක් ගෙන මැදීමෙන් ගිනි උපදවන්නේ ද? යැයි අසා වදාළ සේක.

එවිට සච්චක "භවත් ගෞතමයනි, එසේය. යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඊට හේතු කවරේද? යැයි අසා වදාළ සේක. එකල්හි සච්චක භවත් ගෞතමයනි, ඒ ලීය වියළුණේ වෙයි, කිරි සිඳුණේ වෙයි, දියෙන් ගෙන ගොඩ තබන ලද්දේත් වෙයි. එම නිසා ය" යැයි කීවේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, එපරිද්දෙන් ම යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කාමයන් ගෙන් වෙන් ව වාසය කරත්ද, ඔවුන්ගේ කාම වස්තූන් කෙරෙහි යම් ඇල්මක් වේද, කාම ආසාවක් වේද, කාම මුර්ඡාවක් වේද, කාම දැවිල්ලක් වේද ඒ කාම ආශාව අධ්‍යාත්මයෙහි හොඳින් ප්‍රහීණ වූයේ වේද, හොඳින් මැඩ පැවතියේ ද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හට ගත්තා වූ, තියුණු වූ, කටුක වූ, වේදනාවන් නොවිඳිත්. ඔවුහු මාර්ග ඥාන දර්‍ශනය පිණිස, නිරුත්තර වූ අවබෝධය පිණිස සුදුස්සෝම ය.

අග්ගිවෙස්සනය, ඓශ්චර්‍ය්‍ය වූ පෙර නො ඇසූ විරූ මේ උපමා තුන මට වැටහුනාහුය.

අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත පහළ විය. යම් හෙයකින් මට යටි දත් පෙළෙන් උඩු දත් පෙළ තද කරගෙන දිව උඩු තල්ලෙහි තද කරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නෙම් නම්,

පෙළන්නෙම් නම් යෙහෙක' යැයි සිත් විය. අග්ගිවෙස්සනය, ඉන් පසු මම යටි දත් පෙළෙන් උඩු දත් පෙළ තද කරගෙන දිව උඩු තල්ලෙහි තද කරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරමි, පෙළීමෙහි යෙදුණෙමි. එසේ කෙලෙස් තවන්නා වූ ඒ මාගේ කිහිලිවලින් ඩහදිය වැගිරෙන්නට විය.

අග්ගිවෙස්සනය, යම් සේ බලවත් පුරුෂයෙක් තෙම වඩා දුර්වල පුරුෂයෙකු හිසින් හෝ අල්ලාගෙන, බෙල්ලෙන් හෝ අල්ලාගෙන තද කරන්නේ ද, පෙළන්නේ ද, තවන්නේ ද, අග්ගිවෙස්සනය, එපරිද්දෙන් ම යටි දත් පෙළෙන් උඩු දත් පෙළ තද කරගෙන, දිව උඩු තල්ලෙහි තද කරගෙන කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නා වූ, පෙළන්නා වූ, තවන්නා වූ ඒ මාගේ කිහිලිවලින් ඩහදිය වැගිරෙන්නට විය. එහෙත් පටන් ගත් වීර්‍ය්‍යය නො හැකිළුණේ ය. සිහිය එළඹ සිටියේ ය. කුසල් සිතෙහි පිරිහීමක් නොවූයේ ය.

අග්ගිවෙස්සනය, ආශ්වාස ප්‍රශ්වාස කිරීම් රහිතව ධ්‍යානය වඩන්නෙම් නම් යෙහෙක යැයි සිතක් ඇති විය. මම කටින් ද, නාසයෙන් ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූවෙමි. එවිට කන් සිදුරුවලින් පිටවෙන වාතයෙහි අධික ශබ්දය ඇතිවෙයි. මයින හමක් පිඹින කල්හි යම් සේ අධික ශබ්දයක් ඇති වේ ද, එපරිද්දෙන් ම අග්ගිවෙස්සනය, මාගේ මුඛයෙන් ද නාසයෙන් ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි කන් සිදුරුවලින් පිටවෙන වාතයෙහි අධික ශබ්දය ඇති විය. ශරීරය දහ සහිත විය. මට උපන්නා වූ මෙබඳු වූ ද, දුක් වේදනාව හේතුවෙන් ද කුසල් සිතෙහි පිරිහීමක් නොවූයේ ය.

අග්ගිවෙස්සනය, ඉන් පසු මට ආශ්වාස රහිත ධ්‍යානයම වඩන්නෙම් නම් යෙහෙක යැයි සිත් විය. මම මුඛයෙන් ද, නාසයෙන් ද, කණින් ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූවෙමි. එවිට බලවත් පුරුෂයෙක් තියුණු කටුවකින් හිස් මුදුන විදින්නාක් මෙන් අධික ලෙස වාතය තද වී හිස් මුදුන පලන්නාක් මෙන් වෙයි. එසේ ම බලවත් පුරුෂයෙක් දැඩි වර පට බැම්මකින් හිස වෙළන්නාක් මෙන් හිසෙහි අධික වේදනාව ඇති වෙයි. එහෙත් කුසල් සිතෙහි පිරිහීමක් නොවූයේ ය.

අග්ගිවෙස්සනය, ඒ මට ආශ්වාස රහිත ධ්‍යානයම තව දුරටත් වඩන්නෙම් නම් යෙහෙක මෙසේ කල්පනා විය. මම මුඛයෙන් ද, නාසයෙන් ද, කණින් ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූවෙමි. එවිට දක්‍ෂ වූ ගවයන් මරන්නෙක් හෝ ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ ගෙරින් කපන තියුණු ආයුධයකින් බඩ කපන්නාක් මෙන් අධික වූ වායු පීඩනයෙන් කුස සිඳින්නාක් මෙන් වෙයි. බලවත් පුරුෂයෝ දෙදෙනෙක් දුර්වල පුරුෂයෙකු දෑතින් අල්ලා ගෙන අඟුරු වළකට අල්ලා තවන්නාක් මෙන් බලවත් වේදනාවන් ඇති විය. එහෙත් කුසල් සිතෙහි පිරිහීමක් නොවූයේ ය.

එකල්හි දේවතාවෝ මා දැක 'ශ්‍රමණ ගෞතම තෙම කළුරිය කළේ ය' මෙසේ කීහ. ඇතැම් දේවතා කෙනෙක් 'ශ්‍රමණ ගෞතම තෙම කළුරිය නොකළේ ය. එහෙත් කළුරිය කරන්නේය' යැයි කීහ. ඇතැම් දෙවතා කෙනෙක් 'ශ්‍රමණ ගෞතම තෙම කළුරිය කළේත් නොවේ. කළුරිය කරන්නේත් නොවෙයි. ශ්‍රමණ ගෞතම තෙම රහත්ය. මෙය රහතුන්ගේ වාසය කිරීමක් යැයි කීහ.

අග්ගිවෙස්සනය, ඒ මට මුළුමනින් ආහාර නො වැළඳීම පිණිස පිළිපදින්නෙම් නම් ඉතා යෙහෙක මෙසේ කල්පනා විය. එවිට දේවතාවෝ මා වෙත පැමිණ 'නිදුකාණෙනි, ඔබ මුළුමනින් ආහාර නොගෙන සිටින්නට නො සිතුව මැනවි. යම් හෙයකින් ඔබ මුළුමනින් ආහාර නොගෙන සිටිය හොත් අපි ඔබගේ රෝම කූපයන්ගෙන් දිව්‍ය ඕජස් ශරීරගත කරන්නෙමු. ඔබ එයින් යැපෙන්නෙහි ය යැයි කීහ. අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ කල්පනා විය. මම වනාහි මුළුමනින් නිරාහාර ව සිටීමට සිතින් එකඟ උනිමි. එහෙත් මේ දේවතාවෝ මාගේ රෝම කූපයන්ගෙන් දිව්‍ය ඕජස් ශරීර ගත කරන්නේ නම් එයින් මම යැපෙන්නෙමි. එවිට එය මාගේ මුසාවක් වන්නේ ය. අග්ගිවෙස්සනය, ඒ මම ඒ දෙවියන් වැළැක්වූවෙමි. වුවමනා නැතැයි කීවෙමි.

අග්ගිවෙස්සනය, ඒ මට මම පතක් පමණ වූ මුං තැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ ඉතා ස්වල්ප වූ ආහාරයක් වළඳන්නෙම් නම් යෙහෙක යැයි මේ සිත පහළ විය.

අග්ගිවෙස්සනය, ඒ මම පතක් පමණ වූ, මුං තැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ ඉතා ස්වල්ප වශයෙන් ආහාරය වැළඳුවෙමි. මෙසේ ඉතා ස්වල්ප වශයෙන් ආහාර ගන්නා වූ ඒ මාගේ ශරීරය ඉතා කෙට්ටු විය. අසූ වසක් ගිය වැලක පුරුක් හෝ කලු වැල් නම් වැලක පුරුක් හෝ යම් සේද මාගේ අඟපසඟ එබඳු විය. ඔටු පියවර මැද ගැඹුරු වේද, එපරිද්දෙන් ම මාගේ නිසීදන මාංශය (තට්ටම) මැදින් ගැඹුරු විය. රැහැනක ඇවුණු දැව වැටිය අතරතුර උස් මිටි වේද, එපරිද්දෙන් මාගේ කොඳු ඇටය උස් මිටි වෙයි. යම් සේ දිරූ ශාලාවක පරාල උඩු යටි වශයෙන් නැමුණාහු වෙත් ද, එපරිද්දෙන් මාගේ ඉල ඇට උඩු යටි වශයෙන් නැමුණාහු වෙත්. ගැඹුරු ළිඳක දිය යට පෙනෙන තුරු ගැඹුරට ගියාහු යට බැස්සාහු දක්නා ලැබෙත් ද, එපරිද්දෙන් ම මාගේ ඇස්වල නෙත් තරු වල ගැඹුරු වී යට බැස්සාහුය. තිත්ත ලබු ගෙඩියක් අමුවෙන් කැපූ විට අව් සුළඟින් හැකිළීමට මැලවීමට පත් වන්නාක් මෙන් මගේ හිසේ සම හැකිළී මැලවී ගියේ ය.

අග්ගිවෙස්සනය, මම බඩේ සම අතගාන්නෙමි යැයි පිට කටුවම අතගාන්නෙමි. පිට කටුව අල්ලමි යැයි බඩේ සම අල්ලමි. අග්ගිවෙස්සනය, මෙසේ ස්වල්ප ආහාරය නිසා එපමණට මාගේ බඩේ සම කොඳු ඇටයෙහි ඇලුණේ ය. ඒ මම වර්චස් හෝ මුත්‍ර හෝ කරන්නෙමි යැයි හුන්නේ එහි ම යටිකුරු ව වැටෙමි. මම මේ ශරීරය අස්වසමි යැයි අතින් ශරීරාවයව පිරිමදිමි. එවිට මුල් කුණු වූ ලොම් ශරීරයෙන් ගැලවී වැටෙත්.

අග්ගිවෙස්සනය, සමහර මිනිස්සු මා දැක ශ්‍රමණ ගෞතම තෙම කළු ය යැයි කීවාහුය. ඇතැම් මිනිස්සු 'ශ්‍රමණ ගෞතම තෙම කළු නොවෙයි පලාවන් පාටය යැයි කීවාහුය. ඇතැම්හු 'ශ්‍රමණ ගෞතම තෙම කලුත් නොවෙයි, පලාවන් පාටත් නොවෙයි, ශ්‍රමණ ගෞතම තෙම රන් වන් සිවි ඇත්තේය යැයි කීවාහුය. අග්ගිවෙස්සනය, මෙසේ කීමට තරමට ම මාගේ පිරිසිදු වූ හාත්පසින් බබළන්නා වූ ශරීර වර්ණය ඒ නිරාහාර භාවය නිසාම නැසුණේ ය.

අග්ගිවෙස්සනය, ඉන් මට "අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් යම් දුක් වූ, තියුණු වූ, කටුක වූ වේදනා වින්දාහු නම් ඒ මේ තරම් ම වෙයි. මීට වැඩි නොවෙයි. අනාගත

කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් යම් දුක් වූ, තියුණු වූ, කටුක වූ වේදනා විඳින්නාහු නම් ඒ මේ තරම් ම වෙයි. මීට වැඩි නොවෙයි. මේ වර්තමාන කාලයෙහි යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් යම් දුක් වූ, තියුණු වූ වෙදනාවන් විඳිත් නම් ඒ මේ තරම් ම වෙයි මීට වැඩි නොවෙයි. මම වනාහි මේ කටුක වූ දුෂ්කර ක්‍රියාවෙන් මනුෂ්‍ය ධර්මයට ඉක්මවා සිටි ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථ වූ ඥාන දර්ශන විශේෂයක් නොලැබීමි. මාර්ගාවබෝධය පිණිස අන්‍ය මාර්ගයක් ඇත්තේ ද" යැයි කල්පනා විය.

අග්ගිවෙස්සනය, ඒ මට "පිය වූ සුද්ධෝදන ශාක්‍ය මහ රජතුමා ගේ වප් මඟුල් දිනයෙහි සිහිල් වූ දඹ රුක් සෙවනෙහි හුන්නේ ආනාපාන සතිය වඩා කාමයන් ගෙන් වෙන්ව ම අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කළ බව දනිමි. ඒ ආනාපාන සති භාවනාව මාර්ගය මාර්ග ඥාන අවබෝධය පිණිස වන්නේය යැයි අදහස් විය. අග්ගිවෙස්සනය, ඒ මට අවබෝධය පිණිස මේ මාර්ගය යැයි සිහිය අනුව පැවති විඥ්ඥාණය පහළ විය.

අග්ගිවෙස්සනය, ඒ මට "මෙ තරම් දුර්වල වූ ශරීරයකින් යුක්තව ඒ ප්‍රථම ධ්‍යාන සැපය ලබන්නට බැරිය. යම් හෙයකින් මම බත් හා කොමු පිඬු ආදි ඖදරික ආහාරයක් ගන්නෙම් නම් හොඳය" කියා සිත් විය.

අග්ගිවෙස්සනය, ඒ මම බත්, කොමු පිඬු යැයි කියන ඖලාරික ආහාරයක් ගත්තෙමි. අග්ගිවෙස්සනය, ඒ කාලයෙහි "ශ්‍රමණ ගෞතම තෙම යම් ලොවුතුරා දහමක් ලැබුවේ නම් එය අපට කියන්නේය' යන අදහසින් භික්ෂූන් පස් දෙනෙක් මට උපස්ථාන කරමින් සිටියහ. අග්ගිවෙස්සනය, යම් කලක පටන් මම බත් හා කොමු පිඬු ආහාර ගන්නට වූයෙම් ද, එකල්හි ඒ භික්ෂූහු 'ශ්‍රමණ ගෞතම තෙම ප්‍රත්‍යය බහුල කොට ඇත්තේ ය. රසයෙහි ගිජුව ප්‍රණීත පිණ්ඩපාතාදිය

වැළඳීමට හැරුණේ ය. වීයර්ය කිරීමෙන් පිරිහුණේ ය" යැයි කියා කලකිරී බැහැර ගියාහුය[1].

අග්ගිවෙස්සනය, මම ඕලාරික ආහාර ගෙන ශරීර ශක්තිය ලැබ කාම ක්ලේශ කාමයන්ගෙන් වෙන් ව, සෙසු අකුශල ධර්මයන්ගෙන් ද වෙන් ව, විතර්ක විචාර සහිතව, නීවරණයන් ගෙන් වෙන් වීම හේතුවෙන් ප්‍රීතියෙන් හා සුවයෙන් යුක්ත වූ ප්‍රථම ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කළෙමි.

ඉන් පසු විතර්ක විචාර සන් සිඳීමෙන් කැලඹිලි නැති සිතෙහි මනා ප්‍රසාදය ඇත්තා වූ නිශ්චල වූ බලවත් සමාධියෙන් යුත් ප්‍රීතිය, සැපය, ඒකාග්‍රතාව යන අංග තුනෙන් යුත් දුතිය ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කළෙමි.

ඉන් පසු ප්‍රීතිය අත්හැර අග්‍ර වූ ධ්‍යාන සුවයෙහි ද පක්ෂපාත බවක් නූපදවන යම් මැදහත් බවක් වේ ද, ඒ ධ්‍යාන උපේක්ෂාවෙන් යුක්තව මනා සිහිය නුවණ ඇතිව කයින් ද ඉතා මියුරු සැපයට පැමිණ වෙසෙයි ද, බුදු පසේ බුදු මහරහත් ආදී ආර්ය මහෝත්තමයන් වහන්සේලා යම් ධ්‍යාන සුවයක් ප්‍රීතිය නූපදනා බැවින් මනා සතියෙන් යුක්ත වේ යැයි ද, ඉතා මියුරු සැපයක් ගෙන දෙන නමුත් සැපයෙහි නො ඇලී උපේක්ෂාවෙන් යුක්ත වේ යැයි ද, ඒ හේතු කොට යම් ධ්‍යාන ලාභියෙකු කෙරෙහි උපේක්ෂාවත් සිහියත් සැප විහරණයත් ඇත්තේය යැයි පසසන ලද්දේ වේ ද, එසේ වූ තෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කළෙමි.

අනතුරුව ප්‍රථම ධ්‍යාන උපචාරය ඉක්මවා අර්පනාවට පැමිණීමෙහි දී කායික දුක්ඛය ප්‍රහාණය කිරීමෙන් ද, චතුර්ථ ධ්‍යාන උපචාරය ඉක්මවා අර්පනාවට පැමිණීමෙහි දී කායික සැපය ප්‍රහාණය කිරීමෙන් ද, මෙලෙස කලින් ම සැප හා දුක් වේදනා දුරු කිරීමෙන් හා දුතිය ධ්‍යාන උපචාරය ඉක්මවා අර්පනාවට පැමිණීමෙහි දී දෝමනස්සය ප්‍රහාණය වීමෙන් ද, තතිය ධ්‍යාන උපචාරය ඉක්මවා අර්පනාවට

[1] අභිනිෂ්ක්‍රමණය කොට කොපමණ පිරිස් සමග පැවිදි වුව ද බුද්ධත්වය ලබන විට ඒ සියලු දෙනාගෙන් ම වෙන් වී එකලා වීම ධර්මතාවයකි.

පැමිණීමෙහි දී සෝමනස්සය ප්‍රහීණ වීමෙන් ද මෙලෙස පළමුකොටම සැප දුක් සෝමනස්ස දෝමනස්ස වේදනා නැතිව යාමෙන් දුක් ද නොවූ සැප ද නොවූ මධ්‍යස්ථ බව කෘත්‍ය රසය කොට ඇති බැවින් උපේක්‍ෂාවෙන් ම හටගත් හෙයින් කිසිවකින් බාධාවක් නැති පිරිසිදු ලෙස පිහිටි සිහිය ඇති බැවින් උපේක්‍ෂා සති පාරිශුද්ධිය යැයි කියනු ලබන චතුර්ථ ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කළෙමි.

ඒ මම මෙසේ චිත්ත විශුද්ධිය සම්පූර්ණ වීමෙන් මනාව එකඟ වූ සිත් ඇති වූ කල්හි, සර්වප්‍රකාරයෙන් පාප ධර්මයන්ගෙන් මිදුණු කල්හි, කෙලෙසුන්ගෙන් දුරු වූ කල්හි, උපක්ලේශයන් පහ වූ කල්හි, සිත මොලොක් වූ කල්හි, මනාව පිරිසිදු වූ දීප්තිමත් වූ සිත් ඇති කල්හි පෙර ජාති දැනීමේ ඥාණය පිණිස සිත නැමුවෙමි.

ඒ මම අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැදී එයින් නැගී සිට පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත යෙදුවෙමි. ඒ මම එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දසයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පණසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති ලක්‍ෂයක් ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන් ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන් ද, නොයෙක් විනාශ වන, හැදෙන කල්පයන් ද සිහි කළෙමි.

මම ඒ ඒ තැන්හි දී මෙසේ වූ නමක් ඇතිව මෙසේ වූ ගෝත්‍ර ඇතිව විසුවෙමි. මෙනම් ශරීර වර්ණය ඇත්තෙක් වීමි. මෙබඳු වූ ආහාර පාන ඇත්තෙක් වීමි. මෙබඳු වූ සැප දුක් වින්දෙමි. මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව අසවල් තැන උපන්නෙමි. එහි දී ද මෙබඳු නමක් ඇතිව, මෙබඳු ගෝත්‍ර ඇතිව, මෙබඳු පැහැ ඇතිව, මෙබඳු ආහාර පාන ඇතිව, මෙබඳු සුව දුක් ඇතිව, මෙබඳු ආයුෂ කෙළවර කොට විසුවෙමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි යැයි මෙසේ අනේක විධ වූ පෙර විසූ ස්කන්ධ පරම්පරාව සිහි කරයි. මෙනම් ක්‍ෂත්‍රිය වංශයෙහි හෝ බ්‍රාහ්මණ වංශයෙහි මෙනම් වර්ණාදියෙන් යුක්ත වීමි යනාදී ආකාර වශයෙන් ද, මෙනම් නම් ඇතිව මෙනම් ගෝත්‍ර ඇතිව විසුවෙමි යනාදී උද්දේශ වශයෙන් ද නා නා විධ වූ පෙර විසූ ස්කන්ධ පරම්පරාව සිහි කරමි.

අග්ගිවෙස්සනය, මා විසින් රාත්‍රියේ පළමු යාමයෙහි දී මේ පළමු වන විද්‍යාව වූ පෙර විසූ තැන් දන්නා නුවණ ලැබුවෙමි. එය වසන අවිද්‍යාව නැසුවෙමි. විද්‍යාව ලැබුවෙමි. අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම් සේ සිදු විය යුතු නම් එසේ විය.

ඉන් පසු මම මෙසේ මනාව එකඟ වූ සිත් ඇති වූ කල්හි, සර්වප්‍රකාරයෙන් පාප ධර්මයන්ගෙන් මිදුණු කල්හි, කෙලෙසුන්ගෙන් දුරු වූ කල්හි, උපක්ලේශයන් පහ වූ කල්හි, සිත මොලොක් වූ කල්හි, මනාව පිරිසිදු වූ දීප්තිමත් වූ සිත් ඇති කල්හි ච්‍යුත වන්නා වූ ද, උපදින්නා වූ ද සත්ත්වයන් දැන ගන්නා නුවණ ලැබීම පිණිස සිත යොමු කර පිරිසුදු වූ මිනිසුන්ගේ ඇසට පෙනෙන සීමාව ඉක්මවා සිටියා වූ මිනිස් ඇසට නො පෙනෙන ඉතා සියුම් වූ රූපාදිය දැකීමට සමත් දිව්‍යමය ප්‍රසාද චක්ෂුසයෙන් (දෙවියන්ගේ ඇසෙන්) බලන්නාක් මෙන් සියුම් රූපාදිය දැකීමට සමත් දිව්‍ය චක්ෂු අභිඥා නුවණින් ච්‍යුත වන්නා වූ ද, උපදින්නා වූ ද, හීන වූ ද, ප්‍රණීත වූ ද, යහපත් වර්ණ ඇත්තා වූ ද, අයහපත් වර්ණ ඇත්තා වූ ද සත්වයන් දකිමි. කර්මානුරූපව උපදින්නා වූ සත්වයන් දැක ගත්තෙමි. කෙසේ ද?

අසවල් සත්වයෝ එකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. මනෝ දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. ආර්‍යයන්ට ගර්හා කළාහුය. මිථ්‍යාදෘෂ්ටි ගත්තාහුය. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. ඔවුහු කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහ වූ දුක්ම උරුමව වැටෙන්නා වූ නපුරු ගති ඇත්තා වූ නිරයෙහි උපන්නාහුය.

අසවල් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූවාහු ය. වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු ය. මනෝ සුචරිතයෙන් යුක්ත වූවාහු ය. ආර්‍යයන්ට නින්ද නොකළාහු ය. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු ය. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවාහු ය. ඔවුහු කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇත්තා වූ ස්වර්ග ලෝකයෙහි උපන්නාහුය යැයි, මෙසේ මිනිසත් බව ඉක්ම වූ පිරිසිදු වූ දිව්‍ය චක්ෂුසින් ච්‍යුත වන්නා වූ ද, උපදින්නා වූ ද හීන වූ ද, ප්‍රණීත වූ ද, යහපත් වර්ණ ඇත්තා වූ ද, අයහපත් වර්ණ

ඇත්තා වූ ද, කර්මානුරූපව ඒ ඒ භවයෙහි ඉපදීමට එළඹ සිටින්නා වූ සත්වයන් දකිමි.

අග්ගිවෙස්සනය, මා විසින් රාත්‍රියෙහි මධ්‍යම යාමයෙහි මේ දෙවන විද්‍යාව වූ සත්වයන්ගේ ච්‍යුත වීම්, ඉපදීම් දක්නා නුවණ ලබන ලදී. එය වසන අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නේය. ආලෝකය පහළ විය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම් සේ සිදු විය යුතු නම් එසේ විය.

ඉන් පසු මම මනාව එකඟ වූ සිත් ඇති වූ කල්හි, සර්වප්‍රකාරයෙන් පාප ධර්මයන්ගෙන් මිදුණු කල්හි, කෙලෙසුන්ගෙන් දුරු වූ කල්හි, උපක්ලේශයන් පහ වූ කල්හි, සිත මොලොක් වූ කල්හි, මනාව පිරිසිදු වූ දීප්තිමත් වූ සිත් ඇති කල්හි ආශ්‍රවයන් ක්ෂය කරන ඥානය ලැබීම පිණිස සිත නැමුවෙමි. ඒ මම ඉපදීම ද දුකකි. ජරාව ද දුකකි. මරණය ද දුකකි. ශෝකය ද, හැඬීම ද, වැලපීම ද, කායික දුක ද, මානසික දෝමනස්සය ද, ශෝකාදිය හේතුවෙන් ඇතිවෙන දැඩි වෙහෙස ද යන මේ සියල්ල ම දුක් ය. අප්‍රියයන් සමග එක්වීම ද දුකකි. ප්‍රියයන්ගෙන් වෙන් වීම ද දුකකි. යමක් කැමති නම් එය නොලැබීම ද දුකකි. සැකෙවින් රූප උපාදනස්කන්ධය, වේදනා උපාදනස්කන්ධය සංඥා උපාදනස්කන්ධය, සංස්කාර උපාදනස්කන්ධය, විඤ්ඤාණ උපාදනස්කන්ධය යන උපාදනස්කන්ධ පස ම දුක්ම ය. මේ සියල්ල **"පීඩන, සංඛත, සන්තාප, විපරිණාම"** ලක්‍ෂණයන්ගෙන් යුක්ත බැවින් ඒකාන්තයෙන් දුක් ම යැයි තතු ලෙස දැන ගත්තෙමි. මෙයින් මතු අන්‍ය දුකක් නැතැයි දැන ගත්තෙමි.

නැවත ඉපදීම ඇති කරන්නා වූ **නන්දිය** යැයි කියන ලද රාගයෙන් යුත් ඒ ඒ තැන ඇලෙන්නා වූ යම් මේ තෘෂ්ණාවක් වේ ද, එය කාම තණ්හාව ද, භව තණ්හාව ද, විභව තණ්හාව ද යන තුනට අයත් ය. මේ දුක් ඉපදීමේ හේතුව වූ තෘෂ්ණාව **"ආයූහන, නිදාන, සංයොග, පළිබෝධ"** ලක්‍ෂණයන්ගෙන් යුක්ත බව ද තතු ලෙස දැන ගත්තෙමි. මෙයින් මතු දුක් හට ගැනීමට හේතුවන වෙනත් හේතු නැත යැයි දැන ගත්තෙමි.

ඒ දුක් උපදවන තෘෂ්ණාවගේ ම යම් සම්පූර්ණයෙන් වෙන් වීමක්, නිරුද්ධ කිරීමක්, අත්හැරීමක්, දුරු කිරීමක්, මිදීමක්, ආලය හැරීමක් ඇත්තේ ද, ඒ මේ තෘෂ්ණාව ගේ නිරවශේෂ නිරෝධයෙන් ලබන නිර්වාණය ප්‍රත්‍යක්‍ෂ කිරීම දුක් නැති කිරීම යැයි දැන ගත්තෙමි. ඒ නිවන **නිස්සරණ, විවේක, අසංඛත, අමත** ලක්‍ෂණයන්ගෙන් යුක්ත යයි තතු ලෙස දැන ගත්තෙමි. මේ නිවන තෘෂ්ණාව ගේ අභාවයෙන් ම සිද්ධ යැයි තතු සේ දැන ගත්තෙමි.

ඒ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදව මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම වෙයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මේ අට ය. මේ දුක් නැති කිරීමේ මාර්ගය යැයි දැන ගත්තෙමි. ඒ මාර්ගය "**නීයාන හේතු දස්සන අධිපති**" ලක්‍ෂණයන්ගෙන් යුක්ත යැයි තතු ලෙස දැන ගත්තෙමි. මෙය වනාහි මේ දුක් නැසීමට ඇති එකම ප්‍රතිපදව වෙයි. මෙයින් මතු වෙනත් මාර්ගයක් නැත යැයි තතු ලෙස දැන ගත්තෙමි.

සෝවාන් මාර්ග චිත්තයට පෙරටුව උපදින ගෝත්‍රභූ චිත්තය දක්වා ද, කාම රූප අරූප තුන් භවයෙහි ම පැවැත්ම වන හෙයින් ද, සිහිය නමැති අගුල නො දමන තාක් ඇස - කන - නාසය ආදී දෙරටුවලින් සිදුරු වූ කලයකින් වැගිරෙන ජලයක් මෙන් ද, ව්‍රණ මුඛයකින් වැගිරෙන ලේ සැරව මෙන් ද, සසර දුක් වැඩි කරවන හෙයින්ද, සුරා පානය කළ තැනැත්තා ප්‍රකෘති ස්වභාවයෙන් වෙන් ව උමතු වූවන් මෙන් සියලු දුසිරිත්හි හැසිරෙත් ද, එලෙස ම "**කාම, භව, දිට්ඨි, අවිද්‍යා**" යන සතර ධර්මයෝ සත්වයා මත් කරවන හෙයින් ද, සසර දුකට කාරනා වන හෙයින් ද "**ආශ්‍රවයෝ**" යැයි දැන ගත්තෙමි.

මෙසේ දක්නා මාගේ සිත අර්හත් මාර්ග ක්‍ෂණයෙහි එම ආශ්‍රවයන්ගෙන් මිදුණේ ය. එලෙස සිත ආශ්‍රවයන්ගෙන් මිදුණු කල්හි අර්හත් ඵලයට පැමිණීම සිදු විය. ඉන් පසු ප්‍රත්‍යවේක්‍ෂා ඥානයන්ගෙන් **මාර්ග ප්‍රත්‍යවේක්‍ෂාව ද, ඵල ප්‍රත්‍යවේක්‍ෂාව ද, නිර්වාණ ප්‍රත්‍යවේක්‍ෂාව ද, ප්‍රහීණ ක්ලේශ ප්‍රත්‍යවේක්‍ෂාව** ද සිදු කොට නැවත ප්‍රහීණ කිරීමට කෙලෙස් ඉතුරුව නැත යැයි ප්‍රත්‍යක්‍ෂ වශයෙන් ම දැන ගත්තෙමි.

නැවත භවයෙහි ඉපදීම පිණිස අවිද්‍යා තෘෂ්ණා ආදී කෙලෙසුන් නැති බැවින් ඉපැත්ම ක්‍ෂය වූයේ ය යැයි දැන ගත්තෙමි.

අග්ගිවෙස්සනය, රාත්‍රියෙහි අන්තිම යාමයෙහි දී මේ තුන්වැනි විද්‍යාව වූ ආශ්‍රවක්‍ෂයකර ඥාන නම් වූ අභීත් මාර්ගය මා විසින් ලබන ලදී. එය වසන අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නේය. ආලෝකය උපන්නේය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම් සේ සිදු විය යුතු නම් එසේ විය.

අග්ගිවෙස්සනය, මම වනාහි නොයෙක් සිය ගණන් පිරිසෙහි ධර්මය දෙශනා කළ බව දනිමි. එහි දී "**ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ධර්මය දෙශනා කරන්නේ මටමය**" යැයි එක් එක් පුද්ගලයා සිතයි. අග්ගිවෙස්සනය, මේ කාරණය මෙසේ නො දත යුතුයි. තථාගතයන් වහන්සේ ධර්මය අවබෝධ කිරීම පිණිස යම්තාක් පිරිස ඇත්තේ ද ඒ සියල්ලන්ට ම ධර්මය දෙශනා කරන්නේය යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි සච්චක "**මේ ශ්‍රමණ භවත් ගෞතමයන්ගෙන් මම එක් ප්‍රශ්නයක් ඇසුවෙමි. ශ්‍රමණ ගෞතමයෝ නොනවත්වා කරුණු වදාරමින් සිටියි. මොහු කිපීමට පත්ව මෙසේ කියන්නේ ද**" යැයි මෙසේ සිතුවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "**අග්ගිවෙස්සන, තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන කල්හි දහස් ගණන් දෙනාට දේශනා කරන්නේ නමුත් කිපිමට පත්ව කියන්නේය යැයි කීමට කිසිම තැනක් නැත. අන්‍යයන්ගේ අවබෝධය පිණිස ප්‍රතිවේධය පිණිස තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරති**" යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි සච්චක "**මේ ශ්‍රමණ ගෞතමයෝ සිත් ඇදගන්නා සුළුය. දුටු දුටුවන් පහදින්නේ ය. දෙතොල් මනා ලෙස පිහිටා ඇත්තේ ය. දිව මොළොක්ය. ඉතා මිහිරි හඬ ඇත්තේය. කථාව ද මිහිරිය. පිරිස තමන් වෙත රඳවා ගැනීමට සමත්ය. එහෙත් මගේ සිතෙහි එකඟ බව නැත**" යැයි මෙසේ සිතුවේ ය.

මෙසේ සච්චකට ඇති වූ පරිවිතර්කය දැක වදාළ භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සන, තථාගතයන් වහන්සේ පිරිස් පිරිවරා නොහැසිරෙයි. සක්වළ කෙළවර කොට ඇති සියලු පිරිසට තථාගතයන් වහන්සේ දහම් දෙසති. ඒ පිරිසෙහි නො ඇලී ඒකාන්තයෙන් අසහාය විහරණ ඇතිව ශූන්‍යතා ඵල සමාපත්තියෙහි පිහිටා දහම් දෙසති"** යැයි වදාළ සේක.

එසේ ම තථාගතයන් වහන්සේ ධර්ම දේශනා කරන කල්හි මනුෂ්‍යයෝ යම් විටෙක සාධුකාර පවත්වත් ද, ඒ ඇසිල්ලෙහි පුරුදු කරන ලද සමාපත්තියකට සම වදී. එසේ ම ඒ සාධුකාර ශබ්දය අවසන් වීමට ප්‍රථමයෙන් එම සමාපත්තියෙන් නැගී සිට නැවැත්තූ තැන් සිට නැවත දේශනාව කරති. භාග්‍යවතුන් වහන්සේලාට වනාහි භවාංගයෙහි විසීම ඉතා සුළු වේලාවක් ම වේ. ආශ්වාස වාරයක් පාසාම ඵල සමාපත්තියෙහි යෙදී නිරතුරුව වෙසේ ද, ඒ සමාධි නිමිත්තෙහි සිත මනාව පිහිටුවමින් වෙසෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි සච්චක **"අතීත් වූ සම්‍යක් සම්බුදුවරයෙකු යම් ඵල සමාපත්තියකින් නිතරම වාසය කරමි' යැයි වදාරන සේක් ද, එසේ වූ අතීත් වූ සම්‍යක් සම්බුදු කෙනෙකුට යම් සේ නම් එසේම භවත් ගෞතමයන්ගේ ද මේ සමාපත්තියට සමවැදීම ඇදහිය යුතුය"** යැයි කීවේය.

මේ සච්චක භාග්‍යවතුන් වහන්සේ සමග වාදයක් කිරීමට සිතා නිද්‍රාව පිළිබඳ ප්‍රශ්නයක් ගොතා ගෙන ආවේ ය. යම් සේ සුනඛයෙක් දිය නුමුසු කොට කිරෙන් පිසින ලද කිරි බතක් ගිතෙලින් අනා බඩ පුරා කවන ලද්දේ නමුත් අසූචි දැක නොකා යන්නට නොහැකි වේ ද, නොකන්නේ නමුත් ඉව කොට බලා හෝ යන්නේ වේ ද, එසේ ඉව කොට හෝ නොගිය හොත් එම සුනඛයාගේ හිසේ රදය දුරු නොවන්නේ ය. එපරිද්දෙන් ම මේ සච්චක හට ද ශාස්තෘන් වහන්සේ විසින් දිය නොමුසු කිරිබතක් කවන්නාක් මෙන් මහාභිනිෂ්ක්‍රමණයෙහි පටන් ආශ්‍රවක්‍ෂය කිරීම දක්වා වූ පැහැදිය යුතු ධර්මය දේශනා කොට වදාළ සේක. එසේ දෙසන ලද ධර්මය අසා නමුත් තථාගතයන් වහන්සේ කෙරෙහි පැහැදීමක් ඇති නොවූයේ ය. එබැවින් තමා විසින් සිතෙහි සඟවා ගෙන ආ ප්‍රශ්නය නො විචාරා යෑමට නොහැකි විය. මෙලෙස

භාග්‍යවතුන් වහන්සේගේ එකඟ සිත් ඇති බව පිළිගෙන තමන් විසින් නිද්‍රාව පිළිබඳව ගොතා ගෙන ඇවිත් සඟවා ගෙන සිටි එම ප්‍රශ්නය විමසමින් **"භවත් ගෞතමයන් වහන්සේ දහවල් නිඳි ගත් බවක් දන්න සේක් ද?"** යනුවෙන් ඇසුවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"අග්ගිවෙස්සනය, ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි බතින් පසුව පිණ්ඩපාතයෙන් වැළකුණේ සඟල සිවුර සතර පොටක් කොට එලා සිහි ඇතිව මනා නුවණ ඇතිව දකුණු ඇළෙන් සැතපුණ බව මම දනිමි"** යැයි වදාළ සේක.

මෙහි දී ක්ෂීණාශ්‍රව වූ බුදු පසේබුදු මහ රහතන් වහන්සේලාගේ අහීත් මාර්‍ගීය ලැබීම සමගම ථීනමිද්ධය ප්‍රහීණ වේ. කාය දරථය උපාදින්නක ශරීරයෙහි ද, අනුපාදින්නක ශරීරයෙහි ද ඇති වේ. පියුම් උපුල් ආදිය හිරු රැස් වැටුණු විට පිපෙයි. හිරු රැස් නැති විට හැකිළෙයි. සියඹලා ආදී ඇතැම් ශාකයන්හි පත්‍ර සවසට මැලවෙයි. උදයට පිබිදෙයි. මෙය වනාහි ඍතු නියාම ධර්‍මතාවයකි. එසේ ම පෘතග්ජන වූ ද, ආර්‍යය වූ ද රූප කයෙහි ඍතුජ රූප කිපීමාදී හේතුන් නිසා කායික වෙහෙසකර බව, බර බව ඇති වෙයි. ඒ හේතුවෙන් සිත භවංග ගත වීම සිදු වේ. එබඳු අවස්ථාවන්හි දී තථාගතයන් වහන්සේ දහවල් කාලයෙහි මඳක් සැතපෙන බව වදාළ සේක.

එවිට සච්චක භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍ම දේශනා කරන අතර ද සමාපත්තීන්ට සමවැදීම ආදී ලෙස වදාළ ඓශ්චර්‍ය්‍ය කථා අසා, මෙවැනි වූ ප්‍රතිපත්ති ඇති සම්‍යක් සම්බුදුවරයෙකු දහවල් නිදන්නේ ද යැයි භාග්‍යවතුන් වහන්සේට උපවාද කිරීමක් වශයෙටන් **"භවත් ගෞතමයනි, ඇතැම් මහණ බමුණෝ මේ දහවල් නිදීම වනාහි මුළා වී වාසය කිරීමක්ය"** යයි කියති යනුවෙන් කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, මෙපමණකින් මුළා වූවෙකු හෝ නො මුළා වූවෙකු හෝ නොවෙයි. මුළා වූවෙකු හෝ නො වූවෙකු හෝ වීම කෙසේ වේද, එය අසව, මනාකොට සිතෙහි තබා ගනුව, කියන්නෙමි යැයි වදාළ සේක. "එසේය, පින්වතුන් වහන්ස" කියා සච්චක භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

අග්ගිවෙස්සනය, යම් කිසිවකුට සිත කෙලෙසන්නා වූ, නැවත නැවත ඉපදීම ඇති කරන්නා වූ දුක් විපාක ගෙන දෙන්නා වූ, මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නා වූ ආශ්‍රවයෝ අප්‍රහීණව ඇත්තේ වෙත් ද, ඔහු මුළා වූවෙකු යැයි මම කියමි. අග්ගිවෙස්සනය, ආශ්‍රවයන් ක්‍ෂය නොකිරීමෙන් මුළා වීම වෙයි.

අග්ගිවෙස්සනය, යම් කිසිවකුට සිත කෙලෙසන්නා වූ, නැවත නැවත ඉපදීම ඇති කරන්නා වූ, දුක් විපාක ගෙන දෙන්නා වූ මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නා වූ ආශ්‍රවයෝ ප්‍රහීණ වූයේ වෙත් ද, මම ඔහු නො මුළා වූවෙකු යැයි කියමි. අග්ගිවෙස්සනය, කෙලෙසුන් නැති කිරීමෙන් නො මුළා වීම වෙයි.

අග්ගිවෙස්සනය, තථාගතයන් වහන්සේට වනාහි සිත කෙලෙසන්නා වූ, නැවත ඉපදීම ඇති කරන්නා වූ, දුක් විපාක ඇති කරන්නා වූ, මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නා වූ යම් ආශ්‍රවයෝ වෙත් ද, ඔවුහු නැති වූවාහුය, සිඳින ලද මුල් ඇත්තාහ. මුලින් උදුරන ලද තල් ගසක් මෙන් කරන ලදහ. විනාශ කරන ලදහ. මත්තෙහි නූපදින ස්වභාව ඇත්තාහ.

අග්ගිවෙස්සනය, මුදුන කපන ලද තල් ගසක් යම් සේ නැවත වැඩෙන්නට අසමත් ද, අග්ගිවෙස්සනය, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේගේ, සිත කෙලෙසන්නා වූ, නැවත ඉපදීම ඇති කරන්නා වූ, දුක් විපාක ඇති කරන්නා වූ, මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නා වූ යම් ක්ලේශයෝ වෙත් ද, ඔවුහු නැති වූහ. මුල් සිඳින ලද්දහ. මුලින් උදුරන ලද තල් ගසක් මෙන් කරන ලදහ. විනාශ කරන ලදහ. මත්තෙහි නූපදින ස්වභාව ඇත්තාහ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි සච්චක මෙසේ කීය. "භවත් ගෞතමයනි, ආශ්චර්ය්‍ය ය, භවත් ගෞතමයනි, අද්භූත ය, මෙසේ කියනු ලබන්නා වූ, භවත් ගෞතමයන්ගේ ශරීර වර්‍ණය ද බබළයි. මුහුණෙහි වර්‍ණය ද පහදියි. අර්හත් වූ සම්‍යක් සම්බුදු කෙනෙකුන්ගේ මෙන් වේ.

භවත් ගෞතමයනි, මම පූරණ කාශ්‍යප, මක්ඛලිගෝසාල, අජිත කෙසකම්බල, පකුධ කච්චායන, සංජය බෙලට්ඨිපුත්‍ර, නිගණ්ඨ නාතපුත්‍ර හට වාද කථාවෙන් වාදය ආරෝපණය කළ බව දනිමි. ඔවුහු වනාහි මා විසින් වාද කථාවෙන් වාදය පටන් ගන්නා ලද්දේ අන්‍ය කථාවකින්, කථාව යටපත් කළහ. කථාව වෙනත් අතකට නැමූහ. කෝපය ද, ද්වේෂය ද, නොසතුට ද පහළ කළහ.

එහෙත් මෙසේ වාද කොට කථා කරන කල්හි භවත් ගෞතමයන්ගේ ශරීර වර්ණය ද බබළයි. මුහුණෙහි වර්ණය ද පහදියි. අර්හත් වූ සම්මා සම්බුදු කෙනෙකුන්ගේ මෙන් වේ.

"භවත් ගෞතමයනි, දැන් අපි යන්නෙමු. අපි බොහෝ වැඩ කටයුතු ඇත්තෝ වෙමු" යැයි සච්චක කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "අග්ගිවෙස්සනය, නුඹ යමක් සඳහා සුදුසු කාලය යයි හඟින්නෙහි ද, දැන් ඊට කාලයය" යැයි වදාළහ. ඉක්බිති සච්චක නිගණ්ඨ පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගෙන සිතින් පිළි නොගෙන වචනයෙන් පමණක් පිළිගෙන උන් ආසනයෙන් නැගිට ගියේ ය.

මෙසේ තථාගතයන් වහන්සේ තමන් සමග වාද කොට පැරදවීමට කැමති ව පැමිණි සච්චක නිගණ්ඨ පුත්‍රයා මහා කරුණාවෙන් පිළිගෙන ඔහුගේ ප්‍රශ්න විසඳමින් මජ්ඣිම නිකායෙහි ඇතුළත් චුල්ල සච්චක මහා සච්චක යන සූත්‍ර දෙකකින් ම ධර්ම දේශනා කොට වදාළ සේක. එහි පළමු සූත්‍රය එක් බණවරකි. දෙවන සූත්‍රය බණවර එකහමාරකි. මෙසේ බණවර දෙක හමාරක ධර්මයක් ශ්‍රවණය කළ නමුත් ඔහු අධිගමයකට නො පැමිණියේ ය. බුදුරජාණන් වහන්සේ ද ධර්මය ද සරණ නො ගියේ ය. අඩුම තරමින් දෑත් එක් කොට වැඳීම් මාත්‍රය කුදු නොකළේ ය. එහෙත් තථාගතයන් වහන්සේ ඔහුට බොහෝ වෙහෙසී ධර්ම දේශනා කොට වදාළේ අනාගතයෙහි ඔහු මේ ලක්දිව ඉපද පැවිදි ව අර්හත්වයට පැමිණ නිවන් සුව ලබන බව දුටු නිසා ය.

මෙසේ ලොවට අනුකම්පාකාරී වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පන්සාළිස් වන වර්ෂයෙහි උත්පත්තියෙන් අසූ වන වියෙහි දී කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවර්තන නම්

ශාල වනෝද්‍යානයෙහි දී අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක. සච්චක මිනිස් ලොවෙන් චුතව දෙව්ලොව ඉපිද ලක්දිව බුදු සසුන පිහිටි කල්හි එයින් චුතව දක්ෂිණා ගිරි විහාරයෙහි ඇමති පවුලක ඉපිද සුදුසු වයසෙහි දී ගිහි ගෙයින් නික්ම ඇවිත් බුදු සසුනෙහි බුද්ධරක්ඛිත නමින් පැවිදි වී ත්‍රිපිටක බුද්ධ වචනය මැනවින් ඉගෙන ගෙන ආචාර්යයෙකු වශයෙන් ප්‍රසිද්ධ විය. දිනක් මේ බුද්ධරක්ඛිත තෙරුන් භික්ෂූන් වහන්සේලා පිරිවරා තම උපාධ්‍යයන් වහන්සේ වැඳීමට ගියේ ය. එවිට ඒ උපාධ්‍ය තෙරුන් වහන්සේ තම සද්ධිවිහාරිකයා හික්මවන්නට සිතා බුද්ධරක්ඛිත තෙරුන්ට මුහුණ නොදුන්හ. පිළිසඳර කථා මාත්‍රයකුදු නොකළේ ය. පසු දින උදෑසන බුද්ධරක්ඛිත භික්ෂුව උපාධ්‍යයන් වහන්සේ වෙත ගොස් වැඳ **"ස්වාමීන් වහන්ස, මම ත්‍රිපිටක ධර්මය මනා කොට ඉගෙන නුඹ වහන්සේ වැඳීමට පැමිණියෙමි. නුඹ වහන්සේ මට මුහුණ දී කථා මාත්‍රයකුදු නොකරන සේක. ස්වාමීනි, මා අතින් සිදු වී ඇති වරද කුමක් ද?"** යැයි අසා සිටියේ ය. එවිට උපාධ්‍ය තෙරුන් වහන්සේ **"ඇවැත්නි බුද්ධරක්ඛිතය, නුඹ ත්‍රිපිටක ධර්මය උගත් පමණින් පැවිදි කෘත්‍යයන් සම්පූර්ණ වූයෙහි යැයි සිතන්නෙහි ද"** යැයි කීවේ ය. **"ස්වාමීනි, මා විසින් තව කුමක් කළ යුතුද?"** යැයි බුද්ධරක්ඛිත තෙරුන් ඇසුවේ ය. එවිට උපාධ්‍ය තෙරුන් වහන්සේ **"බුද්ධරක්ඛිතය, පිරිස හැර පළිබෝධ සිඳ හැර කසිතපබ්බත විහාරයට ගොස් මහණ දම් කරව"** යැයි කීවේ ය. ඉන් පසු බුද්ධරක්ඛිත තෙරුන් උපාධ්‍යයන් වහන්සේගේ අවවාදයෙහි පිහිටා ශ්‍රමණ ධර්ම පූර්ණය කොට කෙටි කලකින් ම සව් කෙලෙසුන් නසා සිවුපිළිසිඹියා ඥාණ සහිතව අර්හත්වයට පත් විය. ඉන් පසු බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ බොහෝ පිරිවර භික්ෂූන් ඇති රාජ පූජිත තෙරුන් වහන්සේ නමක් වී චේතියපබ්බත විහාරයෙහි[1] වැඩ සිටියේ ය.

ඒ කාලයෙහි තිස්ස රජතුමා සිල් සමාදන්ව සෑගිරියෙහි[2] රජ ලෙනෙහි වාසය කළේ ය. රජතුමා කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ ධර්ම දේශනා කරන ප්‍රශ්න විසඳන අවස්ථාවක් වෙතොත් මට දැනුම්

---

[1] මිහින්තලය

[2] මිහින්තලය

දෙන්න යැයි බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේගේ උපස්ථායක තෙරුන් වහන්සේට කීවේ ය.

එක් දිනක් කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ භික්ෂු සංඝයා සමග කණ්ඨක චෛත්‍ය වැඳ එය සමීපයෙහි කළු තිඹිරියා ගසක් මුල වැඩ සිටියේ ය. එකල්හි එක් පිණ්ඩපාතික තෙරුන් වහන්සේ නමක් කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේගෙන් කාළකාරාම සූත්‍රයෙන් ප්‍රශ්නයක් ඇසීය. එදින පොහෝ දිනයක් විය. කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ **"අද ධර්‍ම දේශනා කරන දිනය නොවේ ද"** යැයි භික්ෂූන් ගෙන් ඇසුවේ ය. එවිට භික්ෂූහු **"එසේය ස්වාමින් වහන්ස"** යැයි පිළිතුරු දුන්හ. එකල්හි කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ **"එසේ නම් පුටුවක් ගෙනෙව, අද මෙහි දී ම ධර්‍ම දේශනා කරමි"** යැයි කීවේ ය. කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ එහි ම වැඩ හිඳ රාත්‍රිය මුළුල්ලෙහි ම කාළකාරාම සූත්‍රයෙන් ධර්‍ම දේශනා කළේ ය. එම දේශනාව කිරීමෙහි දී පස් වරක් මහ පොළොව කම්පිත විය. ඒ බුදුගුණ ධර්‍ම දේශනාව අසා පන්සියයක් භික්ෂූහු සව් කෙලෙසුන් නසා අර්හත්වයට පත් වූහ. සුවාසූ දහසක් සත්වයන්ට ධර්‍මාවබෝධය වූහ.

කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ ධර්‍ම දේශනා කරන බව උපස්ථායක තෙරුන් වහන්සේ තිස්ස රජතුමාට දැන්වී ය. තෙරුන් වහන්සේ ධර්‍මාසනාරූඪව මාතෘකා ශීර්‍ෂය කියා අවසන් වීගෙන එන අවස්ථාවෙහි තිස්ස රජතුමා ධර්‍ම ශ්‍රවණය පිණිස එහි පැමිණියේ ය. පැවිදි ගිහි විශාල පිරිසක් අතර නැතිව වාඩි වී ධර්‍ම ශ්‍රවණය කළහ. රජතුමා ද ධර්‍ම ශ්‍රවණය පිණිස එහි ගොස් පිරිස් කෙළවර අප්‍රසිද්ධ වේශයෙන් සිටගෙන ධර්‍මය ශ්‍රවණය කළේ ය. කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ අලුයම ධර්‍ම දේශනාව අවසන් කරණු පිණිස **"ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්‍දුන්ති"** වදරන කල්හි රජතුමා සාධුකාර දුන්නේ ය. තෙරුන් වහන්සේ රජතුමාගේ හඬ හැඳිනගෙන **"මහරජ, කොයි වෙලාවෙහි පැමිණියෙහි ද"** යැයි විචාළේ ය. **"ස්වාමින් වහන්සේ ධර්‍ම දේශනාව පිණිස මාතෘකා ගාථා කියා අවසන් කරන වෙලෙහි ආවෙමි"** යැයි කීවේ ය. එවිට කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ **"මහරජ, නුඹ තුන් යම් රාත්‍රිය මුළුල්ලෙහි සිටගෙන ම ධර්‍මය ශ්‍රවණය කිරීමෙන් දුෂ්කර වැඩක් කෙළෙහි ය"** යැයි කීවේ ය. එකල්හි රජතුමා **"ස්වාමින් වහන්ස, එය**

දුෂ්කර දෙයක් නොවේ. ස්වාමින් වහන්සේ ධර්මය දේශනා කිරීමට පටන් ගත් තැන් පටන් එක දහම් පදයකින් හෝ මා අනාඃවිහිත වී නම් එය මේ ලංකාද්වීප භූමියේ කෙවිටක් සිටවන තරම් තැනක් මා හට හිමි නොවන්නේය" යැයි කියා "ස්වාමින් වහන්ස, බුදුගුණ මෙපමණ ද, තවත් ඇත්තේ ද" යැයි ඇසුවේ ය.

එවිට කාල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ "මහරජ, මා කී බුදුගුණ ඉතා ස්වල්ප ය. නොකී බුදු ගුණ ම ඉතා බොහෝ ය" යැයි කීවේ ය. ඉන් පසු රජතුමා "ස්වාමින් වහන්ස, උපමාවක් දක්වන සේක්වා" යැයි කීවේ ය. තෙරුන් වහන්සේ "මහරජ, සියක් කිරියක් වපුරන කුඹුරක එක ගොයම් කරලකට ඉතිරි ගොයම් කරල් වැඩි වන්නාක් මෙන් මා කී බුදුගුණ ඉතා ස්වල්පයකි. නොකී බුදු ගුණ ම ඉතා බොහෝ වෙති" යැයි කීවේ ය. "ස්වාමින් වහන්ස, තවත් උපමාවක් වදාළ මැනව" යැයි රජතුමා කීවේ ය. එවිට තෙරුන් වහන්සේ "මහරජ ජලය පිරී දෙගොඩ තලා ගලා යන මහා ගංගා ජලයකට ඉදි කටු මලක් ඇල්ලුව හොත් ඒ ඉදි කටු සිදුරෙන් යන ජලය ඉතා ස්වල්ප වන්නේය. ඉතිරි ගංගා ජලය ම බොහෝ වන්නේය. එසේම මා කී බුදුගුණ ඉතා ස්වල්පය. නොකී බුදුගුණ ම ඉතා බොහෝ ය" යැයි කීවේ ය. එවිට රජතුමා "ස්වාමින් වහන්ස, තවත් උපමාවක් වදාළ මැනව" යැයි කීවේ ය. එකල්හි තෙරුන් වහන්සේ "මහරජ අහසෙහි පියාඹන වැහි ළිහිණි නම් කුඩා පක්ෂි විශේෂයක් ඇත. කිමෙක් ද මහ රජ එම පක්ෂියෙකු අහසෙහි පියාසර කරන විට එම පක්ෂියාගේ පියාපතට වැසෙන ආකාශය වැඩි ද, ඉතිරි ආකාශය වැඩි ද" යැයි අසා සිටියේ ය. එවිට රජතුමා "ස්වාමින් වහන්ස, කුමක් කියන සේක් ද? ඒ කුඩා ළිහිණියාගේ පියාපත්වලට වැසෙන ආකාශය ඉතා ස්වල්ප ය. නො වැසෙන ආකාශයම බොහෝ වන්නේ ය" යැයි කීවේ ය. එවිට තෙරුන් වහන්සේ "මහරජ, එමෙන් ම මා විසින් කී බුදුගුණ ඉතා ස්වල්පයකි. නොකී බුදු ගුණ ම ඉතා බොහෝ වෙති" යැයි කීවේ ය.

එකල්හි රජතුමා "ස්වාමින් වහන්ස, සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ අනන්ත වූ බුද්ධ ගුණස්කන්ධය අනන්තාකාශයට ම උපමා කිරීම යහපත් ය. මම ආයර්‍යයන් වහන්සේට ප්‍රසන්න වීමි. ආයර්‍යයන් වහන්සේට සුදුසු පූජාවක් කිරීමට මම සමත් නොවෙමි. මාගේ මේ දුප්පත් පඬුර පිළිගන්නා සේක්වා. සියක් යොදුන් පිරි මඬුලු වූ මේ

**ලංකාද්වීප රාජ්‍යය මම දහම් පඬුරක් වශයෙන් පුදමි**" යැයි කීවේ ය. එකල්හි තෙරුන් වහන්සේ "**මහරජ, ඔබ තුමාගේ පැහැදීම නිසා කළ යුත්ත කළෙහි ය. අපට දුන් රාජ්‍යය අපි නැවත ඔබට ම දෙමු. දැහැමින් සෙමෙන් ඔබ ම රාජ්‍යය කරන්නෙහි ය**" යැයි කියා රජතුමාට ම නැවත රාජ්‍යය භාර කළේ ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සමග වාද කොට පැරදවීමට සිතා පැමිණි සච්චක පිළිගෙන අනාගතයෙහි ඔහුට වන අර්ථය දැක මහා කරුණාවෙන් යුක්තව ඔහුගේ ප්‍රශ්න විසඳ ධර්ම දේශනා කොට සුගති මග නිවන් මග සාද දී සසර දුකින් මුදවාලූ සේක.

මෙය අර්ථ වශයෙන් ගෙන සත්‍යක්‍රියා කොට සෙත් පැතීම මෙම ගාථාවෙන් දැක්වෙයි.

**සච්චං විහාය මතිසච්චක වාදකෙතුං**
**වාදාභිරොපිතමනං අති අන්ධභූතං,**
**පඤ්ඤාපදීප ජලිතො ජිතවා මුනින්දො**
**තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.**

මෝහෙන් මුලා වී සැබෑ - දේ ඉක්ම වූ ඒ
වාදෙන් දිනන්නට එද - ආ සච්චකයි නම්
දුල් වූ දිදුල් නැණ බෙලෙන් - දිනූ වීරයාණෝ
ඒ ආනුභාව බලයෙන් - සුව සෙත් සැදේවා.

# 7. නන්දෝපනන්ද නාගරාජ දමනය

එක් දිනක් අනාථපිණ්ඩික සිටුතුමා ජේතවනාරාමයට ගොස් ධර්ම ශ්‍රවණය කොට සම්මා සම්බුදුරජාණන් වහන්සේ අමතා "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, හෙට දින පන්සියයක් භික්ෂු සංඝයා වහන්සේ සමග අපගේ නිවසට දනය පිණිස වඩින සේක්වා**" යැයි ආරාධනා කොට ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණීම් භාවයෙන් ඒම ආරාධනය ඉවසා වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ පසු ද අලුයම බ්‍රහ්ම මුහුර්තයෙන් අවදිව වෙන ද මෙන් ම සුපුරුදු ලෙස මහා කරුණා සමාපත්තියට සමවැද දස දහසක් ලෝක ධාතුවෙහි මහා කරුණා ආලෝකය පතුරවා එයින් නැගී සිට **"අද මාගෙන් පිහිට ලබන්නේ කවරෙක් ද"** යැයි බලා වදාළ සේක. එදින භාග්‍යවතුන් වහන්සේගේ මහා කරුණා ඤාණයට නන්දෝපනන්ද නාග රාජයා අරමුණු විය. එකල්හි ඒම නාග රාජයාට උපනිඃශ්‍රය සම්පත් ඇත් දැයි බලා වදාරණ සේක් **"මොහු මිථ්‍යා දෘෂ්ටිකයෙකි. රත්නත්‍රයෙහි අප්‍රසන්න වූවෙකි"** යැයි දැක **"මොහු කෙසේ මෙම මිථ්‍යාවෙන් මුදවා ගත හැකි වේද"** යැයි විමසා බලා වදාරණ සේක් මුගලන් මහ රහතන් වහන්සේ දුටු සේක.

භාග්‍යවතුන් වහන්සේ කය පිළිදැගුම් කොට ආනන්ද තෙරුන් වහන්සේ අමතා **"ආනන්දය, පන්සියයක් පමණ භික්ෂූන් රැස් කරව, අද තථාගතයන් වහන්සේ දේව චාරිකාවෙහි වඩිනු කැමැත්තේ වෙමි"** යැයි වදාළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ ආරාමයෙහි වැඩ සිටි මහා සංඝයාගෙන් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා හා අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා ප්‍රධාන ව රහතන් වහන්සේලා පන්සිය නමකට බුදු රජාණන් වහන්සේගේ අදහස දැනුම් දුන්නේ ය.

එදින නන්දෝපනන්ද නා රජු මහා මේරු පර්වතාසන්නයෙහි සුරා පාන සැණකෙළිය පිණිස භූමිය සකස් කරන කාලය විය. නාග රාජයා දිව්‍යමය වූ සේසත යට දිව්‍යමය රත්න පර්‍යංකයෙහි හිඳ නාටක ස්ත්‍රීන් හා නාග පිරිස පිරිවරා ගෙන දිව්‍යමය වූ භාජනයන්හි එළවන ලද ආහාර පානාදිය බලමින් හුන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ ද එම නා රජුට දැකිය හැකි පරිදි අධිෂ්ඨාන කොට ඒ නාග විමානයට ඉහළින් පන්සියයක් රහතන් වහන්සේලා සමග තව්තිසා දෙව්ලොව බලා වැඩි සේක. එලෙස වඩින්නා වූ බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා දැක නන්දෝපනන්ද නා රජුට **"මේ මුඩු මහණහු අපගේ භවන උඩින් තව්තිසා දෙව්ලොව යම්හ යැයි නික්මුණාහු ය. මොවුන්ට අපගේ භවන මත පා දූවිලි විසුරුවමින් යෑමට නොදෙමි"** යැයි සිතුවිල්ලක් ඇති විය. මෙසේ සිතා නාග රාජයා මහා මේරු පර්වත පාමුල සමුද්‍ර පතුලට ගොස් තමාගේ මහත් නාග වේශය මවාගෙන මහා මේරු පර්වතය සත් වටක් දරණ වැලින් වෙලා මුදුනෙහි

පෙනය තබා තව්තිසා භවනය යටිකුරු කොට පෙණයෙන් වසා ගෙන අන්ධකාර කොට නොපෙනෙන්නට සැලැස්වීය.

එකල්හි රට්ඨපාල මහ රහතන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මින් පෙර අවස්ථාවල අපි දෙව්ලොව යද්දී මෙම ප්‍රදේශයෙහි දී මහා මේරු පර්වතය පෙනෙයි. මහා මේරු පර්වතය හාත්පස තව්තිසා භවනයට ආරක්‍ෂාව පිණිස පිහිටි යොදුන් පන්සියයක් පමණ විශාල වූ යක්‍ෂ නාග කුම්භාණ්ඩ ආලින්දයන් ද, එම යක්‍ෂ නාග කුම්භාණ්ඩයන්ගේ වාසස්ථාන වශයෙන් පැවති පරිභාණ්ඩයෝ ද පෙනෙයි. එසේ ම තව්තිසා භවනය ද, වෛජයන්ත ප්‍රාසාදය ද පෙනෙයි. වෛජයන්ත ප්‍රාසාදය මත නංවන ලද ධජය ද පෙනෙයි. අද ඒ කිසිවක් නොපෙනෙයි. එයට හේතු කවරේ ද?**" යැයි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසුවේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "**රට්ඨපාලය, අද නන්දෝපනන්ද නම් නාග රාජයා නුඹලා කෙරෙහි කිපී මහාමේරු පර්වත පාමුල සමුද්‍ර පතුලට ගොස් තමාගේ මහත් නාග වේශය මවාගෙන මහාමේරු පර්වතය සත් වටක් දරණ වැලින් වෙලා මුදුනෙහි පෙනය තබා තව්තිසා භවනය යටිකුරු කොට පෙණයෙන් වසා ගෙන නො පෙනෙන ලෙස අන්ධකාර කොට සිටින්නේ ය**" යැයි වදාළ සේක.

එකල්හි රට්ඨපාල රහතන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම ඒ නාග රාජයා දමනය කරමි**" යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ එය නො අනුදත් සේක. ඉන් පසු භද්දිය රහතන් වහන්සේ ද "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම ඒ නාග රාජයා දමනය කරමි**" යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ එය ද නො අනුදත් සේක. ඉන් පසු රාහුල රහතන් වහන්සේ ද "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම ඒ නාග රාජයා දමනය කරමි**" යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ එය ද නො අනුදත් සේක. මෙලෙස පිළිවෙළින් සියලු රහතන් වහන්සේලා ම "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම ඒ නාග රාජයා දමනය කරමි**" යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේලාට නො අනුදත් සේක. අවසානයෙහි දී මුගලන් මහ රහතන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම ඒ නාග රාජයා දමනය කරමි**" යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ "**මොග්ගල්ලානය, නුඹට එය කළ හැකිය, දමනය කරව**" යැයි වදාළ සේක.

මුගලන් මහ රහතන් වහන්සේ තම භික්ෂු වේශය අතහැර නාග වේශයක් මවා මහා මේරු පර්වත පාමුලට වැඩ මහාමේරු පර්වතය දරණ සතකින් වෙලා සිටි ඒ නාගයාගේ ශරීරය මත දරණ වැල් තුදුසකින්[1] වෙලා ගෙන එම නාගයාගේ පෙනය මත තම පෙනය තබාගෙන නාගයාව මහාමේරු පර්වතයට තද කොට සිටියේ ය. එවිට නාග රාජයා තම ආනුභාවෙන් දුම් පිට කළේ ය. මුගලන් මහ රහතන් වහන්සේ ද තම ඍද්ධ්‍යානුභාව බලයෙන් දුම් පිට කළේ ය. නාගයා පිට කළ දුමෙන් මුගලන් මහ රහතන් වහන්සේට අපහසුවක් නොවූයේ ය. මුගලන් මහ රහතන් වහන්සේ පිට කළ දුමෙන් නාගයා පීඩාවට පත් විය. ඉන් පසු නාග රාජයා තම ආනුභාවෙන් ගිනි පිට කළේ ය. මුගලන් මහ රහතන් වහන්සේ ද තේජෝ කසිණ සමාපත්තියට සමවැද තම ඍද්ධ්‍යානුභාව බලයෙන් ගිනි පිට කළේ ය. නාගයා පිට කළ ගින්නෙන් මුගලන් මහ රහතන් වහන්සේට අපහසුවක් නොවූයේ ය. මුගලන් මහ රහතන් වහන්සේ පිට කළ ගින්නෙන් නාගයා පීඩාවට පත් විය. දැවෙන්නට විය.

ඉන් පසු නාග රාජයා "**මේ තෙමේ මා මහා මේරුව හා තද කොට දුමා දවයි. මොහු කවරෙක් ද**" යැයි සිතා "**නුඹ කවරෙක් ද**" යැයි ඇසුවේ ය. එවිට මුගලන් මහ රහතන් වහන්සේ "**නාගය, මම මුගලන් නම් වෙමි**" යැයි වදළේ ය. එවිට නාග රාජයා "**ස්වාමීනි, එසේ නම් භික්ෂු වේශයෙන් සිටිනු මැනව**" යැයි කීවේ ය. මුගලන් මහ රහතන් වහන්සේ භික්ෂු වේශයෙන් පෙනී සිට නාගයාගේ දකුණු කනින් ඇතුල්ව වම් කනින් නික්මෙයි. වම් කනින් ඇතුල්ව දකුණු කනින් නික්මෙයි. දකුණු නාසිකා සිදුරින් ඇතුල්ව වම් නාසිකා සිදුරින් නික්මෙයි. වම් නාසිකා සිදුරින් ඇතුල්ව දකුණු නාසිකා සිදුරින් නික්මෙයි. ඉන් පසු නාගයා මුව විවර කළේ ය. එකල්හි මුගලන් මහ රහතන් වහන්සේ නාගයාගේ මුවින් කුසට ඇතුළුව කුස තුළ නැගෙනහිර දිසාවට සක්මන් කරමින් සිටියේ ය.

මෙම අවස්ථාවෙහි සම්මා සම්බුදුරජාණන් වහන්සේ මුගලන් මහ රහතන් වහන්සේ අමතා "**මොග්ගල්ලානය, සිහි උපදවා ගන්න**" යැයි වදළ සේක. එවිට මුගලන් මහ රහතන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා විසින් සතර ඍද්ධිපාදයෝ වඩන ලද්දෙමි.**

---

[1] දූ හතරකින්

**නැවත නැවත පුරුදු කරන ලද්දෙමි. ගමනට යානාවක් මෙන් ද, සිටීමට වාස්තුවක් මෙන් ද කරන ලද්දෙමි. නැවත නැවත පිහිටුවන ලද්දෙමි. පුරුදු කරන ලද්දෙමි. මනා කොට ආරම්භ කරන ලද්දෙමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ එක නාගයෙක් සිටීවා! මෙබඳු නාගයන් සියයක් හෝ දහසක් හෝ දමනය කරමි"** යැයි වදාළේ ය.

මෙම නාග රාජයා "**මොහු කුස තුළට වදනා බව මම නොදුටුවෙමි. දැන් මොහු පිටතට නික්මෙත් ම දළ ඇතුළට ගෙන සඟවා කමි"** යැයි සිතා "**ස්වාමීනි, මෙසේ මා හට පීඩා නොකර පිටතට නික්මෙව"** යැයි කීවේය. එවිට මුගලන් මහ රහතන් වහන්සේ නාගයාගේ මුවින් පිටතට නික්ම ක්‍ෂණයකින් චතුර්ථ ධ්‍යානයට සම වැදුණේ ය. නාග රාජයා තෙරුන් වහන්සේ අළු කරමි යැයි සිතා නාසයෙන් විෂ සහිත ගිනි පිට කළේ ය. එහෙත් මුගලන් මහ රහතන් වහන්සේගේ රෝම කූපයක් හෝ දවාලීමට නොහැකි විය.

භද්දිය රාහුල ආදී අන් රහතන් වහන්සේලාට භාග්‍යවතුන් වහන්සේ නාගයා දමනයට අවසර නො දුන්නේ මෙම අවස්ථාව ජය ගත නොහැකි වන හෙයිනි. ඒ අන් රහතන් වහන්සේලා ඍද්ධි විෂයට සමත් වුව ද ඛිප්පනිසන්තිතාව නම් වූ වහා ක්‍ෂණයකින් ධ්‍යානයන්ට සම වැදීම පුරුදු කර නැත.

ඉන් පසු නාග රාජයා "**මේ තෙරුන් වහන්සේ මහත් ආනුභාව ඇති අයෙකි. මාගේ නාසිකා වාතයෙන් රෝම කූපයකුදු සොලවාලිය නොහැකි වීමි"** යැයි සිතුවේ ය. එවිට මුගලන් මහ රහතන් වහන්සේ මහත් ගුරුළු වේශයක් මවා කල්ප විනාශක වාතය බඳු ගුරුළු වාතය දනවා නා රජු ලුහු බැන්දේ ය. එවිට නාග රාජයා නාගාත්මය හැර මානවක වේශයක් මවා ගෙන "**ස්වාමීනි, නුඹ වහන්සේ සරණ යමි, මා ගැත්තහුට සරණ වනු මැනව"** යැයි කියා මුගලන් මහ රහතන් වහන්සේට වැඳ සිටියේ ය. එවිට මුගලන් මහ රහතන් වහන්සේ "**එම්බා නාග රාජය, භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ වැඩි සේක. මෙසේ එව, ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත යම්හ"** යැයි කියා නාග රාජයා කැඳවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වූයේ ය. ඉන් පසු නාග රාජයා බුදු රජාණන් වහන්සේ වැඳ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ සරණ යමි"**

යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "**සුඛී හොතු නාගරාජ**" "සුවපත් වේවා නාග රාජය" යැයි වදාළ සේක.

ඉන් පසු බුදුරජාණන් වහන්සේ මහා සංඝයා වහන්සේ පිරිවරා අනාථපිණ්ඩික මහ සිටුතුමාගේ නිවසට වැඩ පනවන ලද ආසනයන්හි වැඩසිටි සේක. සිටුතුමා "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඉතා දහවල් වූයේ කුමක් නිසා ද**" යැයි ඇසුවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "**මහ සිටාණෙනි, මුගලන් තෙරුන් වහන්සේ හා නන්දෝපනන්ද නාග රජායා අතර යුද්ධයක් විය**" යැයි වදාළ සේක. "**ස්වාමීනි, ජය පරාජය වූයේ කාට ද?**" යැයි සිටුතුමා ඇසුවේ ය. "**මහ සිටාණනි, මුගලන් තෙරුන් වහන්සේට ජය විය. නන්දෝපනන්ද නාග රාජයාට පරාජය විය**" යැයි වදාළ සෙක. එවිට සිටුතුමා "**එසේ නම් ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සතියක් මුගලන් මහ තෙරුන් වහන්සේගේ ජය පූජාව පවත්වමි. සතියක් ම මාගේ ආරාධනය පිළිගත මැනවි**" කියා ආරාධනා කොට ඒ නිමිත්තෙන් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා උදෙසා සතියක් මහා දන් දී පූජා සත්කාර කළේ ය.

මෙසේ මහත් ආනුභාව ඇති නන්දෝපනන්ද නාග රාජයා මනා උපදේශය ලබා දී මුගලන් මහ රහතන් වහන්සේ ලවා දමනය කරවූ සේක.

මෙය අර්ථ වශයෙන් ගෙන සත්‍යක්‍රියා කොට සෙත් පැතීම මෙම ගාථාවෙන් ප්‍රකාශ කොට දක්වන්නේ ය.

**නන්දොපනන්ද භුජගං විබුධං මහිද්ධිං**
**පුත්තෙන ථෙර භුජගෙන දමාපයන්තො,**
**ඉද්ධූපදෙස විධිනා ජිතවා මුනින්දො**
**තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.**

| | |
|---|---|
| නන්දෝපනන්ද නම් වූ | - තෙද හා විකුම් යුත් |
| ඒ නා රජුන්ද දම වූ | - මුගලන් තෙරුන්ගෙන් |
| එහි දී මනා උපදෙසින් | - දිනූ වීරයාණෝ |
| ඒ ආනුභාව බලයෙන් | - සුව සෙත් සැදේවා. |

# 8. බක බ්‍රහ්ම දමනය

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩසිටි සේක. ඒ කාලයෙහි දී ප්‍රථම ධ්‍යාන භූමියට අයත් මහා බ්‍රහ්ම තලයෙහි වෙසෙන බක බ්‍රහ්මයාට **"මේ බ්‍රහ්ම ආත්ම භාවය නිත්‍ය ය, මෙය ස්ථිර ය, මෙය සදාකාලික ය, මෙය නැති නොවන ස්වභාව ඇති එකකි. මෙහි උපන්නෙකු වනාහි නැවත නූපදියි, නොදිරයි, නොමැරෙයි, මෙයින් අන්‍ය වූ මත්තෙහි බඹලොවක් නැත. සතර මාර්ග සතර ඵල නිර්වාණයක් නැත"** යැයි ශාස්වත දෘෂ්ටියක් උපන්නේය.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ බක බ්‍රහ්මයාගේ අදහස තම සිතින් දැන, යම් සේ ශක්තිමත් පුරුෂයෙක් නැවූ අතක් ක්‍ෂණයකින් දිගු කරන්නේ හෝ දිගු කළ අතක් නවන්නේ හෝ යම් සේද, එසේම ජේතවනාරාමයෙන් අතුරුදන් ව ඒ බ්‍රහ්ම ලෝකයෙහි පහළ වූ සේක.

බක බ්‍රහ්මයා වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දැක, භාග්‍යවතුන් වහන්සේ අමතා **"නිදුකාණනි, වඩින මැනවි. නිදුකාණනි නුඹගේ පැමිණීම ඉතා යහපත් ය. බොහෝ කලකට පසු ඔබ මෙහි වැඩියේ ය. එය ඉතා යහපත් ය. නිදුකාණනි, මේ බ්‍රහ්ම ආත්මභාවය වනාහි නිත්‍යය, මෙය ස්ථිර ය, මෙය සදාකාලික ය, මෙහි ච්‍යුත නොවන ස්වභාවයෙන් යුක්ත ය. මෙය නැවත ඉපදීමක් දිරීමක් මරණයක් නැති තැනකි. මෙයට අන්‍ය නිස්සරණයක් නැත"** යැයි කීය.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ බක බ්‍රහ්මයා අමතා, **"යමක් අනිත්‍ය නම් එය නිත්‍ය යැයි කියයි ද, අස්ථිර වන දේ ස්ථිර යැයි කියයි ද, සදාකාලික නොවන දේ සදාකාලික යැයි කියයි ද, කැඩෙන බිඳෙන දේ නො කැඩෙන නොබිඳෙන දෙයක් යැයි කියයි ද, ච්‍යුත වන ස්වභාවයෙන් යුක්ත වූව ච්‍යුත නොවන දෙයක් යයි කියයි ද, යම් තැනක ජාති ජරා ව්‍යාධි මරණ නැවත ඉපදීම ඇති වේ නම්, ඒ පිළිබඳව එහි ජාති ජරා ව්‍යාධි මරණ නැවත ඉපදීම නැතැයි කියයි ද, ජාති ජරා ව්‍යාධි මරණ නැවත ඉපදීම නැත්තා වූ යම් නිවනක් ඇති කල්හි, ජාති ජරා ව්‍යාධි මරණ ආත්තා වූ නැවත ඉපදීම ඇති තැන නිවනක් ඇත**

**යැයි කියයි ද මේ බක බ්‍රහ්ම තෙම ඒකාන්තයෙන් අවිද්‍යාවෙන් අන්ධ වූයේ ය"** යැයි වදාළසේක.

එවිට බක බ්‍රහ්මයා භාග්‍යවතුන් වහන්සේ අමතා "ගෞතමයනි, අපි හැත්තෑ දෙනෙක් විසින් කරන ලද පින්කම් ඇත්තෝ ව ජාතිය හා ජරාව ඉක්ම ගියෝ වමු. අනුන් තමන් වසඟ කොට පවත්වන්නෝ වමු. වේද සංඛ්‍යාත ඥාණයෙහි කෙළවරට පැමිණියේ වෙමු. මේ වනාහි අන්තිම බඹලොව උපතයි, අන්‍ය බොහෝ ජනයා අප ප්‍රාර්ථනා කරති" යැයි කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මයා අමතා "බක බ්‍රහ්මය, නුඹ යම් ආයුෂයක් දීර්ඝායුෂ යැයි හඟින්නෙහි ද, එය දීර්ඝායුෂයක් නොවේ. නුඹගේ ඉතිරි වූ ආයුෂය නිරබ්බුද ලක්ෂයක්[1] යැයි මම දනිමි" යැයි වදාළ සේක.

බක බ්‍රහ්මයා භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ ඇසුවේ ය. භාග්‍යවතුනි, මම අනන්තදර්ශී වෙමි යැයි ද ජාතිය හා ජරාව ද ශෝකය ඉක්ම සිටියෙම් වෙමි යැයි ද කියන්නෙහි ය. මාගේ පෙර කර්මය කුමක්ද සමාදන් වූ ව්‍රතය කුමක් ද? ශීලය කුමක් ද? යමක් මම නුඹ වහන්සේගෙන් අසා දැන ගන්නෙම් ද එය මට කියනු මැනව.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "ග්‍රීෂ්ම කාලයෙහි පිපාසයෙන් පීඩිත වූ බොහෝ මිනිසුන්ට තෝ පැන් පෙවූවෙහි ද, තාගේ ඒ පුරාතන වූ ව්‍රත සමාදානය හා ශීලය නිදා පිබිදිය කෙනෙකු මෙන් මම සිහි කරමි.

ඒණි නම් ගංතෙර සොරුන් විසින් අල්ලා ගෙන අතපය බැඳගෙන යනු ලබන්නා වූ මිනිසුන් යම් හෙයකින් එම සොරුන්ගෙන් අත මිදෙව්වේ ද, තාගේ ඒ පුරාතන ව්‍රත සමාදානය හා ශීලය මම සිහි කරමි.

[1] එකයි බින්දු හතළිස් දෙකක ඉලක්කමකි

"මිනිසුන් විනාශ කරනු කැමැත්තෙන් ආවා වූ රෞද්‍ර නාගයා විසින් ගඟ දියෙහි දී ගන්නා ලද නැව බලහත්කාරයෙන් ඒ නාගයා මැඩ මිදුවෙහි ය. ඒ තාගේ පුරාතන වූ ව්‍රත සමාදනය හා ශීලය මම සිහි කරමි.

එක් කලෙක මම කප්ප නමින් නුඹගේ අතවැසියකු වූයෙමි. එකල්හි මම නුඹ මනා නුවණැත්තෙකු වශයෙන් ද, මනා ව්‍රත සම්පන්නයකු ලෙස ද සිතුවෙමි. එසේ වූ තාගේ ව්‍රත සමාදනය හා ශීලය මම සිහි කරමි."

එවිට බක බ්‍රහ්මයා භාග්‍යවතුන් වහන්සේ අමතා මෙසේ කීවේය. නුඹ වහන්සේ මාගේ ආයුෂ ඒකාන්තයෙන් දන්නෙහි ය. සෙසු සියල්ල ද දන්නෙහි ය. එසේ හෙයින් ම නුඹ වහන්සේ බුද්ධ වෙහි ය. එහෙයින් ඔබගේ මේ දිලිසෙන ආනුභාවය බඹ ලොව මුළුල්ලෙහි බබුළුවමින් සිටී.

ඉක්බිතිව පාපී මාර තෙම බ්‍රහ්ම පාරිසජ්ජ බඹලොව එක්තරා බ්‍රහ්මයෙකුට ආවේශ වී භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේ ය. ශ්‍රමණය, ශ්‍රමණය! මේ බ්‍රහ්ම පදවියට නින්ද නො කරව, මෙයට නින්ද නො කරව, ශ්‍රමණය මේ බ්‍රහ්මයා වනාහි මහා බ්‍රහ්මයා ය. අන්‍යයන් මැඩ පවත්වන්නේ ය. අන් බ්‍රහ්මයන් අභිභවනය කොට මැඩ පවත්වා සිටියි. ඒකාන්තයෙන් සියල්ල දක්නේ ය. සියල්ලන් තමන් වසඟයෙහි පවත්වයි. ලෝකයට අධිපති ය. ලොවෙහි කර්තෘ ය, පෘථිවිය, හිමවත, මහා මේරුව, සක්වළ මහා සමුද්‍රය ආදී සියල්ල මවන්නාය, ලෝක ශ්‍රේෂ්ඨයා ය. ලෝකවාසී සත්වයන් "නුඹ ක්ෂත්‍රියයෙක් වෙව, නුඹ බ්‍රාහ්මණයෙක් වෙව, නුඹ වෛශ්‍ය වෙව, නුඹ ශුද්‍රයෙකු වෙව, නුඹ පැවිද්දෙකු වෙව, නුඹ ගිහියෙකු වෙව යනාදී උඩත් පිරිසෙයින් ද, නුඹ ඔටුවෙක් වෙව, නුඹ ගොනෙක් වෙව යනාදී ලෙස යටත් පිරිසෙයින් ද බෙද දක්වමින් ලොව සකස් කරන්නේ ය. උපන්නා වූ ද, උපදිමින් සිටින්නා වූ ද සත්වයින්ගේ පියා ය.

ශ්‍රමණය, ඔබ ඉපදීමට පෙර ද ලෝකයෙහි අනිත්‍යය දුකය යනාදීන් කියා පඨවි ධාතුවට ගරහන්නා වූ පඨවි ධාතුව පිළිකුල් කරන්නා වූ, ආපෝ ධාතුවට ගරහන්නා වූ, ආපෝ ධාතුව පිළිකුල්

කරන්නා වූ, තේජෝ ධාතුවට ගරහන්නා වූ, තේජෝ ධාතුව පිළිකුල් කරන්නා වූ, වායෝ ධාතුවට ගරහන්නා වූ, වායෝ ධාතුව පිළිකුල් කරන්නා වූ, භූතයන්ට ගරහන්නා වූ භූතයන් පිළිකුල් කරන්නා වූ, දෙවියන්ට ගරහන්නා වූ, දෙවියන් පිළිකුල් කරන්නා වූ, මාරයාට ගරහන්නා වූ, මාරයා පිළිකුල් කරන්නා වූ, බ්‍රහ්මයාට ගරහන්නා වූ, බ්‍රහ්මයා පිළිකුල් කරන්නා වූ ඔබ වැනි ශ්‍රමණය බමුණෝ වූහ. ඔවුහු කය බිඳීමෙන් දිවි සිඳීමෙන් සතර අපායෙහි උපන්නාහුය.

ශ්‍රමණය, නුඹ ඉපදීමට පෙර ද ලෝකයෙහි පඨවි ධාතුව ප්‍රශංසා කරන්නා වූ පඨවි ධාතුවට සතුටු වන්නා වූ, ආපෝ ධාතුවට ප්‍රශංසා කරන්නා වූ, ආපෝ ධාතුවට සතුටු වන්නා වූ, තේජෝ ධාතුවට ප්‍රශංසා කරන්නා වූ තේජෝ ධාතුවට සතුටු වන්නා වූ, වායෝ ධාතුවට ප්‍රශංසා කරන්නා වූ වායෝ ධාතුවට සතුටු වන්නා වූ, භූතයන්ට ප්‍රශංසා කරන්නා වූ භූතයන්ට සතුටු වන්නා වූ, දෙවියන්ට ප්‍රශංසා කරන්නා වූ දෙවියන්ට සතුටු වන්නා වූ, බ්‍රහ්මයාට ප්‍රශංසා කරන්නා වූ බ්‍රහ්මයාට සතුටු වන්නා වූ, ශ්‍රමණය බමුණෝ සිටියහ. ඔවුහු කය බිඳීමෙන් දිවි සිඳී මෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශ්‍රමණය, එහෙයින් මම ඔබට මෙසේ කියමි. නිදුකාණෙනි, බ්‍රහ්ම තෙමේ යමක් ඔබට කීවේ ද, ඔබ එයම කරව, ඔබ බ්‍රහ්මයාගේ වචනය, නො ඉක්මව, ශ්‍රමණය, ඉදින් ඔබ බ්‍රහ්මයාගේ වචනය, ඉක්මවන්නෙහි නම්, යම් සේ පුරුෂයෙක් තමා වෙතට එන්නා වූ ශ්‍රී කාන්තාව සිවු රියන් මුගුරක් ගෙන එළවා දමන්නාක් වැනි ය. තව ද ශ්‍රමණය, යම් පුරුෂයෙක් ගැඹුරු මහ වලක වැටෙන්නේ අතින් ද, පයින්ද පොළොවෙහි අල්ලා ගත යුතු පා තැබිය යුතු තැන් අතහැරී වළට වැටෙන්නේ ද ශ්‍රමණය, ඔබට ද මෙසේ ම වන්නේ ය. නිදුකාණෙනි, එබැවින් යමක් බ්‍රහ්ම තෙම කීවේ ද, ඔබ එයම කරව. ඔබ බ්‍රහ්මයාගේ වචනය නො ඉක්මව, ශ්‍රමණය, ඔබ මෙහි බබළමින් දිලිසෙමින් රැස්ව සිටින්නා වූ බ්‍රහ්මයාගේ අවවාදයෙහි පිහිටා මහත් ආනුභාව සම්පන්න ව සිටින්නා වූ බ්‍රහ්ම පිරිස නො දක්නෙහි ද?' ශ්‍රමණය නුඹත් මහ බඹහුගේ වචනය නො ඉක්මවා බ්‍රහ්මයා විසින් යමක් කියන්නෙහි ද, එසේ කරව. එවිට නුඹ ද මේ බ්‍රහ්මයන් මෙන් යයසින් ද ශ්‍රීයෙන් ද බබළන්නේ ය යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ද බ්‍රහ්ම පිරිසට සම කොට කීවේ ය.

මේ වසවත් මාරයා වනාහි කලින් කල තමාගේ භවනයෙහි ම හිඳ ශ්‍රමණ ගෞතමයන් අද කොහේ ඉන්නේ ද, කවර ගමක හෝ නියම්ගමක වෙසේ ද යැයි ශාස්තෲන් වහන්සේ පිළිබඳව සොයා බලන්නේ ය. එදින ද ශාස්තෲන් වහන්සේ ගැන සොයා බලන කල්හි උක්කට්ඨා නුවර ඇසුරු කොට සුභග වනය වෙසෙයි. දැන් කොහේ ගියේ ද යැයි සොයා බලන්නේ බ්‍රහ්ම ලෝකයට යන වඩින බව දැක **"ශ්‍රමණ ගෞතමයන් බඹ ලොවට යයි. එහි ගොස් දහම් දෙසා බ්‍රහ්ම සමූහයා මාගේ විෂය නො ඉක්මවා ද, ඊට ප්‍රථමයෙන් බඹ ලොවට ගොස් ධර්ම ශ්‍රවණයට ඇති කැමැත්ත නැති කරන්නෙමි"** යැයි සිතා ශාස්තෲන් වහන්සේ යන පියවර අනුව ම ගොස් බ්‍රහ්ම පිරිස මැද නොපෙනෙන ශරීරයෙන් යුතුව සිට ශාස්තෲන් වහන්සේ බක බ්‍රහ්මයා කෙරෙහි අප්‍රසාදය පළ කළ අවස්ථාවෙහි බ්‍රහ්ම පාරිසජ්ජ බඹ ලොව එක් බ්‍රහ්මයෙකුට ආරූඪ වී බ්‍රහ්මයාට සහාය වීම් වශයෙන් සිට මෙසේ කීවේ ය. මේ මාරයාට බ්‍රහ්ම පාරිසජ්ජ බඹලොව වෙසෙන බ්‍රහ්මයන්ට පමණක් ආරූඪ විය හැකිය ඉන් මත්තෙහි පිහිටි බ්‍රහ්ම පුරෝහිත මහා බ්‍රහ්ම ආදී බඹලොව බ්‍රහ්මයන්ට ඇරූඪ විය නොහැකිය.

මාරයා මෙසේ කී කල්හි බුදුරජාණන් වහන්සේ මාරයා අමතා "පාපිය, මා තා නොදන්නේය යැයි නො සිතව. නුඹ මහ ජනයා මරණ හෙයින් මාරයා වෙහිය, මහ ජනයාට පවිටු වූ ලාමක වූ විපත් පමුණුවන බැවින් පාපී මාරයා ය. මම තා දනිමි. යම් බ්‍රහ්මයෙකුත් වේ ද, යම් බ්‍රහ්ම පිරිසකුත් වේ ද, යම් පිරිවර බ්‍රහ්මයෝත් වෙත් ද, ඒ සියල්ල තාගේ අතට අසු වූහ. ඒ සියලු දෙනාම තාගේ වසඟයට ගියාහුය. පාපීය, නුඹට වනාහි මෙබඳු අදහසක් වෙයි. මේ තෙමේත් මට අසු වූවෙකු වන්නේ ය. මට වසඟ වූවෙකු වන්නේය යැයි මෙබඳු අදහසක් වන්නේ ය. පාපීය, මම වනාහි තාගේ අතට අසු වූයේ නොවෙමි. ඔබට වසඟ වූයේ නොවෙමි" යැයි වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ කල්හි බක බ්‍රහ්ම තෙම බුදුරජාණන් වහන්සේට මෙසේ කීවේ ය. "නිදුකාණෙනි, මම වනාහි නිත්‍ය වූවක්ම නිත්‍ය යයි කියමි. ස්ථිර වූවක්ම ස්ථිරයි කියමි. සදාකාලික වූවක්ම සදාකාලිකයි කියමි. ච්‍යුත නොවන ස්වභාව ඇත්තක් ම ච්‍යුත නොවන ස්වභාව ඇත්තක් යයි කියමි. යම් තැනක වනාහි නූපදී ද, නොදිරයි ද, ච්‍යුත නොවේ ද, නැවත නූපදී ද, එයම මම මෙහි නූපදී

යයි ද, නොදිරයි යයි ද, චුත නොවේය යයි ද, නොමැරෙයි යයි ද, නැවත නූපදී යයි ද කියමි. මෙයින් අන්‍ය වූ මත්තෙහි නිර්වාණයක් නැති හෙයින් ම අන්‍ය වූ නිර්වාණයක් නැතැයි කියමි. ශ්‍රමණය, ඔබට පෙර ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පහළ වූහ. ඔබගේ මුලු ආයුෂය යම් පමණක් වේ ද, ඔවුන්ගේ තපස් කිරීමේ කාලය එපමණ විය. ඔවුහු වනාහි මෙසේ දන්නාහ:- කෙසේ ද? මත්තෙහි අන්‍ය වූ නිර්වාණයක් ඇත්නම් ඇත කියා ද, මත්තෙහි අන්‍ය වූ නිර්වාණයක් නැත්නම් නැතැයි කියා ද දන්නාහුය. ශ්‍රමණය, මම ඔබට මෙසේ කියමි. නුඹ ද මෙයින් අන්‍ය වූ මත්තෙහි නිර්වාණයක් නො දක්නෙහිය. එය සොයන්නට යෑමෙන් නුඹ ම ක්ලාන්තයට, වෙහෙසට පත් වන්නෙහි ය. ශ්‍රමණය, ඉදින් වනාහි ඔබ පඨවි ආපෝ තේජෝ වායෝ ධාතූන් කෙරෙහි ද, භූතයන්, දෙවියන්, මාරයන්, බ්‍රහ්මයන් කෙරෙහි ද තෘෂ්ණා දෘෂ්ඨි මාන වශයෙන් ගැලී ගන්නෙහි නම් මා මෙන් මෙම බඹලොව ඕපපාතිකව උත්පත්ති වශයෙන් පැමිණෙව. මා අනුව යාම ඊම ආදිය කරන්නෙක් වෙව. මා මෙන් බඹ ලොවට අධිපති වෙව. මාගේ කැමත්ත පරිද්දෙන් කටයුතු කිරීමෙන් ඔබට එය කළ හැකි වන්නෙහිය" යැයි කියා තමන් සියල්ල දන්න බව හඟවමින් භාග්‍යවතුන් වහන්සේට අවමන් කොට මෙසේ කීවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මය, මම ද මෙය දනිමි. ඉදින් පඨවි ආපෝ තේජෝ වායෝ ධාතූන් කෙරෙහි ද, භූතයන්, දෙවියන්, මාරයන්, බ්‍රහ්මයන් කෙරෙහි ද තෘෂ්ණා දෘෂ්ඨීන් ගැලී ගන්නෙම් නම් නුඹගේ සමීපයෙහි උපදින්නෙක් වන්නෙමි. නුඹගේ වසඟයෙහි පවතින්නෙක් වන්නෙමි. නුඹ විසින් කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි. අතිශයින් පහත් කට යුත්තෙක් වන්නෙමි. යැයි වදාළ සේක.

එවිට බක බ්‍රහ්මයා භාග්‍යවතුන් වහන්සේ අමතා "නිදුකාණෙනි, බක බ්‍රහ්මයා මෙබඳු මහත් ඍද්ධි ඇත්තෙක, මෙබඳු මහත් ආනුභාව ඇත්තෙක, මෙබඳු මහේශාක්‍ය වූවෙකි යැයි කෙසේ නම් ඔබ මාගේ ගතිය දන්නෙහි ද? ආනුභාවය දන්නෙහි ද?" යැයි ඇසී ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

**"යාවතා චන්දිමසූරියා - පරිහරන්ති දිසා භන්ති විරොචනා**
**තාව සහස්සධා ලොකො- එත්ථ තෙ වත්තතෙ වසො"**

රශ්මියෙන් බබළන්නා වූ චන්ද්‍ර සූර්‍ය දෙදෙනා යම් පමණ තැන්හි සැරිසරත් ද, ඒ දිසාවන් බබුළුවමින් දීප්තිමත් වෙත් ද, එසේ ආලෝකවත් වන ප්‍රදේශය මෙම ලෝක ධාතුවත් ඇතුළත් ව දහසක් සක්වළ සහ ශ්‍රී ලෝක ධාතුව නම් වෙයි. මේ දහසක් ලෝක ධාතුව නුඹගේ බල පරාක්‍රමය පැවැත්විය හැකි ප්‍රමාණය වන්නේ ය.

**"පරොවරඤ්ච ජානාසි - අථො රාගවිරාගිනං;**
**ඉත්ථභාවඤ්ඤථාභාවං - සත්තානං ආගතිං ගතින්ති"**

මේ සක්වළ දහසෙහි වෙසෙන්නා වූ උසස් පහත් වූ ද, හීන ප්‍රණීත වූ ද සත්වයන් දන්නෙහි ය. තව ද සරාගික වූ ද විරාගික වූ ද සත්වයන් ද, මේ සක්වළ ද අන් සක්වළවල් එකුන් දහස ද (නවසිය අනූ නවය) ඒ සක්වළ දහස අතර සත්වයින්ගේ ප්‍රතිසන්ධි වශයෙන් ඊම ද, ච්‍යුති වශයෙන් යාම ද දන්නෙහි ය.

බ්‍රහ්මය, නුඹට මම ඊට වඩා මහත් කරුණක් කියමි. නුඹ දන්නේ මේ දහසක් ලෝක ධාතුව පිළිබඳ වූ දේ පමණකි. එබැවින් නුඹ සහශ්‍රී බ්‍රහ්ම නම් වේ. බ්‍රහ්මය, නුඹ දන්නා වූ මේ සහශ්‍රී ලෝක ධාතුව ඉක්මවා පිහිටියා වූ ද්වී සහශ්‍රී ලෝක ධාතුව ත්‍රී සහශ්‍රී ලෝක ධාතුව චතු සහශ්‍රී ලෝක ධාතුව පඤ්ච සහශ්‍රී ලෝක ධාතුව දස සහශ්‍රී ලෝක ධාතුව සහශ්‍රී ලෝක ධාතුව සහස්‍ර සහශ්‍රී ලෝක ධාතුව තුළ වෙසෙන බ්‍රහ්මයන්ගේ ප්‍රමාණයක් නැත. ඒ අනුව බලන විට නුඹ සතර රියන් රෙදි කඩක් ගැනීමට උත්සාහ දරන්නෙකු වැනිය යැයි නිග්‍රහ කරමින් වදාළ සේක.

බ්‍රහ්මය, මේ ලෝක ධාතුවෙහි ම මේ මහා බ්‍රහ්ම තලයට ඉහළින් පිහිටි ආභස්සරය, සුභකිණ්හකය, වේහප්ඵලය යැයි අන්‍ය වූ තවත් බ්‍රහ්ම ලෝක තුනක් ඇත්තේමය. නුඹ එය ද නොදන්නෙහිය, නොදක්නෙහිය. මම එය ද දනිමි. දකිමි. බ්‍රහ්මය යම් තැනකින් ච්‍යුතව නුඹ මෙහි උපන්නේ ද, එය ද මම දනිමි. නුඹ පෙර බුදු කෙනෙකුන් ලොව නූපන් කාලයක තවුස් පැවිද්දෙන් පැවිදි ව කසිණ භාවනා වඩා නො පිරිහුණු ධ්‍යාන ඇතිව කළුරිය කොට චතුර්ථ ධ්‍යාන භූමිය වූ

වේහප්ඵල බඹ ලොව ඉපද මහා කල්ප පන්සියයක් එහි විසුවේ ය. නුඹ එහි ආයුෂය කෙළවර කොට වැස තෘතිය ධ්‍යානය ප්‍රණීත වශයෙන් වඩා තෘතිය ධ්‍යාන බඹ තලයෙහි ප්‍රණීත භූමිය වූ සුභකිණ්හක බඹලොව ඉපද මහා කල්ප සිව් සැටක් එහි විසුවේ ය. නුඹ එහි දී ද්‍විතිය ධ්‍යානය ප්‍රණීත වශයෙන් වඩා එයින් ච්‍යුතව ද්‍විතිය ධ්‍යාන භූමියෙහි ප්‍රණීත තලය වූ ආභස්සර බඹලොව ඉපද මහා කල්ප අටක් එහි විසුවෙහි ය. නුඹ එහි දී ප්‍රථම ධ්‍යානය ප්‍රණීත වශයෙන් වඩා මහා කල්පයක් ආයුෂය ඇති මෙහි උපන්නෙහි ය. නුඹ ඉතා දීර්ඝ කාලයක් මේ ඉහළ බඹ තලයන්හි වාසය කොට එයින් ච්‍යුතව ප්‍රතිසන්ධි වශයෙන් පහළට ආ බව අමතක වී ඇත. එහෙයින් නුඹ එය නොදන්නෙහි ය. නොදක්නෙහි ය. මම එය ද දනිමි. දකිමි. බ්‍රහ්මය මේ දැනීමෙන් මම නුඹට සම නොවන්නෙමි, පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මම ම නුඹට වඩා උසස් වෙමි යැයි වදාළ සේක.

මේ බ්‍රහ්මයා මෙහි උපන් මුල් කාලයෙහි තමන් කළ කර්‍මය ද, උපන් තැන් ද දැන ගත්තේ ය. එහෙත් කල් යාමෙන් ශාස්වත දෘෂ්ටිය ඉපදවූ තැන් පටන් එය අමතක ව ගියේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි බක බ්‍රහ්මයා මෙසේ සිතුවේ ය. "**මේ ශ්‍රමණ භවත් ගෞතමයෝ මගේ ආයුෂය ද, උපන් තැන් ද, පෙර කරන ලද කර්‍මයන් ද සියල්ල දනිති. හොඳයි මම පෙර කල කර්‍මය විචාරමි**" යැයි සිතා තමන් විසින් පූර්‍වයෙහි දී කරන ලද කර්‍මය ශාස්තෲන් වහන්සේගෙන් විචාළේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

බ්‍රහ්මය, නුඹ අතීතයෙහි බ්‍රාහ්මණ කුල ගෙයක ඉපද කාමයන්හි ආදීනව දැක ජරා ව්‍යාධි මරණ දුරු කරන්නෙමි යැයි සෘෂි පැවිද්දෙන් පැවිදි ව ධ්‍යාන අභිඥා සමාපත්තීන් උපදවා ගං ඉවුරක පන්සලක් කරවා ධ්‍යාන සුව විඳිමින් කල් යැවීය. එකල්හි කලින් කල සාර්‍ථවාහකයෝ[1] ගැල් පන්සියයක බඩු පටවාගෙන මාරක කාන්තාරයට පිවිසියහ. ඒ මරු කතර දහවල් කාලයෙහි යෑමට නොහැකි බැවින් රාත්‍රී කාලයෙහි දීම ගමන් යෑම වේ. එකල්හි මුල් කරත්තයෙහි බැඳි ගවයෝ නතර වෙවී

[1] කරත්තවලින් බඩු විකුණන්නෝ

ගමින් කරකැවී නැවත පළමු ව ආ මගට ම සේන්දු වූහ. සියලු කරත්ත එසේ නැවතුණහ. හිරු නැගි කල්හි කරත්ත ඒ කාන්තාරයෙහි නැවතී ඇති බව දැන ගත්හ. එදින වනාහි ඔවුහු කාන්තාරයෙන් එතර විය යුතු දවස විය. සියලු ජලය ද දර ද අවසන් වී තිබුණි. එබැවින් ඔවුහු **"අපගේ ජීවිත නැත"** යැයි සිතා ගවයන් කරත්ත රෝදවල බැඳ මිනිස්සු ඒ කරත්තවල සෙවණැලි යට නිදා ගත්හ. එදින මේ තාපසයා කලින් ම පන්සලෙන් නික්ම පන්සල් දොර සිට ගඟේ පෙරළී එන්නා වූ ජල කඳ මැණික් කැට මෙන් දැක **"මෙබඳු මිහිරි ජලය නො ලැබීමෙන් දුක් විඳින සත්වයෝ ඇත් ද?"** යැයි සිතුවේ ය. ඔහු මෙසේ ආවජිනා කරමින් සිටියදී මරු කතර දිය නොලැබ සිටින ගැල් සාත්තුව දැක **"මේ සත්වයෝ නො නැසෙත්වා, මේ මහා දිය කඳ සිඳී මරු කතර කරත්ත කරුවන්ට පෙනෙන සේ ඉදිරියෙන් යේවා"** යැයි අභිඥා චිත්තයෙන් අධිෂ්ඨාන කළේ ය. එසේ සිතීමත් සමගම ඇලකින් ගලා යන්නා සේ ජලය එහි ගලා ගියේ ය. මිනිස්සු දිය හඬින් නැගිට ජලය දැක සතුටු වී දිය නා බී ගොනුන්ට ද පොවා සුව සේ තමන් කැමති තැනට ගියහ. ශාස්තෲන් වහන්සේ ඒ බ්‍රහ්මයාගේ පූර්ව කර්මය දක්වමින් මෙසේ වදාළ සේක.

**"යං ත්වං අපායෙසි බහූ මනුස්සෙ,**
**පිපාසිතෙ ඝම්මනි සම්පරෙතෙ,**
**තං තෙ පුරාණං වතසීලවත්තං,**
**සුත්තප්පබුද්ධොව අනුස්සරාමි"**

බ්‍රහ්මය, නුඹ හටගත් සා පිපාස ඇති, ග්‍රීෂ්මයෙන් අතිශයින් පීඩිත ව ක්ලාන්ත වූ බොහෝ මිනිසුන්ට පැන් පෙවූහ. නුඹ විසින් කරන ලද ඒ පැරණි ව්‍රත සමාදනය හා සීලය නිදා පිබිදියෙකු අලුයම දුටු සිහිනයක් මෙන් සිහි කරමි.

තව ද ශාස්තෲන් වහන්සේ ඔහුට තවත් පූර්ව කර්මයක් දක්වමින් මෙසේ වදාළ සේක.

බ්‍රහ්මය, නුඹ මෑත කාලයෙහි තාපසයෙකු ව එක් ගමක් අසල පන්සලක වාසය කළේ ය. ඒ කාලයෙහි සොරු ඒ ගම කොල්ල කමින් මිනිසුන්ගේ හස්ත සාර වස්තුව ද, ගවයන් දෙනුන් ආදී ජංගම වස්තූන්

ද පැහැර ගෙන යති. ගව දෙනුන් ද සුනඛයෝ ද මිනිස්සු ද මහ හඬින් හඬති. තාපසයා එම ශබ්දය අසා මේ කිමෙක් ද යැයි ආවර්ජනා කොට බලන්නේ මිනිසුන්ට බියක් ඇති වූ බව දැක **"මා දක්නා කල්හි මේ සත්වයෝ නො නසිත්වා"** යැයි අභිඥා පාදක ධ්‍යානයට සමවැදී නැගී සිට අභිඥා චිත්තයෙන් සොරුන්ගේ ඉදිරියට පැමිණෙන සිවුරඟ සෙනගක් මවා පෑවේ ය. සොරු ඒ සිවුරඟ හමුදාව දැක රජු ආවේය යැයි පැහැර ගත් වස්තූන් ද දමා පලා ගියහ. ඒ තාපසයා **"යම් භාණ්ඩයක් යම් කෙනෙකුන්ට අයත් වේ නම් ඒ සියල්ල ඔවුන්ට ම හිමි වේවා"** යැයි අධිෂ්ඨාන කළේ ය. ඒ සමගම එලෙස සිදු විය. මහ ජනයා දුකින් මිදී සැපතට පැමිණියහ. ශාස්තෘන් වහන්සේ ඒ බ්‍රහ්මයාගේ පූර්ව කර්මය දක්වමින් මෙසේ වදාළ සේක.

**"යං එණිකූලස්මි ජනං ගහීතං**
**අමොචයී ගය්හක නීය්‍යමානං;**
**තං තෙ පුරාණං වතසීලවත්තං,**
**සුත්තප්පබුද්ධොව අනුස්සරාමි"**

"ඒනි නම් නදී තීරයෙහි සොරුන් විසින් බලහත්කාරයෙන් අල්ලාගෙන ගෙන යන ලද සත්වයෝ මේ තාපසයා විසින් මුදවන ලද්දේය. නුඹ විසින් කරන ලද ඒ පැරණි ව්‍රත සමාදානය හා සීලය නිද පිබිදියෙකු අලුයම දුටු සිහිනයක් මෙන් සිහි කරමි"

ශාස්තෘන් වහන්සේ ඔහුට තවත් පූර්ව කර්මයක් දක්වමින් මෙසේ වදාළ සේක.

නැවත ද එක් කලෙක ගංගාවක ඉහළ කොටසෙහි ජීවත් වන මිනිස්සු එම ගඟෙහි පහළ කොටසෙහි ජීවත් වන මිනිස්සු සමග සමගි සම්පන්න ව නැව් අඟුල ගෙන බොහෝ කන බොන දෑ පුරවා ගෙන මල් දම් ආදියෙන් සැරසී ගඟ දියෙන් එති. මේ මිනිස්සු දිව්‍ය විමානයකින් යන අය මෙන් ඉතා ප්‍රීතිමත් ව ගීතිකා ගයමින් නටමින් යන්නාහුය. එකල්හි ඒ ගඟෙහි වාසය කරන්නා වූ එක් බලවත් නාග රාජයෙක් ඒ පිරිස දැක **"මොවුහු මා කෙරෙහි කිසිඳු ගරු සරුවක් නැතිව ගමන් කරති"** යැයි කිපී **"මේ සියලු දෙනා මුහුදට ඇද දමන්නෙමි"** යැයි සිතා මහත් වූ නාග වේශයක් මවාගෙන ගඟ දිය දෙබෑ කොට මහත්

පෙනයක් මවා ඒ සුසුම් ලමින් පිඹිමින් මනුෂ්‍යයන් පසුපස එළවීය. ඒ මහ ජනයා එම නාග රාජයා දැක බියට පත්ව මහත් හඬින් කෑ ගැසූහ. මේ වේලාවෙහි පන්සලෙහි හුන් තාපසයා ඒ කුමන ශබ්දයක් ද යැයි විමසා බලා නාග රාජයා දැක **"මා බලා සිටියදී මේ සත්වයෝ විනාශ නොවේවා"** යැයි අභිඥා පාදක ධ්‍යානයට සමවැදී තම මිනිස් වෙස අතහැර මහත් ගුරුළු වේශයක් මවාගෙන නා රජු හමුවෙහි පෙනී සිටියේ ය. එවිට ඒ නාග රාජයා බියට පත්ව පෙනය හකුළුවා ගෙන දිය යටට ගියේ ය. මහ ජනයා සැපයට පැමිණියහ. ශාස්තෘන් වහන්සේ ඒ බ්‍රහ්මයාගේ පූර්ව කර්මය දක්වමින් මෙසේ වදාළ සේක.

**"ගඞ්ගාය සොතස්මිං ගහීතනාවං,**
**ලුද්දෙන නාගෙන මනුස්සකප්පා;**
**අමොචයි ත්වං බලසා පසය්හ,**
**තං තෙ පුරාණං වතසීලවත්තං;**
**සුත්තප්පබුද්ධොව අනුස්සරාමි"**

"ගඟ දියෙහි නැව්වලින් යන්නා වූ මහ ජනයා නසනු කැමතිව ගඟ දියෙන් මතු වූ දරුණු වූ නාග රාජයාගේ බලය මැඩ පවත්වා මිනිසුන් උවදුරුවලින් මුදවාලීය. නුඹ විසින් කරන ලද ඒ පැරණි ව්‍රත සමාදනය හා සීලය නිදා පිබිදියෙකු අලුයම දුටු සිහිනයක් මෙන් සිහි කරමි"

නැවත ද මොහු ඍෂි පැවිද්දෙන් පැවිදි ව **"කේසව තාපසයා"** නමින් ප්‍රසිද්ධ ව සිටියේ ය. එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සේ **"කප්ප"** නම් තරුණයෙකු ව ඒ කේසව තාපසයාගේ වත් පිළිවෙත් කරන අතවැසියා වූයේ ය. එකල්හි **"නාරද"** නම් ඇමතියා අසනීපයෙන් සිටි ඒ කේසව තාපසයා බරණැස් නුවර සිට හිමවත වාසය කළා වූ කප්ප නම් අතවැසියා සමීපයට කැඳවාගෙන ආවේ ය. එහි දී ඒ අතවැසියා තම ආචාර්යවරයාගේ රෝගය බලා සන්සිඳවූයේ ය. කේසව තාපසයා හිමවතට ඇරලා නාරද ඇමතියා නැවත බරණැසට ම ගියේ ය. පසු කාලයෙහි ඒ නාරද නම් ඇමතියා නැවත කේසව තාපසයන් බැලීමට හිමවතට පැමිණියේ ය. එහි දී ඔහු නිරෝගී ව සිටිනු දැක මෙසේ කීවේය.

**"මනුස්සින්දං ජහිත්වාන - සබ්බකාමසමිද්ධිනං;**
**කථං නු භගවා කෙසි - කප්පස්ස රමති අස්සමෙ'ති"**

"තමා කැමති සියලුම දෑයින් සපිරි රජු අතහැර කෙසේ නම් කේසව තාපසයන් වහන්සේ කප්ප තාපසයාගේ අසපුවෙහි සිත් අලවා වෙසෙන්නේ ද?"

ඒ නාරද ඇමතියාට පිළිතුරු දෙන්නා වූ කේසව තවුසා මෙසේ කීවේ ය.

**"සාධූනි රමණීයානි - සන්ති වක්ඛා මනොරමා;**
**සුභාසිතානි කප්පස්ස - නාරද රමයන්ති මං"**

"නාරදය, කප්ප තවුසාගේ රමණීය වූ සුභාෂිත වචනය මිහිරිය. වනපෙත ද සිත්කලු ය. මේ හැම දෙයක් ම මා සතුටු කරයි.

භාග්‍යවතුන් වහන්සේ පූර්වයෙහි මෙසේ ඔහුගේ අතවැසියා වී ඔහුගේ රෝගය සුව කළ බව පැහැදිලි කරමින් මෙසේ වදාළ සේක.

**"කප්පො ච තෙ බද්ධචරො අහොසි**
**තං බුද්ධිමන්තං වතිනං අමඤ්ඤිං;**
**තං තෙ පුරාණං චතසීලවත්තං,**
**සුත්තප්පබුද්ධොව අනුස්සරාමි"**

බ්‍රහ්මය, නුඹ කේසව තාපස ව සිටි කාලයෙහි මම කප්ප නුඹට වත් පිළිවෙත් කරන අතවැසියෙකු වීම. එකල්හි නුඹ බුද්ධිමතෙකු ය, මනා වෘත ඇතියෙකු ය යැයි සිතීමි. නුඹ විසින් කරන ලද ඒ පැරණි වෘත සමාදනය හා සීලය නිදා පිබිදියෙකු අලුයම දුටු සිහිනයක් මෙන් සිහි කරමි" යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මේ සියල්ල වදළේ ඒ බ්‍රහ්මයා දැනුවත් කිරීම පිණිස ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒ බ්‍රහ්මයා විසින් පූර්ව ආත්ම භාවයන්හි දී කළ කර්මයන් හෙළි කොට වදාළ සේක. ශාස්තෲන් වහන්සේ මෙසේ වදරද්දී ම පහන් දහසක් දල්වෙන කල්හි සෙවණැලි පෙනෙන්නාක් මෙන් එම බ්‍රහ්මයාට පූර්ව කර්ම සියල්ලම ප්‍රකට වූයේ ය. ඉන් පසු ඒ බක බ්‍රහ්මයා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණු සිතින් යුතුව ස්තුති කරමින් මෙසේ කීවේ ය.

**"අද්ධා පජානාසි මමෙතමායුං,**
**අඤ්ඤම්පි ජානාසි තථා හි බුද්ධො;**
**තථා හි ත්‍යායං ජලිතානුභාවො,**
**ඔභාසයං තිට්ඨති බ්‍රහ්මලොකන්ති"**

"නිඳුකාණෙනි, නුඹ වහන්සේ මාගේ ආයු ප්‍රමාණය ඒකාන්තයෙන් දන්නේ ය. වෙනත් දේවල් ද දන්නේ ය. ඒ නිසා නුඹ වහන්සේ "බුද්ධ" නම් වන්නේ ය. බුදුවරුන්ට වනාහි තේරුම් ගත නොහැකි කිසිවක් නැත. සියලු ධර්මයන් අවබෝධ කළ බැවින් ම එබඳු උතුමන් "බුද්ධ" නම් වෙති. එසේ බුදු වූ බැවින් ම නුඹ වහන්සේගේ දිලිසෙන ශරීර ප්‍රභාව මුළු මහත් බඹලොව බබුළුවමින් සිටී" යැයි කීවේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මත්තෙහි ද තමන් වහන්සේ බ්‍රහ්මයාට අසම බව ප්‍රකාශ කරමින් මෙසේ වදාළ සේක.

"බ්‍රහ්මය, මම පඨවි ධාතුව, පඨවි ධාතුව වශයෙන් ද, එය හටගන්නා හේතුව ද, එයින් නිදහස් වූ පඨවි ස්භාවයට නො පැමිණි යම් නිවනක් වේ නම් එය ද ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන පඨවි ධාතුව තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ද ආත්ම වශයෙන් ද නො ගනිමි" යැයි වදාළ සේක.

මෙහි දී පඨවි ධාතුව "**ලක්ෂණ පඨවි, සසම්භාර පඨවි, ආරම්මණ පඨවි, සම්මුති පඨවි**" යැයි චතුර්විධ වේ.

එහි තම ශරීරයෙහි ඇත්තා වූ කෙස් ලොම් නිය දත් ආදී කර්කශ ගතියෙන් හා තද ගතියෙන් යුක්ත වූ යම් කොටස් වේ ද මෙය **"ලක්ෂණ පඨවි"** නම් වේ.

එසේ ම ආධ්‍යාත්මික වූ කෙස් ලොම් ආදී කොටස් විස්ස ද, බාහිර වූ යකඩ පොළොව ගල් ආදී වූ නොයෙක් වර්ණාදියෙන් යුත් සමූහයක් වේ ද, මේ සියල්ල **"සසම්භාර පඨවි"** නම් වේ.

පඨවි කසින භාවනාව වැඩීම ආදියට යොදා ගන්නා කසින අරමුණ **"ආරම්මණ පඨවි"** නම් වේ.

ලෝක ව්‍යවහාරය සම්මුතිය අනුව ගනු ලබන පෘථිවිය ආදිය **"සම්මුති පඨවි"** නම් වේ.

මෙසේ පඨවි ධාතුවෙහි සත්‍ය වශයෙන් ඇති ස්වභාවය නොදන්නා වූ පුහුදුන් සත්වයා විසින් තණ්හා දිට්ඨි මාන වශයෙන් ගැට ගැසී සත්ව පුද්ගල සඤ්ඤාවෙන් ගෙන සතර වැදෑරුම් පඨවි ධාතුව පඨවි ධාතුව වශයෙන් හඟියි. පඨවි ධාතුව පඨවි ධාතුව වශයෙන් හැඳින, පඨවි ධාතුව නිත්‍ය ආත්මයක් ය යැයි හඟියි. නිත්‍ය ආත්මය පඨවි ධාතුවෙහි පිහිටියේය යැයි හඟියි. පඨවි ධාතුවෙන් පිටත නිත්‍ය ආත්මය පිහිටියේය යැයි හඟියි. පඨවි ධාතුව මගේ ආත්මය යැයි හඟියි. පඨවි ධාතුව මගේ නිත්‍ය ආත්මය යැයි ආසාවෙන් සතුටු වෙයි. ඊට හේතු කවරේද? ඔහුගේ වෙන් වශයෙන් බෙදා නො දැනීම නිසාම ය.

භාග්‍යවතුන් වහන්සේ එය ඇති ලෙස ප්‍රත්‍යක්ෂාවබෝධයෙන් දැක මෙය ආධ්‍යාත්මික පඨවි ධාතුවය, මෙය බාහිර පඨවි ධාතුවය, මේ ඒ පඨවියෙහි ලක්ෂණය, කෘත්‍ය රසය, වැටහෙන ආකාරය, ආසන්න කාරණය වශයෙන් දැන වදාළ සේක. මෙය **ඤාත පරිඤ්ඤාව** නම් වේ.

ඉන් පසු එලෙස ඤාත පරිඤ්ඤාවෙන් දැන වදාළ පඨවි ධාතුව අනිත්‍ය දුක්ඛ රෝග භය ආදී සතළිස් ආකාරයෙන් (චත්තාළිසාකාර විදර්ශනා වශයෙන්) විනිශ්චය කොට වදාළ සේක. මෙය **තීරණ පරිඤ්ඤාව** නම් වේ.

මෙසේ තීරණ පරිඥ්ඥාවෙන් තීරණය කොට ඒ පඨවි ආදියෙහි මුලා වී බැඳීම ඇතිවන ඡන්ද රාගය මාර්ග ඥානයෙන් ප්‍රහාණය කළ සේක. මෙය **පහාණ පරිඥ්ඥාව** නම් වේ. අන් ආපෝ තේජෝ වායෝ ධාතූන් පිළිබඳව ද මෙසේම ය.

බ්‍රහ්මය මෙසේ දැනීමෙන් මම නුඹ හා සම නොවන්නෙමි. පහත් බවක් නම් කොයින්ද, එහෙයින් මම ම නුඹට වඩා උසස් වෙමි.

බ්‍රහ්මය, මම ආපෝ ධාතුව, තේජෝ ධාතුව, වායෝ ධාතුව, භූත, දේව, මාර, බ්‍රහ්ම, ආභස්සර, සුභකිණ්හක, වේහප්ඵල, අභිභූ යන සියල්ල පිළිබඳව ද ඇත්තා වූ ආකාරයෙන් ම දැන ධාතු වශයෙන් දැන එය හටගන්නා හේතුව ද, එයින් නිදහස් වූ යම් නිවනක් වේ නම් එය ද ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ද ආත්ම වශයෙන් ද නො ගනිමි. බ්‍රහ්මය මෙසේ දැනීමෙන් මම නුඹ හා සම නොවන්නෙමි. පහත් බවක් නම් කොයින්ද, එහෙයින් මම නුඹට වඩා උසස් වෙමි යැයි වදාළ සේක.

නිදුකාණෙනි, ඉදින් වනාහි සියල්ල සියලු භාවයෙන් නොපැමිණියේ ද, එසේ ඇති කල්හි ඔබගේ වචනය හිස් වන්නේ ය. නිෂ්ඵල වන්නේ ය යැයි භාග්‍යවතුන් වහන්සේට නිග්‍රහ කිරීම් වශයෙන් කීවේ ය.

මෙහි දී භාග්‍යවතුන් වහන්සේ විසින් සක්කාය දෘෂ්ටිය පිළිබඳව **"සබ්බ"** යනුවෙන් වදාළ සේක. ආර්‍ය්‍ය භූමියෙහි දී සතර මාර්ග ඥානය ලැබ ප්‍රත්‍යවේක්ෂා ඥාණයන්ගෙන් සියලු සංයෝජන ප්‍රහීණ කිරීමෙන් සියලු සංස්කරයන්ගෙන් නිදහස් වීම සිදු වේ. බක බ්‍රහ්මයා එම වචනය තමන් ආත්ම වාදී බැවින් සබ්බ යනුවෙන් වදාළ වචනය සියල්ල යන හැඟීමෙන් ගෙන සර්වාකාරයෙන් නො විඳින ලද්දක් වේ නම් එය ගගන කුසුමක් මෙන් කිසිවක් නැත්තා වූ මිථ්‍යාවක් වන්නේය. ශ්‍රමණය නුඹ කී එම කරුණ බොරු වන්නේය යැයි භාග්‍යවතුන් වහන්සේට මුසා බස් කියන්නෙකි යැයි නිග්‍රහ කිරීම් වශයෙන් කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ එම බ්‍රහ්මයාට වඩා සිය දහස් ගුණයෙන් වාදිසිංහ වන බැවින් බ්‍රහ්මයාගේ වාදය බිඳිමින් මෙසේ වදාළ සේක.

බ්‍රහ්මය, චක්ඛු විඤ්ඤාණයට (ඇසට) නොපෙනෙන බැවින් නිවන අනිදස්සන නම් වෙයි. ඉපදීමක් නැති වීමක් නැති බැවින් අනන්ත නම් වෙයි. අන් සියල්ලට වඩා ප්‍රභාවත් වෙයි. ඒ නිවන පඨවි ආපෝ තේජෝ වායෝ භූත දේව මාර බ්‍රහ්ම ආභස්සර සුභකිණ්හක වේහප්ඵල අභිභූ යන සියල්ලෙන් කිසිවකට විෂය නොවෙයි යැයි වදාළ සේක.

මෙහි දී විඤ්ඤාණ යන්නෙන් විශේෂයෙන් දැකීම වදාළ සේක. චක්ඛු විඤ්ඤාණය ඉදිරියට රූපාරම්මණයක් මෙන් නො එන දහමක් බැවින් ඒ නිවන අනිදස්සන නම් වේ. භූතයෝ (හේතු ප්‍රත්‍යයෙන් නිර්මිත සංස්කාර) උත්පාද ව්‍යය සංඛ්‍යාත අන්ත ඇත්තේ වේ. එබඳු අන්ත රහිත බැවින් නිවන ප්‍රත්‍යයෙන් නිර්මිත වූවක් නොවේ. නූපන් වස්තුවෙහි උත්පාද ව්‍යය අන්ත නො පැනවිය හැකිය. එබැවින් නිවන අනන්ත නම් වෙයි. සම්පූර්ණයෙන් නිවනට වඩා ප්‍රභා සම්පන්න වූ අතිශයින් බබළන්නා වූ අතිශයින් පණ්ඩර වූ දහමක් තවත් නැත. මේ නිවනට පිවිසීමට තොටුපොළවල් සීමාවක් නැත. මහා සමුද්‍රයට යම් යම් තැනකින් බසිනු කැමැත්තේ ද ඒ ඒ තැන්වලින් බැසිය හැකි වේ. ඒ සෑම තැනක් ම තොටක් වේ. එසේම අට තිස් කර්මස්ථාන අතරින් යම් යම් දොරටුවකින් නිවනට බසිනු කැමති වේ ද ඒ ඒ කර්මස්ථානය නිවනට බැසීමට තොටක් වේ. පඨවි ධාතු ආපෝ ධාතු ආදී වූ ත්‍රෛභූමික සියලු සංස්කාරයන් තෘෂ්ණා දිට්ඨි මාන ප්‍රපඤ්චයන්ට හසුව මෝහයෙන් මුලා වී තෘෂ්ණාවෙන් වැළඳ ගෙන උපාදාන වශයෙන් ගෙන නැවත නැවත සංස්කාර රැස් කරවමින් භව පරම්පරාව වර්ධනය කරන යම් ස්වභාවයක් වේ ද, ඒ නිවන එබඳු ස්භාවයෙන් දුරු වූයේ ය. බ්‍රහ්මය, මේ උතුම් අර්ථය නුවණින් නො විමසා යම් දෝෂයක් ප්‍රකාශ කරන්නේ ද, එය මිථ්‍යාවකි" යැයි බ්‍රහ්මයාගේ වාදය බිඳිමින් වදාළ සේක.

ඉක්බිති බක බ්‍රහ්මයා තමන් විසින් ගත් සියලු වාදයන් භාග්‍යවතුන් වහන්සේ බිඳ දැමූ බැවින් නැවත වාද පිණිස ගත යුතු කිසිවක් නො දැක භාග්‍යවතුන් වහන්සේ අමතා "**නිදුකාණෙනි, එසේ නම්, මම ඔබට නො පෙනී සැඟවෙමි**" යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ "**බ්‍රහ්මය, ඉදින් හැකි නම් නුඹ මට නොපෙනී සැඟවී සිටුව**" යැයි වදාළ සේක. ඉක්බිති බක බ්‍රහ්ම තෙම 'ශ්‍රමණ ගෞතමයන්ට නොපෙණෙන්නෙමි' යැයි තම මූල ප්‍රතිසන්ධි සිතට යාමට උත්සාහ කළේ ය. මොහු මේ භවයට පැමිණියේ ආභස්සර බඹලොව සිටය. එබැවින් දැන් සිටින ප්‍රකෘති රූපය අතහැර අන් බ්‍රහ්ම කායික රූපයකින් පෙනී සිටීමට උත්සාහ කළ නමුත් එසේ කිරීමට නොහැකි විය. ඉන් පසු තමන් නොපෙනෙන ලෙස අන්ධකාරයක් මවා පෑවේ ය.

භාග්‍යවතුන් වහන්සේට එය දැන මොහුට නොපෙනී සිටින්නට නොහැකි වේවා යැයි අධිෂ්ඨාන කොට ආලෝකයක් ඇති කරවා එම අඳුර දුරු කළ සේක. එයින් මේ බ්‍රහ්මයාට නොපෙනී සිටීමට නොහැකි වූ බැවින් සැඟවී සිටීමට සිතා තම විමානයෙහි සැඟවෙයි. කප් රුකෙහි සැඟවෙයි. උක්කුටිකයෙන් හිඳියි. එහෙත් නොපෙනී සිටීමට නොහැකි විය. ඉක්බිති අන් බ්‍රහ්මයෝ බක බ්‍රහ්මයා අමතා "**බ්‍රහ්මය නුඹ අතුරුදහන් වීමට නොහැකිව දැන් සැඟවීමට සිතයි ද?**" යැයි අපහාස කළහ.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ බක බ්‍රහ්මයා අමතා "**බ්‍රහ්මය, එසේ නම් මම නුඹට නොපෙනී අතුරුදහන් වන්නෙමි**" යැයි වදාළ සේක. "නිදුකාණෙනි, හැකි නම් මට නොපෙනී සිටුව" යැයි බ්‍රහ්මයා කීවේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බක බ්‍රහ්මයාට හා අන් බඹ පිරිසට ද "**මාගේ රූපය නොපෙනේවා ශබ්දය පමණක් ඇසේවා**" යැයි අධිෂ්ඨාන කොට එබඳු වූ ඍද්ධි ප්‍රාතිහාර්‍යයක් කොට ඔවුන්ට නොපෙනී සිට මේ ගාථාව වදාළ සේක.

**"භවෙ'වාහං භයං දිස්වා - භවඤ්ච විභවෙසිනං,**
**භවං නාභිවදිං කිඤ්චි - නන්දිඤ්ච න උපාදියි'න්ති"**

"මම මේ සංසාරයෙහි ජාති ජරා මරණ ආදී භය දැක, මේ කාම භව ආදී ත්‍රිවිධ භවයන්හි සත්වයන් සැරිසරමින් සිටිනු දැක ඒ ත්‍රිවිධ භවයෙන් වෙන් වීම් සංඛ්‍යාත විභව නම් වූ නිර්වාණය සොයමින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් කිසි භවයක් ග්‍රහණය නො කළෙමි. භව තෘෂ්ණාවට නො පැමිණියෙමි" යැයි වදාළ සේක.

මෙහි දී "**භව**" යන්නෙන් දුක්ඛ සත්‍යය ද, "**නන්දි**" යන්නෙන් සමුදය සත්‍යය ද, "**විභව**" යන්නෙන් නිරෝධ සත්‍යය ද "**නන්දික්ඛය න උපාදියං**" යන්නෙන් මාර්ග සත්‍යය ද දක්වන ලද්දේ ය. මෙසේ මෙම ගාථාවෙන් චතුරාර්‍ය්‍ය සත්‍යය විස්තර කොට දක්වූවේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ බ්‍රහ්මයන්ගේ අදහසට අනුරූපව සත්‍යයන් විස්තර වශයෙන් ප්‍රකාශ කොට දක්වන සේක් විදර්ශනාවට පමුණුවා අර්හත්වයෙන් මෙම දේශනාව කූළු ගැන්වූ සේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ චතුරාර්‍ය්‍යය සත්‍ය කුළු ගන්වමින් විදර්ශනා ප්‍රතිසංයුක්ත ව මෙම ගාථාවෙන් ධර්ම දේශනා කොට වදාළ කල්හි ඒ ඔස්සේ සිත යවා එම බඹ පිරිසෙහි ඇතැම් කෙනෙක් සෝවාන් ඵලයෙහි පිහිටියහ. ඇතැම් කෙනෙක් සකෘදගාමී ඵලයෙහි පිහිටියහ. ඇතැම් කෙනෙක් අනාගාමී ඵලයෙහි පිහිටියහ. ඇතැම් කෙනෙක් අර්හත් ඵලයෙහි පිහිටියහ. මෙසේ දස දහසක් පමණ පිරිසක් මඟ ඵල නිවනට පැමිණ අමෘත පානය වැළඳූහ.

ඉක්බිති බක බ්‍රහ්මයා ප්‍රධාන පිරිවර බ්‍රහ්ම සමූහයා පුදුමයට පැමිණ "පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ මහත් ඍද්ධි ඇති බව, මහත් ආනුභාව ඇති බව ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යය. අද්භූතය. ශාක්‍ය පුත්‍ර වූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදි වූ මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙන් මහත් ඍද්ධි ඇති, මෙසේ මහානුභාව ඇති අන්‍ය වූ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ මීට පෙර අප විසින් නොදක්නා ලද්දේ ය. නො අසන ලද්දේ ය. පින්වත්නි, භවයෙහි කැමැත්ත ඇති, භවයෙහි ඇලුණු. භවයෙහි සතුටු වන්නා වූ දෙව් මිනිසුන්ගේ අවිද්‍යා මුල් සහිත වූ භවය උපුටා හරින ලද්දේ ය" යැයි ප්‍රශංසා මුඛයෙන් කීහ.

භාග්‍යවතුන් වහන්සේ බෝ මැඩ දී ප්‍රථමයෙන් තමන් වහන්සේ ගේ සන්තානයෙහි පැවති අවිද්‍යා මූලය උපුටා දමා ධර්ම දේශනා කිරීමෙන් අන් සත්වයන්ගේ ද උපුටා හරින ලද්දේ ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ දැඩි මිථ්‍යා දෘෂ්ටි ගෙන මුලා වී සිටියා වූ බක බ්‍රහ්මයා හට ධර්ම දේශනා කොට ප්‍රාතිහාර්‍ය්‍යය දක්වා බක බ්‍රහ්මයා සමග දස දහසක් බ්‍රහ්මයන් නිවන් පුරයට පමුණුවාලූ සේක.

මෙය අර්ථ වශයෙන් ගෙන සත්‍යක්‍රියා කොට සෙත් පැතීම මෙම ගාථාවෙන් ප්‍රකාශ කොට දක්වන්නේ ය.

**දුග්ගාහදිට්ඨි භුජගෙන සුදට්ඨ හත්ථං**
**බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි බකාභිධානං,**
**ඤාණාගදෙන විධිනා ජිතවා මුනින්දො**
**තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.**

නා නා අවුල් මිසදිටුන් - අවුලේ වෙලීගත්
සෝභා විලාස තෙද යුත් - බක බ්‍රහ්මයාණන්
බලයෙන් මහා නැණ බෙලෙන් - දිනූ වීරයාණෝ
ඒ ආනුභාව බලයෙන් - සුව සෙත් සැදේවා.

මෙම ගාථාවන්ගෙන් කියවෙන අර්ථයන් මනා සිහි නුවණින් යුතුව ගෞරව බහුමානයෙන් ඇසුරු කරන්නේ නම් එයින් ලැබෙන ලෞකික ලෝකෝත්තර ආනිශංස මෙම ගාථාවෙන් ප්‍රකාශ කොට දක්වෙන්නේ ය.

**එතාපි බුද්ධ ජයමඞ්ගල අට්ඨ ගාථා**
**යො වාචකො දින දිනෙ සරතෙ මතන්දී,**
**හිත්වාන නෙක විවිධානි චුපද්දවානි**
**මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො සපඤ්ඤො'ති.**

යම් පින්වතෙක් දිනපතා - මැලි කම් නො දක්වා
සැදැහෙන් මනා ජයමගුල් - ගථා කියා නම්
දුරු වී නොයෙක් උවදුරින් - සැපතින් පිරී ගොස්
ඒ මේ සදතනික වූ - සුවයත් ලබා මැයි.

නිමි.